# මහා අරගලය

*ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ දූතයන්ද*
*සාතන් සහ ඔහුගේ දූතයන්ද*
*අතර*
*මහා අරගලය*


**එලන් ජී වයිට් තුමිය**
**විසින්ය**


---


බැටල් ක්‍රීක් මිච්ගන්
ජේම්ස් වයිට් විසින් ප්‍රකාශිතය
1858

m<uq uqøKh
2005

***ප්‍රකාශකයෝ***
,lamyk mí,sIsx yjqia
fkd( 8" foajd, mdr" kqf.af.dv'

**පරිවර්තනය**
**ටියුඩර් පෙරේරා දේවගැති තුමා**
**පටුන**

**පිටු අංක**


1. සාතන්ගේ වැටීම ............................................................ 1
2. මනුෂ්‍යයා පාපයට වැටීම ............................................ 3
3. ගැළවීමේ සැලැස්ම ........................................................ 5
4. ක්‍රිස්තුස්වහන්සේගේ පළමුවන පැමිණීම ........................ 9
5. ක්‍රිස්තුස්වහන්සේගේ මෙහෙය ........................................ 14
6. අන්‍යරූප විලාශ වීම .................................................... 17
7. ක්‍රිස්තුස්වහන්සේව පාවා දීම .......................................... 20
8. ක්‍රිස්තුස්වහන්සේව විනිශ්චය කිරීම ................................ 23
9. ක්‍රිස්තුස්වහන්සේව කුරුසියෙහි ඇණ ගැසීම ................. 28
10. ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් උත්ථාන වීම ........... 33
11. ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ගයට යාම ................................ 40
12. ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයෝ ..................................... 42
13. ස්තේපන්ගේ මරණය ..................................................... 46
14. සාවුල්ගේ හැරීම ........................................................... 48
15. යුදාවරු පාවුල් තුමාව මරන්ට තීරණය කිරීම ............. 50
16. පාවුල් නැවත යෙරුසලමට පැමිණෙයි .......................... 53
17. ඇදහිල්ලෙන් වැටී යාම ................................................. 56
18. පාපයේ අභිරහස ........................................................... 59
19. මරණය සදාකාලික දුකෙහි ජීවත්වීම නොවේය ........... 63
20. ප්‍රතිසංස්කරණය ........................................................... 67
21. සභාව සහ ලෝකය එකට එක්වේ ................................ 70
22. විලියම් මිලර් ................................................................ 73
23. පළමුවන දේව දූතයාගේ පණිවිඩය ............................. 76
24. දෙවන දේව දූතයාගේ පණිවිඩය ................................ 80
25. දෙවන ඊම ගැන වූ මෙහෙය නිදර්ශනයෙන් .......... 82
26. තවත් නිදර්ශනයක් ................................................. 86
27. ශුද්ධස්ථානය ........................................................... 90
28. තුන්වන දේව දූතයාගේ පණිවිඩය .......................... 93
29. ස්ථිර වේදිකාවක් ..................................................... 97
30. ආත්මවාදය නොහොත් මළවුන්ගෙන් පණිවිඩ ........ 100
31. වස්තු තණ්හාව ........................................................ 104
32. සොලවනු ලැබීම ..................................................... 106
33. බබිලෝනියේ පාපයන් ............................................ 110
34. මහත් හඬ ................................................................. 113

35. තුන්වන පණිවිඩය නිම කිරීම .................................. 115
36. යාකොබ්ගේ විපත්ති කාලය .................................... 118
37. ශුද්ධවන්තයන්ගේ මිදීම ............................................ 120
38. ශුද්ධවන්තයන්ගේ විපාකය ...................................... 123
39. පොළොව පාළු විය .................................................. 125
40. දෙවන මළවුන්ගෙන් නැගිටීම .................................. 127
41. දෙවන මරණය ........................................................ 129

## දිවි පෙවතේ සටහන්

## t,ka f.d,aâ jhsÜ 1827-1915

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයෙක් ලෙස කැපව සිටියාවූ එලන් මහත්මිය වයස අවුරුදු 17 දක්වා ජීවත් වූයේ මෙතෝදිස්ත සභාවේ සාමාජිකාවක් ලෙසය. 1843 දී යේසුස්වහන්සේ නැවත වර පැමිණෙන බව විශ්වාස කළ නිසාද ඒ ගැන අන් අයට කථා කළ නිසාද ඇයව සභා සාමාජිකත්වයෙන් ඉවත් කරන ලදී. ලෝකයට ප්‍රකාශ කරන පිණිස දෙවියන්වහන්සේ ඇයට දර්ශනද පණිවිඩයක්ද දුන්සේක. මීට පෙර උන්වහන්සේ වෙන දෙදෙනෙකුට වගකීම දෙන්ට උත්සාහ කළ නමුත් ඔවුහු එය ප්‍රතික්ෂේප කළහ. සෞඛ්‍ය පණිවිඩය ලැබුවායින් පසුව එම පණිවිඩය ඉදිරියට ගෙන යාමේ ප්‍රමුඛයෙක් ලෙස ඇය ක්‍රියා කරන්නට වූවාය. ඒදන් උයනේදී දෙනු ලැබූ ආහාර ක්‍රමයට ආපසු හැරී එන ලෙසද සියල්ලේදී පමණ දැන ක්‍රියා කරන ලෙසද සෞඛ්‍යයට අහිතකර සියල්ලෙන් වැලකී සිටින ලෙසද ඇය ජනතාව කැඳවූවාය.

වයිට් මහත්මිය කිසිදිනක තමා අනාගතවක්තෘවරියක් යයි කියා නොගත්තාය. බොහෝ අය ඇය එනමින් පිළිගත්තෝය. නමුත් ඇය කියා සිටියේ තමා දෙවියන්වහන්සේගේ පණිවිඩකාය බවය. එම පිළිතුර අනුව ඇය නිරතව සිටියේ සෞඛ්‍ය සාධනය, පව් ගැන පසුතැවීමට ජනයා කැඳවීම ක්‍රිස්තියානි ඇදහිල්ලේ සිදුවී ඇති කැඩුම් බිඳුම් අළුත් වැඩියා කිරීම සඳහා වන කාර්යයන්හි පුරෝගාමියෙකු ලෙස ක්‍රියාකිරීම ආදී වශයෙන් අනාගතවක්තෘවරයෙකුගේ කාර්යයන්ට වඩා පුළුල් සේවයක් වෙනුවෙනි. ඇයට ඉටු කිරීමට තිබෙන පුළුල් සේවයෙන් ඇය දේව නමස්කාරය සඳහා පොත් පත් කීපයක් සම්පාදනය කළාය. ක්‍රිස්තියානි පඩි පෙළ නොහොත් (අළුත් නව පිරිපුන් මග) ජනප්‍රිය වූ පොත් අතරින් එකකි. නමුත් ඇය සිතා ගත්තේ 'ක්‍රිස්තුස්වහන්සේද උන්වහන්සේගේ දූතයන් සහ සාතන්ද ඔහුගේ දූතයන්ද අතර පවතින මහා අරගලය' නමැති පොත ඉතාමත්ම වැදගත් පොත ලෙසය.

## ප්‍රස්ථාවනාව

*~ව්‍යවස්ථාවද සාක්ෂියද වෙතට යමු" එම වචනයට අනුව ඔවුන් කථා නොකළොත් එසේ වන්නේ ඔවුන් තුළ ආලෝකය නැති නිසාය" යෙසායා 8: 20.*

21 වන සියවස ආරම්භයේ සිට පෙනී යන්නේ සෑම කෙනෙක්ම අනාගතවක්තෘ කෙනෙක් බවට පත්ව සිටිනවා මෙනි. අන්තර් ජාලය තුළද මීට සම්බන්ධ පුද්ගලයන් ඇතුළත් කර ඇත. මේවායෙහි සමහර අය අමුතු පුදුම දේ කථා කරති. ඔවුන් කියා සිටින ආකාරයට ඔවුන් දේව වචනය ලබන්නාවූ අය ලෙස අපට විශ්වාස කළ හැකිද? ඔවුන් පවසන්නාවූ දේ ව්‍යවස්ථාවද සාක්ෂියද සමග සමාන කර බැලිය යුතුය. ආදී කාලයේ පටන් තම සෙනඟට දෙවියන්වහන්සේ විසින් දෙනු ලැබූ පණිවිඩ ලියනු ලැබ, දන් පොත් වශයෙන් බයිබලයට ඇතුළත්ව ඇත. මේ ලියවිලි එකිනෙකට ප්‍රතිවිරුද්ධ විය නොහැක.

අන්තිම කාලයේදී අනාගතවාක්‍ය කීම් ආගමික ප්‍රශ්නයක් වන නිසා එවන් දේ සෝදිසියකට භාජනය කළ යුතු බවට යේසුස්වහන්සේම අනාවැකියක් පැවසූ සේක. බොහෝ බොරු අනාගතවක්තෘන් නැගිට බොහෝ දෙනෙකු මුළා කරන්නෝය. මතෙව් 24: 11. මෙයට එකතු කිරීමක් ලෙස දෙවියන්වහන්සේ යොහන් තුමා තුළින්ද දනුම් දීමක් කළසේක. ප්‍රේමවන්තයෙනි, සෑම ආත්මයක්ම විශ්වාස නොකරල්ලා. නමුත් එම ආත්ම දෙවියන්වහන්සේගෙන් දැයි සෝදිසි කර බලාපල්ලා. මක්නිසාද බොහෝ බොරු අනාගතවක්තෘවරු දනටම ලෝකයට පිටත්ව ගොස් ඇත. 1 යොහන් 4: 11. වයිට් මහත්මිය ගැන විශේෂත්වයක් නැත. මෙම පොත ගෙන ශුද්ධ ලියවිලි සමග සමාන කර ඊට එකඟද කියා සෝදිසි කර බලන්න. මුළු සත්‍යය කරා මගපෙන්වන ලෙස ශුද්ධාත්මයාණන්ව එවන ලෙස ස්වර්ගීය පියාණන් වහන්සේට යාච්ඤා කරන්න.

විසිවන සියවසේ අවසාන අවුරුදු කීපය වන තුරු ජීවත්වූ ක්‍රිස්තියානින් යයි කියාගත් හැම දෙනෙක්ම වාගේ දෙවියන්වහන්සේගෙන් එළිදරව් ලබා ගන්නවා යයි පැවසූ අයට විරුද්ධව සිටියහ. ඔවුන්ගේ ස්ථාවරය ඔප්පු කිරීමට ඔවුන් ඉදිරිපත් කළේ, එළිදරව් 22: 18, 19 දක්වාවූ විස්තරයන්ය. මේ පොතේ අනාගතවාක්‍ය වචන අසන සියල්ලන්ට මෙසේ සහතික ලෙස කියමි. එනම් යමෙක් ඒ වචනවලට යමක් එකතු කරන්නේ නම් දෙවියන්වහන්සේ මේ පොතේ ලියන ලද පීඩා ඔහුට එකතු කරන සේක. යමෙක් මේ අනාගතවාක්‍ය පොතේ යමක් අහක් කරන්නේ නම් මේ පොතෙහි ලියා තිබෙන ජීවන වෘක්ෂයෙන්ද ශුද්ධ නුවන්ද දෙවියන්වහන්සේ ඔහුගේ කොටස අහක් කරන සේක යනුයි.

දන් මෙම කියමන්වලින් අදහස් කරන්නේ යොහන් තුමාගෙන් පසු දෙවියන්වහන්සේගෙන් වූ අනාගතවක්තෘවරුන් නොසිටින බවද? එය එසේ නම් බොරු අනාගතවක්තෘවරුන්ගෙන් ප්‍රවේශම් වෙයල්ලා යයි යේසුස්වහන්සේ පැවසුවේ මන්ද? ආත්මයන් සෝදිසි කරන්නට යයි යොහන් තුමා ලවා ප්‍රකාශ කර ඇත්තේ ඇයි? යොහන් තුමාගෙන් පසු කිසිම අනාගතවක්තෘවරයෙකු විශ්වාස කරන්නට එපා යයි කීවා නම් වඩාත්ම පහසුයි නොවේද? නමුත් දේව සැලැස්ම එය නොවේය. අවශ්‍යතා අනුව උන්වහන්සේ අළුත් සත්‍යතාවයන් දෙන සේක. තම කැමැත්ත එළිදක්වන සේක. සිතින් අවංකව සිටින අය ඒවා සත්‍යදයි සොයා බලා සතුටින් පිළිගෙන, අනුගමනය කරති. සාතන්ටද ක්‍රියා කරන්නට ඉඩ දී ඇත. එසේ නොවූයේ නම් දෙවියන්වහන්සේ අසාධාරණ යයි ඔවුන් දොස් කියනවා ඇත.

සමහර අය මගහැර ගොස් ඇති ඉතා වැදගත් ප්‍රශ්න කිහිපයක් ශුද්ධාත්මයාණන් වහන්සේ පාවුල් තුමා මගින් ඉදිරිපත් කර ඇත. 1 කොරින්ති 12. සියල්ලෝම අපෝස්තුළුවරුද? සියල්ලෝම අනාගතවක්තෘවරුද? සියල්ලෝම ප්‍රාතිහාර්ය කරන්නෝද? සෑම දෙනාටම සුවකිරීමේ දීමනාව තිබේද? සෑමදෙනාම අන් භාෂා කථා කරත්ද? ඊටත් වඩා උතුම් මාර්ගයක් මම නුඹලාට පෙන්වමි යයි කියමින් අපට ප්‍රේමය නැත්නම් මෙම දීමනාවලින් කිසි ප්‍රයෝජනයක් නැති බව පෙන්වා දෙයි. 14 වන පරිච්ඡේදයෙන් පාවුල් තවත් පියවරක් ඉදිරියට යමින් ප්‍රේමය සොයන්න, ආත්මික දීමනාවලට ආශා වන්න. ධර්මවාක්‍ය කියන්ට උනන්දු වෙයල්ලා. අන් භාෂා කථාකිරීම තහනම් නොකරල්ලා. ආත්මයාණන් වහන්සේ නොනිවල්ලා. අනාගතවාක්‍ය කීම් සුළු කොට නොසිතල්ලා. සියල්ල සෝදිසි කර බලා හරි දේ අල්ලා ගනිල්ලා. 1 තෙසලෝනික 5: 19-21.

එලන් වයිට් මහත්මියට මහා අරගලය සම්බන්ධව දර්ශන දෙනු ලැබුවේ ඇමරිකාවේ ඔහියෝ ප්‍රාන්තයේ ලොයිඩ්ස් ග්‍රොව් නම් ස්ථානයේදී 1858 වසරේදීය. දර්ශනයේ බොහෝ දේ ඇය දුටුවේ මීට වසර 11 කට පෙරය. නමුත් මෙම අවස්ථාවේදී ඇය දකින සියල්ල සාතන් කොතෙක් විරුද්ධකම් පෑවත් ලියා තබන ලෙස ස්වාමින්වහන්සේ ඇයට පැවසූ සේක. සමහර කොටස් 'කුඩා රුළ' යන පත්‍රිකාවෙන්ද, විශේෂයෙන් 30 වන පරිච්ඡේදය 1847 වසරේදී හා ක්‍රිස්තියානි අත්දකීම් යන කුඩා පොත 1851 වසරේදී ද, 'තවත් විස්තර' යනුවෙන් 1854 දී ද ප්‍රකාශයට පත්කරන ලදී. මේ සියල්ලම ශුද්ධාත්මයාණන් වහන්සේගේ පෙළඹවීම ඇතිව ලියා දී ප්‍රකාශයට පත් කළේ ඇය ඉතා දුර්වල කාන්තාවක්ව සිටි අවධියේ වූ 1858 වසරේදීය. බයිබලය පොළොවෙන් තුරන් කර දැමීමට සෑම උත්සාහයක්ම දරූ සාතන් ලෝකයේ දෙවෙනි තැන ගන්නා මෙම පොතද දූෂණය කර විනාශ කිරීමට උත්සාහ දරීය. නමුත් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනය ආරක්ෂා කළසේක.

අපගේ ලෝකයේ මෙතරම් කරදර රාශියක් එනම් යුද්ධ, අපරාධ, ලිංගික අශුද්ධ තත්ත්වය එපමණක් නොව ආගමික ඇදහිලි රාශියක්ද ඇත්තේ මන්දයි අසන අය සිටිති. ක්‍රිස්තුස්වහන්සේ සහ සාතන් අතර පවතින මහා අරගලය කියවා අවබෝධ කරගැනීමෙන් මේවාට පිළිතුරු ලබාගත හැකිය. මෙම අරගලය ආරම්භ වී පවතිමින් ඇත්තේ අපගේ ආරම්භයටත් පෙර සිටය. මෙය කියවන ඔබ මෙම පොතෙහි ලියා තිබෙන සියල්ල දේව වචනය වන බයිබලය සමග සසඳා සියල්ල සෝදිසි කරන අතර, ස්වාමින්වහන්සේගේ උතුම් දීමනාව ඔබට දෙනු ලැබේවා.

For Your own free copy of the book. Please download it at: http://www.early
questions or comments, email Daniel Winters at earlysda@hotmail.com.

*NOTE - The Biographical Sketch, Foreword, Word List and references a
each chapter were not written by Ellen White or in the original book.

## වචන ලැයිස්තුව

jpk woyi

| | |
|---|---|
| **යේසුස් ක්‍රිස්තුස්** | දේවත්වයේ සඳහන් වන පුද්ගලයින් තුන්දෙනාගෙන් කෙනෙක් ලෝකයේ සහ විශ්වයේ සියලු දේ මැවූ සේක. එතුමා වසර 2000 කට පෙර මනුෂ්‍යයෙක් ලෙස උපත ලැබීය. වසර 33 දී කුරුසියක ඇණ ගසා මරණයට පත් කෙරිණ. මළවුන්ගෙන් නැගිටුවනු ලැබ අපේ මිදීම පිණිස දැන් ස්වර්ගයෙහි සේවය කරමින් සිටින සේක. නැවත ඉක්මණින් පැමිණ රාජ්‍ය බලය ලබාගෙන සදාකාලයටම රජකම් කරන සේක. |
| **සාතන්** | සියලු දුෂ්ටකමේ පියාය. ඉතාම උතුම් අලංකාර සම්පූර්ණ දේව දූතයෙකු ලෙස මවන ලද්දෙකි. නමුත් ඔහු කැරලි ගැසීමට තීරණය කළේය. තවමත් ඔහු දුෂ්ටකම් කරමින් සිටී. අවසානයේදී ඔහුව විනාශ කරනු ලබන්නේය. |
| **ස්වාමින්වහන්සේ** | යේසුස්වහන්සේ, දෙවියන්වහන්සේ. |
| **මම දුටිමි“ මට පෙන්වීය** | කතෘ තැන-එලන් වයිට් දර්ශනය දුටු විට දේවදූතයෙක් ඇය සමග සිටිමින් දර්ශන පෙන්වමින් කාරණා විස්තර කර දෙන්ට විය. ඇය තමාගේම ඇස්වලින් දුටු දේ ලියා තැබුවාය. |
| **දෙවි පියාණන්** | පියා, පුත්‍රයා, ශුද්ධාත්මයාණන් යන තුන්දෙනාම එක දෙවියන්වහන්සේය. |
| **දේව පුත්‍රයාණන්** | යේසුස් ක්‍රිස්තුස්. |
| **දේව වචනය** | 1. දෙවිඳුන් පවසන දේ. 2. බයිබලය. |
| **මුදා ගැනීම** | මුලින්ම මනුෂ්‍යයා දෙවියන්වහන්සේ සතු විය. අප ආදී මුතුන් මිත්තන් පව් කළ නිසා අප හැම කෙනෙක්ම සාතන්ට අයත් විය. යේසුස්වහන්සේ අපව සාතන්ගෙන් මුදා ගනී. |
| **දේව දූතයා** | එලන් වයිට් මහත්මිය දර්ශනය දකින විට මගපෙන්වන්ට එවනු ලැබූ දේව දූතයා. |
| **දෙවෙනි ඊම** | යේසුස්වහන්සේ නිල වශයෙන් මෙලොවට පැමිණියේ වසර 2000 කට පමණ පෙරය. දෙවන වර පැමිණීම ඉතා ඉක්මණින් සිදුවේ. |
| **දෙවිඳුන්ගේ බැටළු පැටවා** | යේසුස් ක්‍රිස්තුස්වහන්සේ. |

පරිච්ඡේදය 4
පරිච්ඡේදය 4
පරිච්ඡේදය 4
පරිච්ඡේදය 4
පරිච්ඡේදය 5
පරිච්ඡේදය 5
පරිච්ඡේදය 17
පරිච්ඡේදය 6
පරිච්ඡේදය 6
පරිච්ඡේදය 7
පරිච්ඡේදය 7
පරිච්ඡේදය 9
පරිච්ඡේදය 10
පරිච්ඡේදය 10
පරිච්ඡේදය 11
පරිච්ඡේදය 12
පරිච්ඡේදය 13
පරිච්ඡේදය 14
පරිච්ඡේදය 15
පරිච්ඡේදය 23
පරිච්ඡේදය 23

**යොහන් බව්තීස්ත** අනාගතවක්තෘවරයෙක්. යේසුතුමාගේ ඥාති සොහොයුරෙක්. පසුතැවීමටද, බව්තීස්මයටද ජනතාව පෙළඹ වූහ.

**බව්තිස්මය** කිතුණුවෙකු ලෙස පිළිගැනීම සඳහා කෙනෙක්ව සම්පූර්ණ ලෙස ජලයේ ගිල්වා නැගිටුවීම.

**එලියා** අනාගතවක්තෘවරයෙකි. මරණයට පත් නොවී ස්වර්ගයට ගෙන යනු ලැබීය.

**පූජාව** දෙවියන්වහන්සේට සත්වයන් පූජා කරනු ලැබීම, ක්‍රිස්තුස් වහන්සේ පූජා වීම.

**දෙවිඳුගේ සෙනඟ** 1. පුරාණ කාලයේ ඊශ්‍රායෙල් හා යුදා සෙනඟ.
2. මෙකල ක්‍රිස්තුස් වහන්සේ පිළිගත් සැමදෙනා.

**දෙවිඳුන්ගේ පොත** 1. ස්වර්ගයේ තිබෙන ජීවන පොත. ගැළවෙන හැමදෙනාගේ නම් එහි ලියා ඇත.
2. බයිබලය.

**මිඛායෙල්** ස්වර්ගීය දේව දූතයාගේ ප්‍රධානියා.

**රූ** මැදපෙරදිග වැඩෙන ගසක්. බෙහෙත් සඳහා යොදා ගනී.

**සහෝදර,සහෝදරී** දෙවිඳුන් විශ්වාස කරන එතුමන්ගේ කැමැත්ත කරන හැමදෙනා.

**හෝසන්නා** දෙවිඳුන්ට ප්‍රශංසාව.

**සබත් දිනය** සිකුරාදා හිරු බැස යාමෙන් සබත් දිනය ආරම්භ වී සෙනසුරාදා හිරු බැස යෑමත් සමග හමාර වන සම්පූර්ණ දවස. උත්පත්ති 2: 2, 3.

**පණිවිඩය** දෙවිඳුන්ගෙන් පැමිණෙන පණිවිඩයයි. එය පැතිරවීමේ වැඩ පිළිවෙල.

**ස්වර්ගාරෝහණය** ස්වර්ගයට නැගී යාම.

**අපෝස්තුළු** ශුභාරංචි පණිවිඩය ප්‍රකාශ කිරීමට සම්පූර්ණ කාලය කැපකර සිටින අය විශේෂයෙන් එකල සිටි ගෝලයන්.

**මනුෂ්‍ය පුත්‍රයා** යේසුස් ක්‍රිස්තුස්වහන්සේ.

**අන්‍ය ජාතීන්** යුදා සෙනඟට අයත් නැති අනෙකුත් සෙනඟ.

**පාවුල්** හැරීමට පෙර ඔහුගේ නම වූයේ සාවුල්ය. ක්‍රියා 13: 9.

1843-1844 යේසුස් වහන්සේගේ දෙවන පැමිණීම සිදුවේය කියා මෙම වසර දෙකේදීම බලාපොරොත්තු විය. දානියෙල් 9: 14 අනාවැකිය සම්බන්ධ කාලය 1844 දී නිමාවට පත්විය.

**බැටළු එඬේරා** 1. සභාවේ ප්‍රධානින්, දේවගැතිවරුන්.
2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ

**ශුද්ධවන්තයෝ** මුළු හදවතින්ම දෙවියන්වහන්සේට ප්‍රේම කරමින් උන්වහන්සේගේ කැමැත්ත කරන මනුෂ්‍යයන්.

පරිච්ඡේදය 24
පරිච්ඡේදය 25
පරිච්ඡේදය 23
පරිච්ඡේදය 26
පරිච්ඡේදය 27
පරිච්ඡේදය 27
පරිච්ඡේදය 27
පරිච්ඡේදය 28
පරිච්ඡේදය 28
පරිච්ඡේදය 28
පරිච්ඡේදය 29
පරිච්ඡේදය 29
පරිච්ඡේදය 32
පරිච්ඡේදය 32
පරිච්ඡේදය 37

**ශුද්ධස්ථානය** — අපගේ ගැළවීම සඳහා යේසුස්වහන්සේ දැන් ස්වර්ගයේ සේවය කරමින් සිටින ස්ථානයය. එය ශුද්ධස්ථානය සහ අති ශුද්ධස්ථානය යන කොටස් දෙකකින් යුක්තය. පුරාණ කාලයේ මෝසෙස් විසින් සාදා තිබුණේ ස්වර්ගීය ශුද්ධස්ථානයේ ආදර්ශයට අනුවය.

**සමගි කිරීම** — යේසුස්වහන්සේ තමන්ගේම රුධිරය පූජාකිරීම මගින් මනුෂ්‍යයන්ව දෙවියන් වහන්සේව සමගි කරන සේක

**සියොන්** — 1. ස්වර්ගයේ දැන් තිබෙන නගරයේ නමකි.
2. දෙවිඳුන් අනුව යන අයගේ නමය.

**අළුත් යෙරුසලම** — ස්වර්ගයේ තිබෙන නගරයේ නාමයය. දෙවිඳුන්ගේ ද දේව දූතයන්ගේ ද මධ්‍යස්ථානයය. මෙම නගරය ලෝකයට ගෙනැවිත් සදාකාලයටම මෙහි තිබෙන්ට යන වගය.

**කෙරුබ්** — උසස් පදවියක සිටින දේවදූතයන්.

**මැදහත්කාර මෙහෙය** — යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ සහ පව්කාර මනුෂ්‍යයන් අතරේ සිටිමින් ගැළවීම සඳහා කරන මෙහෙය.

**මෘගයා** — දෙවියන්වහන්සේට විරුද්ධව ක්‍රියා කරති. අති විශාල ජන කණ්ඩායමකට දී තිබෙන නාමය. එළිදරව් 13.

**යෙහෝවඃ** — දෙවියන්වහන්සේගේ එක් නාමයකි.

**කානාන් දේශය** — ඊශ්‍රායෙල්වරුන්ට පොරොන්දු වී තිබූ දේශය. එය ස්වර්ග රාජ්‍යයද නියෝජනය කරයි. උත්පත්ති 12: 5.

**පෙන්තකොස්ත දවස** — ඊශ්‍රායෙල්වරුන්ට දෙනු ලැබූ එක් මංගල්‍යයකි. ලෙවී 23: 5-16 සහ ක්‍රියා 2 වන පරිච්ඡේදයි.

**ඇඩ්වෙන්ටිස්ත** — යේසුස්වහන්සේ දෙවන වර පැමිණෙන බව විශ්වාස කරන සෙනඟ සහ සභාවේ නම.

**ලවෝදික** — එළිදරව් පොතේ සඳහන් සභා හතේ අන්තිම සභාව එළිදරව් 2 සහ 3 මෙම කණ්ඩායම ඉතා ධනවත් යයි සිතන නමුත් ආත්මිකව ඉතා දිළිඳු අඩියක සිටී.

**අන්තිම වර්ෂාව** — යේසුස්වහන්සේගේ පැමිණීම ඉතා ලංව තිබෙන විට ඒ සඳහා සෙනඟව සූදානම් කිරීමට බලවත් ලෙස ශුද්ධාත්ම බලය සෙනඟ වෙත වැගිරවීම, යෝවෙල් 2: 23 සහ ක්‍රියා 3: 19 ද බලන්න.

**ජුබිලිය** — නිදහස් වීමේ වසර අවුරුදු 50 කට වරක් ඊශ්‍රායෙල්වරු ඔවුන් ගෙන තිබූ සියල්ලම ආපසු මුල් අයිතිකරුවන්ට දීම. මෙම අවුරුද්දේදී කිසිම ගොවිතැන් කිරීමක් නොකරන ලදී.

## *1 - පරිච්ඡේදය*

# සාතන්ගේ වැටීම

සාතන් යේසුස්වහන්සේට පමණක් පහතින් සිටියාවූ ගෞරවය ලැබුවාවූ දේව දූතයෙක්ව සිටි බව ස්වාමින්වහන්සේ මට පෙන්වූ සේක. ඔහුගේ පෙනීම පැහැපත්ව අනිකුත් දේව දූතයන් මෙන් සතුටින් පිරි මුහුණක් ඇතිව සිටියේය. මහත් ප්‍රඥව ඇත්තෙකුගේ මෙන් නළල් තලය උස්ව පළල්ව පිහිටා තිබිණ. ඔහුගේ සිරුර සම්පූර්ණවද, තේජාන්විතවද ගෞරවණීය ආකාරයකින්ද තිබිණ. දෙවියන්වහන්සේ තම පුත්‍රයාණන්ට කථා කොට අපි අපගේ සමානත්වයෙන් මනුෂ්‍යයා සාදමු යයි කී විට සාතන් දේව පුත්‍රයාණන්ට ඊර්ෂ්‍යා කරන්ට වූ බව මම දුටිමි. මනුෂ්‍යයා මැවීම ගැන තමා සමග කථා කළ යුතුව තිබුණා යයි ඔහු සිතීය. සාතන් ඊර්ෂ්‍යාවෙන්ද, ක්‍රෝධයෙන්ද පූර්ණ විය. දෙවියන්වහන්සේ හැරුණු විට ස්වර්ගයෙහි උසස්ම තැනැත්තා වීමට උසස්ම ගෞරව ලැබීමට ඔහුට ඕනෑ විය. මේ දක්වා මුළු ස්වර්ගයම එකඟතාවයක දිව්‍ය පාලනයකට නතුව සම්පූර්ණ සාමකාමී වාතාවරණයක් ඇතිව තිබිණ.

දෙවියන්වහන්සේගේ කැමැත්තටද, ක්‍රමවත් පාලනයටද විරුද්ධව කැරලි ගැසීම මහත් පාපයය. මුළු ස්වර්ගයම අරගලයක ස්වභාවයට පත්විය. පාලක දූතයන් යටතේ දේවදූත කණ්ඩායම් ඔබ මොබ ගමන් කෙරිණ. සියලුම දූතයෝ නොසන්සුන් වූහ. දෙවියන්වහන්සේගේ පාලනයට විරුද්ධවද යේසුස්වහන්සේගේ බලයට පටහැනිවද තමාම උසස් කරගැනීම සඳහා සාතන් දේව දූතයන් නොමඟ යැවීමක නිරත විය. සමහර දූතයෝ සාතන්ට පක්ෂපාතව ඔහුට අනුකම්පාව දක්වූහ. අනික් දේව දූතයෝ යේසුස්වහන්සේට බල අධිකාරිය පැවරීමේ දිව්‍ය ප්‍රඥව ගැන සතුටුව සාතන්ට විරෝධය පෑහ. දිව්‍ය පාලනය ප්‍රතිසංස්කරණය කරන්ට සිතූ සාතන් සහ ඔහුගේ දූතයෝ යේසුස්වහන්සේට සීමා රහිත බලයක් පැවරීමේ දේව අභිප්‍රාය එනම් සොයා දැනගත නොහැකි දිව්‍ය ප්‍රඥව කුමක්දැයි සොයා දැනගන්ට උත්සාහ කළහ. දේව පුත්‍රයාණන්ගේ ආධිපත්‍යයට විරුද්ධව ඔවුහු කැරලි ගැසූහ. ඔවුන් ගැන තීරණයක් ගන්නා පිණිස සියලුම දූතයන් පියාණන්වහන්සේ ඉදිරියට කැඳවනු ලැබූහ. සාතන්වද ඔහුගේ පාක්ෂිකයන් සියලු දෙනාවද ස්වර්ගයෙන් පහ කිරීමට තීරණය කරන ලදී. එවිට ස්වර්ගයෙහි සටනක් ඇති විය. දේව පුත්‍රයාණන්ව පරාජය කරන්ට සාතන් සහ ඔහුගේ දූතයන් යත්න දැරූහ. විශ්වාසවන්ත දේව දූතයෝ සටන් කළ අතර ජයගෙන සාතන්ව සහ ඔහුගේ දූතයන්ව ස්වර්ගයෙන් නෙරපා හරින්නට වූහ.

ඉන්පසු සාතන්ට හැඟී ගියේ තම පවිත්‍රතාවයද මහිමයද සදහටම නැතිව ගිය බවය. පසුතැවිලි වී ස්වර්ගයෙහි තමාට තිබූ තත්ත්වය හෝ ඊට වඩා අඩු තත්ත්වයකට හෝ පත්ව ආපසු ස්වර්ගයට ඇතුළු වීම සාතන්ගේ පැතුම විය. ස්වර්ගය අනතුරුදායක තත්ත්වයකට පත් කළ යුතු නැත. ඔහුව ස්වර්ගයට ගතහොත් මුළු ස්වර්ගයටම එය අහිතකර විය හැක. පාපය ආරම්භ වූයේ ඔහු තුළය. කැරලි ගැසීමේ බීජ ඔහු තුළ තිබිණ. සාතන් සහ ඔහුගේ අනුගාමිකයෝ පසුතැවිලිව වැලපෙමින් තමන්ව දෙවියන්වහන්සේගේ අනුකම්පාවට භාජනය කරන ලෙස අයැද සිටියහ. නුමුත් ඔවුන්ගේ පාපය, වෛරය, ඊර්ෂ්‍යාව අති මහත් බැවින් එය මකා දමන්නට දෙවියන්වහන්සේට නොහැකි විය. අවසාන දඬුවම ලබන තෙක් එය ඔවුන් සමග විය යුතුය.

දෙවියන්වහන්සේගේ අනුකම්පාවට භාජන නොවන බව සම්පූර්ණ ලෙස දැනගත් පසු සාතන්ගේ වෛරය සහ ක්‍රෝධය එළිදකින්ට විය. ඔහු තම දූතයන් රැස්කර සාකච්ඡාවක් පවත්වා උන්වහන්සේගේ ආණ්ඩු ක්‍රමයට විරුද්ධව තවදුරටත් සටන් කිරීමට සැලසුම් කරගත්තේය. ආදම් ඒව දෙදෙනාම ඒදන් උයනෙහි පදිංචි කරවූ අතර ඔවුන් දෙදෙනා විනාශ කිරීමට සැලසුම් කළහ. මෙම යුවල දෙවියන්වහන්සේට කීකරුව සිටින තාක් කල් ඔවුන්ගේ ප්‍රීතිය නැති කළ නොහැක. පළමුව අකීකරු වෙන්ට සැලැස්වූයේ නැතිනම් තම බලය ඔවුන් කෙරෙහි ක්‍රියාත්මක කළ නොහැකි බව සාතන් දනී. ඒනිසා සාතන් වෙනත් ස්වරූපයක් දරාගෙන මනුෂ්‍යයා කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වන බව පෙන්විය යුතුය. දේව වචනයේ සත්‍යවාදී භාවය ගැන සැකයක් ඇති කළ යුතුය. දෙවියන්වහන්සේගේ සොයාගත නොහැකි දේ දැනගැනීමේ කුතුහලයක් ඔවුන් තුළ ඇති කළ යුතුය. සාතන්ද වරදකාරයෙක් වූයේ මේවා සොයන්ට යාම නිසාය. හොඳ නරක දැනගැනීමේ ගහෙන් කන්ට එපා කීවේ මක්නිසාදැයි දැනගත යුතුය.

*කියවා බලන්න: යෙසායා 14: 12-20; එසකියෙල් 28: 1-19; එළිදරව් 12: 6, 7*

## *2 - පරිච්ඡේදය*

# මනුෂ්‍යයා පාපයට වැටීම

ස්වර්ගීය දූතයෝ නිතර ඒදන් උයනට පැමිණ ආදම් ඒව දෙදෙනාට ඔවුන් කළ යුතු වැඩ ගැනද, සාතන්ගේ කැරලි ගැසීම සහ වැටීම ගැනද දැනම්තිකම් දුන් බව මම දිටිමි. දේව දූතයෝ සාතන් ගැන ඔවුන්ට අනතුරු අඟවමින් යම් අවස්ථාවක ඔහුව මුණ ගැසෙනවා ඇත කියාද පාපයට වැටුණ එම සතුරාට අසු නොවන පිණිස එකිනෙකාගෙන් ඈත්ව නොසිටින ලෙසද ඔවුන්ට අවවාද කළහ. සම්පූර්ණ කීකරුකම තුළ පමණක් ආරක්ෂාව තිබෙන බැවින් දෙවියන්වහන්සේ කියා දුන් සියල්ල ඒ ආකාරයෙන්ම ඉටුකරන මෙන් ඔවුන්ව දැනුවත් කළහ. කීකරු වුවහොත් සතුරාට ඔවුන් කෙරෙහි බලයක් නැති බවද පැවසූහ.

සාතන් මුලින් කළේ ඒව මුළා කරගැනීමය. ඇය තම පුරුෂයාගෙන් ඈතට ගියාය, ඊළඟට තහනම් ගස ළඟ බලාපොරොත්තු වූවාය. සර්පයාගේ හඬට සවන් දුන්නාය. මෙයින් කෑ දවසෙහි නුඹලා ඇත්තටම නසිනවා ඇතැයි කිවූ දේව වචනය සැක කරන්ට වූවාය. ඇය අත දිගු කොට එයින් ගෙන කෑවාය. එය ඇසට ප්‍රියව කටට රසව තිබිණ. තමන්ගේ යහපත සඳහා වූ දෙයක් වළක්වා තිබීම ගැන දෙවියන්වහන්සේ සමග අමනාප වූවාය. ඇය තම පුරුෂයාට ගෙනැවිත් දෙමින් ඔහුව රැවටුවාය. සර්පයා කිවූ සියල්ල ඔහුට පවසමින් ෂර්පයාට කථා කිරීමට හැකිව තිබූ බලය ගැන ඇය පුදුමය පළ කළාය.

ආදම්ගේ මුහුණෙහි දුකක් සහ තැති ගැන්මක්ද, භයක්ද මතුව පෙනෙනවා මම දිටිමි. ඔහුගේ සිතෙහි අරගලයක් හටගෙන තිබුණා වැනිය. ඔහුට හැඟී ගියේ ඇයට සතුරා මුණ ගැසී ඇති බව හා දැන් ඉතින් ඈ මැරෙන්ට ඕනෑ බවය. ඒවට ආදම් මහත් සේ ආදරය කළේය. මහත් සිත් තැවුලකට පත් ඔහු ඇය සමගම මැරෙන්ට සිතා ගෙඩියෙන් කෑවේය. සාතන් මහත් ප්‍රීතියට පත්විය. ඔහු ස්වර්ගයේදී කැරලි ගසා කණ්ඩායමක් ඔහු අනුව යන්නට එක්කරගෙන තිබිණ. දැන් ඔහු ඒව රවටාගෙන ඈ ලවා ඇයගේ පුරුෂයාවද පාපයට වට්ටාගෙන තම පක්ෂයට එක් කර ගත්තේය.

මනුෂ්‍යයාගේ වැටී යාම ගැන ප්‍රවෘත්තිය මුළු ස්වර්ගය පුරාම පැතිර ගියේය. ස්වර්ගයෙහි වූ ගීත නාද නතර විය. දේව දූතයෝ තම ඔටුනු ගළවා දුක ප්‍රකාශ කළහ. මුළු ස්වර්ගයම නොසන්සුන් තත්ත්වයක මුහුණුවරක් ගැනිණ. වරද කළ යුවල ගැන තීරණයක් ගැනීමට සම්මන්ත්‍රණයක් පැවැත්විණ. ජීවන වෘක්ෂයේ ගෙඩි ගෙන කා එම යුවල නොනසින පව්කාරයන් බවට පත්වේදෝ කියා දේව දූතයෝ බියට පත්වූහ. නමුත් වරද කළ යුවල ඒදන් උයනෙන් පිටමං කරන බව දෙවියන්වහන්සේ පැවසූ සේක. ජීවන වෘක්ෂය රැකවල් කරන පිණිස එවෙලේම දේව දූතයන් යවන ලදී. සාතන්ගේ සැලැස්ම වූයේ ආදම් ඒව දෙදෙනා පව්කරන්ට සලස්වා ජීවන වෘක්ෂයෙන්ද ගෙඩි ගෙන කා සදාකාල පව්කාරයන් බවට පත්කර පාපය අමරණභාවයට පත්කිරීමය. ආදම් ඒව යුවල උයනෙන් පිට කිරීමටද ජීවන ගස රැකවල් කිරීමටද දේව දූතයන් යවන්නට යෙදින. මෙම දේව දූතයන්ගේ අත්වල දිලිසෙන කඩු වැනි යමක් පෙනෙන්ට තිබිණ. අකීකරුකම නිසා ස්වර්ගයෙන් පිටමං කරනු ලැබූ සාතන් ආදම් ඒව යුවල ඒදන් උයනෙන් පිටමං කිරීම ගැන අතිශයින් සතුටට පත්විය.

***උත්පත්ති 3 වන පරිච්ඡේදය කියවන්න.***

## *3 - පරිච්ඡේදය*

# ගැළවීමේ සැලැස්ම

මනුෂ්‍යයා පව් කළ බවද, දෙවියන්වහන්සේ මැවූ ලෝකය දුකට රෝගවලට හා මරණයට භාජනවූ මනුෂ්‍යයන්ගෙන් පිරී තිබෙන්ට යන බවද දැනගත් විට ස්වර්ගය කණගාටුවෙන් පිරීයන්ට විය. ආදම්ගේ මුළු පරම්පරාවම නසින්ට ඕනෑය. අනුකම්පාව සහ කණගාටුවෙන්ද යුත් පෙනුමක් මුහුණෙහි ඇතිව සිටි යේසුස්වහන්සේව මම දුටිමි. පියාණන්වහන්සේව වසාගෙන තිබූ මහත් ආලෝකය වෙතට යේසුස්වහන්සේ සමීප වන බව දුටුවෙමි. මගපෙන්වූ දේව දූතයා මට මෙසේ පැවසීය. යේසුස්වහන්සේ තම පියාණන් සමග කථා කරමින් සිටින සේක. දේව දූතයෝ මහත් නොඉවසිල්ලෙන් බලා සිටියහ. තුන් වරක් දිව්‍ය ආලෝකය උන්වහන්සේව වසාගන්ට විය. පසුව පියාණන් වහන්සේ වෙතින් පිටතට ආ විට උන්වහන්සේගේ මුහුණෙහි දිස්වූයේ වචනවලින් පැවසිය නොහැකි නිසල අරගලයකින් තොර පරිත්‍යාගශීලී අලංකාර පෙනුමකි. මරණයට භාජනවූ මනුෂ්‍යයාට මිදීමේ මාර්ගයක් විවෘතව තිබෙන බව ක්‍රිස්තුස්වහන්සේ දේව දූතයන්ට එළිදරව් කළසේක. මනුෂ්‍යයාට නියමව තිබෙන මරණය වෙනුවට

මිදීමේ මිලයක් කොට තමාගේ ජීවිතය පූජා කරන්ටත් පාපවලට කමාව ලබා දෙන්ටත් පියාණන් වහන්සේගෙන් අවසර ලබාගත් බව උන්වහන්සේ දේව දූතයන්ට පැවසූ සේක. දන් ඉතින් තමන්ගේ ජීවිත පූජාව නිසා ව්‍යවස්ථාවට කීකරු වීමත්, දෙවියන්වහන්සේ ඉදිරියේ කරුණාවත්, අලංකාර උයනේ තිබෙන ජීවන වෘක්ෂයේ ගෙඩි කන්ටත් මනුෂ්‍යයන්ට ඉඩ ප්‍රස්ථා තිබෙන බව උන්වහන්සේ පැවසූ සේක.

යේසුස්වහන්සේ සියල්ල මෙසේ විස්තර කළසේක. 'මම පියාණන්වහන්සේගේ උදහසත් වරදකාර මනුෂ්‍යයාත් අතර සිටීමට යමි. නින්දා අපහාස විඳීමට යමි. සියලූ දෙනාම පාහේ මට වෛර කිරීමටත් මාව එපා කිරීමටත් පෙළඹෙනවා ඇත. මම මගේ ස්වර්ගීය තේජස හැරදමා යටහත් පහත් මනුෂ්‍යයෙක් වෙමි. පරික්ෂා කරනු ලබන අයට උපකාර කිරීමට ඉගෙන ගන්නා පිණිස සෑම පරික්ෂාවකටම මුහුණ දෙමි. ගුරුවරයෙක් ලෙස මාගේ මෙහෙය හමාර කළ විට මනුෂ්‍යයන්ගේ අත්වලට භාරදෙනු ලැබ සාතන් විසින් පොළඹවනු ලැබූ දුෂ්ට මනුෂ්‍යයන්ගෙන් අති මහත් දුක් වේදනා විඳීමට මට සිදුවෙනවා ඇත. කුරුසියක ඇණ ගසනු ලැබූ පව්කාරයෙකු විලසින් අහස සහ පොළොව අතරේ එල්ලී සිට ඉතාම කුරිරු මරණයකට භාජනය වීමට සිදුවන්නේය. පැය කීපයක් මාරාන්තික වේදනා විඳීමට සිදුවන අතර දේව දූතයෝ එදෙස බැලීමට නොහැකිව අත්වලින් මුහුණු වසා ගන්නවා ඇත. ශාරීරික වේදනාවන්ට වඩා දරාගත නොහැකි මානසික පීඩා විඳීමට සිදුවන්නේය. ඉන්පසු මම මරණයට පත්ව තැන්පත් කරනු ලැබ තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිට ස්වර්ගයට, මාගේ පියාණන් වහන්සේ වෙතට පැමිණ පව්කාර මනුෂ්‍යයන් වෙනුවෙන් මැදහත්කාර මෙහෙයක යෙදෙමි." මේ සියල්ල මෙසේ අසා සිටි දේව දූතයන්ට සතුටු වන්ට නොහැකි විය. නමුත් ඔවුහු උන්වහන්සේ ඉදිරියෙහි වැඳ වැටී තමුන්ගේ ජීවිත පුදන්ට අවසර ඉල්ලා සිටියහ. නමුත් උන්වහන්සේ කථා කොට ගෙවන්ට තිබෙන මිලය සඳහා දේව දූතයෙකුගේ ජීවිතය ප්‍රමාණවත් නැත. මගේ මරණය තුළින් බොහෝ දෙනෙකු ගැළවීම ලබන්ට යන අතර මිදීමේ මිලයක් වශයෙන් පියාණන්වහන්සේ පිළිගන්නේ මගේ ජීවිත පූජාව පමණක් යයි කීසේක.

දේව දූතයන්ටද ගැළවීමේ සැලැස්මෙහි කොටසක් ඉටුකරන්ට තිබෙන බව යේසුස්වහන්සේ පැවසූ සේක. සමහර අවස්ථාවල උන්වහන්සේව ශක්තිමත් කිරීමට අවශ්‍යය. මක්නිසාද මනුෂ්‍ය ස්වභාවයට පැමිණි විට උන්වහන්සේගේ ශක්තිය දේව දූතයන්ගේ ශක්තියට වඩා අඩු මට්ටමක වන නිසා, උන්වහන්සේගේ පහත්වීමද, විඳින්ට තිබෙන දුක් පීඩාද දකින විට මනුෂ්‍යයන් වෛර කරන විට පෙළඹවීම් ඇතිවී මුදාගැනීමේ අරමුණින් ක්‍රියා නොකළ යුතුය. ඔවුන් මෙසේ දකින්ට යන සිදුවීම්වලදී මැදිහත් වීමෙන් වැළකී සිටිය යුතුය. මළවුන්ගෙන් නැගිටීමේදී ද සේවයක් කිරීමට තිබෙන අන්දමට සැලැස්ම සකස් කර ඇත යනුවෙන් දේව දූතයෝ දැනුවත් කළසේක. පියාණන්වහන්සේ සැලැස්ම පිළිගත් බවද පැවසූ සේක.

යේසුස්වහන්සේ තවදුරටත් දේව දූතයන්ට අනුශාසනා කර ඔවුන්ව සනසා තමන්වහන්සේගේ මරණය කරණකොටගෙන බොහෝ දෙනෙකු මුදාගන්නා බවද, මිදීම ලත් අය උන්වහන්සේ සමග සදාකාලයටම ජීවත්වන බවද, මරණය කෙරෙහි බලය ඇත්තා වන සාතන්ව විනාශ කරනු ලබන බවද, පියාණන්වහන්සේ රාජ්‍යය තමන්ට භාරදෙන බවද, ඉන්පසු ස්වර්ගයට හෝ අළුත් ලෝකයට හෝ කිසිම ප්‍රශ්නයක් ඇති නොවන බවද, එබැවින් පියාණන්වහන්සේ පිළිගත් ගැළවීමේ සැලැස්මට සහභාගිත්වය දක්වන ලෙස ඉල්ලූ සේක.

එවිට පැවසිය නොහැකි ප්‍රීතියකින් මුළු ස්වර්ගයම පිරීයන්ට විය. දේව දූත සේනාවන් ප්‍රශංසාවේ සහ නමස්කාරයේ ගීත ගැයූහ. දෙවියන්වහන්සේගේ අති මහත් අනුකම්පාව සහ කැරලිකාර සෙනඟක් මුදාගැනීම පිණිස පහත් වෙන්ට තම ප්‍රේමණීය පුත්‍රයාණන් දෙන්ට කැමතිවීම සහ පුත්‍රයා තම ජීවිතය පූජා කරන්ට කැමති වීම නිසාද ප්‍රශංසාව ස්වර්ගය පුරා ඇසෙන්ට විය.

දේව දූතයා මෙසේ ප්‍රශ්න කළේය. 'පියාණන්වහන්සේ සිතෙහි අරගලයකින් තොරව පුත්‍රයාණන් වහන්සේව දුන්නා යයි නුඹලා සිතනවාද? නැත. නැත. වරදකාර මනුෂ්‍යයාව විනාශ වෙන්ට හරිනවාද නැතහොත් තමන් ප්‍රේමණීය පුත්‍රයාණන්ව දෙනවාද යන තීරණයේදී ස්වර්ගීය දෙවියන්වහන්සේටද මහත් අරගලයක් වීය." මට මගපෙන්වූ දේව දූතයාද මෙසේද පැවසීය. 'මනුෂ්‍යයා උදෙසා පූජාවෙන්ට දේව දූතයන් බොහොමයක් කැමතිව සිටි නමුත් එයින් ප්‍රයෝජනයක් වන්නේ නැත. අකීකරුකමේ පාපය අති විශාලය. දේව දූතයෙකුගේ ජීවිතය දීමෙන් එම ණය ගෙවිය නොහැක. එම ණය ගෙවා බලාපොරොත්තු සුන් බවෙන් හා දුක්ඛිත බවෙන් මරණයට භාජනව සිටින මනුෂ්‍යයා මුදාගත හැකිවන්නේ දේව පුත්‍රයාණන්ගේ මරණය හා මැදහත්කාර මෙහෙය තුළින් පමණක්ය."

දේව පුත්‍රයාණන් වහන්සේව සනසන්ට හා ශක්තිමත් කරන්ට දේවදූතයන්ට සේවාවන් නියම කර තිබිණ. එපමණක් නොව දේව අනුග්‍රහයට භාජනයව සිටින අය වෙත සාතන් අතුරන අඳුර ඉවත්

කර ඔවුන්ව රැක බලාගැනීමද දේව දූතයන් විසින් කළ යුතුව ඇත. දෙවියන්වහන්සේට උන්වහන්සේගේ ව්‍යවස්ථාව අවලංගු කර හෝ වෙනස් කර පාපයේ නැසී යන්ට වන මනුෂ්‍යයන් ගලවන්ට නොහැකි බව මම දුටිමි. ඒ නිසා මනුෂ්‍යයන්ගේ පාප උදෙසා දිවි පුදන්ට දෙවියන්වහන්සේ තම පුත්‍රයාණන් වහන්සේට අවසර දුන්සේක.

නැවතත් සාතන් තම දූතයන්ද සමග මහත් සේ උද්දාම වූයේ මනුෂ්‍යයා පාපයට ඇදගැනීමේ හේතුවෙන් දේව පුත්‍රයාණන් වහන්සේව උසස් කර තිබූ තත්ත්වයෙන් පහතටම ඇදගන්ට තමාට හැකිවීම ගැනය. ඔහු තම දූතයන්ට මෙසේ කීවේ යේසුස්වහන්සේ පාපයට වැටී සිටින මනුෂ්‍යයාගේ ස්වභාවයට පත්වූ විට උන්වහන්සේව තමාගේ බලයට යටත් කරගෙන ගැළවීමේ සැලැස්මට බාධා පමුණුවන බවය.

සාතන් පෙර සිටි ආකාරය මට පෙන්වනු ලැබීය. ඔහු උසස් කරනු ලැබ ප්‍රීතියෙන් සිටි දේව දූතයෙක් වූවෙහිය. පසුව සිටින ආකාරයද මට පෙන්වීය. ඔහු තවම දරා සිටින්නේ රාජකීය ස්වරූපයකි. ඔහුගේ රූපාංග ගෞරවණීය පෙනුමකින් යුතුය. ඔහු වැටී ගිය දේව දූතයෙකි. නමුත් ඔහුගේ මුහුණෙන් පිළිබිඹු වන්නේ අසන්තෝෂය, වෛරය, අදම්ටුකම, වංචාව හා සෑම ආකාරයකම දුෂ්ටකමය. වරක් තේජාන්විත පෙනුමකින් යුතුව තිබූ නළල් තලය දෙස මම විශේෂයෙන් බැලූවෙමි. නළල් තලය ඇස් ළඟින් ආරම්භව පිටුපසට අඩුවෙමින් තිබෙනවා දුටිමි. බොහෝ කාලයක් ඔහු තමාව දූෂණය කරගනිමින් සිටි නිසා ඔහුගේ හැම හොඳ ගුණාංගයක්ම පහත් තත්ත්වයකට වැටී සෑම දුෂ්ට ගුණාංගයක්ම වර්ධනය වී තිබෙන සැටි මම දුටිමි. විනිවිද දකින ඔහුගේ ඇස් දුෂ්ටව තිබෙනවාද, ඔහුගේ සිරුර මහත්ව තිබූ අතර මුහුණේද අත්වලද මාංශ පේශීන් රැලි ගැසී බුරුල්ව එල්ලෙමින් තිබෙනවාද දුටිමි. ඔහු වාඩිව සිටි ඉරියව්වෙහි ඔහුගේ නිකට වම් අතෙහි රැඳී තිබිණ. ඔහු ගැඹුරු කල්පනාවක යෙදී සිටින බව පෙනෙන්ට විය. ඔහුගේ මුවෙහි වූ සිනාව දුටු මා තැති ගැන්මකට පත්වීමි. ඒ සිනහව තුළ සාතනික දුෂ්ටකම් සැඟවී තිබිණ. මෙම සිනහව ඔහු ගොදුරක් අල්ලා ගැනීමට සූදානම්ව සිටින විට ඇතිවන හැඟීම් පෙන්වන සිනහවය.

*යෙසායා 53 කියවන්න.*

## *4 - පරිච්ඡේදය*

# ක්‍රිස්තුස්වහන්සේගේ පළමුවන පැමිණීම

දේව පුත්‍රයාණන් වහන්සේ යටහත් පහත්වී, මනුෂ්‍ය ස්වභාවයට පැමිණ සාතන්ගේ පරීක්ෂාවන්ට මුහුණ දෙන්ට තිබූ කාලය වෙතට මා ගෙනයනු ලැබීය. උන්වහන්සේගේ උපත ලෝක උත්සවාකාරයකින් නොවීය. උන්වහන්සේ ගවහලක ඉපිද, ගව ඔරුවක තබන ලද නමුත් උන්වහන්සේගේ උපත මනුෂ්‍ය පුත්‍රයන්ගේ උපත්වලට වඩා ඉතා ගෞරවාන්විත ආකාරයෙන් සිදුවිය. යේසුස්වහන්සේගේ උපත දේව දූතයන් විසින් එඬේරුන්ට දන්වූ අතර ආලෝකයෙන්ද දේව මහිමය ප්‍රකාශ වීමෙන්ද සිදුවිය. ස්වර්ගීය දූතයෝ වීණා වාදනය කරමින් දෙවියන්වහන්සේට ප්‍රශංසා කළහ. පාපයට වැටී සිටින ලෝක වාසීන්ට සාමයත්, සතුටත්, සදාකාල ජීවනයත් ලබාදෙන පිණිස දේව පුත්‍රයාණන් වහන්සේගේ පළමුවන ඊම දේවදූතයෝ ජයග්‍රාහී ආකාරයෙන් ප්‍රකාශයට පත් කළහ.

යේසුස්වහන්සේ බව්තීස්මය ලැබූ ස්ථානයේ අහස් කුසෙහි දේව දූතයෝ සැරි සැරූහ. ශුද්ධාත්මයාණන් වහන්සේ පරෙවියෙකුගේ හැඩයෙන් උන්වහන්සේ වෙත බැස වදාළ සේක. සෙනඟ විශ්මයට පත්ව උන්වහන්සේ දෙස නෙත් යොමා සිටි අතර 'මේ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාණෝය. මොහු කෙරෙහි මම ඉතා ප්‍රසන්නව සිටිමි"යි යන පියාණන් වහන්සේගේ හඬ ස්වර්ගයෙන් පැමිණි සේක. යොහන් බව්තීස්ත යේසුස්වහන්සේව කලින් හඳුනාගෙන සිටියේ නැත. දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණන්වූ උන්වහන්සේව හඳුනා ගැනීම සඳහා පොරොන්දු දී තිබුණ ලකුණ වූයේ පරෙවියෙකුගේ හැඩයෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ යේසුස්වහන්සේ කරා පැමිණ නතර වීමය. යොහන් තුමාද තම හස්තය යේසුස්වහන්සේ දෙසට දිගු කොට 'බලව, ලෝකයේ පාපය දුරු කරන දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණෝ" යයි පවසමින් හඬ නැගීය.

යොහන් බව්තීස්ත තමාගේ සේවය හමාර කරමින් සිටියදී ඔහු තම ගෝලයන්ට කථා කරමින් යේසුස්වහන්සේ දිව්‍ය පොරොන්දුවලට අනුව වූ මෙසියස්වහන්සේ බවද මෙසේ ලෝකයේ

ගැළවුම්කාරයාණන් බවද පෙන්වා දී උන්වහන්සේ දෙස බලන ලෙසද අනුව යන ලෙසද තම ගෝලයන්ට පැවසීය. යොහන් තුමාගේ ජීවිතය දුකෙන් වටව තිබූ තමකම ත්‍යාග කළාවූ ජීවිතයකි. ඔහු යේසුස්වහන්සේව හඳුන්වා දෙන පෙරමග දූතයා වූ නමුත් යේසුස්වහන්සේ කළ ප්‍රාතිහාර්යයන් හෝ එතුමාගේ පුදුම බලය හෝ දකගන්ට අවසර නොදෙන ලදී. යේසුස්වහන්සේ ගුරුවරයෙක් ලෙස ස්ථාපිත වූ විට තමා නසින්ට ඕනෑ බව ඔහු දනගෙන තිබිණ. ඔහු තමාට අයත් සේවය ඉටුකරන පිණිස සමාජයේ ඇසුරද තම පියාගේ නිවසේ සතුටද හැරදමා තනිව ජීවත් වීමට පිටත්ව ගියේය. ඔහුගේ හඬ කලාතුරකින් හෝ ඇසුණේ වනාන්තර ප්‍රදේශයෙහිදීය. මෙම විශේෂ පුදුම අනාගතවක්තෘවරයාට සවන් දෙන පිණිස සමූහයෝ නගරවලින් හා ගම් නියම් ගම්වලින්ද වනාන්තර ප්‍රදේශයට රොක් වූහ. ඔහු ගස මුලට පොරව තැබීය. ප්‍රතිචාරය කුමක් වුවත් ඒ ගැන නොසිතා නිර්භයව පාපයද විපාකයද පෙන්වා දෙමින් දිව්‍ය බැටළු පැටවාණන්ගේ මාර්ගය සූදානම් කළේය.

හෙරොද් රජද, යොහන් තුමාගේ දේශනා ඇසීමෙන් සිතේ හැඟීම් ඇතිවී ඔහුගේ ගෝලයෙක් වීමට තමා කුමක් කළ යුතු දැයි ඇසුවේය. හෙරොද් තම සහෝදරයා ජීවත්ව සිටියදීම සහෝදරයාගේ භාර්යාව විවාහ කරගැනීමට සූදානම් වන බව යොහන් තුමාට දනගන්ට ලැබී තිබිණ. එය නීති විරෝධී බව යොහන් තුමා හෙරොද්ට පැවසීය. හෙරොද් කැප කිරීමක් කරන්ට නොකැමති විය. හෙරොද් ඇයව විවාහ කරගෙන ඇයගේ බලපෑම මත යොහන්ව සිරගෙට යැවීය. හෙරොද්ගේ අදහස වූයේ පසුව යොහන්ව නිදහස් කිරීමය. යේසුස්වහන්සේගේ බලගතු පුදුම ක්‍රියා ගැන තම ගෝලයන් මගින් යොහන්ට අසන්ට ලැබිණ. උන්වහන්සේගේ අනුග්‍රහයේ වචන ඔහුට අසන්ට නොලැබුණු නමුත් ගෝලයන්ගේ මාර්ගයෙන් දනගන්ටද සැනසෙන්ටද හැකි විය. පසුව හෙරොද්ගේ භාර්යාවගේ ඉල්ලීම පරිදි යොහන්ගේ ගෙල සිඳ දමනු ලැබීය. යේසුස්වහන්සේ අනුව ගියාවූ, උන්වහන්සේ කළ පුදුම හාස්කම් දුටුවාවූ, සහ උන්වහන්සේගේ සැනසිලි වචන ඇසුවාවූ අය යොහන්ට වඩා උසස්වූ, ගෞරව කරනු ලැබූ, සහ ජීවිතයේ ප්‍රීතිය භුක්ති වින්දාවූ අය ලෙස මම දුටිමි.

යොහන් තුමා එලියාගේ ආත්මයෙන්ද, බලයෙන්ද යුක්තව ක්‍රියා කළේ යේසුස්වහන්සේගේ පළමු පැමිණීම ප්‍රකාශ කිරීම සඳහාය. මාව අවසාන කාලය දෙසට යොමු කළ අතර මා දුටුවේ යේසුස්වහන්සේගේ දෙවන පැමිණීම ප්‍රකාශ කිරීම සඳහා එලියාගේ ආත්මයෙන්ද, බලයෙන්ද ක්‍රියා කරන අයව යොහන් තුමාගෙන් සංකේතවත් කළ බවය.

යොර්දානයෙහිදී බව්තීස්ම ලැබූවායින් පසු යක්ෂයා විසින් පරික්ෂා කරනු ලබන පිණිස ආත්මයාණන් වහන්සේ යේසුස්වහන්සේව වනාන්තර ස්ථානයකට පැමිණෙවූ සේක. දින සතළිහක් පරික්ෂා කරනු ලැබූ අතර උන්වහන්සේ කිසි ආහාරයක් ගත්තේ නැත. යේසුස්වහන්සේ අවට වූ පරිසරය මනුෂ්‍ය ස්වභාවය හැකිලීමට පත්කරන තරම් ඉතා අප්‍රසන්න තත්ත්වයක විය. එහි වූයේ සාතන් සහ වන මෘගයන්ය. දුක් විඳීමෙන් හා ආහාර නොගැනීමෙන් උන්වහන්සේ සුදුමැලිව හා බෙහෙවින් කෘෂ වී සිටි බව මම දුටිමි. නමුත් උන්වහන්සේගේ මාර්ගය ලකුණු කර තිබිණි. උන්වහන්සේ කරන්ට ආ සේවය සම්පූර්ණ කළ යුතුය.

සාතන් අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට සිතා දේව පුත්‍රයාණන්ව නොයෙක් අයුරින් පරික්ෂා කිරීමට සූදානම් විය. මනුෂ්‍යයෙකුගේ තත්ත්වයට පත්වීමට යන නිසා උන්වහන්සේව පරාජය කරන්ට ඔහු බලාපොරොත්තු විය. සාතන් උන්වහන්සේ වෙතට ගලක් ගෙනැවිත් 'ඔබ දේව පුත්‍රයාණන් නම් මේ ගල රොටියක් වෙන්ට අණ කරන්නැ"යි කීය. මනුෂ්‍යයා ජීවත් වන්නේ රොටී පමණකින් නොව දෙවියන්වහන්සේගේ මුඛයෙන් නික්මෙන සෑම වචනයකින්ම බව යේසුස්වහන්සේ මෘදු ලෙස සාතන්ට පැවසූ සේක.

යේසුස්වහන්සේ දේව පුත්‍රයා නොවන බවට තර්ක ඉදිරිපත් කරන්ට සාතන් උත්සාහ කළේය. උන්වහන්සේගේ දුර්වල දුක්ඛිත තත්ත්වය පෙන්වා තමා උන්වහන්සේට වඩා ශක්තිමත් බව කියාපාන්ට විය. නුමුත්, නුඹ මාගේ ප්‍රේමණීය පුත්‍රයාය. මම නුඹ කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි"යි කියා ස්වර්ගයෙන් වූ හඬ දුක් කරදර මැදදී උන්වහන්සේව දිරි ගැන්වීමට ප්‍රමාණවත් විය. උන්වහන්සේගේ සේවය කොතැනකදීවත් තමා දේව පුත්‍රයා බව සහ ලෝකයේ ගැළවුම්කාරයා බවට සාක්ෂි ඉදිරිපත් කිරීමට යේසුස්වහන්සේට අවශ්‍යව තිබුණේ නැත. උන්වහන්සේගේ උසස් තත්ත්වය සහ බල අධිකාරිත්වය ගැන සාතන්ට අවශ්‍ය තරම් සාක්ෂි තිබිණ. යේසුස්වහන්සේට යටත් වන්ට නොකැමති වීම ඔහුව ස්වර්ගයෙන් පිටමං කිරීමට හේතු විය.

සාතන් තමාගේ ශක්තිය පෙන්වන පිණිස යේසුස්වහන්සේව ගෙන ගොස් යෙරුසලම් දේව මාළිගාවේ උසම කොතක් මත තබා තමා දේව පුත්‍රයා නම්, පය ගලක නොවදින ලෙස දේව දූතයින් අත්වල රඳවා ගන්න බවට දිව්‍ය පොරොන්දුව දී තිබෙන බැවින් කොතෙන් පහළට පැන දේව පුත්‍රයා බව ඔප්පු කරන ලෙස ඉල්වීය. යේසුස්වහන්සේ ඊට පිළිතුරු වශයෙන් 'තාගේ දෙවිවූ ස්වාමින්වහන්සේව පරික්ෂා නොකරව'යි කියාත් ලියා තිබේ" යයි පැවසූ සේක. මෙවන් පරික්ෂා

කරණකොටගෙන සාතන් උත්සාහ කළේ ගැලවීමේ සැලැස්ම අසාර්ථක කිරීමටය. මෙවැනි කිසිවකින් අවලක්ෂණ කරන්ට හෝ අසාර්ථක කරන්ට හෝ සාතන්ට නොහැකි වන අයුරින් ගැලවීමේ සැලැස්ම ඉතා ගැඹුරු ලෙස ස්ථාපිත කර තිබෙන බව මම දුටිමි.

පරීක්ෂා කරනු ලබන සෑම කිතුණුවෙකුම තම අයිතිවාසිකම් ගැන තර්ක කරද්දී ක්‍රිස්තුස්වහන්සේව ආදර්ශයට ගත යුතු බව මම දුටිමි. පරීක්ෂාවේදී ඉවසීමෙන් ක්‍රියා කළ යුතුය. සතුරන්ගෙන් තමන්ව ආරක්ෂා කරන පිණිස ප්‍රාතිහාර්යය පාන්ට කියා ඉල්ලා සිටින්ට අපට අයිතියක් නැත. එක එල්ලේම එය දේව ගෞරවය පිණිස සිදුවේ නම් එසේ ඉල්විය හැක. යේසුස්වහන්සේ එතැනින් පහළට පැන්නා නම් එයින් පියාණන්වහන්සේ ගෞරවයට පත් නොවන බව මම දුටිමි. මක්නිසාද එම ක්‍රියාව දකින්ට යන්නේ සාතන් සහ දේව දූතයන් පමණක්ය. එය ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ බලවත්ම සතුරාට තම බලය ප්‍රදර්ශනය කිරීමේ පරීක්ෂාවක් වනවා ඇත. එමෙන්ම යටත් කරගන්ට ආ තැනැත්තාට තමන් යටත් වීමක් බවටද පත්වනවා ඇත.

ඉන්පසු සාතන් යේසුස්වහන්සේව ඉතා උස කඳු මුඳුනකට ගෙන ගොස්, මොහොතකින් ලෝකයේ සියලු රාජ්‍යවල් උන්වහන්සේට පෙන්වා දීමේ සියලු රාජ්‍යවල බලයද මහිමයද මම නුඹට දෙමි. මක්නිසාද ඒවා මට භාර දී ඇත. මම කැමති කෙනෙකුට මම ඒවා දෙන්නෙමි. ඒ නිසා නුඹ මට නමස්කාර කරනවා නම් සියල්ලම නුඹට දෙමි"යි ඔහු කීවේය. එවිට යේසුස්වහන්සේ උත්තර දෙමින් සාතන්, මා පස්සට යව. 'තාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට නමස්කාර කරව, උන්වහන්සේට පමණක් සේවය කරව"යි කියා ලියා තිබේ යයි කීසේක.

ගැලවීමේ සැලැස්ම එලෙසින්ම සම්පූර්ණ වුවොත් තමාගේ බලය සීමාවී අවසානයේදී තමාට මරණයද අත්වන බව සාතන් දනී. එබැවින් ඔහුගේ එල්ලය වූයේ දේව පුත්‍රයා ආරම්භ කළ සැලැස්ම සම්පූර්ණත්වයට පැමිණෙන්ට ඉඩ නොදී බාධා කිරීමය. මනුෂ්‍යයා මුදාගැනීමේ කාර්යය ඇන හිටියහොත් රාජ්‍ය පාලනය තමා සතුව තිබෙන්නේය. තම උත්සාහයන් සඵල වුවහොත් ඔහු කියා සිටියේ තමාගේ රාජ්‍යය දෙවියන්වහන්සේගේ රාජ්‍යයට විරුද්ධව පවත්වාගෙන යන බවය.

යේසුස්වහන්සේ ස්වර්ගයද, බලපරාක්‍රමයද අතහැර ස්වර්ගයෙන් පිටවූ විට සාතන් මහත් උද්දාමයට පත් විය. ඔහු සිතුවේ දේව පුත්‍රයා තමාගේ බලය යටතට පත්වන්ට යන බවය. ආදම්, ඒව දෙදෙනා යටත් කරගැනීමට ඉතාම පහසු වූ නිසා දේව පුත්‍රයාණන්වද තමාගේ සාතනික මුළාවන් සහ බලය කරණකොටගෙන යටත් කරගැනීමට ඔහු බලාපොරොත්තු විය. පියාණන් වහන්සේගේ කැමැත්තෙන් ඉවතට යන්ට පුත්‍රයාණන්ව මුළා කරගැනීම සාතන්ගේ අරමුණ විය. යේසුස්වහන්සේ සාතන්ට පස්සට යන ලෙස අණ කළසේක. නමස්කාර කරන්නේ පියාණන් වහන්සේට පමණක්ය. සාතන් අත්පත් කරගෙන තිබෙන සියල්ල මුදාගන්නා කාලය පැමිණෙන්නේය. ඉන්පසු ස්වර්ගයෙහිද, පොළොවෙහිද වන සියල්ලෝ යේසුස්වහන්සේට යටත් වෙති. ලෝකයේ සියලු රාජ්‍යයන් තමාට අයිති බව සාතන් කීවේය. ඔහු යේසුස්වහන්සේට යෝජනා කළේ එය ලබාගැනීමට දුක්විඳින්ට උවමනා නැති බවය. නමුත් යේසුස්වහන්සේ තමන්ගේ ස්ථාවරයෙහිම සිටිසේක. ලෝකයේ රාජ්‍යවල අයිතිය නිත්‍යානුකූල ලෙස ලබාගැනීමට උන්වහන්සේ දුක්විඳීමේ ජීවිතය තෝරාගත් සේක. සදාකාල උරුමයක් ලෙස ඒ සියල්ල පියාණන් වහන්සේ තමන් අතට බාරදෙන තුරු බලා සිටින සේක. විනාශකර දමන පිණිස සාතන්වද, පියාණන්වහන්සේ යේසුස්වහන්සේට භාරදෙන සේක. ඉන්පසු යේසුස්වහන්සේටවත් මහිමයට පත්ව සිටින ශුද්ධවන්තයන්ටවත් සාතන්ගෙන් කරදර වන්නේ නැත.

***කියවන්න: ද්විතිය කථාව 6: 16;   8: 3 2; රාජාවලිය 17: 35-36; ගීතාවලිය 91: 11-12; ලූක් 2-14 පරිච්ඡේද.***

## *5 - පරිච්ඡේදය*

# ක්‍රිස්තුස්වහන්සේගේ මෙහෙය

සාතන් පරීක්ෂාවන් නිම කොට ටික කලකට යේසුස්වහන්සේ වෙතින් ඉවත්ව ගියේය. දේව දූතයෝ එහිදී උන්වහන්සේට ආහාර සූදානම් කරදී උන්වහන්සේව ශක්තිමත් කළහ. පියාණන්වහන්සේගේ ආශිර්වාද ද යේසුස්වහන්සේ වෙත ගලා ආහ. සාතන් තමාගේ බලවත් පරීක්ෂාවන්ගෙන් පරාජය ලැබූ නමුත් ඉදිරියේදී නොයෙක් අවස්ථාවල උන්වහන්සේ සේවය කරන

අතර තමාගේ ප්‍රයෝගවලට උන්වහන්සේව අල්ලා ගන්ට අදහස් කළේය. යේසුස්වහන්සේව පිළි නොගන්න, උන්වහන්සේට වෛර කරන, මරන්ට සොයන අයව කුපිත කිරීමට සාතන් බලාපොරොත්තු විය. සාතන් තම දූතයන් සමග විශේෂ රැස්වීමක් පැවැත්විය. තමන්ගේ උත්සාහයන් නිෂ්ඵල විම ගැන ඔවුහු බලාපොරොත්තු කඩ වී කෝපයට පත්ව සිටියහ. දන් ඔවුන් තීරණය කළේ වඩාත් ප්‍රයෝගකාරී අන්දමින් මුළු බලය යොදා යේසුස්වහන්සේ ගැළවුම්කාරයාණන් ලෙස පිළි නොගන්නා පිණිස යුදා සෙනඟගේ සිත්වල අවිශ්වාසය ඇතිකර එමගින් යේසුස්වහන්සේව අධෛර්යයට පත් කිරීමටය. යුදාවරුන්ගේ චාරිත්‍ර විධි සහ පුද පූජා ආදිය නිසි අයුරින් පැවැත් වුවත් ප්‍රශ්නයක් නැත. නමුත් ඔවුන් බලාපොරොත්තු වන ගැළවුම්කාරයා ලෝකයේ බලවත් පුද්ගලයෙක් යයි විශ්වාස කරන ලෙස අනාවැකි වරදවා තේරුම් කළහොත්, එවන් කෙනෙක් මතු දවසක පැමිණෙන තුරු බලා සිටින්ට සැලැස්වුව හොත් ජය අත්කර ගත හැකි යැයි ඔවුන් විශ්වාස කළහ.

ක්‍රිස්තුස්වහන්සේ මෙහෙයේ යෙදී සිටි කාලයේදී උන්වහන්සේව සැක කරන්ටත්, වෛර කරන්ටත් නින්දා අපහාස කරන්ටත් සාතන් සහ ඔහුගේ දූතයන් සෙනඟව පොළඹවමින් සිටි බව මම දුටිමි. බොහෝ විට ඔවුන්ගේ පාප පෙන්වා දෙන සත්‍ය වචන කථා කළ විට ඔවුහු අතිශයින් කෝපයට පත්වූහ. උන්වහන්සේගේ ජීවිතය නසා දමීමට සාතන් සෙනඟව පෙළඹවීය. එක් අවස්ථාවක උන්වහන්සේට ගසන්ට ඔවුහු ගල් අතට ගත්හ. එම අවස්ථාවේදී ස්වර්ගීය දූතයෝ උන්වහන්සේව ආරක්ෂා ස්ථානයකට ගෙන ගියහ. නැවත වරක් සිත් කාවදින සත්‍යතාවන් උන්වහන්සේගේ මුඛයෙන් පිටවූ අවස්ථාවේදී උන්වහන්සේව අල්ලා ගෙන කඳු මුදුනෙන් තල්ලු කර දමන පිණිස කන්දට ගමන් කරද්දී උන්වහන්සේට කුමක් කළ යුතු දැයි බහින් බස්වීමක්ද ඇති විය. ඒ අතර දේව දූතයෝ සමූහයාට නොපෙනෙන ලෙස උන්වහන්සේව සහවාගෙන වෙනත් ස්ථානයකට ගෙන ගියහ.

කෙසේ වෙතත් සාතන් බලාපොරොත්තු වූයේ ගැළවීමේ සැලැස්ම අසාර්ථක වේය කියායා. මිනිසුන්ගේ සිත් තදවන ලෙසද යේසුස්වහන්සේව අප්‍රිය කරවන පිණිසද සාතන් ඔහුට හැකි සියල්ලම කළේය. යේසුස්වහන්සේව පිළිගන්ට යන්නේ ඉතාම ස්වල්ප දෙනෙක් නිසා මෙතරම් මහත් පූජාවීමක් ස්වල්ප දෙනෙක් උදෙසා කිරීමේ තේරුමක් නැතැයි අධෛර්යයට පත්වී සැලැස්ම අත්හැර දමාවි යයි සාතන් සිතීය. නමුත් උන්වහන්සේව දේව පුත්‍රයා ලෙසද තමන්ගේ ගැළවුම්කාරයාණන් ලෙසද පිළිගන්ට යන්නේ මනුෂ්‍යයන් දෙදෙනෙක් පමණක් වුවත් උන්වහන්සේ සැලැස්ම අවසානය දක්වා ක්‍රියාත්මක කරනවා මම දුටිමි.

දුක් විඳින්නන් කෙරෙහි වූ සාතන්ගේ බලය බිඳ දමමින් යේසුස්වහන්සේ තමන් සේවය ආරම්භ කළසේක. දුෂ්ට බලපෑම් නිසා රෝගාතුරව සිටිනවුන් උන්වහන්සේ සුවපත් කළසේක. සුව වූ කොරව සිටි අය දුව පනිමින් ප්‍රීතියෙන් දෙවියන්වහන්සේට ප්‍රශංසා කළහ. අන්ධයින්ට පෙනීම දී සාතන්ගේ කෲර යදම්වලින් බැඳ සිටි අයව උන්වහන්සේ නිදහස් කළසේක. දුකට, වේදනාවට, අසහනයට පත්ව සිටි අයවලුන්ට අනුග්‍රහයේ වචන වලින් සහනය ගෙන දුන්සේක. මළවුන්ව නැවත ජීවත් කළසේක. දේව මහිමය ප්‍රකාශ වෙන්ට සැලැස්වූ සේක. අදහාගත් අය උදෙසා බලවත් දේ කළසේක. ශරීරයට සනීපයද සිතට සතුට හා ප්‍රීතියද ගෙන දුන්සේක.

යේසුස්වහන්සේගේ ජීවිතය පරිත්‍යාගශීලී භාවයෙන්ද, දයානුකම්පාවෙන් සහ ප්‍රේමයෙන්ද පිරී ඉතිරී තිබිණ. තමා වෙතට පැමිණි හැම කෙනෙකුටම සවන් දී ඔවුන්ගේ දුක්වලින් ඔවුන් මිදූ සේක. සමූහයෝ උන්වහන්සේගේ දිව්‍ය බලයේ සාක්ෂි තමන්ගේ අත්දැකීම් සමග ගෙන ගියහ. නමුත් බොහෝ දෙනෙක් තමන්ගේ අවශ්‍යතාවන් සම්පූර්ණ වූ පසු එම බලවත් ගුරුවරයාණන්ගේ යටහත් පහත් තත්ත්වය ගැන ලැජ්ජා වූහ. පාලකයන් උන්වහන්සේව අදහා නොගත් නිසා උන්වහන්සේ සමග දුක් විඳින්ට ඔවුහු නොකැමති වූහ. උන්වහන්සේ දුක දන්නාවූ වේදනා ඇත්තාවූ කෙනෙක්ව සිටිසේක. එම ගුණාංග මගින් පාලනය කරනු ලබන්ට වැඩි දෙනා කැමති වූයේ නැත. ඔවුන්ගේ පැතුම වූයේ ලෝකයාගෙන් ලබන ගෞරවය සහ ලෝකයේ දේවල්ය. උන්වහන්සේ අනුව ආ අය උන්වහන්සේගේ මුවින් නික්මුණු අනුග්‍රහයේ වචන සහ දහම්තිකම්වල රස බලා දැනගත්හ. උන්වහන්සේගේ වචන අදහස් වලින් පූර්ණව තිබූ අතර ඉතාම දුර්වලයාට පවා පහසුවෙන් තේරුම්ගත හැකිවිය.

සාතන් සහ ඔහුගේ දූතයෝ යුදාවරුන්ගේ තේරුම් ගැනීම මොට කරමින් ඔවුන්ගේ සිත් අන්ධ කළහ. යේසුස්වහන්සේගේ ජීවිතය නැති කිරීමට සාතන් සෙනඟගේ ප්‍රධානීන්වද, පාලකයන්වද උසි ගැන්වූහ. උන්වහන්සේව අල්ලා ගෙන එන්ට නිලධාරින්ව යැවූහ. උන්වහන්සේ වෙතට ළංවූ ඔවුහු මහත් විශ්මයට පත්වූහ. මිනිසුන්ගේ පීඩිත භාවය දුටු උන්වහන්සේ දයානුකම්පාවෙන් පෙළඹී සිටිනවා ඔවුන්ට පෙනුණේය. රෝගීව දුර්වලව සිටි අයට දිරි දෙමින් කථා කළ වචන ඔවුන්ට ඇසිණ. සාතන්ගේ සිරකාරයන් බවට පත්ව සිටි අයව නිදහස් කරන පිණිස ඔහුව පළවා හරිමින් කථා කළ බලධාරිත්වයේ වචන ඔවුන්ට ඇසිණ. උන්වහන්සේගේ දෙතොලින් පිටවූ ප්‍රඥාවේ වචනවලින් ඔවුහු වසඟයට පත්වූහ. උන්වහන්සේව අල්ලන්ට ඔවුහු නොකැමති වූහ. පූජකයන් හා වැඩිමහල්ලන් වෙතට ඔවුන් ආපසු ගිය විට, නුඹලා ඔහුව නොගෙනාවේ මන්දැයි ඔවුහු ඇසූහ. ප්‍රශ්නයට පිළිතුරු දෙමින්

තමන් ඇසූ දුටු සියල්ල පවසා ඔවුන්ගේ සාක්ෂි දීම අවසාන කළේ 'මෙතෙක් කල් කිසිවෙක් මේ වාගේ කථා කළේ නැත" යනුවෙන් පවසමිනි. එවිට පූජකයෝ නුඹලාත් මුළා වෙලා යයි නිලධාරින්ට දොස් තැබූහ. සමහරෙක් යේසුස්වහන්සේව නොගෙන ඒම ගැන ලැජ්ජා වූහ. පූජකයෝ ඔවුන්ට සරදම් කරමින් ප්‍රධානින්ගෙන් කිසිවෙක් ඔහු කෙරෙහි අදහාගෙන නැතැයි කීහ. නමුත් විනිශ්චයකාරයන්ගෙන්ද, වැඩිමහල්ලන්ගෙන්ද බොහෝ දෙනෙක් උන්වහන්සේ කෙරෙහි අදහාගත් බවද ප්‍රසිද්ධියේ එය පැවසීමෙන් සාතන් ඔවුන්ව වැළැක්වූ බවද මම දුටිමි. ඔවුහු දෙවියන්වහන්සේට භය වෙනවාට වඩා මනුෂ්‍යයන්ගෙන් පැමිණිය හැකි අපහාසයට භය වූහ.

මේ දක්වා සාතන්ට ඔහුගේ ප්‍රයෝග වලින්වත්, වෛරයෙන්වත් ගැළවීමේ සැලැස්ම බිඳ දමන්ට නොහැකි විය. ඉටු කරන පිණිස යේසුස්වහන්සේ මෙලොවට පැමිණ සේවා කාලයේ ඉලක්කය ළඟා වෙමින් තිබිණ. සාතන් සහ ඔහුගේ දූතයින් සාකච්ඡා කර තීරණය කළේ උන්වහන්සේගේම ජාතිය පොළඹවා උන්වහන්සේගේ ලේ සිඳ හෙලන ලෙස ඉල්ලා කෑගස්සවන්ටත් නින්දා අපහාස කරන්නට සහ තද කෲර වේදනා උන්වහන්සේ මත ගොනු කරන්ටත්ය. මෙවන් දේ ගැන තරහෙන් උන්වහන්සේ දොස් කියාවි යයිද නිහතමානී බවද මෘදුකමද තවදුරටත් පවත්වා නොගනීවි යයිද ඔහු සිතීය.

සාතන් මෙවන් දේ සිතමින් සිටි අතර යේසුස්වහන්සේ තමන් විඳින්ට යන දුක් පීඩා වේදනා නින්දා අපහාස ආදී සියල්ල ගැන ගෝලයන්ට විස්තර කරමින් සිටිසේක. තමන්වහන්සේව කුරුසියක තබා ඇණ ගසන බවද තුන්වෙනිදා උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටින බවද ඔවුන්ට පැවසූ සේක. නමුත් ගෝලයන්ගේ තේරුම් ගැනීමේ හැකියාව මොටවී තිබුණෙන් උන්වහන්සේ පැවසූ දේ ඔවුන්ට අවබෝධ කරගත නොහැකි වූහ.

*බලන්න: ශු. ලූක් 4: 29; ශු. යොහන් 7: 45-48 සහ 8: 59.*

## *6 - පරිච්ඡේදය*

# අන්‍යරූප විලාශ වීම

යේසුස්වහන්සේ අන් වෙසක් වූ අවස්ථාවේ සිට උන්වහන්සේගේ ගෝලයන්ගේ ඇදහිල්ල ශක්තිමත් වූ බව මම දුටිමි. පොරොන්දු වූ මෙසියස්වහන්සේ යේසුස්වහන්සේ බවට බලවත් සාක්ෂියක් උන්වහන්සේගේ අනුගාමිකයනට දීමට දෙවියන්වහන්සේ කැමති වූසේක. පැමිණෙන්ට යන දුක් ශෝක හා බලාපොරොත්තු කඩවීමේදී තමන්ගේ ඇදහිල්ල ඉවත නොදමන පිණිස එවැනි දෙයක් ඔවුන්ට අවශ්‍ය විය. පැමිණෙන්ට තිබෙන දුක් ශෝකය හා මරණය ගැන යේසුස්වහන්සේ සමග කථා කරන්ට දෙවියන්වහන්සේ මෝසෙස් සහ එලියාව එවූ සේක. තම පුත්‍රයාණන් සමග කථා කරන්ට දේව දූතයන් එවනවා වෙනුවට එම දෙදෙනාව තෝරා ගත්තේ පොළොවෙහිදී ඔවුන් දුක් දරාගෙන සේවය කිරීමේදී අත්දකීම් ලබා සිටි නිසාය. අන්‍යරූප විලාශ වීමේදී උන්වහන්සේගේ මුහුණේ දිව්‍ය අලංකාරයද තේජසින් බබලන උන්වහන්සේගේ වස්ත්‍රද දකින පිණිසත් 'මේ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය, මොහුට ඇහුම්කන් දීපල්ලා" යයි කියන දෙවියන්වහන්සේගේ බලවත් තේජවත් හඬද අසන පිණිස උන්වහන්සේ තෝරා ගත්තේ ටික දෙනෙකුවය.

එලියා දෙවිඳුන් සමග හැසිරුන කෙනෙක්ය. ඔහුගේ සේවය ඉතා අසීරු එකක් විය. පව් පෙන්වාදීම සහ අනාවැකි පැවසීම නිසා දිවි ගළවා ගැනීමට තැනින් තැන යන්ට ඔහුට සිදුවිය. මරා දමන පිණිස සතුරෝ හැම තැන ඔහුව ලුහු බඳින්ට වූහ. දෙවියන්වහන්සේ ඔහුව අන් වෙසකට හැරවූ සේක. දේව දූතයෝ ඔහුව ජයග්‍රාහී ලෙස ස්වර්ගයට ඔසවාගෙන ගියහ.

මෝසෙස් දෙවියන්වහන්සේගෙන් ගෞරව ලැබූ කෙනෙකි. ඔහුට පෙර විසූ කිසිවෙකුටත් වඩා ඔහු බලවත් කෙනෙක් විය. මනුෂ්‍යයෙක් තම මිත්‍රයෙකු සමග කථා කරන ලෙස ඔහු දෙවියන්වහන්සේ සමග මුහුණට මුහුණ ලා කථා කළේය. පියාණන්වහන්සේව වසාගෙන තිබෙන මහිමාන්විත ආලෝකය බලන්නට ඔහුට අවසර දෙන ලදී. දෙවියන්වහන්සේ මෝසෙස් ලවා ඊශ්‍රායෙල් සෙනඟව මිසරයේ වහල්කමින් මුදාගෙන ආසේක. ඔවුන් උදෙසා මෝසෙස් මැදහත්කාරයෙකු ලෙසද ක්‍රියා කළේය. යම් අවස්ථාවල ඔහු ඊශ්‍රායෙල් ජාතියත් දේව උදහසත් අතරේ සිට ගත්තේය. ඊශ්‍රායෙල්වරුන්ගේ නොඇදහිල්ලත් කෙඳිරීම් සහ භයානක පාප ක්‍රියාවන්ද නිසා දේව උදහස මහත් සේ ඇවිලී ගිය විට ඊශ්‍රායෙල්වරුන් කෙරෙහි වූ මෝසෙස්ගේ ප්‍රේමය පරීක්ෂණයකට භාජනය කරන ලදී. ඊශ්‍රායෙල් ජාතිය විනාශ කොට මෝසෙස්ගෙන් බලවත් ජාතියක් ඇතිකර දෙන්ට දෙවියන්වහන්සේ

පොරොන්දු වූ විට ඔහු ඉල්ලා සිටියේ සෙනඟට සමාව දෙන ලෙසය. නැත්නම් තමාගේ නම උන්වහන්සේ ලියා තිබෙන පොතෙන් මකා දමන ලෙසය.

ඊශ්‍රායෙල් සෙනඟ කාන්තාරයේදී වතුර නොලැබුණු අවස්ථාවක ඔවුහු දෙවියන්වහන්සේටත්, මෝසෙස්ටත් විරුද්ධව කොඳුරන්ට වූහ. 'නුඹලා අපවත් අපේ දරුවන්වත් මරණ පිණිස මේ කාන්තාරයට ගෙනාවෝය" යයි කියමින් මෝසෙස්ට දොස් කීවෝය. දෙවියන්වහන්සේ ඔවුන්ගේ කෙඳිරීම් අසා ඊශ්‍රායෙල් පුත්‍රයන්ට වතුර ලැබෙන පිණිස පර්වතයට සැරයටියෙන් ගසන ලෙස මෝසෙස්ට අණ කළසේක. මෝසෙස් සෙනඟ කෙරෙහි උදහස් වී තමාට ගෞරවය ලැබෙන ආකාරයට පර්වතයට ගැසීය.

ඊශ්‍රායෙල් සෙනඟගේ නිරන්තර කෙඳිරීම් සහ නොමග යාම් මෝසෙස්ට මහත් දුක් ශෝක ඇති කෙරිණ. දෙවියන්වහන්සේ ඔවුන් ගැන කොතරම් ඉවසුවාද කියාත් ඔවුන්ගේ කෙඳිරීම් තමාට නොව දෙවියන්වහන්සේට විරුද්ධව බවත් මෝසෙස්ට මොහොතකට අමතක විය. ඔහු තමා ගැන සිතීය. තමා දක්වූ ආදරයට ඉවසීමට සැලකීමක් නොදක්වීම ගැන, කලගුණ නොසැලකීම ගැන, ඔහුට ගැඹුරු සිත් වේදනාවක් ඇති විය.

මෝසෙස් පර්වතයට ගසන විට දෙවියන්වහන්සේට ඊශ්‍රායෙල් ජනතාවගෙන් ගෞරවය ලැබෙන අන්දමට ක්‍රියා කළේ නැත. මෝසෙස්ගේ එම ක්‍රියාව ගැන දෙවියන්වහන්සේ ප්‍රසන්න වූයේ නැත. පොරොන්දු දේශයට ඇතුල් වන්ට ඔහුට ඉඩ දෙන්ට දෙවියන්වහන්සේ කැමති නොවූ සේක. උන්වහන්සේගේ අභිප්‍රාය වූයේ දුෂ්කරතා ඇතිවන ස්ථානවලට ඊශ්‍රායෙල්වරුන්ව ගෙනැවිත් දුෂ්කරතා දැඩිව දැනෙන විට, උන්වහන්සේගේ බලය දැනගන්ට සලස්වා ඔවුන්ගේ සිත්වල උන්වහන්සේ වාසය කර, තමන්වහන්සේව ගෞරවයට පමුණුවන්ට ඔවුන්ට ඉඩ ප්‍රස්ථා සලසා දීමය.

දස ආඥාවන් ලියා දුන් ගල් ලැලි දෙක රැගෙන කන්දෙන් බැසගෙන එන විට මෝසෙස් දුටුවේ ඊශ්‍රායෙල් සෙනඟ රන් වස්සාට නමස්කාර කරමින් සිටින ආකාරයය. ඔහුගේ උදහස ඇවිළී ගල් ලැලි දෙක පර්වතයේ ගසා බිඳ දැමීය. මෝසෙස් මේ කාරණයේදී පව් නොකළ බව මම දුටිමි. ඔහු උදහස් වූයේ දෙවියන්වහන්සේගේ ගෞරවය සහ මහිමය උදෙසාය. නමුත් ඔහු තම ස්වභාවික හැඟීම්වලට ඉඩ දී දෙවියන්වහන්සේට අයිති ගෞරවය තමාටම ලබාගත් විට ඔහු පව් කළේය. එම පාපය නිසා දෙවියන්වහන්සේ ඔහුට පොරොන්දු දේශයට ඇතුල් වන්ට ඉඩ නොදුන් සේක.

මෝසෙස්ගේ යම් වරදක් අල්ලා ගැනීමට සාතන් උත්සාහ දැරීය. දෙවියන්වහන්සේ අප්‍රසන්න වන දෙයක් කිරීමට මෝසෙස්ට සලස්වා සාතන් සතුටට පත්ව තම දූතයන්ට කියා සිටියේ මනුෂ්‍යයන් ගළවන්ට යේසුස්වහන්සේ ලෝකයට ආ විට උන්වහන්සේවත් තමාට යටත් කරන්ට හැකිවන බවය. මෝසෙස් කළ වරද නිසා ඔහු මරණයේ බලයට යටත් විය. මෝසෙස් ස්ථිරවම සිටියා නම් ස්වාමින්වහන්සේ ඔහුව පොරොන්දු දේශයට ගෙන එන්ටද ඉන්පසු මරණයට පත් නොවී අන් වෙසකට හරවා ස්වර්ගයට ගෙන යන්ටද තිබුණි. ඔහු මරණයට පත්විය. නමුත් ශරීරය කුණු වෙන්ට පෙර මිඛායෙල් තෙම පැමිණ ඔහුට ජීවිතය දුන්සේක. සාතන් මෝසෙස්ගේ ශරීරය ගැන තම අයිතිය පෙන්වීය. තම සිරකරුවාව උදුරා ගැනීම අසාධාරණයක් යැයි සාතන් දෙවියන්වහන්සේට දොස් පැවරීය. සාතන් මෝසෙස්ගේ ශරීරය තබාගන්ට උත්සාහ කළේය. මෝසෙස් පාපයට අසු වුණේ සාතන්ගේ පරීක්ෂාවන් නිසා වුවත් මිඛායෙල් තෙම සාතන්ට තර්ජන නොකර 'ස්වාමින්වහන්සේ නුඹට තරවටු කරන සේක්වා"යි පවසා මෝසෙස්ව මළවුන්ගෙන් නැගිටුවා ස්වර්ගයට ගෙන ගිය සේක.

'දෙවියන්වහන්සේගේ රාජ්‍යය බලයෙන් යුක්තව එනවා දකින තුරු මෙහි සිටින්නන්ගෙන් සමහරෙක් මරණය විඳින්නේ නැතැ" යි යේසුස්වහන්සේ කීසේක. අනාරූප විලාශ වූ අවස්ථාවේදී මේ දේ සිදුවිය. යේසුස්වහන්සේගේ මුහුණ වෙනස් වී සූර්යයා මෙන් බබළන්ට විය. උන්වහන්සේගේ වස්ත්‍ර ආලෝකය මෙන් දිළිසෙන්ට විය. මෝසෙස් එහි විය. ඔහු සංකේතවත් කළේ යේසුස්වහන්සේගේ දෙවන ඊමේදී සිදුවන ධර්මිෂ්ඨයන්ගේ මළවුන්ගෙන් නැගිටීමය. එලියාගෙන් සංකේතවත් කළේ මරණයට පත් නොවී අන් වෙසකට හරවා එලියාව ගෙන ගියාක් මෙන් ස්වර්ගයට ගෙන යනු ලබන ධර්මිෂ්ඨයන්වය.

ගෝලයෝ භයෙනුත් විශ්මයට පත්වීමෙනුත් යුතුව යේසුස්වහන්සේගේ තේජාන්විත භාවය දෙස බලා සිටියහ. උන්වහන්සේට ඉහළින් වූ දීප්තිමත් වලාකුළද දුටු අතර 'මේ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය, මොහුට ඇහුම්කන් දීපල්ලා" යයි ස්වර්ගයෙන් වූ දෙවියන්වහන්සේගේ තේජවන්ත බලවත් හඬද ඇසුවෝය.

*කියවන්න: නික්මයාම 32; ගණන් කථාව 20: 7-12; ද්විතිය කථාව 34: 5; 2 රාජාවලිය 2: 11ත ශු. මාර්ක් 9 පරිච්ඡේදය; යුදස් 9.*

## *7 - පරිච්ඡේදය*

# ක්‍රිස්තුස්වහන්සේව පාවා දීම

යේසුස්වහන්සේ තම ගෝලයන් සමග පාස්කු භෝජනය අනුභව කළ කාලය වෙතට දේවානුභාවයෙන් මාව පමුණුවනු ලැබීය. සාතන් යුදස් ඉස්කාරියෝත් රවටා තමා යේසුස්වහන්සේගේ සැබෑ ගෝලයෙක් යයි සිතන්ට සලස්වා තිබිණ. නමුත් ඔහුගේ සිත නිතරම වූයේ මාංසික මට්ටමකය. මුල සිටම යේසුස්වහන්සේ සමග සිටි ඔහු උන්වහන්සේගේ පුදුම ක්‍රියා දුටු අතර සැබවින්ම යේසුස්වහන්සේ මෙසියස් තුමා බව හැඟීම්බරව දන සිටින්ට විය. නමුත් ඔහු සිටියේ තෘෂ්ණාධික කමින් තම මනස වසා ගෙනය. මුදලට ඔහු ආශා විය. යේසුස්වහන්සේගේ ශරීරය මත සුවඳ තෙල් වත් කළ අවස්ථාවේ ඔහු ඊට එරෙහිව පැමිණිලි කළේය. මරියා යේසුස්වහන්සේට ප්‍රේම කළාය. උන්වහන්සේ බොහෝ වූ ඇයගේ පාප ඇයට කමා කර තිබිණ. ඇය බොහෝ සේ ප්‍රේම කළ ඇයගේ සහෝදරයාව උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටුවා තිබිණ. ඒ නිසා යේසුස්වහන්සේට පුදන කිසිවක් අධික මිලයක් ලෙස ඇය සැලකුවේ නැත. යුදස් තම වස්තු තණ්හාව සඟවා ගෙන නිදහසට හේතුවක් දක්වමින් එම ආලේප තෛලය විකුණා දිළිඳුන්ට දෙන්ට තිබුණා නොවේද කියා පැවසීය. නමුත් ඔහු එසේ පැවසුවේ දිළිඳුන් කෙරෙහි සැලකිල්ල දක්වූ නිසා නොව දිළිඳුන්ට උපකාර කිරීම සඳහා ඔහුට දෙනු ලැබ තිබූ මුදලින් කොටසක් තමාගේම ප්‍රයෝජනයට වැය කළ නිසාය. යුදස් යේසුස්වහන්සේගේ අවශ්‍යතාවන් ගැන හෝ පහසුව ගැන හෝ සැලකුවේ නැත. ඔහු බොහෝ විට දිළිඳුන් ගැන කථා කළේය. මරියාගේ නොමසුරු දීමනාව යුදස්ට තම මසුරුකම කෙරෙහි වැදුන මරු පහරක් සේ දනුණි. සාතන්ට යුදස්ගේ මනසට ඇතුල් වීමට පහසු මාර්ගයක් විවෘතව තිබිණ.

යුදා ප්‍රධානීහු යේසුස්වහන්සේට වෛර වූහ. නමුත් සමූහයෝ උන්වහන්සේ වෙතට රැස්වූයේ ප්‍රඥාවෙන් වූ වචන අසන පිණිසත් උන්වහන්සේ කළ ආශ්චර්යමත් ක්‍රියා දකින පිණිසත්ය. සෙනඟගේ අවධානය නායක පූජකයන් හා වැඩි මහල්ලන් වෙතින් යේසුස්වහන්සේ වෙතට ඇදී එන්නට විය. බොහෝ ප්‍රධානීන්ද යේසුස්වහන්සේ කෙරෙහි අදහා ගත්හ. නමුත් ඒ බව ප්‍රසිද්ධියේ කියන්ට මැලි වූයේ සිනගෝගවලින් ඉවත් කරාවි යන භය නිසාය. ජනතාවගේ අවධානය ආපසු තමන් වෙත හරවා ගන්නා පිණිස යමක් කළ යුතු යයි නායක පූජකයෝ තීරණය කළහ. සියල්ලන් උන්වහන්සේ කෙරෙහි අදහා ගනු ඇතැයි ඔවුහු බියට පත්වූහ. තමන් හට ආරක්ෂාවක් නැති බව ඔවුන්ට දනිණ. තම තත්ත්වය රැක ගන්නට, යේසුස්වහන්සේව මරා දැමිය යුතුයි. එපමණක් නොව යේසුස්වහන්සේ විසින් මළවුන්ගෙන් නැගිටවූ ලාසරුස්ව දකගැනීමට ජනතාව ඇදී එන්ට වූයෙන් ඔහුව ද මරා දැමීමට ඔවුහු තීරණය කළහ. නැගී එන ජන මතය මෙලෙස මැඩපැවැත්වීම, ජනතාවගේ සිත් නැවත පරම්පරා නියෝග වෙතට සහ දසභාගය, සුවඳතලාය, සතපුෂ්පය, සුදුදුරුය යන මනුෂ්‍ය ඉගැන්වීම් වෙතට හරවා ගෙන බලපෑම් ඇති කිරීම ඔවුන්ගේ අභිප්‍රාය විය.

සමූහයන් අතර සිටින යේසුස්වහන්සේව අල්ලා ගැනීමට උත්සාහ කළහොත් සෙනඟ ගල් ගසාවිය යන භය නිසා තනිව සිටින විටකදී අල්ලා ගැනීමට ඔවුහු එකඟ වූහ.

යේසුස්වහන්සේව අල්ලා ගැනීමට පූජකයන් තද උනන්දුවකින් සිටින බව දනගත් යුදස් උන්වහන්සේව පාවා දීමට කැමැත්ත දක්වීය. මුදලට ආශා කළ ඔහු රිදී කාසි කීපයකට තම ස්වාමින්වහන්සේව උන්වහන්සේගේ බලවත් සතුරන් අතට පාවා දීමට එකඟ විය. සාතන් යුදස්ව මෙහෙයවන්ට විය. පාස්කු භෝජනය වළඳන ඒ ආගමික මෙහෙය කෙරීගෙන යන විට යුදස් සිතමින් සිටියේ යේසුස්වහන්සේව පාවාදෙන ක්‍රමය ගැනය. එදා රාත්‍රියේදී ගෝලයන් සියලු දෙනාම තමන් නිසා බාධාවට පැමිණෙන බව දුක්ඛිත ස්වරයෙන් යේසුස්වහන්සේ පැවසූ අතර කවරෙක් බාධාවට පැමිණියත් උන්වහන්සේව අත් නොහරින බව පේත්‍රුස් තුමා පැවසීය. සාතන් ඔහුව ගෝධුම මෙන් පොලන්ට ඉල්ලූ බව පේත්‍රුස්ට පවසා 'මම නුඹගේ ඇදහිල්ල නැති නොවන ලෙස යාච්ඤා කළෙමි' යි දන්වා 'නුඹ හැරුණායින් පසු නුඹගේ සහෝදරයන් ශක්තිමත් කරන්නැ' යි යේසුස්වහන්සේ පේත්‍රුස්ට පැවසූ සේක.

ඉන්පසු යේසුස්වහන්සේ ගෝලයන් සමග ගෙත්සෙමන උයනෙහි සිටිනවා මම දර්ශනයෙන් දුටිමි. පරික්ෂාවන් පැමිණෙන විට ගෝලයන්ගේ ඇදහිල්ල බිඳී යාමද බලාපොරොත්තු කඩවීමද සිදුවිය හැකි බව දුටු යේසුස්වහන්සේ ආරක්ෂාව හා ශක්තිය ලබාගන්නා පිණිස අවදිව සිටිමින් උනන්දුවෙන් යාච්ඤා කරන මෙන් තම ගෝලයන්ගෙන් ඉල්ලූ සේක. යේසුස්වහන්සේද මහත් හැඬීමකින් යුතුව පියාණෙනි, මෙම දුක් පාත්‍රය ඔබ කැමති නම් පහ කළ මැනව. එහෙත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත ලෙස වේවා"යි කියමින් යාච්ඤා කළසේක. දේව පුත්‍රයාණන් වේදනාවෙන් යාච්ඤා කළසේක. ලේ පැහැයෙන් ඩාදිය බිඳු උන්වහන්සේගේ සිරුරෙන් බිමට පතිත විය. උන්වහන්සේව මෙම වේදනාවෙන් මුදාගැනීමට දේව දූතයන් ආශාවෙන් සිටි නමුත් අණ දෙන දේව දූතයා එක දේව දූතයෙකුට පමණක් ළඟට ගොස් උන්වහන්සේව ශක්තිමත් කරන්ට අවසර දෙන්ට යෙදින. දූත සේනාවෝ නිහඬව උන්වහන්සේගේ දුක් විඳීම දෙස බලා සිටියහ. පාවා දීමෙන් මුදවා ගන්ට දේව දූතයන් උත්සාහ කළහොත් දේව කැමැත්ත ඉටු නොවන්නේය. සැලැස්ම පිළියෙල කර තිබිණ. එය සම්පූර්ණ ලෙස ඉටු විය යුතුය.

යාච්ඤා කිරීමෙන් පසුව යේසුස්වහන්සේ තම ගෝලයන් වෙතට පැමිණි සේක. මෙම අතිමහත් වේදනාත්මක අවස්ථාවේ යේසුස්වහන්සේට තම ගෝලයන්ගෙන් සහය හෝ පහසුව ලැබුණේ නැත. ඔවුන් සිටියේ නිදාගෙනය. යේසුස්වහන්සේ උදෙසා හිරගෙට වුවත් යන්නට කැමති බව පැවසූ පේත්‍රුස් තුමාද තද නින්දේය. "පේත්‍රුස් නුඹට මා සමග ඔක පැයක්වත් අවදිව සිටින්ට නොහැකි වූවා" දයි අසමින් උන්වහන්සේ ඔහුට, ඔහු දුන් පොරොන්දුව මතක් කර දුන්සේක. යේසුස්වහන්සේ තුන්වරක්ම වේදනාවෙන් යාච්ඤා කළසේක. යූදස් තම කණ්ඩායම සමග පැමිණියේය. පුරුදු පරිදි උන්වහන්සේට ආචාර දක්වීය. කණ්ඩායම යේසුස්වහන්සේ වටකර ගත්හ. 'නුඹලා සොයන්නේ කාවද? ඒ මමය," යනුවෙන් උන්වහන්සේ ප්‍රකාශ කළ විට දේව මහිමය උන්වහන්සේ වෙතින් නිකුත් විය. එවිට ඔවුහු පසු පසට ගොස් බිම ඇද වැටිණ. යේසුස්වහන්සේ මෙසේ පැවසුවේ උන්වහන්සේගේ බලය ඔවුන්ට ප්‍රකාශ වන පිණිසත් උවමනා වූවා නම් ඔවුන්ගෙන් මිදී යන්ට උන්වහන්සේට බලය තිබෙන බවට සාක්ෂියක් දක්වන පිණිසත්ය.

ඔවුහු නැවත නැගිට යේසුස්වහන්සේව වටලා ගත් විට පේත්‍රුස් තමා අත වූ කඩුවෙන් ගසා කෙනෙකුගේ කණ කපා දැමීය. කඩුව කොපුවේ දමන ලෙස අණ කළ උන්වහන්සේ ඔහුට මෙසේ පැවසූ සේක. 'මාගේ පියාණන් වහන්සේට කථා කොට දේව දූත සේනා දොළසක් මේ දැන් ගෙන්වා ගන්ට බැරිය කියා නුඹ සිතනවාද? 'මේ වචන ඇසූ දේව දූතයන්ගේ මුහුණුවල අමුතු එළියක් මම දුටිමි. ඔවුහු උන්වහන්සේව මුදා ගන්ට සැරසෙත්ම ඊළඟට උන්වහන්සේගේ මුවින් පිට වූ වදන් 'එසේ වුවහොත් ශුද්ධ ලියවිලිවල ලියා තිබෙන දේ සම්පූර්ණ වන්නේ කෙසේද?" යන වදන් ඇසූ විට දේව දූතයන්ගේ මුහුණු කණගාටුදායක ස්වරූපයකින් දිස්විණ. යේසුස්වහන්සේ සතුරන් අතට භාර වෙනවා දුටු ගෝලයන්ගේ සිත් මහත් දුකකට සහ බලාපොරොත්තු කඩවීමකට පත්වූහ.

තමන්ගේ ජීවිත ගැන භයට පත්වූ ගෝල පිරිස යේසුස්වහන්සේව තනිවන්ට හැර දමා ඒ මේ අත විසිර ගියහ. අහෝ! දේව දූතයන් හට කවර නම් දුකක්ද? සාතන්ට ජයග්‍රහණයේ මොනතරම් සතුටක්ද? අණ දෙන දේව දූතයන් ඇතුළු දේව දූත කණ්ඩායම් බොහෝමයක් මෙම සිදුවීම් දැක බලාගන්ට එවනු ලැබ සිටියහ. දේව පුත්‍රයාණන්ට විරුද්ධව කළ සෑම ක්‍රියාවක්ම, සෑම කෲරකමක්ම, සෑම අපහාසයක්ම උන්වහන්සේට විඳින්ට වූ සෑම වේදනාවක්ම ඒ අය විසින් සටහන් කර තැබිය යුතු විය. ඒ දේවල් කළාවූ අය ඉදිරියේ යම් දිනක ජීවමාන චරිතාකාරයෙන් ඒවා මුණ ගැසෙන්ට යන්නේය.

***ශු. මතෙව් 26: 1-56; ශු. මාර්ක් 14: 1-52; ශු. ලූක් 22: 1-46; ශු. යොහන් 11 පරිච්ඡේදය; 12: 1-11 සහ 18: 1-12 කියවා බලන්න.***

## *8 - පරිච්ඡේදය*

# ක්‍රිස්තුස්වහන්සේව විනිශ්චය කිරීම

දේවදූතයෝ ස්වර්ගයෙන් පිටත්ව ආ විට ඔවුන්ගේ ප්‍රීතිමත් මුහුණු දුක්මුසු බවට පත්වූ අතර යේසුස්වහන්සේ කටු ඔටුන්නක් හිසේ ඇතිව සිටි බැවින් තමන් පැළඳ සිටි දීප්තිමත් ඔටුනු ගළවා දැමූහ. අනුකම්පාවෙන් යුතු මිනිස් හැඟීම් නැතිකර දමන පිණිස සාතන් තම දූතයන්ද සමග නඩු ශාලාවට පැමිණ ක්‍රියාකාරීව සිටියේය. ඔවුන්ගේ බලපෑම් නිසා වාතාවරණයද අයහපත් වී තිබිණ.

මනුෂ්‍ය ස්වභාවයට දරාගන්ට නොහැකි ආකාරයෙන් යේසුස්වහන්සේට නින්දා අපහාස කරන්නට පූජකයන්ගේ සහ යුදා නායකයන්ගේ සිත් සාතන් විසින් පොළඹවා තිබිණ. මෙවන් දුක් වේදනා සහ නින්දා අපහාස නිසා දේව පුත්‍රයාණන් මුවින් යම් දොස් කීමක් හෝ කොඳුරන වචන පිටවේය කියා හෝ එසේත් නැත්නම් තම දේව බලය දක්වමින් සමූහයන්ගෙන් මිදී යාවි, එවිට ගැළවීමේ සැලැස්ම බිඳ වැටේවි යයි සාතන් බලාපොරොත්තු වූයේය.

පාවා දීමෙන් පසුව යේසුස්වහන්සේට කුමක් වේදෝ කියා දැක ගන්න පිණිස පේත්‍රුස් උන්වහන්සේට ටිකක් ඈතින් ගමන් කරන්ට යෙදින. 'ඔහු උන්වහන්සේගේ ගෝලයෙක්"යයි කෙනෙක් කී විට එය ඔහු ප්‍රතික්ෂේප කළේය. දෙවෙනි වරද උන්වහන්සේව හඳුනන්නේ නැති බව ප්‍රකාශ කළේය. යේසුස්වහන්සේ සමග ඇසුරු කිරීම නිසා ගෝලයන්ගේ කථා විලාශය උතුම් පවිත්‍ර තත්ත්වයක පැවතුණි. තුන්වෙනි වර ඔහු යේසුස්වහන්සේගේ ගෝලයෙක් යැයි කෙනෙක් කීවිට පේත්‍රුස් බැණ වදිමින් දිවුරමින් ශාප කරමින් තමා ගෝලයෙක් නොවන බව කියා පෑවා. මේ වන විට යේසුස්වහන්සේ සිටියේ ඔහුට නුදුරු ස්ථානයකය. යේසුස්වහන්සේගේ අනුකම්පා සහගත නෙත් පේත්‍රුස් දෙස යොමුව තිබිණ. 'රාත්‍රියේ කුකුළා හඬලන්නට පෙර තුන්වරක් නුඹ මා හඳුනන්නේ නැතැ"යි කී වචන සහ 'නුඹ නැවත හැරුණායින් පසු නුඹේ සහෝදරයන් ශක්තිමත් කරපන්න" යන ඉල්ලීම ඔහුට මතක් විය. එම කාරුණික බැල්ම ඔහුගේ සිත මෘදු බවට පත් කෙරිණ. පසුව ඔහු හඬමින් වැලපෙමින් තම මහත් පාපය ගැන පසුතැවිලි විය.

මහත් සමූහයා යේසුස්වහන්සේගේ ලේ සිඳ හෙලන ලෙස ඉල්ලා කෑගැසූහ. පැරණි රාජ වස්ත්‍රයක් හඳවා හිසේ කටු ඔටුන්නක් පළඳවා බට දණ්ඩක් අතේ තබා 'යුදාවරුන්ගේ රජ" යයි අපහාසාත්මකව හිස් පහත් කර කවටකම් කරන්ට වූහ. පසුව අත තිබූ බට දණ්ඩ රැගෙන හිසෙහි වූ ඔටුන්නට ගසමින් කටු යටට බසින්ට සැලැස්සූහ. හිසෙන් පිටව ආ ලේ කම්මුල් දිගේ ගලා බසින්නට විය. මෙය බලා සිටි දේව දූතයන්ට ඉවසන්ට නොහැකි විය. ඔවුහු යේසුස්වහන්සේව මුදා ගන්ට කැමතිව සිටියහ. නමුත් ඔවුන්ව වළක්වන්ට යෙදින. ගෙවීමට තිබූ මිදීමේ මිලය අති විශාලය. එය අංග සම්පූර්ණ එකක් විය යුතුය. මරණය කෙරෙහි බලය ඇත්තාව මරණයට තීන්දු කරනු ලබන්නේ එමගින්ය. තමන් පත්ව සිටි තත්ත්වය දෙස දේව දූතයන් බලා සිටින බව යේසුස්වහන්සේ දැන සිටිසේක. එහි සිටි මහත් සමූහයාගේ බලය බිඳ දමන්ට දේව දූතයන්ගේ ඉතාම දුබල දේව දූතයාට පුළුවන්ව තිබිණ. පියාණන් වහන්සේගෙන් ඉල්ලූවා නම් දේව දූතයන් තමන්වහන්සේව මුදා ගන්න බවද යේසුස්වහන්සේ දැන සිටිසේක. නමුත් ගැළවීමේ සැලැස්ම සම්පූර්ණත්වයට ගෙන ඒමට යේසුස්වහන්සේට කුරිරු මිනිසුන්ගෙන් බොහෝ දේ විඳින්ට යුතුව තිබුණේය.

මහත් සමූහයා යේසුස්වහන්සේට ඉතා නීච අන්දමට පීඩා කළ අතර ඒ සියල්ල උන්වහන්සේ යටහත් පහත් මෘදු සිතකින් දරාගෙන සිටිසේක. උන්වහන්සේගේ මුහුණට කෙළ ගැසූහ. යම් දිනක ඔවුහු ඒ මුහුණ ඉදිරියෙහි සැඟවෙන්ට සොයනවා ඇත. දෙවියන්වහන්සේගේ නුවරට ආලෝකය දෙන සූර්යයා මෙන් බබළන ඒ මුහුණ වෙතින්, සැඟවෙන්ට ඉදිරි දිනක ඔවුන්ට සිදුවෙනවා ඇත. උන්වහන්සේ ඔවුන්ට කෝපාවිෂ්ට මුහුණක් දැක්වූයේ නැත. නිහතමානීව කෙළ පිස දමාගත් සේක. ඔවුහු උන්වහන්සේගේ මුහුණ රෙදි කඩකින් වසා මුහුණට පහරදී 'නුඹට ගැසුවේ කවුද කියා දිවසින් කියාපන්" යයි කෑගැසූහ. එවිට දේව දූතයන් අතර කලබලයක් ඇති විය. යේසුස්වහන්සේව මුදාගන්ට ඔවුහු සැරසුණු අතර ප්‍රධාන දේව දූතයෝ එය වළක්වාලූහ.

විනිශ්චය ශාලාව වෙත යන්ට සහ සිදුවන දේ දකින්ට ගෝලයෝ අවසර ලබා ගත්හ. ඔවුහු බලාපොරොත්තු වූයේ යේසුස්වහන්සේ තම බලය පෙන්වා ඔවුන්ගෙන් මිදී ඔවුන්ගේ කෲරකම් ගැන ඔවුන්ට දඬුවම් කරනවා දකින්ටය. සිදුවූ දේවල් දකින විට වරින් වර ඔවුන්ගේ බලාපොරොත්තු ඉහළ පහළ යන්ට විය. වරක් තමන් රැවටී සිටින්ට ඇත යන සැකයෙන් ඔවුහු භයටද පත්වූහ. නමුත් කන්දේදී අන්‍යරූප විලාශ වූ විට දුටු මහිමයද 'මේ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය" යන ස්වර්ගයෙන් ඇසුණු හඬද නොයෙක් ආකාර රෝගීන් සුවකර අන්ධයන්ට පෙනීම දීම, කොරුන් ඇවිදවීම, අශුද්ධාත්මයන් පහ කිරීම මළවුන් නැගිටවීම ආදී ඔවුන් දැක තිබූ පුදුම හාස්කම්ද මුහුදේ කුණාටුවලට අසු වූ අවස්ථාවල සුළඟ හා ගලා ආ රළ පතර උන්වහන්සේගේ වචනයට කීකරුව නිශ්චල වීමද සිහියට නැගුණු අතර උන්වහන්සේ මරණයට පත්වේ යයි විශ්වාස කරන්ට ගෝලයන්ට නොහැකි විය.

හමුදාවන් එළවා ගෙන එන විට දුවන ආකාරයෙන් එදා දේව මාළිගාව තුළ වෙළඳාම් කරමින් සිටි මිනිසුන්ට දුවන්ට සැලැස්වූ උන්වහන්සේ බලයෙන් නැගී සිට ලේ පිපාසයෙන් සිටි සමූහයාව එළවා දමාවි යයිද මහත් බලය ප්‍රකාශ වෙන්ට සලස්වා තමන්වහන්සේ ඊශ්‍රායෙල්වරුන්ගේ රජතුමා බව සෙනඟට දැනගන්ට සලස්වාවි යයිද ගෝල පිරිස බලාපොරොත්තු වූහ.

යේසුස්වහන්සේව පාවා දීමෙන් කළ අමානුෂික ක්‍රියාව ගැන යූදස්ගේ සිත ලැජ්ජාවෙන් සහ තිත්ත හැඟීමෙන් පිරී තිබෙන්ට විය. උන්වහන්සේට විඳින්ට සිදුවූ දුක් වේදනා දුටු ඔහුට එය දරාගන්ට නොහැකි විය. ඔහු යේසුස්වහන්සේට ප්‍රේම කර තිබිණ. නමුත් ඊට වඩා මුදලට ප්‍රේම කර තිබිණ. තමා එක්කරගෙන ආවාවූ දුර්ජනයින්ගේ අත්වලට උන්වහන්සේ බාරවේවිය කියා ඔහු සිතුවේ නැත. ඔහු සිතුවේ ප්‍රාතිහාර්යයන් කර උන්වහන්සේ ඔවුන්ගෙන් මිදෙනවා ඇත කියාය. විනිශ්චය ශාලාව තුළ රැස්ව සිටි සමූහයා කෝපාවිෂ්ටව උන්වහන්සේගේ ලේ සිඳ හෙළීම ඉල්ලා සිටි විට යූදස්ට තමා කළ වරද තවත් ගැඹුරු ලෙස හැඟී යන්ට විය. සමූහයා තව තවත් තදින් යේසුස්වහන්සේට වරද තැබූ අතර යූදස් ඔවුන් අතරින් ඉක්මණින් ගොස් නිදොස් ලේ පාවා දීමෙන් තමා පව් කළ බව ඔවුන් ඉදිරියේ කෑගසා කියන්ට විය. මුදල් ආපසු දෙන්ට යමින් සම්පූර්ණයෙන්ම නිර්දෝෂ වූ උන්වහන්සේව මුදා හරින ලෙස බැගෑපත්ව ඉල්ලන්ට විය. ව්‍යාකූලතාවයකට පත්වූ පූජකයෝ කිසිවක් කර කියා ගත නොහැකිව ටික වේලාවක් නිහඬ වූහ. යේසුස්වහන්සේව තමන්ට පාවා දෙන පිණිස උන්වහන්සේගේම ගෝලයෙකු තමන් කුලියට ගත් බව සමූහයා දැන ගන්නවාට ඔවුහු නොකැමති වූහ. යේසුස්වහන්සේව රහසින් අල්ලා ගන්ට ක්‍රියා කළ බව සඟවන්ට ඔවුන්ට ඕනෑ විය. යූදස්ගේ පව් කියාදීමද, ඔහුගේ මුහුණෙහිවූ පෙනුමද පූජකයන් විසින් යේසුස්වහන්සේට වෛර කළ නිසා මෙසේ කළ බව සමූහයාට පෙනෙන්ට විය. යූදස් ශබ්ද නගා 'යේසුස්වහන්සේ නිර්දෝෂ" යයි කළ ප්‍රකාශයට පූජකයන්ගේ ප්‍රතිචාරය වූයේ 'එයින් අපට කම් නැත. නුඹම එය බලාගනින්" කියාය.

මහත් කැළඹීමකට පත්ව සිටි යූදස් තමා අතවූ මුදල් තමාව මුදලට ගත් පූජකයන් දෙසට වීසිකර දමා තමා කළ පාපයේ වේදනාත්මක හැඟීමෙන් යුතුව පිටව ගොස් අත්තක එල්ලී දිවි නසාගත්හ. යේසුස්වහන්සේ වෙත අනුකම්පාව දැක්වූ අය සෙනඟ අතරේ සිටියහ. අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු නොදී සිටීම ගැන ඔවුහු විශ්මයට පත්වූහ. එල්ලවූ නින්දා අපහාස සියල්ල ඉදිරියේ කරදර වූ පෙනුමක් හෝ පෙනෙන්නට නොවීය. පිරිපුන් ගෞරවාන්විත පෙනුමක් උන්වහන්සේ වෙත වූසේක. සෙනඟ උන්වහන්සේ දෙස පුදුමයෙන් බලා සිටියහ. උන්වහන්සේවත් උන්වහන්සේට විරුද්ධව විනිශ්චයෙහි යෙදී සිටි අයවත් සසඳා බැලූ අය එකිනෙකාට කියාපෑවේ උන්වහන්සේ රජ කෙනෙකු මෙන් පෙනෙන බවත් රාජ්‍යයක් භාරදීමට සුදුසු කෙනෙක් බවත්ය. උන්වහන්සේ වෙත අපරාධකාරයෙකුගේ සලකුණක් හෝ නොවීය. උන්වහන්සේගේ ඇස් නිරහංකාරව පැහැදිලිව සහ බියෙන් තොරවද, නළල් තලය උස්ව සහ පළල්වද තිබිණ. සෑම අංගයක්ම ගෞරවණීය ත්‍යාගශීලී ප්‍රතිපත්තිවලින් සටහන්ව තිබිණ. උන්වහන්සේගේ ඉවසීම හා දුක් දරාගැනීම මනුෂ්‍යයන්ට වඩා උසස්වූ හෙයින් බොහෝ දෙනා වෙව්ලන්නට වූහ. හෙරොද් රජ හා පිලාත්ද යේසුස්වහන්සේගේ තේජවන්ත පෙනීම ඉදිරියේ කරදරයට පත්වූහ.

යේසුස්වහන්සේ සාමාන්‍ය මිනිසෙක් පමණක් නොවන බව සහ ඉතා උසස් චරිතයක් ඇති කෙනෙක් බවද, සම්පූර්ණයෙන් නිර්දෝෂී බවද පිලාත් මුල සිටම දැනගෙන සිටින්ට යෙදින. සිදුවීම් දෙස බලා සිටි දේව දූතයන්ට පිලාත්ගේ හැඟීම් සහ යේසුස්වහන්සේ කෙරෙහි දැක්වූ අනුකම්පාවද පෙනෙන්නට විය. යේසුස්වහන්සේව කුරුසියක ඇණ ගසන්ට තීන්දු කිරීමේ භයානක අපරාධයෙන් මුදාගැනීම සඳහා පිලාත්ගේ භාර්යාව වෙතට දේව දූතයෙකු පිටත්කර හරිනු ලැබ, අවශ්‍ය පණිවිඩය එනම් විනිශ්චයට භාජනව සිටි පුද්ගලයා දේව පුත්‍රයා බවත්, කිසි වරදක් කර නැති බවත් සිහිනයකින් දැනුම් දෙන්ට යෙදින. 'ඒ ධර්මිෂ්ඨයාට කිසිවක් නොකරන්න. අද ඔහු නිසා ස්වප්නයකින් බොහෝ දුක් වින්දෙමි" පිලාත්ගේ භාර්යාව පිලාත්ට කියා ඇරියාය. පණිවිඩය ගෙන ආ තැනැත්තා සෙනඟ එහා මෙහා කර දුවගොස් පණිවිඩය පිලාත්ට භාර දුණි. පණිවිඩය කියවූ පිලාත්ගේ මුහුණ දුර්වර්ණ විය. ඔහුගේ ගත වෙව්ලන්ට විය. මේ කාරණයේදී යේසුස්වහන්සේට විරුද්ධව කිසිවක් නොකර සිටීම ඔහුගේ අදහස විය.

හෙරොද් රජ යෙරුසලමට පැමිණ ඇති බව දැනගත් පිලාත්ට සතුටක් ඇති විය. යේසුස්වහන්සේව දඬුවමට පත් කිරීමේ අපරාධයෙන් මිදෙන්ට මඟක් සෙවූ ඔහු යේසුස්වහන්සේව හෙරොද් වෙතට යැවීය. යොහන් බව්තීස්තව මරා දැමීමෙන් හෙරොද් තම හිත තදකර ගත් කෙනෙක්ව සිටින්ට විය. යේසුස්වහන්සේ ගැනත්, උන්වහන්සේගේ පුදුම ක්‍රියා ගැනත් ඇසූ ඔහු සිතුවේ යොහන් තුමා මළවුන්ගෙන් නැගිට ඇවිත්ය කියාය. වරදකාරි හැඟීමෙන් යුත් වූ ඔහු භයෙන් වෙව්ලන්ට විය. පිලාත් යේසුස්වහන්සේව තම අත යටතට පත්කිරීම නිසා හෙරොද් සිතා ගත්තේ පිලාත් හෙරොද්ගේ පාලන බල අධිකාරි බලය හා විනිශ්චය පිළිගෙන සිටි බවය. පසුගිය කාලයේ ඔවුහු සතුරන්ව සිටියහ. දැන් ඔවුහු මිතුරන් බවට පත්වූහ. හෙරොද් යේසුස්වහන්සේව දැකගන්ට සතුටු වූයේ තමා තෘප්තියට පැමිණෙන ආකාරයේ හාස්කම් උන්වහන්සේ කරාවිය යන බලාපොරොත්තුව නිසාය. නමුත් යේසුස්වහන්සේගේ මෙහෙය වූයේ එවන් හැඟීම් ලබාදීම නොවේය. උන්වහන්සේගේ දිව්‍ය හාස්කම් දැක්වීමේ අභිප්‍රාය වූයේ මනුෂ්‍යයන්ට ගැළවීම ලබා දීමය.

හෙරොද්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා හෝ තමන්ට තද ලෙස බැණ වදිමින් සිටි සතුරන් උදෙසා හෝ යේසුස්වහන්සේ කිසිවක් නොකළ සේක. තමාගේ බලය ඉදිරියේ බියපත්වූ පෙනීමක් නොමැතිව උන්වහන්සේ සිටි නිසා හෙරොද්ගේ කෝපය උත්සන්න විය. ඒ නිසා ඔහු තම හේවායින් සමග දේව පුත්‍රයාණන් වහන්සේට නින්දා අපහාස කළේය. මෙලෙස නින්දා අපහාස කරද්දීත් ඒ සියල්ල විඳ දරාගෙන සිටි උන්වහන්සේගේ දෙවි කෙනෙකු මෙන් වූ ස්වර්ගීය පෙනීම නිසා හෙරොද් උන්වහන්සේ වරදට පත්කිරීමට හයව, ආපසු පිලාත් වෙතටම යැව්වේය.

පිලාත්ව ඔහුගේම විනාශය කරා යවන්ට සාතන් සහ ඔහුගේ දූතයන් ඔහුව පරීක්ෂාවලට අසු කරන්ට උත්සාහ කරමින් සිටියහ. යේසුස්වහන්සේව වරදට පත්කිරීමට ඔහු කොටස්කාරයෙකු නොවුව හොත් වෙනත් අය එය ක්‍රියාත්මක කරනවා ඇත. සමූහයා යේසුස්වහන්සේගේ ලේ සිඳ හෙලීමේ පිපාසයෙන් සිටින බැවින් උන්වහන්සේව කුරුස පත්කිරීමට තීන්දුව නොදුන හොත් ඔහුගේ බලයත්, ගෞරවයත් ඔහුට අහිමි වනවා පමණක් නොව සෙනහව මුළා කරන්නෙකු ලෙස නම් කරනු ලැබූ යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාස කරන්නෙක් ලෙසද ඔහුව වරදට පත්කරනු ලබනවා ඇතැයි යෝජනා කළහ. පිලාත්ද තමාගේ අධිකාරී බලය අහිමි වේය යන බියෙන් යේසුස්වහන්සේව කුරුසියේ ඇණ ගැසීම සඳහා කැමැත්ත ප්‍රකාශ කලේය. යේසුස්වහන්සේගේ ලේ උන්වහන්සේට වරද තැබූවන් වෙත පිලාත් පැවරූ අතර සමූහයා 'උන්වහන්සේගේ ලේ අප පිටත් අපේ දරුවන් පිටත් වේවා' යයි කෑගැසූහ. නමුත් පිලාත් වරදෙන් මිදුණේ නැත. ක්‍රිස්තුස්වහන්සේගේ ලේ ගැන ඔහු වරදකාරයෙකි. මක්නිසාද ඔහු ආත්මාර්ථකාමී ආශාවන් මත සහ ලෝකයේ බලවතුන්ගෙන් ලැබෙන ගෞරවය නොලැබේය යන හයෙන් නිර්දෝෂී අයෙකු මරණයට පත්කරන්ට අවසර දෙන්ට යෙදින. පිලාත් තම හෘද සාක්ෂියට අනුව ක්‍රියා කළා නම් යේසුස්වහන්සේව වරදට පත්කිරීමට ඔහු ක්‍රියා නොකරනවා ඇත.

යේසුස්වහන්සේ පිළිබඳ නඩුවද වරදට පත්කිරීමද බොහෝ දෙනෙකුගේ සිත්වල ක්‍රියා කරන්ට විය. මළවුන්ගෙන් නැගිටීමට පසු ඔවුන්ගේ සිත්වල හටගත් හැඟීම් එළිදකින්ට වීම මගින් සභාවට සම්බන්ධ වූ බොහෝ දෙනෙකුගේ හැරීම නඩු විභාගයේ ආරම්භයත් සමග සිදුවූ ලෙස ගණන්ගත යුතුය.

නායක පූජකයන් ලවා යේසුස්වහන්සේට දුන් වධ හිංසාවලදී උන්වහන්සේගෙන් කෙඳිරීමක් හෝ පිට නොවීම ගැන සාතන්ගේ ආවේගය අති මහත් විය. යේසුස්වහන්සේ මනුෂ්‍ය ස්වභාවයට පත්ව සිටි නමුත් දිව්‍යමය වූ බලයක් වැනි පාලන ශක්තියක් උන්වහන්සේව දරාගෙන සිටි බව මම දුටිමි. පියාණන් වහන්සේගේ කැමැත්ත වෙතින් ඉතා සුළු වශයෙන් හෝ උන්වහන්සේ ඈත් නොවූ සේක.

*බලන්න: ශු. මතෙව් 26: 57-75; 27: 1-31; ශු. මාර්ක් 14: 53-72; 15: 1-20; ශු ලූක් 22: 47-71; 23: 1-25; ශු. යොහන් 18, 19: 1-16.*

## *9 - පරිච්ඡේදය*

# ක්‍රිස්තුස් වහන්සේව කුරුසියෙහි ඇණ ගැසීම

දේව පුත්‍රයාණන්ව කුරුසියෙහි ඇණ ගැසීමට මිනිසුන්ට භාරදෙන ලදී. ඔවුහු උන්වහන්සේව ගෙන ගියහ. කසවලින් තැලීමෙන් හා උන්වහන්සේට දුන් වේදනා නිසා මහත් සේ දුර්වලව සිටි නමුත් උන්වහන්සේව ඇණ ගසන්ට වූ බර කුරුසිය උන්වහන්සේගේ කර මත තැබූහ. තුන්වරක්ම උන්වහන්සේ සිහි මූර්ඡා වී ඇද වැටිණ. එවිට ඔවුහු උන්වහන්සේගේ අනුගාමිකයෙකු පිට කුරුසිය තැබූහ. ඔහු එය මාරක ස්ථානය වෙත ගෙන යන්ට විය. මේ තැනැත්තා යේසුස්වහන්සේගේ රහසිගත ගෝලයෙකුව සිටි කෙනෙකි. යේසුස්වහන්සේගේ ගෝලයන් කිහිප දෙනෙක් දුකෙන් වැලපෙමින් උන්වහන්සේ පසුපස ගමන් කළහ. ඉහත දිනක තාලපත්‍ර අත්වල ඇතිව තම වටිනා වස්ත්‍ර පාරේ එලමින් 'හෝසන්නා' කියා කෑගසමින් ජයාන්විත ලෙස යේසුස්වහන්සේ සමග යෙරුසලමට ගමන් කළ ආකාරය ඔවුන්ට මතක් විය. එම අවස්ථාවෙහි ඔවුන්ගේ සිත් තුළ වූයේ උන්වහන්සේ රාජ්‍යය ලබාගෙන ඊශ්‍රායෙල්වරුන් කෙරෙහි රජකම් කරනවා ඇත කියාය. කිනම් වෙනසක්ද, කුමන බලාපොරොත්තු කඩවීමක්ද! පහත් කරනු ලැබුවාවූ අගෞරවයට පත්කරනු ලැබුවාවූ මරණයට පත්කරනු ලබන්ට යන උන්වහන්සේ පසුපස ඔවුහු ගමන් කළහ.

යේසුස්වහන්සේගේ මවද ඒ අතර වූවාය. දයාබර මවකගේ සිතක ඇතිවිය හැකි දුක්බර වේදනා ඇගේ සිත වෙලාගෙන තිබිණ. තම පුත්‍රයා යම් පුදුම ක්‍රියාවක් මගින් සතුරන්ගෙන් ගැළවේය යන බලාපොරොත්තුවක් ඇගේ සිතෙහි විය. උන්වහන්සේ තමාව කුරුසියෙහි ඇණ ගැසීමට ඉඩ හරීවිද යන සිතුවිල්ල ඇයට දරාගත නොහැකි විය. නමුත් සියල්ල සූදානම් කර හමාරය. උන්වහන්සේව කුරුසිය මත දිගා කෙරිණ. ඇණ සහ මිටියද ගෙනෙන්ට යෙදින. ගෝලයන්ගේ සිත් ඔවුන් තුළ ක්ලාන්ත විය. කුරුසිය පිට අත් පා ඇණ ගැසීමට සූදානම් වන විට ඒ දෙස බලන්ට ඒ හඬ ඇසෙන්ට ඉඩ නොතබන පිණිස උන්වහන්සේගේ මෑණියන්ව ඈතට ඔසවා ගෙන ගියහ. ඇණ ගසන විට යේසුස්වහන්සේ දොස් කීවේ නැත. වේදනාවෙන් කෙඳිරි ගෑ සේක. උන්වහන්සේගේ මුහුණ සුදුමැලි විය. නළල මත මහත් දහදිය බිංදු මතුව පෙනෙන්ට විය. දේව පුත්‍රයාට අත්දකින්ට වූ මහත් දුක් වේදනා ගැන සාතන් මහත් සතුටට පත්විය. එහෙත් රාජ්‍යය තමාට අහිමි වන නිසාද මරණය තමාටද අත්වන්ට යන නිසාද ඔහු භයට පත්විය.

උන්වහන්සේව කුරුසියට තබා ඇණ ගැසූ පසු කුරුසිය ඔසවා ඔවුහු එය සඳහා සූදානම් කර තිබූ වළට මහත් තදින් හෙලූහ. එම කම්පනයෙන් උන්වහන්සේගේ මාංශය ඉරී යමින් ඉවසිය නොහැකි මහත් වේදනා ඇති කෙරිණ. උන්වහන්සේගේ මරණය ඔවුහු හැකි තරම් නින්දා සහගත බවට පත් කළහ. සොරුන් දෙදෙනෙකුද කුරුසිවල ඇණ ගසා දෙපැත්තේ සිට වූහ. සොරුන්ව ඇණ ගැසුවේ ඔවුන්ගේ මහත් විරුද්ධකම් මෙල්ල කරමින්ය. නමුත් යේසුස්වහන්සේ යටහත් පහත්ව සිටිමින් ඊට ඉඩ දුන්සේක. සොරු ශාප කරමින් බැණ වැදුන අතර යේසුස්වහන්සේ, 'පියාණෙනි මොවුන් නොදන කරන දේට සමාවුව මැනව' කියා වේදනා දරාගනිමින් ඔවුන් උදෙසා යාච්ඤා කළසේක. ලෝකවාසී සියල්ලන්ගේ පාප උන්වහන්සේ දරා සිටිසේක.

ක්‍රිස්තුස්වහන්සේ කුරුසියේ එල්ලී සිටි අතර ඒ ළඟින් ගිය සමහර අය හිස් වනමින් රජෙකුට මෙන් බොරුවට ආචාර කරමින් දේව මාළිගාව කඩා තුන් දවසකින් ගොඩ නගන බව කිවූ නුඹ නුඹව ගළවා ගනින්නැ' යි කීහ. 'නුඹ දෙවියන්වහන්සේගේ පුත්‍රයා නම් කුරුසියෙන් බැසපන්නැ'යි කීහ. පූජකයන් හා ලියන්නෝද 'ඔහු අනුන් ගැළෙව්වේය නමුත් තමාම ගළවාගන්ට නොහැකි' යයි පැවසූහ. 'නුඹ ඊශ්‍රායෙල්වරුන්ගේ රජ නම් දැන් කුරුසියෙන් බැසපන්න. එවිට අප විශ්වාස කරන්නෙමු' යයි ඔවුහු කියන්ට වූහ. කුරුසියට ඉහළ අහසේ සිට සිදුවන සියල්ල අසමින් බලමින් සිටි දේව දූතයෝ උන්වහන්සේව ගළවා ගන්නට කැමති වූහ. නමුත් ඊට අවසර නොලැබූහ. උන්වහන්සේ කරන්ට ආ මෙහෙය සම්පූර්ණ කරමින් සිටිසේක. උන්වහන්සේ තම මව් තුමියව අමතක කළේ නැත. මේ වන විට ඇය කුරුසිය ළඟට පැමිණ සිටියාය. හද පුපුරන වේදනාවෙන් සිටි ඇය දෙස මහත් දයාවෙන් උන්වහන්සේ බැලූ සේක. යොහන් ගෝලයා දෙස ද බලා මවට කථා කොට 'ස්ත්‍රිය, මේ නුඹේ පුත්‍රයා යයි ද යොහන් ගෝලයාට කථා කොට මේ නුඹේ මව' යයි කීසේක. ඒ පැයේ සිට යොහන් තුමා ඇයව තමාගේ නිවසට භාරගත්තේය.

යේසුස්වහන්සේට පිපාස විය. ඔවුහු උන්වහන්සේට තවත් අවමන් කරමින් කාඩි සහ විනාකිරි බොන්ට දුන්හ. තම ස්වාමින්වහන්සේට කරන නින්දා අපහාස දෙස තවදුරටත් බලා සිටිය නොහැකිවූ දේව දූතයන් තම අත්වලින් මුහුණු වසා ගත්හ. සූර්යයාද මෙම දර්ශනය බලන්ට නොකැමති විය. උන්වහන්සේට වධ හිංසා කළ මිනීමරුවන් බිය උපදවන මහත් හඬකින් යේසුස්වහන්සේ 'ඉතින් නිමයි' කියා හඬ නැගුසේක. දේව මාළිගාවේ තිරය උඩ සිට පහළට දෙකඩව ඉරුණේය. පොළොව කම්පා විය. පර්වත පැලුණේය. භූමිය මතු පිට මහත් අන්ධකාරයක් විය. යේසුස්වහන්සේ මැරුණ විට ගෝලයන් තුළ වූ අවසාන බලාපොරොත්තුවද අහෝසි විය. උන්වහන්සේගේ අනුගාමිකයන් බොහෝ දෙනෙක් මෙම සිදුවීම් සියල්ල බලා සිටි අතර ඔවුන්ගේ දුක් දැරීමේ කුසලාන පිරී ඉතිරී තිබිණ.

ඉහතදී කළාක් මෙන් දැන් සාතන් සතුටු වූයේ නැත. ගැළවීමේ සැලැස්ම කඩා බිඳ දැමීමට සාතන් බලාපොරොත්තු වූ නමුත් සඵල වූයේ නැත. එය ඉතාම ගැඹුරු ලෙස සැලසුම් කර තිබිණ. තමා මරණයට පත්වන බවත් යේසුස්වහන්සේට රාජ්‍යය භාරදෙනු ලබන බවත් සාතන් තේරුම් ගන්ට විය. ඔහු තමන්ගේ දූතයන් සමග රැස්වීමක් පැවැත්වූහ. දේව පුත්‍රයාණන්ට විරුද්ධව කළ අරගලය නිෂ්ප්‍රභා විය. දැන් ඔවුන්ගේ උත්සාහයන් බොහෝ සෙයින් වැඩි කරගෙන බලය සහ කපටිකම් ඇතිව උන්වහන්සේගේ ගෝලයන් වෙතට අරගලය දියත් කළ යුතුය. යේසුස්වහන්සේ මෙතරම් මිලයක් ගෙවා ලබා ගත් ගැළවීම ලබා ගැනීමෙන් ඔවුන්ව වළක්වා ලිය යුතුය. මෙසේ කිරීමෙන් දෙවියන්වහන්සේගේ රාජ්‍යය පාලනයට විරුද්ධව සාතන්ට තවදුරටත් ක්‍රියා කළ හැකිය. හැකි පමණ දෙනෙකුව යේසුස්වහන්සේගෙන් වෙන්කර තබාගැනීම තමාට වාසිදායක වනවාය. යේසුස්වහන්සේගේ ලේ කරණකොටගෙන ගළවනු ලැබූ අයගේ පාප අවසානයේදී පාපයේ නිෂ්පාදකයා වන තමා වෙතට හරවනු ලබන අතර උන්වහන්සේගේ ගැළවීම ලබා නොගත් අයට ඔවුන්ගේ පාපවල දඬුවම ඔවුන්ටම විඳින්ට සිදු වෙනවාය.

යේසුස්වහන්සේගේ ජීවිතය සුඛෝපභෝගී ප්‍රදර්ශනයෙන් හා ලෞකික අභිමානයෙන් තොරවූ ජීවිතයකි. උන්වහන්සේගේ නිහතමානී පරාර්ථකාමී ජීවිතය පූජකයන්ගේ ද පාලකයන්ගේ ද ජීවිත වලට සම්පූර්ණයෙන්ම ප්‍රති විරුද්ධව තිබූ අතර සැප පහසුවට සහ ලෝකයාගෙන් ගෞරවය ලබන්ට බලා සිටි ඔවුන් හට යේසුස්වහන්සේගේ නිර්මල ජීවිතය ඔවුන්ගේ පාප නිරන්තර දක්වාලීමක් විය. උන්වහන්සේට අවමන් කළ ඔවුහු යම් දිනක පියාණන්වහන්සේගේ මහිමයෙන් හා අභිමානයෙන් යුක්තවූ උන්වහන්සේව දකින්ට යෙදෙනවා ඇත. විනිශ්චය ශාලාවේදී සතුරෝ උන්වහන්සේව වටලාගෙන සිටියහ. ලේ පිපාසයෙන් සිටි ඔවුහු 'ඔහුගේ ලේ අප පිටත්, අපගේ දරුවන් පිටත් වේවා" කියා කෑගැසූහ. ගෞරව කරනු ලබන රජ කෙනක් ලෙස ඔවුහු උන්වහන්සේව නැවත දකිනවා ඇත. ස්වර්ගීය පිරිවර සමග උන්වහන්සේ නැවත බලයෙන් මහිමයෙන් දේව දූතයන්ගේ ගී නාද ඇතුව වඩිනවා ඇත. මළ නමුත් මරණය ජයගත් තැනැන්වහන්සේ ලෙස වඩිනවා ඔවුහු දකිනවා ඇත. දිළිඳු, දුර්වල මනුෂ්‍යයෝ කෲර මනුෂ්‍යයන්ගේ ජයඝෝෂා මධ්‍යයේ නින්දා අපහාස කරමින් මහිමවත් රජතුමාගේ මුහුණට කෙළ ගැසූහ. ස්වර්ගීයයන් ආශාවෙන් නරඹන්නාවූ ඒ මුහුණ ඔවුහු නැවත දකින්ට යෙදෙනවා ඇත. දහවල් සූර්යාලෝකය මෙන් බබළන ඒ මුහුණ ඉදිරියෙන් පලාගොස් සැඟවෙන්ට ඔවුන් සොයනවා ඇත. විලාප කියනවා ඇත. උන්වහන්සේ ඇණ ගසනු ලැබූ අත්වල ලකුණු පෙන්වනවා ඇත. එම ලකුණු සදාකාලයටම පවතිනවාය. අපගේ ගැළවීම සඳහා ගෙවූ, තක්සේරු කළ නොහැකි මිලයේ කථාන්තරය අපට කියනවා ඇත. උන්වහන්සේගේ ඇලයට ඇන්නාවූ හෙල්ල පහරේ කැළල ඔවුහු දකිනවා ඇත. හිසට ඉහළින් කුරුසිය මත වූ 'යුදාවරුන්ගේ රජය" යන ලියවිල්ල එදා දුටු විට උන්වහන්සේට අපහාස කළ අය, රාජකීය තත්ත්වයෙන් ගෞරවයට පත්කරනු ලැබ සිටිනවා ඔවුහු නැවත දකිනවා ඇත. මහිමාලංකාරයෙන් වැඩ සිටින උන්වහන්සේට 'ස්වාමින්ගේ නාමයෙන් එන තැනැත්තේ ආශිර්වාද ලද්දේ" යයි කියා පවසන්ට එදින ඔවුන්ගේ සිත් බලකරනවා ඇත.

භූමිය කම්පාවීම, පර්වත පුපුරා යාම, දේශය මත පැතිර පැවති අඳුර, 'ඉතින් නිමයි" කියා උන්වහන්සේගේ මුඛයෙන් නික්මුණු බලවත් හඬ, සතුරන්ව කරදරයට පත් කළහ. මිනීමරුවන්ගේ ඇඟපත වෙව්ලන්ට සැලැස්වූහ. උන්වහන්සේගේ ගෝලයන් මේ සිද්ධීන් අත්දකීමෙන් පුදුමයට පත්වූ නමුත්, ඔවුන්ගේ බලාපොරොත්තු සුන්වී තිබිණ. තමන්ටද මරණය අත්වේ යයි ඔවුහු භයට පත්ව සිටියහ. දේව පුත්‍රයාණන්ට විරුද්ධව ඔවුන් තුළ වූ වෛරය එතැනින් නතර නොවේ යයි ඔවුහු සිතූහ. මහත් බලාපොරොත්තු කඩවීමකට පත්ව සිටි ඔවුහු දුක් වේදනාවෙන් වැලපෙමින් යේසුස්වහන්සේ ඇත්තටම මෙසියස්වහන්සේද නැතහොත් අපව රැවටූ කෙනෙක්ද කියා සැක කරන්ටද වූහ. උන්වහන්සේගේ මවද වැලපෙමින් සිටි අතර ඇගේ විශ්වාසයද සෙලවීමකට භාජන වූවාය.

ගෝලයන්ගේ ඇදහිල්ලෙහි වැටීමක් සහ සැකයක් ඇතිවූ නමුත් උන්වහන්සේට ඔවුහු ආදරය කළහ. ගෞරවණීය භූමදානයක් කිරීමට අදහස් කළා. නමුත් මෘත දේහය ලබාගන්නේ කෙසේදැයි දැන සිටියේ නැහැ. අර්මේතියාවේ යෝශෙප් නමැත්තා ගෞරවයෙන් සලකනු ලැබූ කෙනෙකි. පාලකයන්ගේ හොඳ හිත දිනාගෙන සිටි අතර යේසුස්වහන්සේගේ සැබෑ ගෝලයෙක්ව සිටි කෙනෙකි. ඔහු රහසිගතව පිලාත් වෙතට ගොස් යේසුස්වහන්සේගේ ශරීරය ලබාගන්ට යෙදින. ඔහු ප්‍රසිද්ධියේ යන්ට නොකැමති වූයේ යේසුස්වහන්සේට ගෞරවයෙන් යුතු භූමදානයක් දීමට යුදාවරු විරුද්ධව ක්‍රියා කරාවි යන භයෙන්ය. පිලාත් කුරුසියෙන් ශරීරය පහතට ගන්ට ඔහුට අවසර දුණි. ශරීරය බිමට ගත් අතර ගෝලයන්ගේ දුක්වේදනා අතිශයින් වැඩි වන්නට විය. ශරීරය රෙදිවලින් ඔතා යෝශෙප් තමාගේම සොහොන් ගෙයිහි එය තැන්පත් කළේය.. උන්වහන්සේගේ නිහතමානී අනුගාමිකයන්ව සිටි ස්ත්‍රීහු උන්වහන්සේගේ ශරීරය සොහොන් ගෙයක තබා ගලකින් එය වසන තුරු උන්වහන්සේ වෙතින් අහක්ව ගියේ නැත. සතුරෝ ඇවිත් ශරීරය ගෙනයාවි යයි බියක්ද ඔවුන් තුළ තිබිණ. භයවන්නට හේතුවක් වූයේ නැත. මක්නිසාද කිව නොහැකි උනන්දුවකින් දේව දූත සේනාවන් ශරීරය තබා තිබූ ස්ථානය රැකවල් කරමින් සිටි බව මම දුටිමි. මහිමයේ රජතුමාව සිරමැදිරියක් වැනි සොහොන් ගෙයින් මුදාගැනීමට අණ ලැබෙන තුරු ඔවුහු බලා සිටියහ.

ක්‍රිස්තුස්වහන්සේව මරා දමූ ඝාතකයෝද යම් විධියකින් උන්වහන්සේ නැවත ජීවිතය ලැබ ගැළවී යාවි යන භයෙන් පසුවූහ. තුන්වන දින දක්වා සොහොන් ගෙය ආරක්ෂා කිරීමට භටයන් යොදවන ලෙස ඔවුහු පිලාත්ගෙන් ඉල්ලා සිටියහ. ගෝලයෝ රාත්‍රියේ ඇවිත් ශරීරය සොරාගෙන ගොස් උන්වහන්සේ මළවුන්ගෙන් නැගිට්ටේ යයි ප්‍රකාශ නොකරන පිණිස සොහොන් ගෙයි කටට මහත් ගලක් මුද්‍රා කර තැබූහ.

***කියවන්න: මතෙව් 21: 1-11: 27: 32-66; ශු. මාර්ක් 15: 21-47; ශු. ලූක් 23: 26-56; ශු. යොහන් 19: 17-42; එළිදරව් 19: 11-16.***

## *10 - වන පරිච්ඡේදය*

# ක්‍රිස්තුස්වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වීම

තම ස්වාමින්වහන්සේගේ මරණය ගැන දුක්වෙමින් ගෝල පිරිස සබත්දින නිවාඩු ගත්හ. මහිමවත් රජතුමා වන යේසුස්වහන්සේ සොහොන් ගෙය තුළ නිවාඩු ගත්සේක. රාත්‍රිය සෙමින් ගෙවී යන්ට විය. දේව පුත්‍රයාණන් සොහොන් ගෙයින් නිදහස ලබන වේලාවද ලංවෙමින් තිබිණ. සොහොන් ගෙයට ඉහළින් බලා සිටි දේව දූතයෝ විමසිලිමත්ව සිටියහ. ඔවුහු මෙසේ බලා සිටි අතර මහත් බලය ඇති දේව දූතයෙක් ස්වර්ගයෙන් බැස එනවා පෙනෙන්ට විය. ඔහුගේ මුහුණ විදුලි ආලෝකය මෙන්ද, ශරීරය හිම මෙන්ද පෙනෙන්ට විය. අඳුර පළවා හරිමින් මෙම දේව දූතයා පැමිණෙද්දී සාතන්ගේ දූත සේනාව වෙව්ලමින් පලා ගියහ. යේසුස්වහන්සේගේ දේහය තබා තිබූ සොහොන් ගෙය රැකවල් කරමින් සිටි දේව දූතයන්ද පැමිණ එම දේව දූතයාට එක්වී පහතට බසිනවා දුටිමි. බසිනවාත් සමගම එම ස්ථානය චලනය විය. මහත් බලය ඇතිව පැමිණි දේව දූතයා සොහොනේ කට වසා තිබූ විශාල ගල පැත්තකට පෙරළා හැර ඒ මත වාඩි විය.

රැකවලුන් කෙරෙහි මහත් භයක් පැමිණියේය. තමන්ගේ සේවා වගකීම ගැන හෝ ගෝලයෝ පැමිණ සිරුර සොරාගෙන යාම ගැන වූ භය හෝ ඔවුන්ට මතක් වූයේ නැත. සූර්යාලෝකය මෙන් බබළන දේව දූතයන්ගේ ආලෝකය දුටු ඔවුහු විශ්මයටද භයටද පත්වූහ. දේවදූතයන්ව දුටු ඔවුහු මළවුන් මෙන් බිම ඇද වැටිණ. ගල අහකට පෙරලූ දේව දූතයා බලවත් හඬකින් කථා කොට: 'දේව පුත්‍රයාණෙනි, ඔබගේ පියාණන්වහන්සේ ඔබට හඬ ගසනවා" යයි කීය. යේසුස්වහන්සේව නවතා තබාගැනීමට මරණයට නොහැකි විය. නැගිට සිටි උන්වහන්සේ වෙතට ගිය අනිත් දේව දූතයා මුහුණ බැඳ තිබූ රෙදිකඩ ඉවත් කෙරිණ. යේසුස්වහන්සේ ජයග්‍රාහී ලෙස පිටතට ආ සේක. පැමිණ සිටි දේව දූත සමූහයා බිම වැටී උන්වහන්සේට නමස්කාර කළෝය. සාතන්ට ජය අත් නොවීය. ඔහුගේ දූතයෝ දේව දූතයන්ගේ ආලෝකය ඉදිරියෙන් පලායන්ට වූහ. ඔවුහු තම අධිපතියාට පැමිණිලි කළේ තමන්ගේ ගොදුර බලහත්කාරයෙන් උදුරාගත් බවය. නොහොත් තමන් මෙතරම් වෛර කළ තැනැත්තා මළවුන්ගෙන් නැගිට සිටි බවය.

පාපයට වැටුණාවූ මනුෂ්‍යයන් කෙරෙහි වූ තම බලපෑම කරණකොටගෙන ජීවනයේ අධිපතියාව සොහොනක තැන්පත් කරන්ට හැකිවීම ගැන සාතන් සහ ඔහුගේ දූත කැල සුළු කාලයකට ජයග්‍රාහී ලෙස සතුටට පත්වූහ. එය පැවතියේ ටික කලකට පමණය. යේසුස්වහන්සේ මරණයෙන් ජයගෙන සොහොනෙන් පිටතට ආ නිසා තව ටික කලෙකින් තමා නසින්ට ඕනෑ බවද රාජ්‍යය සැබෑ අයිතිකරු වන උන්වහන්සේගේ අතට පත්වන බවද සාතන් දනගත් අතර මෙතරම් උත්සාහයකින් හා බලයකින් ක්‍රියා කළද යේසුස්වහන්සේව යටත් කරගන්ට නොහැකිවීම ගැන සහ මනුෂ්‍යයන්ට ගැළවීමේ මාර්ගය විවෘත කරදීම ගැන දරුණු ක්‍රෝධයකින් පෙලෙන්නට විය. කැමති ඕනෑම කෙනෙකුට ගැළවීමේ මාර්ගයෙහි ගමන් කළ හැකිය.

ටික කලක් කරදරයට හා දුකට පත්ව සිටි සාතන් මින් ඉදිරියට දෙවියන්වහන්සේගේ රාජ්‍යයට විරුද්ධව කළ යුතු දේ ගැන සැලසුම් කිරීමට තම දූත සේනාව කැඳවීය. 'නුඹලා ඉක්මණින් යන්ට ඕනෑ නායක පූජකයන් සහ වැඩි මහල්ලන් වෙතට. මුලදී ඔවුන් රවටන්ටත් සිත් අඳුරු කරන්ටත් අප සමත් වුණා. යේසුස්වහන්සේට විරුද්ධව ඔවුන්ගේ සිත් දරුණු කළා. වෛර කරන්ටත් මරන්ටත් සැලැස්සුවා. රෝම හේවායන් ප්‍රචාරය කරාවි උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටි බව. මෙය පැතිරිලා ගියොත් නිදොස් කෙනෙකු මැරූ වරදට සෙනඟ ඔවුන්ට ගල් ගසා මරන්ට තැත් කරාවි කියලා ඔවුන් ඉදිරියේ පෙන්වාපල්ලා." යනුවෙන් ඔවුන්ට කීවේය.

දේව දූතයන් ආපසු ස්වර්ගයට හැරී ගිය පසු රෝම හේවායෝ නැගිට අවට පරිසරය සෝදිසි කරනවා මම දුටිමි. සොහොන් ගෙය වසා තිබූ විශාල ගල අහකට පෙරළා තිබෙනවාත් යේසුස්වහන්සේගේ සිරුර සොහොන් ගෙය තුළ නැති බවත් දුටු විට ඔවුහු විශ්මයට පත්වූහ. හේවායන් ඉක්මණින් ගොස් යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටි පුදුම ප්‍රවෘත්තිය පූජකයන්ට පැවසූ විට ඔවුන්ගේ මුහුණු සුදුමැලි බවට පත්විය. ඔවුන් කළ දේ ගැන මහත් භීතියකින් ඔවුන්ගේ සිත් වෙලා ගැනිණ. ප්‍රවෘත්තිය සැබෑ නම් මරණය තමන් ඉදිරියේ බව දන එකිනෙකාගේ මුහුණු දෙස බලාගෙන නිහඬව සිටිමින් කුමක් කළ යුතු දැයි සිතන්ට වූහ. දේවදූතයාගේ පැමිණීමත්, විශ්මපත් ආලෝකයත්, යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටීමත් හේවායින් මූර්ඡා වී ඇද වැටීමත් නමැති ප්‍රවෘත්තිය පතල වී ගියහොත් තමන්ට මරණය නියත බව දන්නා ඔවුහු මෙම ප්‍රවෘත්තිය රහසක්ව

තබාගන්නා පිණිස හේවායන්ව මුදලට ගන්ට සිතූහ. හේවායන්ට ඔවුහු මුදල් දුන්හ. අප නිදා සිටියදී ගෝලයෝ පැමිණ යේසුස්වහන්සේගේ සිරුර ගෙන ගිය බව පවසන්ට කියා ඔවුන්ව කැමති කරගත්හ. රැකවල් කිරීමේදී නිදා සිටීමේ වරද ගැන හේවායන් පැවසූ විට, 'අපි ඒ ගැන ආණ්ඩුකාරයන් සමග කථා කර බේරා ගන්නෙමු' යයි ඔවුහු පොරොන්දු වූහ. මුදලට ආශා කළ හේවායෝ තම ගෞරවය මෙසේ විකුණා දමා පූජකයන්ගේ ඉල්ලීම ලෙස ක්‍රියා කළහ.

කුරුසිය මතදී යේසුස්වහන්සේ 'ඉතින් නිමයි' කියා හඬ නැගූ විට පොළොව කම්පා විය. පර්වත පැලී සමහර සොහොන් ගෙවල් විවෘත වූහ. උන්වහන්සේ ජයාන්විත ලෙස මළවුන්ගෙන් නැගිට සොහොන් ගෙයින් පිටතට පැමිණ හඬ නැගූ විට, ඒ අසා මළවුන්ගෙන් නැගිටි සොහොන් ගෙවල්වලින් පිටතට පැමිණි ශුද්ධවන්තයෝ යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිට බවට සාක්ෂි දැරූහ. සොහොන් ගෙවලින් මහිමයෙන් යුතුව නැගිට ආ එම ස්වල්ප දෙනා මැවීමේ සිට කුරුසිය දක්වා ජීවත්වූ ශුද්ධවන්තයන් අතරෙන් තෝරාගනු ලැබූ පුද්ගලයන් වූහ. මළවුන්ගෙන් නැගිටීම යටපත් කරන්ට පූජකයන් උත්සාහ කරද්දී, මහිමයෙන් යුතුව මළවුන්ගෙන් නැගිට යේසුස්වහන්සේ ගැන සාක්ෂි දරන්ට දෙවියන්වහන්සේ මෙලෙස කණ්ඩායම් සූදානම් කළසේක.

මළවුන්ගෙන් නැගිටිනු අය උස මහතින් එකිනෙකාට වෙනස්ව සිටියහ. ඔවුහු ශක්තියෙන් හීනවෙමින් පෙනුමෙන් දුබල වෙමින් සිටි බව කියාදෙන්ට යෙදින. රෝග සහ මරණයේ බලය සාතන් සතුව තිබිණ. යුගයෙන් යුගය ශාපය ක්‍රියාකාරීව තිබූ බව පැහැදිලිව පෙනෙන්ට තිබිණ. මළවුන්ගෙන් නැගිටුවනු ලැබූ අය අතරෙන් සමහරු පෙනුමෙන් අනිත් අයට වඩා ගෞරවාන්විත හැඩයෙන් යුක්ත වූහ. නෝවා සහ ආබ්‍රහම් ජීවත්වූ කාලයෙහි විසූ අය පෙනුමෙන්ද ශක්තියෙන්ද දේව දූතයන් මෙන් වූ බව මට දන්වීය. පරම්පරාවෙන් පරම්පරාවට රෝගවලට භාජන වීම හා දුර්වලවීම වැඩි විය. ජීවිත කාල ප්‍රමාණයද අඩු විය. මිනිස් ප්‍රජාව දුකට හා නොසන්සුන් බවටද ශක්තිය හීන වීමටද පත් කළ හැකි ක්‍රම සාතන් හදාරන්නට විය.

යේසුස්වහන්සේගේ නැගිටීමෙන් පසු නැගිට ආ ශුද්ධවන්ත අය බොහෝ දෙනෙකුට පෙනී සිටිමින් යේසුස්වහන්සේ ඔප්පු කළ පූජාව සම්පූර්ණ පූජාවක් බවත්, යුදාවරුන් විසින් කුරුසියක ඇණගසා මරා දමූ තැනැත්වහන්සේ මළවුන්ගෙන් නැගිටි බවත් තමන්ද උන්වහන්සේ විසින් නැගිටුවනු ලද බවත් පැවසූහ. සාතන්ට හෝ ඔහුගේ දූතයන්ටවත් නායක පූජකයන්ටවත් සත්‍යවූ පුදුම ප්‍රීතිමත් ආරංචිය සඟවා තබන්ට නොහැකි විය. යේසුස්වහන්සේද දුක් වේදනාවට පත්ව සිටි තම ගෝලයන්ට ප්‍රකාශ වී ඔවුන් තුළ වූ දුක නැතිකර ප්‍රීති සන්තෝෂය රජකරන්ට සැලැස්වූ සේක.

ආරංචිය ගමින් ගමට නගරයෙන් නගරයට ප්‍රකාශ වී යන අතර යුදාවරු තම ජීවිත ගැන භයට පත්වූහ. ගෝලයන් කෙරෙහි වූ ඔවුන්ගේ වෛරය සඟවා ගත්හ. ඔවුන්ගේ එකම බලාපොරොත්තුව වූයේ බොරුව ප්‍රචාරය කර හැරීමය. ඊට කැමතිව සිටි අය එය විශ්වාස කළහ. පිලාත් කම්පනයට පත්විය. මෙම බලවත් ප්‍රවෘත්තිය සහ තවත් අය මළවුන්ගෙන් නැගිටි බව ඔහු විශ්වාස කළේය. ඔහුගේ සිතෙන් සැනසීම පහ විය. තමා වරදට පත්කර මරණයට තීන්දු කළේ යහපත් සාමාන්‍ය මනුෂ්‍යයෙකුව නොව, තමා වරදකාරයෙකු බවට පත්ව සිටින්නේ දේව පුත්‍රයාණන්ගේ නිදොස් ලේ ගැන බව ඔහුට අවබෝධ විය. එතැන් සිට අවසානය දක්වාම පිලාත් ප්‍රීතියෙන් සන්තෝෂයෙන් තොර දුක්ඛිත තත්ත්වයක ජීවත්වී මරණයට පත්විය.

හෙරොද්ගේ සිත තද බවට පත්විය. යේසුස්වහන්සේ මරණයෙන් නැගිටි බව ආරංචි වූ නමුත් ඔහුගේ සිත එයින් කරදරයට පත් නොවීය. ඔහු යාකොබ් තුමාව මරණයට පත්කළ අතර යුදා සෙනඟ ඒ ගැන සතුටු වූ නිසා පේත්‍රුස්වද මරා දමන අදහසින් සිරභාරයට ගන්ට යෙදින. නමුත් පේත්‍රුස්ට දෙවියන්වහන්සේගෙන් වූ සේවයක් ඉටු කරන්නට තිබිණ. උන්වහන්සේ තමන් දූතයා එවා ඔහුව සිර ගෙදරින් මුදාගත් සේක. හෙරොද් වෙත දේව දඬුවම පැමුණුනේය. මහත් සමූහයක් ඉදිරියේ තමාව උසස් කරගනිමින් කථා කළ අවස්ථාවකදී දෙවියන්වහන්සේගෙන් පහර ලැබූ ඔහු වේදනාත්මක ලෙස මරණයට පත්විය.

හිමිදිරි පාන්දර බිමට එළිය වැටෙන්නටත් පෙර ශුද්ධ ස්ත්‍රීහු තමන් සූදානම් කර තිබූ සුවඳ ද්‍රව්‍යයද රැගෙන සොහොන් ගෙය වෙතට පැමිණියහ. යේසුස්වහන්සේගේ සිරුර එහි නොවූයෙන් ඔවුන්ගේ සිත් මහත් සාංකාවකට පත්වූහ. ඔවුහු සිතුවේ සතුරන් විසින් ශරීරය රැගෙන යන්ට ඇත කියාය. එවිට බලව, ආලෝකයෙන් බබළන සුදු ඇඳුමෙන් සැරසුන දේව දූතයන් දෙදෙනෙක් ඔවුන් ඉදිරියේ විය. උන්වහන්සේ මෙහි නැත. උන්වහන්සේ මළවුන් කෙරෙන් උත්ථාන වූසේක. උන්වහන්සේ නුඹලාට පළමුවෙන් ගලීලයට යන බව ගොස් ගෝලයන්ට කියන මෙන් ස්ත්‍රීන්ට අණ කෙරිණ. ස්ත්‍රීන්ගේ පණිවිඩය විශ්වාස කරන්ට නොකැමති වූ ගෝලයෝ ස්ත්‍රීන්ද කැටුව සොහොන් ගෙය ළඟට පැමිණියහ. ඇත්තටම යේසුස්වහන්සේ එහි නැති බව පිළිගත්හ. නමුත් මළවුන්ගෙන් නැගිටි බව විශ්වාස කරන්ට නොහැකි විය. ඇසූ දුටු දේවල් ගැන විශ්මයට පත්වෙමින් ඔවුහු නැවත නිවසට

පැමිණියහ. නමුත් මරියා තමා ඇසූ දුටු දේවල් ගැන සිතමින් තමා රැවටුණාදෝ යයි කියා තවදුරටත් තනිවම එහි රැඳෙන්නට වූවාය. නැවතත් ඇය බිමට නැමී සොහොන් ගෙය දෙස බැලූ විට සුදු වතින් සැරසුන දේව දූතයන් දෙදෙනෙකුව ඈ දුටුවාය. බබළන අලංකාර පෙනුමෙන් යුක්තවූ ඔවුහු එක්කෙනෙක් යේසුස්වහන්සේගේ හිස තැබූ තැනද අනිත් තැනැත්තා පාද තිබූ තැනද වාඩිවී සිටියහ. ඔවුහු මෘදු ලෙස කථාකොට ඇය හඬන හේතුව විමසූහ. ඇය පිළිතුරු දෙමින් 'මාගේ ස්වාමින්වහන්සේගේ සිරුර ඔවුහු ගෙන ගොස් කොතැන තැබුවාදැයි නොදන්න නිසා" යයි පැවසුවාය.

ඇය එතැනින් යන්ට හැරුණු විට යේසුස්වහන්සේ ඇය ළඟ සිටිනවා ඇය දුටුවාය. නමුත් ඇය උන්වහන්සේව හඳුනා ගත්තේ නැත. ඇයගේ හැඬීමට හේතුව සහ ඇය සොයන්නේ කාවදැයි උන්වහන්සේ ඇසූ සේක. ඒ උයන්ගොව්වා යයි සිතාගෙන 'සිරුර ගෙන ගොස් තැබුවේ කොතැනද මම එය ගෙන යමි"යි ඇය පැවසුවාය. යේසුස්වහන්සේ උන්වහන්සේගේම කටහඬින් 'මරියා" යයි ඇමතූ සේක. ඒ මිහිරි හඬ හඳුනාගත් ඇය 'ස්වාමිනී" යයි පැවසුවාය. ප්‍රීතියෙන් උන්වහන්සේ වැළඳ ගන්නට ඇය සැරසෙද්දී උන්වහන්සේ ඇය වළක්වා මට අත නොතබන්න. මම තවම පියාණන්වහන්සේ වෙතට නොනැග්ගෙමි. දැන් මාගේ සහෝදරයන් වෙතට ගොස් මාගේ පියාණන්වහන්සේද, නුඹලාගේ පියාණන්වහන්සේද මාගේ දෙවියන්වහන්සේද, නුඹලාගේ දෙවියන්වහන්සේද වෙතට යන බව කියාපන්නැ"යි කීසේක. මේ පණිවිඩය රැගෙන ප්‍රීතියෙන් ඇය ගෝලයන් වෙතට දුව ගියාය. යේසුස්වහන්සේද තම පියාණන් වහන්සේ වෙතට නැගී ගියසේක. තම පූජාව සහ අනිකුත් සියල්ල හොඳින් ඉටු කළ බව පියාණන් වහන්සේගේම මුඛයෙන් අසා ස්වර්ගයෙහිද පොළොවෙහිද සියලූ බලය ලබාගන්ට උන්වහන්සේ එහි ගියසේක.

මහත් වලාකුළක් මෙන් දේවදූත සමූහයක් දේව පුත්‍රයාණන්ව වටකර ගත්හ. මහිමයේ රජතුමා ඇතුළු වන පිණිස සදාකාල දොරටු විවෘත කරන ලෙස ඉල්ලූහ. යේසුස්වහන්සේ දේවදූතයන් සමග පියාණන්වහන්සේ ඉදිරියේ සිටි අතර ලෝකයේ සිටි උන්වහන්සේගේ ගෝලයන්ව අමතක කළේ නැත. ගෝලයන්ට දෙන පිණිස බලය ලබාගෙන එදිනම උන්වහන්සේ ආපසු ලෝකයට පැමිණි සේක. ගෝලයන්ට පෙනුණු සේක. තමන්වහන්සේට අත ගසන්ට ඔවුන්ට ඉඩ හැරිය සේක.

මේ අවස්ථාවේ තෝමස් ගෝලයා එහි සිටියේ නැත. අනික් ගෝලයන්ගේ වාර්තා ඔහු පිළිගත්තේ නැත. ඔහු තදින්ම කියා සිටියේ තමාගේ ඇඟිල්ල උන්වහන්සේගේ තුවාලවල දමා හෙල්ලයෙන් සිදුරු වූ තැන තමාගේ අත තබා බලන තුරු විශ්වාස නොකරන බවය. මෙසේ ඔහු සහෝදර ගෝලයන් කෙරෙහි විශ්වාසය තබන්ට නොකැමතිවූ බවක් පෙන්වීය. සියලූම දෙනා මෙවැනි සාක්ෂි බලාපොරොත්තු වුවහොත් ඇදහිල්ලට පැමිණිය හැක්කේ ඉතා ස්වල්ප දෙනෙකුට පමණය. නමුත් දේව කැමැත්ත වූයේ ගෝලයන්ගේ වාර්තා එක්කෙනෙකුගෙන් තව කෙනෙකුට වශයෙන් ව්‍යාප්ත වීමය. මේ ආකාරයෙන් සිදුවීම් ඇසූ දුටු අයගේ මුඛයෙන්ම පණිවිඩය ලබාගැනීමය. තෝමස්ගේ වැනි නොඇදහිල්ලට දෙවියන්වහන්සේ ප්‍රසන්න නොවූ සේක. යේසුස්වහන්සේ නැවත වරක් ගෝලයන් හමුවූ අවස්ථාවේ තෝමස් ද ඔවුන් අතරේ විය. දුටු විටම ඔහු උන්වහන්සේව විශ්වාස කළේය. ඔහු ඉල්ලා සිටි සාක්ෂිය උන්වහන්සේ ඔහුට දුන්සේක. තෝමස්ද 'මාගේ දෙවියනී, මාගේ දෙවියනී" කියා කෑගැසීය. තෝමස්ගේ නොඇදහිල්ල ගැන යේසුස්වහන්සේ ඔහුට දොස් තැබූ සේක. 'තෝමස්, නුඹ මා දුටු නිසා විශ්වාස කළෙහිය. නමුත් නොදැක විශ්වාස කරන්නාවූ අය භාග්‍යවන්තයෝ" යයි උන්වහන්සේ පැවසූ සේක.

මෙලෙසම පළමුවැනි හා දෙවෙනි දූතයන්ගේ පණිවිඩ ගැන අත්දැකීමක් නොලැබූ අය එම අත්දැකීම් ලබා ඉදිරියට පැමිණි අයගෙන් එම පණිවිඩ ලබාගත යුතු බව මම දුටුවෙමි. යේසුස්වහන්සේ කුරුසියෙහි ඇණ ගැසූ ලෙසම මෙම පණිවිඩද ඇණ ගසා ඇති බව මම දුටිමි. 'අපගේ ගැළවීම පිණිස දෙන ලද වෙන නාමයක් අහසින් යට නැත්තේ" යයි එදා ගෝලයින් ප්‍රකාශ කළ ලෙසට මෙකලද දේව සේවකයන් විසින් විශ්වාසවන්ත ලෙසද නිර්භයවද ප්‍රකාශ කළ යුතුවන්නේ තුන්වන දූතයාගේ පණිවිඩයෙන් කොටසක් පමණක් පිළිගෙන සිටින අය පළමුවන හා දෙවන දූතයන්ගේ පණිවිඩද දෙවියන්වහන්සේ දී තිබෙන ආකාරයෙන් පිළිගත යුතු බවය. නැතහොත් එහි කොටසක් ඔවුනට නොලැබෙන බවය.

ශුද්ධවන්ත ස්ත්‍රීහු 'යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිට්ටු සේක" යන ශුභාරංචි පණිවිඩය ප්‍රකාශ කළ අතර රෝම හේවායෝ නායක පූජකයන් විසින් තමන්ට ඉගැන්වූ පණිවිඩය එනම් තමන් නිදා සිටි අතර ගෝලයෝ ඇවිත් ශරීරය රැගෙන ගියාය යන කථාව පතුරුවමින් සිටි බව ස්වාමින්වහන්සේ මට පෙන්වූ සේක. මෙම මුසාව නායක පූජකයන්ගේ සිත්වලට ඇතුල් කර තිබුණේ සාතන් විසින්ය. සෙනඟද මෙම බොරුව විශ්වාස කිරීමට කැමතිව සිටියහ. නමුත් දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ගේ ගැළවීමට ඉතාම අවශ්‍ය මෙම සත්‍යතාවය වසා තබන්ට ඉඩ නොතබා කිසිවෙකුට

සැක සිතන්ට නොහැකි වන පිණිස සැබෑ සාක්ෂිකාරයන් සමූහයක් ක්‍රිස්තුස්වහන්සේ සමග මළවුන්ගෙන් නැගිටුවා වදාළ සේක.

යේසුස්වහන්සේ දින හතළිහක්ම ගෝලයන් සමග සිටිමින් ඔවුන්ට ප්‍රීතිය සතුට ගෙන දෙමින් වඩ වඩා පැහැදිලි ලෙස දේව රාජ්‍යයේ කාරණා ඔවුන්ට තෝරා පහදා දුන්සේක. උන්වහන්සේගේ දුක්විඳීම, මරණය සහ මළවුන්ගෙන් නැගිටීම ආදී වශයෙන් ඔවුන් ඇසුවාවූ දුටුවාවූ දේවල් ගැන සාක්ෂි දෙන්ටත් එම දේවල් ඇදහීම කරණකොටගෙන ගැළවීම ලබාගැනීමට මනුෂ්‍යයන්ට මගපෙන්වන්ටත් ඔවුන්ට කීසේක. සේවය කරන අතරේදී ඔවුන්ට පීඩා සහ කරදර ඇතිවන බවත් එවන් අවස්ථාවලදී උන්වහන්සේ කියාදුන් දේවල් නැවත මතක් කරගෙන සැනසීම ලබාගැනීමට අවවාද කළසේක. සාතන් විසින් තමන්වහන්සේ වෙත ගෙනෙන ලද සියලු පරීක්ෂාවන් ජයගත් බවත් ඔහුගේ පරීක්ෂාවන් දන් උන්වහන්සේ කෙරෙහි බලපවත් වන්නේ නැති බවත් මහත් බලයෙන් යුතුව පරීක්ෂාවන් ගෝලයන් වෙතට ගෙනෙන බවත් උන්වහන්සේ කෙරෙහි අදහන සැමදෙනා වෙත එම පරීක්ෂාවන් පැමිණෙන බවත් ඔවුන්ට ප්‍රකාශ කළසේක. උන්වහන්සේ ජයගත් ලෙස ඔවුන්ටත් ජයගත හැකි බව ඔවුන්ට කීසේක. යේසුස්වහන්සේ ගෝලයන්ට ප්‍රාතිහාර්යයන් කිරීමට බලය දුන්සේක. දුෂ්ට මනුෂ්‍යයන් ඔවුන්ට ශාරීරික වධහිංසා කිරීමට සැරසුණත් උන්වහන්සේ දේවදූතයන් එවා ඔවුන්ව මුදාගන්න බවත් ඔවුන්ගේ මෙහෙය නිමවන තුරු ජීවිත නැති කරන්ට ඉඩ නොදෙන බවත් කීසේක. සමහර විට සේවය සහතික කිරීමට දිවි පුදන්නටද සිදුවන බවද පැවසූ සේක. උන්වහන්සේ කී දේවලට ඔවුහු උනන්දුවෙන් සවන් දී සිටියහ. උන්වහන්සේගේ මුඛයෙන් නික්මුණු සෑම වචනයක්ම රසවත් වදනක් ලෙස ඔවුහු අගය කළහ. මේ වන විට උන්වහන්සේ සැබවින්ම ලෝකයාගේ ගැලවුම්කාරයාණන් බව ඔවුහු විශ්වාස කළහ. තමන් වෙතින් උන්වහන්සේ වෙන්වී යන්ට කාලය පැමිණ තිබෙන නිසාද ස්වර්ගීය ගුරුවරයාණන්ගේ ඉගැන්වීම් තවදුරටත් නොලැබෙන්ට යන නිසාද සැනසීමේ වදන් අසන්ට නොලැබෙන්නට යන නිසාද, ඔවුහු දුකට පත්ව සිටියහ. නමුත් උන්වහන්සේ දුන් පොරොන්දුව එනම් ශුද්ධාත්මයාණන් වන සැනසිලිකාරයාණන් වහන්සේව මුළු සත්‍යය කරා මගපෙන්වීමටද ඉගැන්වීමටද, සැනසීමටද එවන බව සහ ඔවුන් උදෙසා අලංකාර මාළිගා සූදානම් කරන බව සහ ඔවුන්ව කැඳවාගෙන යන්ට නැවත පැමිණෙන බවද ඇසූ විට ඔවුන්ගේ සිත් මහත් ප්‍රීතියෙන් ඉපිලෙන්නට වූහ. උන්වහන්සේ දෙඅත් ඔසවා ඔවුන්ට ආශිර්වාද කළසේක.

***කියවන්න:*** *1. එළිදරව් 14: 6-8 මෙම පොතෙහි පරිච්ඡේද 23, 24 හි විස්තර කර ඇත.*

*2. එළිදරව් 14: 9-12 මෙම පොතෙහි පරිච්ඡේද 28 හි විස්තර කර ඇත.*

*3. ශු. මතෙව් 27: 52-53 සහ 28 වෙනි පරිච්ඡේදය.*

*4. ශු මාර්ක් 16: 1-18 ශු. ලූක් 24: 1-50.*

*5. ශු යොහන් 20 වෙනි පරිච්ඡේදය සහ ක්‍රියා 12 වෙනි පරිච්ඡේදය..*

## *11 - පරිච්ඡේදය*

# ක්‍රිස්තුස්වහන්සේ ස්වර්ගයට යාම

ඊළඟට මට පෙන්වූයේ යේසුස්වහන්සේ ස්වර්ගයට නැගී යන අතර උන්වහන්සේ නොපෙනී යන තෙක්ම දුකින් පිරි හදවත්වලින් යුතුව එදෙස බලා සිටි ගෝලයන් හා එහි සිටි අනිකුත් අයවලුන්වය. සුදු වස්ත්‍ර හැඳ සිටි දේව දූතයන් දෙදෙනෙක් එවිට ඔවුන් ළඟ සිට 'ගලීලයේ මනුෂ්‍යයෙනි නුඹලා ස්වර්ගය දෙස බල බලා සිටින්නේ මක්නිසාද? 'නුඹලා වෙතින් ඔසවා ගනු ලැබූ මේ යේසුස්වහන්සේ ස්වර්ගයට යනවා නුඹලා දුටු ආකාරයෙන්ම එනවා ඇත'යි ඔවුන්ට කීවෝය. යේසුස්වහන්සේගේ මවද ගෝලයන් සමග මෙම දර්ශනය දුටුවාය. ඔවුහු උන්වහන්සේගේ පුදුම ක්‍රියා ගැනද පසුගිය කෙටි කාලය තුළ සිදුවූ විශ්මය ජනක දේ ගැනද කථා කරමින් මුළු රාත්‍රියම ගත කළහ.

ස්වර්ගීය සේනාවන් යේසුස්වහන්සේ පියාණන්වහන්සේ වෙත පැමිණෙන ජයග්‍රාහී වේලාව පැමිණෙන තුරු බලා සිටියහ. ස්වර්ගයට උන්වහන්සේව උත්සවාකාරයෙන් කැඳවා ගෙන යාමට දේව දූතයන් පැමිණ සිටියහ. උන්වහන්සේ අත් ඔසවා ආශිර්වාද කළ විට ගෝලයන් වෙතින් වෙන් කොට

ඔසවා ගනු ලැබූ සේක. දේව දූතයන් අතරට උන්වහන්සේ පිවිසෙන අතර උන්වහන්සේ විසින් මුදාගන්නා ලද මළවුන්ගෙන් නැගිට සිටි පිරිසද උන්වහන්සේ අනුවම දේව දූත සමූහයා අතරට පිවිසියහ. අහස් තරණය කළ මහත් සමූහයා ශුද්ධ නුවර වෙත සමීප වෙත්ම මහත් හඬින් ශබ්ද පවත්වා 'සදාකාල ද්වාරයෙනි, නුඹලාගේ හිස් ඔසවාපල්ලා, මහිමයේ රජතුමා ඇතුල් වන පිණිස නුඹලාගේ දොරටු විවෘත කරපල්ලා' යයි කෑගැසූහ. එවිටම යේසුස්වහන්සේගේ පැමිණීම බලාපොරොත්තුව සිටි අති විශාල දේවදූත කණ්ඩායම කෑගසමින් 'මේ මහිමයේ රජතුමා කවුද'යි ප්‍රශ්න කළහ. යේසුස්වහන්සේ පිරිවරාගෙන පැමිණෙන කණ්ඩායම ශබ්ද නගා 'බලවත් ශක්තිමත් ස්වාමීන්වහන්සේය, සටනෙහි බලසම්පන්න ස්වාමීන්වහන්සේය. නුඹලාගේ හිස් ඔසවාපල්ලා. සදාකාල ද්වාරයෙනි, විවෘත වෙයල්ලා. මහිමයේ රජතුමා ඇතුල් වන පිණිස විවෘත වෙයල්ලා' යයි පැවසූහ. යේසුස්වහන්සේ පිරිවරා ගෙන පැමිණි මහත් සමූහයා ශුද්ධ නුවරට ඇතුල් වූහ. දේව දූත සමූහයා තමන්ගේ අධිපතියාණන් වන දේව පුත්‍රයාණන්ව වටකර ගත්හ. මහත් ගාම්භීර නමස්කාරයෙන් යුතුව හිස් පහත් කොට තමන්ගේ දිළිසෙන ඔටුනු ගළවා උන්වහන්සේගේ දෙපා ළඟ තැබූහ. ඔවුහු තමන්ගේ රන් වීණා රැගෙන මිහිරි ශබ්දයෙන් හා ගී හඬින් මරනු ලැබූ නමුත් ජීවත්වන යේසුස්වහන්සේ ගැන ගී ප්‍රශංසාවෙන් මුළු ස්වර්ගයම පිරවූහ.

සාතන් තම දූතයන් සමග රැස්වීමක් පැවැත්වීය. දෙවියන්වහන්සේගේ රාජ්‍යය කෙරෙහි තද කෝපයෙන් කථා කරමින් තම බලය ලෝකයෙහි පවතින තාක් කල් යේසුස්වහන්සේගේ ගෝලයන්ට විරුද්ධව තම උත්සාහයන් දහ ගුණයකින් වැඩි කළ යුතු බව පැවසීය. අපට යේසුස්වහන්සේව අල්වා ගන්ට නොහැකි විය. නමුත් ගෝලයන්ට විරුද්ධව සෑම පරම්පරාවකම ඔවුන්ව පරීක්ෂාවන්ට හසුකර ගැනීමට ක්‍රියා කළ යුතුය. යක්ෂාත්ම දුරු කරන්ටත් ලෙඩුන් සුවපත් කරන්ටත් යේසුස්වහන්සේ තම ගෝලයන්ට බලය දුන් බව සාතන් තම දූතයන්ට පැවසීය. ඉන්පසු සාතන්ගේ දූතයෝ ගොරවන සිංහයන් මෙන් යේසුස්වහන්සේගේ අනුගාමිකයන් විනාශ කරන්ට සොයන පිණිස පිටත්ව ගියෝය.

*බලන්න: ගීතාවලිය 24: 7-10  සහ ක්‍රියා 1: 1-11.*

## *12 - පරිච්ඡේදය*

# යේසුස්වහන්සේගේ ගෝලයෝ

කුරුසියෙහි ඇණ ගසනු ලැබූ මළවුන්ගෙන් නැගිටි යේසුස්වහන්සේ ගැන ගෝලයෝ මහත් බලයෙන් යුතුව දේශනා කළෝය. ඔවුහු රෝගීන් සුව කළහ. සැමදා කොරව සිට සම්පූර්ණ සුවය ලැබූ මනුෂ්‍යයෙක් ඇවිදිමින්, පැන නගිමින්, ප්‍රශංසා කරමින් ගෝලයන් සමග දේව මාළිගාවට ඇතුල් විය. ආරංචිය පැතිර ගොස් බොහෝ සෙනඟ ගෝලයන් අවට රැස්වන්නට වූහ. බොහෝ දෙනා දුටුවිත් ලබාදී තිබූ සුවය ගැන මහත් සේ විශ්මයට පත්වූහ.

යේසුස්වහන්සේ මැරුණායින් පසු ප්‍රාතිහාර්යය නවතීවි. උනන්දු නැති වී, කැළඹීම් මැරී යාවි, සෙනඟද පරම්පරාගත නියෝග වෙතට නොහොත් පෙර තිබූ තත්ත්වයට හැරී ඒවි යයි පූජකයන්ගේ කල්පනාව විය. නමුත් බලව දන් ඔවුන් මධ්‍යයේම ගෝලයෝ හාස්කම් කරති. ජනතාව පුදුමයෙනුත් විශ්මයෙනුත් පිරී ගෝලයන් දෙස බලා සිටිති. ගෝල පිරිස මේ බලය ලබා තිබෙන්නේ කොහෙන්ද? යේසුස්වහන්සේ ජීවත්ව සිටියදී උන්වහන්සේ ඔවුන්ට බලය ලබා දුන් බව පූජකයෝ විශ්වාස කළහ. දන් යේසුස්වහන්සේ මැරිලාය. හාස්කම් නවතී යයි ඔවුහු බලාපොරොත්තු වූහ. සෙනඟ ව්‍යාකූලව සිටි බව දනගත් පේත්‍රුස්තුමා කථා කරමින් 'ඊශ්‍රායෙල්වරුනි, නුඹලා පුදුමව අප දෙස බලා සිටින්නේ මක්නිසාද? අපගේ ශුද්ධවන්තකමෙන් හෝ බලයෙන් මේ මනුෂ්‍යයාට ඇවිදින්ට අප සැලැස්වූ යයි සිතන නිසාද? ආබ්‍රහම්ගේද, ඊසාක්ගේද, යාකොබ්ගේද දෙවිවූ අපගේ පියවරුන්ගේ දෙවියන්වහන්සේ තමන් මෙහෙකරුවූ යේසුස්වහන්සේව ගෞරවයට පැමිණෙවූ සේක. නුඹලා උන්වහන්සේව පාවා දී, පිලාත් උන්වහන්සේව නිදහස් කරන්ට තීන්දු කරගෙන සිටි කළ ඔහු ඉදිරියේදී උන්වහන්සේව එපා කොට මිනීමරුවෙකුව නුඹලාට දෙන පිණිස ඉල්ලා ජීවනයේ අධිපතියාව මැරුවහුය. දෙවියන්වහන්සේ උන්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ සේක. අප ඊට සාක්ෂිකාරයෝය. උන්වහන්සේ කෙරෙහි වූ ඇදහිල්ල නිසා නුඹලා දන්නාවූ හඳුනන්නාවූ මේ මනුෂ්‍යයා සම්පූර්ණ සුවය ලැබුවේය' යි පේත්‍රුස් තුමා ඔවුන් ඉදිරියේ පැවසීය.

පූජකයන්ට හා වැඩි මහල්ලන්ට මෙය දරාගත නොහැකිව ගෝලයන්ව අල්ලා සිරගෙට දැමූහ. නමුත් ගෝලයන්ගෙන් එක් දේශනාවක් ඇසූ ජනයන් අතරෙන් යේසුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම හා ස්වර්ගයට යාම විශ්වාස කළ දහස් ගණනක් උන්වහන්සේව පිළිගත්හ. යේසුස්වහන්සේ

වෙතට සෙනඟ ඇදී යන නිසා උන්වහන්සේව මරා දැමූහ. නමුත් දැන් තත්ත්වය ඊට වඩා බරපතල වී ඇත. යේසුස්වහන්සේව මරා දැමීම ගැන ගෝලයන් දැන් ප්‍රසිද්ධියේම තමුන්ට දොස් පවරා ඇත. මෙම තත්ත්වය කෙතරම් දුරට වර්ධනය වේවිද, සෙනඟ තමන් ගැන කුමක් සිතාවිද, කියා ඔවුන්ට සිතාගන්ට නොහැකි විය. ගෝලයන්ව මරා දැමීමට ඔවුන්ට පුළුවන්කම තිබිණ. නමුත් ඔවුන් එසේ කළහොත් සෙනඟ ඔවුනට ගල් ගසනවා ඇත. ගෝලයන්ව මන්ත්‍රණ සභාව ඉදිරියට ගෙන්වූහ. ධර්මිෂ්ඨයාණන්ගේ ලේ වගුරුවන්ට ඉල්ලූ අය එහි වූහ. යේසුස්වහන්සේව නාඳුනන බව කීවාවූ පේත්‍රුස්ගේ බියගුළුකම ගැන ඔවුහු අසා තිබිණ. පේත්‍රුස්ව තර්ජනය කර බිය ගන්වා සේවය නතර කරවන්ට ඔවුහු සිතූහ. නමුත් පේත්‍රුස් දැන් හැරුණාවූ ගෝලයෙක්ය. වරක් ඔහු උන්වහන්සේව නොහඳුනන බව දිවුරමින් කියා සිටියේය. දැන් ඔහුට තමා කළ වරද හරිගස්සා ගැනීමට අවස්ථාව පැමිණ ඇත. ශුද්ධාත්මයාණන් කරණකොටගෙන ශුද්ධවූ නිර්භීතකමකින් කථා කර පේත්‍රුස් මෙසේ පැවසීය. 'නුඹලා විසින් කුරුසියේ ඇණ ගසා මැරුවාවූ දෙවියන්වහන්සේ විසින් මළවුන්ගෙන් නැගිටුවා වදාළ නාසරෙත්හි යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් නුඹලා ඉදිරියෙහි සිටින මේ මනුෂ්‍යයා සුවපත්ව සිටි යයිද, ගෙවල් සාදන්නන් වන නුඹලා විසින් එපා කළ ගල දෙවියන්වහන්සේ විසින් කොනේ ප්‍රධාන ගල කරනු ලැබූ බවද, අපේ ගැළවීම පිණිස අවශ්‍ය වූ මනුෂ්‍යයන් අතරේ දෙන ලද වෙන නාමයක් ස්වර්ගයෙන් යට නැත්තේය" යිද කීවේය.

පේත්‍රුස්ගේද, යොහන්ගේද නිර්භීතකම ගැන එහි සිටි අය පුදුමයට පත් වූහ. ඔවුන් යේසුස්වහන්සේ සමග සිටි බව ඔවුහු හැඳින ගත්තෝය. යේසුස්වහන්සේ මිනීමරුවන් ඉදිරියේ හැසිරුණු ආකාරයට ගෝලයන් හැසිරුණු ආකාරය සමාන බව ඔවුහු දුටුවෝය. යේසුස්වහන්සේ එදා එක අනුකම්පාවේ බැල්මකින් පේත්‍රුස්ගේ හැඟීම් වෙනස් කළසේක.. දැන් ඔහු යේසුස්වහන්සේ තම ස්වාමින්වහන්සේ ලෙස ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේය. එවිට ස්වාමින්වහන්සේ පේත්‍රුස්ව පිළිගෙන ආශිර්වාද කළසේක. එහි ප්‍රතිඵලයක් ලෙස පේත්‍රුස් ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ විය.

නායක පූජකයෝ තමන් තුළ වූ ක්‍රෝධය පෙනෙන්ට ඉඩ හරින්ට භය වූහ. ටික වේලාවකට මන්ත්‍රණ සභාවෙන් පිටවෙන්ට ඔවුන්ට අණ කළහ. පසුව ඔවුහු 'මේ මනුෂ්‍යයන්ට කුමක් කරමුද" ඔවුන් කරණකොටගෙන මහත් හාස්කමක් සිදුවී තිබෙන බව යෙරුසලමේ වසන හැමදෙනාම දැනගෙන ඇත. අපට එය නැතැයි කිව නොහැකිය. මෙය තවදුරටත් පැතිරෙන්නට දිය නොහැකිය. එසේ වුවහොත් අපට බලය අහිමි වී යනවා පමණක් නොව, යේසුස්වහන්සේව මරා දැමූ මිනීමරුවන් ලෙස අප දෙස ඔවුන් බලනවා ඇත." යනුවෙන් සාකච්ඡා කොට නැවත ගෝලයන්ව මන්ත්‍රණ සභාව වෙත ගෙන්වා මේ නාමයෙන් තවදුරටත් කථා නොකරන ලෙස ඔවුන්ට තර්ජනය කළහ. නමුත් පේත්‍රුස් භය නැතිව කථා කොට, 'අප ඇසූ දුටු දේ ගැන කථා නොකර සිටින්ට අපට නොහැකිය" යි පැවසීය.

තමන් වෙතට ගෙනෙනු ලැබූ නොයෙක් රෝගීන් ගෝලයෝ යේසුස්වහන්සේගේ නාමයෙන් සුවපත් කළහ. නායක පූජකයන් සහ වැඩි මහල්ලන්ද ඔවුන්ට සම්බන්ධව සිටි තවත් අයද භයට පත්වූහ. දිනපතා සිය ගණන් ජනයා මළවුන්ගෙන් නැගිටි, ස්වර්ගයට වැඩම කළ, යේසුස්වහන්සේගේ ධජය යටතට පැමිණෙන්ට පටන් ගත්හ. ඔවුහු ගෝලයන්ව සිරගත කර ඔවුන්ගේ උනන්දුව නැති වේ යයි බලා සිටියහ. සාතන් ජයග්‍රාහී බවට පත්විය. ඔහුගේ දූතයන් ප්‍රමෝදයට පත්වූහ. නමුත් දෙවියන්වහන්සේ තම දූතයන් එවා සිරගෙයින් ඔවුන් මුදවාගෙන නැවත දේව මාළිගාවට ගොස් මේ ජීවනයේ වචන ප්‍රකාශ කරන්ට ගෝලයන්ට පැවසූ සේක. පසුවදා උදේ මන්ත්‍රණ සභාව රැස්ව සිරකරුවන් ගෙන එන්ට සේවකයින් යැවූහ. ඔවුහු දොරවල් හැර බැලූ විට එහි කිසිවෙක් සම්භ නොවීය. ඔවුහු ආපසු ඇවිත් තමන් යැවූ අයට දැන්වූයේ සිරගෙදර දොරවල් ප්‍රවේශම් සහිතව වසා තිබූ බවත් මුරකරුවන් දොරවල් ළඟ රැකවල් කරමින් සිටි බවත් නමුත් සිරගෙය තුළ කිසිවෙක් නොවූ බවත්ය. එවිටම තවත් කෙනෙක් පැමිණ 'බලාපල්ලා නුඹලා සිරගෙදර දැමූ අය දේව මාළිගාවෙහි සෙනඟට උගන්වමින් සිටිති"යි කීවේය.

මෙම අධිපතියා සේවකයන් සමග ගොස් බලහත්කාර නොකර ඔවුන් ගෙනාවෝය. මක්නිසාද සෙනඟ ගල් ගසිතියි ඔවුහු භය වූවෝය. උත්තම පූජකයා කථා කොට 'මේ නාමයෙන් නූගන්වන්ට නුඹලාට තදින් අණ කළෙමුව. එහෙත් නුඹලා නුඹලාගේ ඉගැන්වීමෙන් යෙරුසලම පුරවා, ඒ මනුෂ්‍යයාගේ ලේ අප පිට පමුණුවන්ට හදනවා" යයි ඔවුන්ට කීවේය. ඔව්හු එදා තදින් කෑගසමින් 'ඔහුගේ ලේ අප පිටත්, අපගේ දරුවන් පිටත් වේවා" යයි ඉල්ලා සිටි නමුත් දැන් උන්වහන්සේගේ ලේ තමන් පිටට පැමිණෙනවාට කැමති වූයේ නැත. ඔවුහු වංචාකාරයෝය. දෙවියන්වහන්සේට ප්‍රේම කරනවාට වඩා මනුෂ්‍යයන්ගේ ප්‍රශංසාව ලබන්ට කැමතිව සිටි අයවලූන්ය.

අපෝස්තුළුවරු භය නැතිව ප්‍රකාශ කළේ ඔවුන් විසින් මනුෂ්‍යයන්ට වඩා දෙවියන්වහන්සේට කීකරු විය යුතු බවය. අපගේ පියවරුන්ගේ දෙවියන්වහන්සේ නුඹලා විසින් කුරුසියක එල්ලා මැරූ යේසුස්වහන්සේව නැගිටුවා වදාළ සේක. උන්වහන්සේ ඊශ්‍රායෙල්වරුන්ට පසුතැවිල්ලත් පව්කමාවත් ලබාදෙන පිණිස අධිපතියෙක්ද ගැළවුම්කාරයෙක්ද කොට දෙවියන්වහන්සේ දකුණතින් ඔසවා තැබූ

සේක. අප මේ දේවල් ගැන උන්වහන්සේගේ සාක්ෂිකාරයෝය. තමන්ට කීකරු වන අයට දෙවියන්වහන්සේ දුන්නාවූ ශුද්ධාත්මයාණන් වහන්සේද සාක්ෂිකාරයෙකැයි ඔවුහු කීවෝය. මේ වචනවලට සවන් දුන් මිනීමරුවෝ කෝපාවිෂ්ට වූහ. ඔවුන්ගේ අත් අපෝස්තුළුවරුන්ගේ ලෙයින් තවරාගන්ට සිතූහ. මොවුන් ඒ දේ කරන්ට සැලසුම් කළ අතර ගමාලියෙල් නමැත්තා වෙතට දෙවියන්වහන්සේ දූතයෙක් යැවූසේක. පූජකයන්ට අවවාද කරන පිණිස දේව දූතයා ගමාලියෙල්ගේ සිත මෙහෙයවන්ට විය. ගමාලියෙල් කථා කර, 'ඊශ්‍රායෙල්වරුනි, නුඹලා මේ මනුෂ්‍යයන්ට කරන්නට යන කාරණාවල් ගැන ප්‍රවේශම් වෙයල්ලා . . . . මක්නිසාද මේ මන්ත්‍රණය හෝ ක්‍රියාව මනුෂ්‍යයන්ගෙන් වී නම්, ඒක පෙරළා දමනු ලබන්නේය. නමුත් ඒක දෙවියන්වහන්සේගෙන් වී නම්, ඔවුන් පරාජය කරන්ට නුඹලාට බැරිය; එසේ උත්සාහ කළහොත් සමහර විට නුඹලා දෙවියන්වහන්සේට විරුද්ධව පවා යුද්ධ කරන්නහු වන්ට පුළුවනැ'යි කීවේය. මෙසේ අපෝස්තුළුවරුන් වෙනුවෙන් හඬක් නගන්නට ගමාලියෙල් තුළින් දෙවියන්වහන්සේ ක්‍රියා කළසේක.

අපෝස්තුළුවරුන් තමන් ඇසූ දුටු දේ ගැන යේසුස්වහන්සේගේ නාමයෙන් සාක්ෂි දරන පිණිස රජවරුන් ඉදිරියට පමුණුවනු ලැබිය යුතුව තිබිණ. පූජකයෝ අපෝස්තුළුවරුන්ට තළා, යේසුස්වහන්සේගේ නාමයෙන් කථා නොකරන ලෙස අණකොට යන්ට හැරියෝය. යේසුස්වහන්සේගේ නාමය නිසා දුක්විඳින්ට සිදුවීම ගැන ඔවුහු දෙවියන්වහන්සේට ප්‍රශංසා කළෝය. ඔවුහු දේව මාළිගාවෙහිදී ද, තමන්ව කැඳවනු ලැබූ නිවෙස්වලද දේශනා කළෝය. දේව වචනය වර්ධනය වෙමින් බලවත් විය. සාතන් යේසුස්වහන්සේගේ මළවුන්ගෙන් උත්ථාන වීම සඟවන්ට උත්සාහ කළ නමුත් ඊට තුඩුදෙන සාක්ෂි ඔවුන් අවට බොහෝ සෙයින් පෙනෙන්ට විය. ගෝලයෝ භය නැතිව එය ප්‍රකාශ කළ අතර බලවත් හාස්කම්ද යේසුස්වහන්සේගේ නාමයෙන් සිදු කළහ.

සෑම පරම්පරාවක් ඔස්සේම ශුද්ධ වූ වැදගත් සත්‍යතාවයන්, නැංගුරමක් ලෙස දෙවියන්වහන්සේගේ ගෝලයන් උදෙසා සේවය කරන පිණිස, විශේෂ ආරක්ෂාවත් සැලකිල්ලත් දක්වීමට දේව දූතයන්ට භාර කළ බව මම දුටිමි.

ඊශ්‍රායෙල්වරුන්ගේ බලාපොරොත්තුව සඳහා යේසුස්වහන්සේ ගැන සාක්ෂි දරන, උන්වහන්සේගේ කුරුසපත් වීම, මළවුන්ගෙන් නැගිටීම සහ ස්වර්ගයට යාම වැනි වැදගත් සත්‍යතාවන් උගන්වන අපෝස්තුළුවරුන් කෙරෙහි විශේෂයෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ පහළ වූසේක. සියලු දෙනාම තමන්ගේ එකම බලාපොරොත්තුව ලෙස ගැළවුම්කාරයාණන් දෙස බලා තමන් මරණය කරණකොටගෙන විවෘත කළාවූ මාර්ගයෙහි ගමන් කරමින් දෙවියන්වහන්සේගේ ආඥාවන් අනුව ජීවත් විය යුතුය. යුදාවරු, යේසුස්වහන්සේට වෛර කරන්ට හා මරන්ට හේතුව වූ උන්වහන්සේ ඉටු කළ සේවය ඉටු කිරීමට ගෝලයන්ට පැවරීමේ තිබෙන ප්‍රඥාවන්තකම හා යහපත්කම මම දුටිමි. සාතන්ගේ ක්‍රියා විනාශ කරන පිණිස උන්වහන්සේ ඔවුන්ට බලය දුන්සේක. නින්දා අපහාස කරනු ලැබූ දුෂ්ට අත්වලින් මරණයට පත් කළ විට සහ මළවුන්ගෙන් නැගිටි විට උන්වහන්සේගේ හිස වටා ආලෝක රශ්මි කවයක් දිස් වූයේ උන්වහන්සේ ලෝකයේ ගැළවුම්කාරයාණන් වහන්සේය යන සත්‍යතාවය අමරණීය බවට පත්කිරීමටය.

*ක්‍රියා 3, 4, 5 පරිච්ඡේද කියවා බලන්න.*

## *13 - පරිච්ඡේදය*

# ස්තේපන්ගේ මරණය

ගෝලයන්ගේ ගණන යෙරුසලමෙහි අතිශයින් වැඩි විය. දේව වචනය බොහෝ සේ වර්ධනය වී පූජකයෝ බොහෝ දෙනෙක්ද ඇදහිල්ලට කීකරු වූහ. ස්තේපන් ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව මනුෂ්‍යයන් අතරේ පුදුමද, හාස්කම්ද කරන්ට විය. බොහෝ අය ක්‍රෝධයට පත්වූයේ පූජකයෝ පරම්පරාගත ඉගැන්වීම්ද, පුද පූජාද අත්හැර දමා උතුම් ම පූජාව වූ යේසුස්වහන්සේව පිළිගත් නිසාය. ස්තේපන් ගෝලයා ස්වර්ගයෙන් ලැබූ බලය කරණකොටගෙන පූජකයන්ගේද, වැඩිමල්ලන්ගේද වැරදි පෙන්වා දෙමින් යේසුස්වහන්සේව ඔසවා තබන්නට විය. ස්තේපන්ගේ ප්‍රඥාවද ඔහු කථා කළ දේව වචනයද ඉදිරියේ සිටින්ට ඔවුන්ට නොහැකිවූ නිසා මෝසෙස්ටද, දෙවියන්වහන්සේටද ඔහු අපහාස කරනවා යයි ඔහුට විරුද්ධව බොරුවෙන් දිවුරන්නට මිනිසුන් පොළඹවා ගත්හ. ඔවුහු ජනතාව පොළඹවා ස්තේපන්ව අල්ලා ගෙන ගොස් දේව මාළිගාවටද, ව්‍යවස්ථාවටද විරුද්ධව කථා කරනවා ඇසූ බව කියන්ට බොරු සාක්ෂිකාරයන් කුලියට ගත්හ. නාසරීය යේසුස් දේව මාළිගාව කඩා දමන බවද මෝසෙස් දුන් චාරිත්‍ර වෙනස් කරන බවද ස්තේපන් කීවේ යයි ඔවුන් බොරුවෙන් පැවසූහ.

ස්තේපන්ට විරුද්ධව විනිශ්චයෙහි යෙදී සිටි සියල්ලෝම දෙවියන්වහන්සේගේ මහිමයේ ආලෝකය ඔහුගේ මුහුණෙහි බබළනවා දුටුවෝය. දේව දූතයෙකුගේ මෙන් ඔහුගේ මුහුණෙහි ආලෝකයක් විය. ඔහු ඇදහිල්ලෙන්ද ශුද්ධාත්මයාණන්ගෙන්ද පිරී නැගිට සිට අනාගතවක්තෘවරුන්ගෙන් පටන් ගෙන ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම, කුරුසපත් වීම, මළවුන්ගෙන් නැගිටීම, ස්වර්ගයට ඔසවා ගැනීම දක්වාම කරුණු කියාදී මනුෂ්‍ය අත්වලින් සාදන ලද දේව මාළිගාවල දෙවියන්වහන්සේ වාසය නොකරන බවද ඔවුන් ඉදිරියේ පැවසීය. ඔවුහු නමස්කාර කළේ දේව මාළිගාවටය. දෙවියන්වහන්සේට නොව දේව මාළිගාවට විරුද්ධව යමෙක් කථා කළහොත් ඔවුහු මහත් සේ කෝපයට පත්වූහ. ස්තේපන් ස්වර්ගීය වේදනාවකින් පෙළඹී ඔවුන්ගේ සිත්වල අචර්මඡේදයනට හා දුෂ්ටකම් වලට එරෙහිව කෑගැසීය. 'නුඹලා නිතරම ශුද්ධාත්මයාණන් වහන්සේට විරුද්ධව ක්‍රියා කරතියි පැවසීය. ඔවුහු පිටාස්තරික චාරිත්‍ර පැවැත්වූහ. ඔවුන්ගේ සිත් දූෂිතව දුෂ්ට අපවිත්‍රතාවන්ගෙන් පිරී තිබිණ. නුඹලාගේ පියවරු අනාගතවක්තෘවරුන්ට පීඩා කළහුය. ධර්මිෂ්ඨයාණන්ගේ පැමිණීම ප්‍රකාශ කළ අයව මැරුවහුය. දැන් නුඹලා උන්වහන්සේව පාවා දෙන්නන්ද මරන්නන්ද වී සිටින්නහු' යයි ඔවුන්ගේ වරද පෙන්වා දුන්හ.

නායක පූජකයන්ද, පාලකයන්ද මේ වචන ඇසූ විට ක්‍රෝධයෙන් පිරී ඔහු වෙතට දුව ආහ. ස්තේපන් වෙත ස්වර්ගීය ආලෝකයක් පතිත විය. ඔහු ස්වර්ගය දෙස බැලූ විට දෙවියන්වහන්සේගේ මහිමයේ දර්ශනයක් ඔහුට දෙන්ට යෙදින. දේව දූතයන් ඔහුට ඉහළින් අහසේ නැවතී බලා සිටියහ. 'බලව, ස්වර්ගය විවෘතව තිබෙනවාත් මනුෂ්‍ය පුත්‍රයා දෙවියන්වහන්සේගේ දකුණු පැත්තේ නැගිට සිටිනවාත් මට පෙනේ' යයි මහත් හඬකින් කෑගැසීය. නමුත් ඔවුහු එම වචන නොඇසෙන ලෙස කන් වසාගෙන එක්සිත්ව ඔහු වෙතට දුවැවිත්, නුවරින් පිටතට ඔහුව ඇදගෙන ගොස් ඔහුට ගල් ගැසූහ. ස්තේපන් දණින් වැටී 'ස්වාමීන්වහන්ස, මේ පාපය ඔවුන් පිට නොතැබුව මැනවැ' යි මහත් හඬින් මොර ගසා කීවේය.

දෙවියන්වහන්සේගේ බලවත් මනුෂ්‍යයෙක් වූ ස්තේපන්ව සභාවේ වැදගත් ස්ථානයක් පුරවන පිණිස නගා සිටුවන ලද කෙනෙක් බව මම දුටිමි. ගෝලයන්ට ඔහුගේ මරණය නිසා මහත් පාඩුවක් දනෙන්නට යන බැවින් සාතන් මහත් සේ සන්තෝෂයට පත්විය. නමුත් එය කෙටි කාලීන සතුටක් විය. මක්නිසාද සෙත්පන්ගේ මරණය දර්ශනය කරමින් කෙනෙක් එතැන සිටි අතර යේසුස්වහන්සේ පුද්ගලිකව ඔහුට දර්ශනය වන්නට බලා සිටිසේක. එම පුද්ගලයා ස්තේපන්ට ගල් නොගැසූ නමුත් ඔහුගේ මරණය ගැන සහය දුන් කෙනෙක්ය. සාවුල් දෙවියන්වහන්සේගේ සභාවට පීඩා කරමින් නිවෙස්වලින් මිනිසුන් ඇදගෙන විත් මරන්ට භාරදුන් කෙනෙකි. සාතන් ඔහුව ප්‍රයෝජනවත් ලෙස යොදා ගෙන තිබිණ. නමුත් දෙවියන්වහන්සේට සාතන්ගේ බැමි කඩා දමන්ට පිළිවන. වහලුන් ලෙස සිටින්නන් මුදා හරින්නට පිළිවන. සාවුල් උගත් කෙනෙක් වූ අතර සාතන් ඔහුගේ දක්ෂකම් සහ තලෙන්ත දේව පුත්‍රයාට විරුද්ධව කැරැල්ල ගෙන යාමට තමාගේ ප්‍රයෝජනයට යොදාගෙන තිබිණ. නමුත් යේසුස්වහන්සේ තමන්ගේ නාමයෙන් දේශනා කරන්ටත්, ගෝලයන්ව ශක්තිමත් කරන්ටත්, ස්තේපන්ගේ මරණයෙන් හිස් වූ තැන පුරවන්ටත් සාවුල්ව තෝරාගත් සේක. යුදාවරු සාවුල්ව උසස් කොට සැලකූහ. ඔහුගේ උනන්දුවද උගත්කමද ගැන සතුටට පත්ව සිටියහ. ගෝලයෝ භයට පත්ව සිටියහ.

***ක්‍රියා පොතේ 6, 7 පරිච්ඡේදයන් කියවන්න.***

## *14 - පරිච්ඡේදය*

# සාවුල්ගේ හැරීම

යේසුස්වහන්සේ ගැන දේශනා කරන පිරිමින් හෝ ගැහැණුන් අත්අඩංගුවට ගෙන යෙරුසලමට ගෙන එන පිණිස බලධාරීන්ගේ ලියුම්ද ඇතිව දමස්කයට ගමන් කරමින් සිටියදී ඔහු අවට ගමන් කළ සාතන්ගේ දූතයෝද මහත් ප්‍රීතියට පත්වූහ. දමස්කයේ නගර දොරටුවට සමීප වෙත්ම හදිසියේ මහත් ආලෝකයක් ඔහු වෙතට යොමු විය. දුෂ්ට දූතයෝ ඔහු වෙතින් පලා ගියහ. සාවුල්ද නිමේෂයකින් බිමට ඇද වැටිණ. 'සාවුල්, සාවුල්, නුඹ මට පීඩා කරන්නේ මක්නිසාද?' යන හඬක් ඔහුට ඇසිණ. 'ඔබ කව්ද ස්වාමීනී' යයි සාවුල් ප්‍රශ්න කළේය. 'පීඩාකරනු ලබන මම නාසරීය යේසුස්ය. කෙවිටට පයින් ගැසීම නුඹට අමාරු දෙයකි.' සාවුල් පුදුමයට පත්ව වෙව්ලමින් 'ස්වාමීනී, ඔබ මට කරන්න කියන්නේ කුමක්ද'යි ඇසීය. 'නැගිට නගරයට ඇතුල් වෙයන්න, නුඹ කුමක් කටයුතුදැයි එහිදී නුඹට කියාදෙන්ට යෙදෙනවා ඇත.'

සාවුල් සමග පැමිණි අනෙක් අය පෙනෙන්ට මනුෂ්‍යයෙක් නැතිව පැමිණි ඒ හඬ ශබ්දය අසා කිසිවක් කථා කරගත නොහැකිව සිටියහ. ආලෝකය නිවී ගිය පසු සාවුල් නැගිට අවට බැලීය. නමුත් ඔහුට කිසිවක් පෙනුණේ නැත. ස්වර්ගයෙන් වූ ආලෝකය ඔහුගේ ඇස් අන්ධ කෙළ්ය. ඔහුට කිසිවක් පෙනුණේ නැත. කෙනෙක් ඔහුගේ අත අල්ලා ගෙන ඔහුව නගරය වෙත කැඳවාගෙන ආවේය. සාවුල් දින තුනක් අන්ධව කෑමත් බීමත් නැතිව එහි සිටියේය. සාවුල් විසින් අත්අඩංගුවට ගනු ලැබීමට සිටි කෙනෙක් වෙතට ස්වාමින්වහන්සේ තමන් දූතයා යැවූ සේක. දූතයා ඔහුට කථා කොට 'අනනියස්නි, නැගිට ඍජු නම් වීථියට ගොස්, තාර්සිස්හි මනුෂ්‍යයෙක් වූ සාවුල් නම් කෙනෙකු ගැන යූදස්ගේ ගෙයි විභාග කරපන්න. මක්නිසාද, ඔහු යාච්ඤා කරමින් සිටිනුයේ තමාට පෙනීම ලැබෙන පිණිස අනනියස් නම් කෙනෙක් පැමිණ තමාගේ හිස පිට අත් තබා යාච්ඤා කරනවා ඔහු දර්ශනයකින් දුටුවේ' යයි කීවේය. අනනියස් භයපත්ව මෙය වැරදීමක් විය හැකි යයි සිතා සාවුල්ගේ පැමිණීමේ අරමුණ ස්වාමින්වහන්සේට පැවසීය. නමුත් ස්වාමින්වහන්සේ අනනියස්ට කථා කොට, 'මම ඔහුව අන්‍ය ජාතීන් වෙතටත් රජවරුන් වෙතටත් ඊශ්‍රායෙල්වරුන් වෙතටත් මාගේ නාමය ගෙන යන තෝරාගත් භාජනයක් කරගතිමි. මාගේ නාමය නිසා මොන තරම් දේ විඳින්ට ඕනෑද කියා මම ඔහුට පෙන්වමි'යි කීසේක. ස්වාමින්වහන්සේ කියා දුන් මාර්ග සලකුණු අනුව ගොස් නිවසට ඇතුල්ව 'සහෝදර සාවුල්, නුඹ පැමිණි මාර්ගයේදී නුඹට දර්ශනය වී, කථා කළ යේසුස්වහන්සේ නුඹේ ඇස් පෙනෙන පිණිසද, ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වන පිණිසද මා එවූ සේකැ'යි පැවසුවේය.

එවේලේම සාවුල් පෙනීම ලැබ නැගිට බව්තීස්මය ලැබීය. ඉන්පසු සාවුල් යේසුස්වහන්සේ ගැන සිනගෝගවල දේශනා කරමින් උන්වහන්සේ දේව පුත්‍රයාණන් බවට සාක්ෂි දැරීය. ඔහු කථා කරනවා ඇසූ සියල්ලෝ, 'මේ නාමයෙන් කථා කළ අයව යෙරුසලමේදී විනාශ කළේ මේ මනුෂ්‍යයා නොවේද? ඔහු මෙහාට පැමිණියේද මිනිසුන් ගැහැණුන් අල්ලා ගෙන ගොස් පූජකයන්ට භාරදීම පිණිස නොවේද?' කියා විශ්මපත් වූහ. සාවුල් ශක්තිමත්ව වර්ධනය විය. සාවුල් යේසුස්වහන්සේට විරුද්ධව ක්‍රියා කිරීම, ඒ නාමය කෙරෙහි අදහා ගත්තවුන් මරණයට පාවාදීම ගැන ඔවුහු දැනගෙන සිටියහ. සාවුල් ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් තම අත්දැකීම් ගැන යුදාවරුන්ට දැන්වීය. ඔහුගේ පුදුමාකාර හැරීම නිසා බොහෝ අය යේසුස්වහන්සේ දේව පුත්‍රයාණන් බව විශ්වාස කළහ. සාවුල් යේසුස්වහන්සේ ගැන දේශනා කරද්දී මහත් බලයක් ඔහු සමග ක්‍රියාත්මක විය. සාවුල්ට ශුද්ධ ලියවිලි ගැන මනා දැනුමක් තිබිණ. බව්තීස්ම වීමෙන් පසු ඔහුට යේසුස්වහන්සේ සම්බන්ධව අනාවැකි ගැන දිව්‍යමය ආලෝකයක් ලැබිණ. පැහැදිලි ලෙසත් නිර්භයවත් අනාගතවාක්‍යය තේරුම් කරදෙන්ට හා වැරදි ලෙස උගන්වන්ට තිබූ ලියවිලි හරි ලෙස කියා දෙන්ටත් ඔහුට පුළුවන් විය. ශුද්ධාත්මයාණන් වහන්සේ ඔහු තුළ වාසය කිරීම මගින් තමාට සමාව දුන් අයව ක්‍රිස්තුස් වහන්සේගේ පළමුවන පැමිණීම වෙතට අනාගතවාක්‍ය මගින් ගෙන ඒමටද, යේසුස්වහන්සේගේ දුක්විඳීම, මරණය සහ මළවුන්ගෙන් නැගිටීම ගැනවූ අනාවැකි සියල්ල උන්වහන්සේ තුළ සම්පූර්ණත්වයට පැමිණි බවට සාක්ෂි දැරීමටද ඔහුට හැකි විය.

*ක්‍රියා 9 පරිච්ඡේදය කියවා බලන්න.*

## *15 - පරිච්ඡේදය*

# යුදාවරු පාවුල් තුමාව මරන්ට තීරණය කිරීම

පාවුල් තුමා තමාගේ හැරීමේ සිදුවීම් විස්තර කරද්දී ඇතිවූ බලපෑම දුටු නායක පූජකයන් සහ පාලකයන් තුළ පාවුල් තුමාට විරුද්ධව මහත් ක්‍රෝධයක් ඇති විය. ඔහු නිර්භීතව යේසුස්වහන්සේ ගැන දේශනා කිරීම, පුදුම හාස්කම් දැක්වීම, සමූහයන් ඔවුන්ට සවන් දී පරම්පරාගත නියෝග අතහැර යාම සහ යේසුස්වහන්සේව මරා දැමූ මිනීමරුවන් ලෙස ඔවුන් දෙස බැලීම ආදී කරුණු සලකා බැලූ විට ඔවුන්ගේ වෛරය අධික විය. මේ තත්ත්වය මැඩ පැවැත්වීමට කුමක් කළ යුතුදැයි තීරණය කිරීමට ඔවුහු රැස්වූහ. පාවුල් තුමාව මරාදැමීම කළ යුතුම දෙය බවට ඔවුහු එකඟ වූහ. ඔවුන්ගේ අරමුණ දන්නාවූ දෙවියන්වහන්සේ පාවුල් තුමා තමාට හිමි සේවය ඉටුකර, යේසුස්වහන්සේගේ නාමයෙන් දුක් විඳ හමාරවන තුරු, ඔහුව රැකවල් කිරීමට දෙවියන්වහන්සේ තම දේව දූතයන්ට අණ දුන්සේක.

යුදාවරු තමන්ව මරන්ට සොයන බව පාවුල්ට දන්වනු ලැබීය. දමස්කයේ නගර දොරටුවෙන් පිට වන විට පාවුල් තුමාව මරා දමන පිණිස දිවා රෑ දෙකේම දොරටුවල රැක සිටින්ට සාතන් යුදාවරුන්ට මගපෙන්වීය. නමුත් ගෝලයෝ රාත්‍රියේදී කූඩයක් මගින් පාවුල් තුමාව තාප්පයෙන් බිමට බැස්වූහ. සාතන්ගේ උත්සාහය නිෂ්ඵල විය, රැකවලුන් ලැජ්ජාවට පත්වූහ. පාවුල් තුමා ගෝලයන් හා

එක්වීමට යෙරුසලමට ගියේය. නමුත් ඔවුහු පාවුල් ගැන බියට පත්වූහ. ගෝලයෙකු මෙන් පිළිගන්ට නොකැමති වූහ. නමුත් බාර්ණබස් ඔහුව පිළිගෙන අපෝස්තුළුවරුන් වෙතට කැඳවාගෙන ඇවිත් පාවුල්ට යේසුස්වහන්සේ මුණගැසුන බවත් දමස්කයේදී උන්වහන්සේ ගැන දේශනා කළ බවත් පැවසීය.

පාවුල් තුමාව නසා දැමීමට සාතන් යුදාවරුන්ව පෙළඹවූ හෙයින් යේසුස්වහන්සේ ඔහුට යෙරුසලමෙන් පිටව යන්ට කීසේක. පාවුල් තුමා වෙනත් නගරවල යේසුස්වහන්සේ ගැන දේශනා කරමින් රෝග සුව කරමින් යන අතර බොහෝ අය යේසුස්වහන්සේව පිළිගත්හ. කොරෙකුව සිටි එක් පුද්ගලයෙකුව සුව කළ අවස්ථාවේ පිළිම වන්දනා කළ අය ගෝලයන්ට පූජා පවත්වන්ට සූදානම් වූහ. පාවුල් තුමා ඔවුන්ව වළක්වා ලමින් මනුෂ්‍යයන් වන අප අහසත් පොළොවත් මුහුදත් එහි ඇති සියලූ දේත් මවා වදාළ දෙවියන්වහන්සේට නමස්කාර කළ යුතු බව පැවසීය. ඔවුන් කළ යහපත් සේවය විනාශ කිරීමට වෙනත් නුවරවල සිටි යුදාවරුන්ව සාතන් පෙළඹවීය. තත්ත්වය ඉක්මණින් වෙනස් විය. ටික වේලාවකට පෙර ගෝලයන්ට නමස්කාර කරන්ට පූජා ඔප්පු කරන්ට සූදානම් වූ අය පාවුල්ට ගල් ගැසූහ. ඔහු මැරුණා යයි සිතූ ඔවුහු පාවුල්ව නගරයෙන් පිටතට ඇද දැමූහ. අනිකුත් ගෝලයන් පාවුල් ගැන හඬමින් වැලපෙමින් සිටියදී පාවුල් නැගිට සිටියේය. ඔවුන්ගේ වැලපීම ප්‍රිතියට හැරී පාවුල් ඔවුනුත් සමග නගරයට ඇතුල් විය.

පාවුල් තුමා දේශනා කරන අවස්ථාවකදී, ශාස්ත්‍ර කියන ආත්මයක් ඇති ස්ත්‍රියක් 'මේ මනුෂ්‍යයෝ ගැළවීමේ මාර්ගය නුඹලාට ප්‍රකාශ කරන්නාවූ මහෝත්තම දෙවියන්වහන්සේගේ සේවකයෝ” යයි මොරගසා කීවාය. ඈ බොහෝ දවසක් මෙසේ කළාය. පාවුල් තුමා මේ ගැන අප්‍රසන්න විය. මක්නිසාද මේ කෑගැසීම සත්‍යයට කන්දීම වෙතින් මනුෂ්‍යයන්ගේ සිත් වෙනතකට හැරවීය. සාතන්ගේ එල්ලය වූයේ ඈ ලවා මේ දේ කිරීමෙන් මනුෂ්‍යයන්ගේ සිත් අප්‍රසන්න කර ගෝලයන්ගේ බලපෑම නැති කර දැමීමය. පාවුල් තුමා සිතින් චංචල වී ඇය දෙසට හැරී ආත්මයට කථා කර 'මෑ කෙරෙන් ඉවත්වන ලෙස යේසුස්වහන්සේගේ නාමයෙන් මම නුඹට අණ කරමි”යි පැවසීය. දුෂ්ට ආත්මය ඈ වෙතින් ඉවත්ව ගියාය.

ඇය කෑගසමින් පාවුල් පසුපස යද්දී ඇගේ ස්වාමිවරු ඒ ගැන සතුටු විය. නමුත් ඈ තුළ වූ නපුරු ආත්මය ඉවත්ව ගොස් ඇය යේසුස්වහන්සේගේ සෙනෙහෙබර ඇදහිලිවන්තියක් වූ බව දුටු අතර ඔවුහු කෝපාවිෂ්ට වූහ. ඇගේ ශාස්ත්‍ර කීම නිසා ඔවුහු බොහෝ මුදල් උපයා ගත්හ. දැන් එය ඔවුන්ට අහිමි විය. සාතන්ගේ එල්ලය වැරදුන නමුත් ඔහුගේ සේවකයෝ පාවුල්ව සහ සීලස්ව ආණ්ඩුවේ බලධාරීන් වෙතටත් නඩුකාරයා වෙතටත් ඇදගෙන ගොස්, 'මේ මිනිස්සු යුදාවරුය. අපේ නගරයේ අයට මහත් කරදරයක් ඇති කරති”යි පැමිණිලි කළහ. මහත් සමූහයක් ඔවුන්ට විරුද්ධව නැගී සිටියහ. නඩුකාරයෝ ඔවුන්ගේ ඇඳුම් ඉරා දමා ඔවූන්ට තලන්ට අණ කළෝය. බොහෝ පහර දුන්නායින් පසු හිරගෙයි දමා, ප්‍රවේශමෙන් රැකවල් කරන්ට හිරගෙයි මුලාදෑනියාට අණ කළෝය. ඔහු එවැනි අණක් ලැබුණු නිසා ඔවුන් ඇතුල් හිරගෙයි දමා, ඔවුන්ගේ පාද සවි ලෙස දඬු ගැසුවේය. නමුත් දේව දූතයෝ ඔවුන් සමග සිරගෙය තුළ වූහ. මෙම සිරගත කිරීම දෙවියන්වහන්සේගේ මහිමය සඳහා වූවකි. තෝරාගත් සේවකයන් සමග උන්වහන්සේ වැඩ සිටිසේක. සිරගෙය තුළ බිත්ති සොලවන්ටත් යකඩ දම්වැල් කඩන්ටත් උන්වහන්සේට පුළුවන.

මධ්‍යම රාත්‍රිය පමණේදී පාවුල්ද සීලස්ද යාච්ඤා කරමින් දෙවියන්වහන්සේට ගී කීවෝය. හිරකාරයෝද ඔවුන්ට ඇහුම්කන් දී ගෙන සිටියෝය. හදිසියෙන් මහත් භූමිකම්පාවක් ඇති විය. එයින් හිරගෙයි අත්තිවාරම් සෙලවුණේය. සියලූ දොරවල් ඇරුණේය. ස්වාමින්වහන්සේගේ දූතයා සියලූ දෙනාගේ දම්වැල් ගලවනවා මම දුටිමි. හිරගෙදර මුලාදෑනියා අවදි විය. දොරවල් ඇරී තිබෙන බව දැක සිරකරුවෝ පැනයන්ට ඇතැයි සිතා කඩුව ගෙන තමාම මරාගන්ට සැදුවේය. නමුත් පාවුල් කථාකොට, 'නුඹට කිසි අනතුරක් කර නොගනින්න. මක්නිසාද අපි සියල්ලෝම මෙහි”යයි මොර ගසා කීවේය. දේව බලය ඔහුට හැඟීම් ඉපිදවීය. ඔහු පහනක් ඉල්ලා ගෙන පාවුල් සහ සීලස් වෙතට දුවැවිත් 'ස්වාමිවරුනි, ගැළවෙන පිණිස මා විසින් කුමක් කටයුතු” දැයි ඇසුවේය. 'ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහා ගනින්න. තවද නුඹේ පවුලද එසේම”යයි කීවේය. හිරගෙයි මුලාදෑනියා එවේලේම තමාගේ පවුලේ සියල්ලන් රැස් කළේය. පාවුල් ඔවුන්ට දේශනා කළේය. මුලාදෑනියාගේ සිත සහෝදර ප්‍රේමයෙන් එක් විය. ඔහු එම රාත්‍රියේම ඔවුන්ගේ තුවාල සේදුවේය. එම රාත්‍රියේම ඔහුද ඔහුගේ පවුලේ අයද බව්තීස්ම කරනු ලැබුවෝය. මුලාදෑනියා ඔවුන් ඉදිරියේ කෑම මේසයක් තබා තමාගේ ගෙයි වැසි සියල්ලන් සමග දෙවියන්වහන්සේ අදහමින් බොහෝ සේ ප්‍රීති වූයේය.

දෙවියන්වහන්සේගේ මහිමාන්විත බලය කරණකොටගෙන සිරගෙවල්වල දොරවල් විවෘත වීමේ පුදුම ආරංචි සමග සිරගෙදර මුලාදෑනියාගේ හැරීම සහ පවුලේ සැමදෙනා බව්තීස්ම වීම සැමතැන පැතිර යන්ට විය. ආණ්ඩුකාරවරු මේ පුවත් ඇසූ විට භයට පත්ව පාවුල්ව සහ සීලස්ව නිදහස් කර

හරින ලෙස හිරගෙයි මුලාදෑනියාට දන්වා යැවීය. නමුත් පාවුල් මෙලෙස රහසිගතව සිරගෙය හැරයන්ට කැමති නොවීය. 'වග විභාගයක් නැතිව රෝමයන්වූ අපට ප්‍රසිද්ධියේ පහර දී හිරගෙට දමා දන් අපව රහසින්ම යවන්ට හදනවාද' යයි පාවුල් විමසීය. දෙවියන්වහන්සේගේ බලවත් ක්‍රියාවන් මෙලෙස වසං වෙනවාට පාවුල් සහ සීලස් මනාප නොවූහ. මේ වචන නඩුකාරයන් ඇසූ විට පාවුල් රෝම පුරවැසියෙක් බව දැනගෙන හය වී ඔවුන්ම ඇවිත් කන්නලව් කර, පිටතට කැඳවා නුවරින් පිටත්ව යන ලෙස ඉල්ලූවෝය.

*ක්‍රියා පොතේ පරිච්ඡේද 14 සහ 16 බලන්න.*

## *16 - පරිච්ඡේදය*

# පාවුල් නැවත යෙරුසලමට පැමිණෙයි

පාවුල් තම හැරීමෙන් ස්වල්ප කලකට පසු යෙරුසලමට පැමිණියේය. යේසුස්වහන්සේගේ පුදුමාකාර අනුග්‍රහය ගැන ඔහු එහිදී දේශනා කළේය. තමාගේ ප්‍රාතිහාර්යමය හැරීම ගැන ඔහු දේශනා කළ විට පූජකයෝ ක්‍රෝධයෙන් දිලිහී ඔහුව මරන්ට සෙවූහ. ඔහුගේ ජීවිතය ආරක්ෂා කරන පිණිස යේසුස්වහන්සේ නැවත ඔහුට දර්ශනය වී, 'ඉක්මණින් යෙරුසලමෙන් පිටවෙයන්න මක්නිසාද ඔවුහු මා ගැන නුඹේ සාක්ෂිය පිළිගන්නේ නැතැ' යි කීසේක. පාවුල් සිතුවේ ඊට වෙනස් ආකාරයකින්ය. තමා ක්‍රිස්තියානි සභාවට විරුද්ධව ගෙන ගිය පීඩාකාරී ක්‍රියාවන්, ස්තේපන් ගෝලයාව ගල් ගසා මැරීමේදී ඊට එකහව තමා දුන් සහයෝගය ආදී සිදුවීම් දන්නාවූ පූජකයන් හා සෙනඟ තමාගේ ප්‍රාතිහාර්යමය හැරීම ගැන පුදුමයට පත්වී ක්‍රිස්තුස්වහන්සේව පිළිගනීවී යයි ඔහුගේ අදහස විය. නමුත් යේසුස්වහන්සේ කථාකොට 'පිටවෙයන්න මම නුඹව මෙයින් ඈතට, අන්‍යජාතීන් වෙතට යවන්නෙමි'යි කීසේක.

පාවුල් යෙරුසලමෙන් පිටව ගිය පසු තමාගේ පුදුම හැරීම සහ අත්දැකීම් ගැන සමහර ස්ථානවල සිටි අයට ලියුම් යැව්වේය. නමුත් සමහර අය එම ලිපිවල වූ බලවත් සාක්ෂි දැරීම නැතිකර දැමීමට ක්‍රියා කළෝය.

පාවුල් තුමා උගතෙක්ව සිටි බවද ඔහුගේ ප්‍රඥාව සහ කථා විලාශයට සෙනඟ වශී වූ බවද මම දුටිමි. උගත් අය ඔහුගේ දැනුම ගැන සතුටට පත්වූ අතර බොහෝ දෙනෙක් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහා ගත්හ. රජවරුන් හා මහත් සමූහයන් ඉදිරියේදී කළ කථාවන් මගින් අසා සිටි අයව වසඟ කරගැනීමේ බලයක් ඔහු තුළ තිබිණ. කාරණා පැහැදිලි කරදීමේදී ඉතා උසස් අන්දමේ සිතුවිලි ඉදිරිපත් කර දෙවියන්වහන්සේගේ අනුග්‍රහයේ වටිනාකම් සහ ක්‍රිස්තුස්වහන්සේගේ විශ්මපත් ප්‍රේමය පෙන්වා දීමට ඔහු සමත් විය. ඒ වගේම සාමාන්‍ය ජනතාවට වැටහෙන සරල ආකාරයකින් ඉතාම බලවත් ලෙස තමාගේ අත්දැකීම් ඉදිරිපත් කර ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන් වීමට තද ආශාවක් ඔවුන් තුළ ඇති කිරීමට ඔහුට පුළුවන් විය. පූජකයන්ගේද, පාලකයන්ගේද වෛරය ඔහුට විරුද්ධව උත්සන්න වීමට මෙය හේතුවක් විය.

තමන්වහන්සේගේ නාමය නිසා බඳිනු ලබන්ටත් දුක් විඳින්ටත් නැවත යෙරුසලමට යා යුතුව තිබෙන බව මෙසියස්වහන්සේ පාවුල්ට එළිදරව් කළසේක. බොහෝ කාලයක් යන තුරු සිරකරුවෙක්ව සිටින්ට යන නමුත් ඔහුගේ බැඳුම් කරණකොටගෙන ක්‍රිස්තුස්වහන්සේ ගැන දැනගැන්ම පතුරුවාලන්ට යෙදෙන සැටිත් දෙවියන්වහන්සේ ගෞරවය ලබන්ට යන බවත් පාවුල්ට දන්වා දුන්සේක. මෙසේ පාවුල් විනිශ්චය කරනු ලබන පිණිස නගරයෙන් නගරයට යවනු ලැබ රජවරුන් හා ආණ්ඩුකාරයන් ඉදිරියේ පෙනී යේසුස්වහන්සේ ගැන සාක්ෂි දැරීමත්, තමාගේ හැරීම ගැන වූ ප්‍රාතිහාර්යමය සිදුවීම් ගැන ප්‍රකාශ කිරීමත් ඔවුන්ගේ දැනගැන්ම පිණිස ඕනෑ විය. දහස් ගණන් යේසුස්වහන්සේ කෙරෙහි අදහාගෙන උන්වහන්සේගේ නාමය ගැන ප්‍රීති සන්තෝෂ වූහ. නැවක ගමන් කළ සෙනඟක් විසින් දෙවියන්වහන්සේගේ බලය දැක අදහාගන්නා පිණිසද අන්‍යජාතීන් විසින් යේසුස්වහන්සේගේ නාමය අසා අදහාගන්නා පිණිසද, පාවුල් මුහුදේ යාත්‍රා කිරීම දෙවියන් වහන්සේගේ විශේෂ අභිප්‍රායක් සම්පූර්ණ වීම සඳහා වූවක් බව මම දුටිමි. පාවුල්ගේ ඉගැන්වීම් සහ ප්‍රාතිහාර්ය කරණකොටගෙන බොහෝ දෙනෙකුගේ හැරීම සිදුවිය. පාවුල් කථා කරමින් කාරණා ඉදිරිපත් කළ ආකාරය නිසාද

ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලපෑම ඇතිව යේසුස්වහන්සේව ඉදිරිපත් කරමින් තමාගේ හැරීම ගැන වූ සිත් කාවදින සිදුවීම් ගැනද කථා කළ විට රජවරුන්ගේ සිත්වල කැළඹීම් ඇතිවන්ට යෙදින. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බව ඔවුන්ට හැඟී යන්ට විය. පාවුල්ගේ සාක්ෂිය නිසා විශ්මයට පත්වූ එක් රජ කෙනෙක් 'නුඹ වැඩි පෙළඹීමක් නැතිව මාව ක්‍රිස්තියානිකාරයෙක් කරන්ට සිතනවා" යයි පාවුල්ට පැවසීය. මතු දවසකදී ඒ ගැන සලකා බලන බව සමහර අය ප්‍රකාශ කළහ. ප්‍රමාද කිරීම සාතන්ගේ වාසිය පිණිස විය. ඒ සිත් උණුසුම් වූ අවස්ථාවය. එම ඉඩ ප්‍රස්ථාව පැහැර හැරීම හෝ කල් දැමීම සිත් තදවීමට හේතු වේ.

යේසුස්වහන්සේව තම ගැළවුම්කාරයාණන් ලෙස පිළිගැනීමට නොහැකි වන ලෙස යුදාවරුන්ව අන්ධභාවයකට පත්කිරීම සාතන්ගේ පළමුවන උපක්‍රමය බව මට පෙන්වනු ලැබීය. දෙවනුව, උන්වහන්සේගේ බලවත් ක්‍රියාවන් දක ඊර්ෂ්‍යා කරමින් උන්වහන්සේගේ ජීවිතය නැති කරන්ට සෙවූහ. උන්වහන්සේගේම ගෝලයන්ගෙන් කෙනෙකු මුළා කරගෙන උන්වහන්සේව සතුරන්ගේ අත්වලට පාවා දුන් අතර ඔවුහු ජීවනයේ අධිපතියාණන්ව කුරුසියේ ඇණ ගැසූහ. උන්වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූ පසු එම සත්‍යතාවය වසං කිරීම සඳහා හේවායින්ට මුදල් දී බොරුවක් පතුරුවන්ට සලස්වා ඔවුහු පාපයට පාපය එකතු කරගත්හ. නමුත් යේසුස්වහන්සේ සමග මළවුන්ගෙන් නැගිටි සමූහයක් උන්වහන්සේගේ නැගිටීම ගැන සාක්ෂි දරා බලවත් ලෙස එම සත්‍යය තහවුරු කළහ. උන්වහන්සේද දවස් ගණනක් ගෝලයන්ට ප්‍රකාශ වූසේක. ඉන්පසු උන්වහන්සේ එක්වර පන්සියයකට වඩා වැඩි දෙනෙකුට ප්‍රකාශ වූසේක.

පුත්‍රයාණන් වහන්සේව එපා කරවමින් දෙවියන්වහන්සේට විරුද්ධව කැරලි ගැසීමට සාතන් යුදාවරුන්ව මෙහෙයවීය. උන්වහන්සේව කුරුසියේ ඇණ ගසන්ට සලස්වමින් තමන්ගේ සිත් කිළුටු කරගත්හ. යේසුස්වහන්සේ දේව පුත්‍රයාණන්වහන්සේ බවටත් ලෝකයේ ගැළවුම්කාරයාණන් බවටත් කොතරම් ප්‍රබල සාක්ෂි දෙනු ලැබ තිබුණත් ඔවුහු උන්වහන්සේව කුරුසියෙහි ඇණ ගැසූහ. උන්වහන්සේ සඳහා වූ කිසිම සාක්ෂියක් පිළිගැනීමට ඔවුන්ට නොහැකි විය. ඔවුන්ගේ සැනසිල්ලේ එකම බලාපොරොත්තුව වූයේ සාතන්ට ඔහුගේ වැටීමෙන් පසුව සිදුවූ ලෙසම; ක්‍රිස්තුස්වහන්සේට විරුද්ධව නැඟී සිටීමය. ඔවුහු ගෝලයන්ව මරා දමමින් කැරැල්ල ඉදිරියට ගෙන ගියහ. තමන්ගේ කන්වලට යේසුස්වහන්සේගේ නම ඇසෙනවාට තරම් ඔවුහු අන් කිසිවකට වෛර කළේ නැත. ස්තේපන් ශුද්ධාත්මයාණන් වහන්සේ කරණකොටගෙන යේසුස්වහන්සේ දේව පුත්‍රයාණන් බවට බලවත්වූ සාක්ෂි දුන්විට නොඇසී නොහැරෙන ලෙස ඔවුහු ඔහුට මැරෙන තුරු ගල් ගැසූහ. යේසුස්වහන්සේව මැරූ මිනීමරුවන්ව සාතන් තදින් තමාගේ ග්‍රහණය යටතේ තබා ගැනිණ. දුෂ්ටකම් කිරීම කරණකොටගෙන ඔවුහු ඔහුගේ කැමැත්ත කරන අය බවට පත්වූහ. සාතන් ඔවුන් මගින් යේසුස්වහන්සේගේ සෙනඟව කරදරවලට පත් කළහ. සාතන් යුදා සෙනඟ ලවා අන්‍යජාතීන්ව යේසුස්වහන්සේගේ නාමයට විරුද්ධව සහ උන්වහන්සේගේ ඇදහිලිවන්ත අයට විරුද්ධව පොළඹවා ගත්තේය. නමුත්, දෙවියන්වහන්සේ තම දූතයන් එවා සේවකයන්ව ශක්තිමත් කළ අතර ඔවුහු නොනැමී සිටිමින් තම ජීවිත පූජා කර සාක්ෂිය මුද්‍රා කළහ.

තමාගේ දැලෙහි යුදා ජාතිය සුරක්ෂිතව සිටිම ගැන සාතන් ප්‍රමෝදයට පත්විය. යුදා සෙනඟ තවදුරටත් තමන්ගේ නිෂ්ඵල පුද පූජා සහ චාරිත්‍ර වාරිත්‍රවල නියැලී සිටියහ. යේසුස්වහන්සේ කුරුසිය මතදී 'ඉතින් නිමයි" යන වචන පැවසූ විට දේව මාළිගාවේ තිරය ඉහළ සිට පහළට දෙකඩව ඉරී ගියේය. මෙයින් දෙවියන්වහන්සේ සංකේතවත් කළේ තවදුරටත් පුද පූජාවල් අවශ්‍ය නොවන බවය. යුදාවරුන් හා අන්‍යජාතීන් අතර වූ වෙන් කිරීමේ බිත්තිය බිඳ දැමූ බවය. යේසුස්වහන්සේ මෙම කණ්ඩායම් දෙකම සඳහා එක පූජාවක් ඔප්පු කළසේක. ගැළවීම ලබන්ට නම්, තම පව් සඳහා වූ එකම පූජාව ක්‍රිස්තුස්වහන්සේ බව විශ්වාස කරන්ටත්, උන්වහන්සේ ලොව සියලූම දෙනාගේ ගැළවුම්කාරයාණන් බව පිළිගන්ටත් උවමනාය.

යේසුස්වහන්සේ කුරුසිය මත එල්ලී සිටියදී හේවායෝ තම අත වූ හෙල්ලයෙන් ඇන උන්වහන්සේගේ ළපැත්ත සිදුරු කළේය. එවිට රුධිරය හා වතුර එම තුවාලය වෙතින් ධාරා දෙකක් ලෙස වෙන් වෙන්ව ගලා ආවේය. රුධිරය උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහා ගන්නාවූ අයගේ පාප සෝදා හැරීම පිණිසය. වතුර සංකේතවත් කළේ ඇදහිලිවන්තයාට ජීවනය ලබාදෙන යේසුස්වහන්සේගෙන් ලබාගත හැකි ජීවනදායක වතුරය.

***කියවා බලන්න: ශු. මතෙව් 27: 51; ශු. යොහන් 19: 34; ක්‍රියා පොතේ 24 සහ 28 පරිච්ඡේදයන්.***

## ***17 - පරිච්ඡේදය***

# ඇදහිල්ලෙන් වැටී යාම

අන්‍යජාතී රූප වඳින්නන් විසින් ක්‍රිස්තියානින්ට වධ හිංසා කර කෲර ලෙස මරා දැමූ කාලය වෙතට මා පමුණුවනු ලැබීය. උගත් අයව, ගෞරව ලබා සිටි අයව, සහ සාමාන්‍ය ජනයන්ව අනුකම්පා විරහිතව මරා දමන්ට යෙදින. ධනවත්ව සිටි අය තම ආගම අත්හරින්ට කැමති නොවූ නිසා අන්ත දුගී බවට පත්කරන ලදී. දුක් පීඩා කොතෙක් විඳින්ට සිදුවුවත් තම ඇදහිල්ලේ තත්ත්වය බාල කරන්ට නොකැමති වූහ. ඔවුහු තම ඇදහිල්ලේ පවිත්‍රතාව රැකගත්හ. දේව ජනතාව විඳි දුක් වේදනාවල්ද සාතන් සතුටු වූ හැටි මම දුටිමි. තමන් උදෙසා දුක් ඉසිලූවාවූ ජීවිතය පූජා කළාවූ අයට දෙවියන්වහන්සේ බොහෝ සේ ප්‍රේම කළ අතර ඔවුන් දෙස අනුකම්පාවෙන් බැලූසේක. ඔවුන් දරාගත් වේදනා අනුව ඔවුන්ගේ ප්‍රතිඵලද වැඩි විය. ශුද්ධවන්තයන්ගේ දුක්විඳීම ගැන සාතන් සතුටට පත්වූ නමුත් ඔහු එයින් සෑහීමට පැමිණියේ නැත. ඔහුට ඔවුන්ගේ මනසවල් පාලනය කිරීමටද උවමනා විය. ක්‍රිස්තියානින් වින්දාවූ වේදනා ඉසුලූවාවූ දුක් ඔවුන්ව දෙවියන්වහන්සේ වෙතට තව ලං කළ අතරම, එකිනෙකාටද සමීප වන්ට සැලැස්වීය. ඊටත් වඩා ස්වාමින්වහන්සේගේ සිත රිදවන්ට ඔවුහු භය වූහ.

ඔවුන් ලවා ස්වාමින්වහන්සේව අප්‍රසන්න කරවන්ට සාතන් කැමති විය. දහස් ගණන් මරනු ලැබූ නමුත් හිස්වූ ස්ථාන පුරවන්ට වෙනත් අය එකතු වූහ. සෙනඟ තමාගේ ග්‍රහණයෙන් ගැළවී යනවා සාතන්ට පෙනිණ. සෙනඟද දුක් විඳ මරණයට පවා පත්වුවත්, දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඔවුන් අයිති වන බව සාතන් වටහා ගෙන වෙනත් ආකාරයකින් දෙවියන්වහන්සේගේ පාලනයට විරුද්ධව සටන් කොට සභාව බිඳ දැමීමට සාතන්ට උවමනා විය. ඔහු රූප වන්දනික සෙනඟව ක්‍රිස්තියානි ඇදහිල්ලේ කොටසක් වැළඳ ගැනීමට මගපෙන්වීය. ඔවුහු ක්‍රිස්තුස්වහන්සේගේ කුරුසපත්වීම සහ මළවුන්ගෙන් නැගිටීම පිළිගෙන, සිත්වල වෙනස්වීම් නැතිව, ක්‍රිස්තු අනුගාමිකයන් සමග එකතු වීමට යෝජනා කළහ. අහෝ! සභාවේ තැති ගත්වන අනතුර; එය මානසික වේදනාවෙන් යුතු අවස්ථාවක් විය. සමහර අය සිතුවේ, කොටසක් වැළඳ ගත් අය පසුව සම්පූර්ණ ලෙස හැරේවිය කියාය. සාතන්ගේ උත්සාහය වූයේ බයිබල් ධර්මතාවයන් දූෂණය කිරීමය. ආත්මික තත්ත්වය පහත වැටී රූප වන්දනාව ක්‍රිස්තු ඇදහිල්ල සමග එක්වී තිබෙනවා මම දුටිමි. ඔවුහු ක්‍රිස්තු භක්තිකයන් යැයි කියාගත් නමුත් රූප වන්දනාවද ඔවුහු තමන් සමග සභාව තුළට ගෙන ආහ. ඔවුහු තමුන්ගේ රූප පෙනුමෙන් හා නම්වලින් ශුද්ධවන්තයන්ගේ පමණක් නොව, ක්‍රිස්තුස්වහන්සේගේද, මරිය තුමියගේද රූපවලට මාරු කරගත්හ. ක්‍රිස්තියානි අය ක්‍රම ක්‍රමයෙන් ඔවුන් සමග එක්වූහ. ක්‍රිස්තියානි ආගම දූෂණය විය. සභාව ඇයගේ පවිත්‍රතාවද බලයද නැතිකර ගත්තාය. තවත් සමහර අය ඔවුන් සමග එකතු වීම ප්‍රතික්ෂේප කර ඇදහිල්ලේ පවිත්‍රතාව රැකගනිමින් දෙවියන්වහන්සේට පමණක් නමස්කාර කළහ. ඔවුහු උඩ අහසෙහිවත් පාත පොළොවෙහිවත් තිබෙන කිසිම රූපයකට නමස්කාර නොකළහ.

බොහෝ දෙනෙකුගේ වැටීම ගැන සාතන් ප්‍රීතියට පත්විය. තවමත් ඇදහිල්ලේ පවිත්‍රතාවය පවත්වා ගෙන යන අයව රූප නමස්කාරයට සහ බාහිර චාරිත්‍රවලට හැරී එන ලෙස බල කරන්ටද, එසේ නොහැරෙන අයව මරා දමන්ටද සාතන් ඇදහිල්ලෙන් වැටී ගියාවූ සභාව පොළඹවන්ට විය. සත්‍යයවූ සභාවට එරෙහිව පීඩා නමැති ගින්න ඇවිලෙන්නට විය. අනුකම්පා නැතිව ලක්ෂ සංඛ්‍යාත ගණන් ඝාතනය කරන ලදී.

පහත සඳහන් ආකාරයෙන් එම දර්ශන මට පෙන්වා දුන්හ. ඉර සඳ සහ තාරකාවන්ගේ රූප ඇති කළු පාට කොඩියක් ඔසවා ගත් රූප වන්දනාකාර කණ්ඩායමකි. ඔවුහු කෝපයෙන් සහ බිහිසුණු පෙනුමෙන් යුක්ත වූහ. ඊළඟට තව කණ්ඩායමක් පවිත්‍ර සුදු පාට කොඩියක් ඔසවා ගෙන සිටියහ. 'ස්වාමින්වහන්සේ පවිත්‍රය ශුද්ධය' කියා කොඩියේ ලියා තිබිණ. ඒ අයගේ මුහුණුවල සන්සුන් භාවය සහ ස්වර්ගීය ආලෝකය පැතිර තිබිණ. අන්‍යජාතික රූප වඳින්නන් ඉදිරියට එනවාද මහා සටනක් ඇවිල යනවාද මම දුටිමි. මහත් ජීවිත විනාශයක් ඇති විය. ක්‍රිස්තියානි අයගේ ගණන අඩු වී තිබෙන නමුත් ඔවුහු සමීපව එකමුතුව සිටියහ. කොඩිය ඔසවාගෙනම සිටියහ. බොහෝ දෙනෙක් වැටී ගිය අතර හිස්තැන් පිරවීමට වෙනත් අය නැගී ආහ.

රූප වන්දනාකාර කණ්ඩායමට ක්‍රිස්තියානි කණ්ඩායම යටත් කරගන්ට නොහැකි විය. ඔවුහු නැවත සාකච්ඡාවක යෙදී සිටිනවා මම දුටිමි. ඉන්පසු ඔවුහු කොඩිය පහත්කර, ක්‍රිස්තියානි කණ්ඩායම වෙතට පැමිණ යම් යෝජනාවක් ඉදිරිපත් කළහ. එවේලෙහි යෝජනාව ප්‍රතික්ෂේප කෙරිණ. ඉන්පසු ක්‍රිස්තියානි කණ්ඩායම 'අපි කොඩිය පහත් කරමු. යෝජනා පිළිගනිමු. දිවි බේරා ගනිමු. පසුව ශක්තිය ලබාගෙන ඔවුන් අතරේ අපේ කොඩිය ඔසවන්ට පුළුවන් වේවි' කියාය. නමුත් අනික් අය ඊට අකමැතිව මරණය දක්වා කොඩිය ඔසවා ගෙන සිටින්ට තීරණය කළහ. මෙසේ

කොටසක් කොඩිය පහත්කර රූප වන්දනා කණ්ඩායමට එකතු වූ අතර ක්‍රිස්තියානි කණ්ඩායම ස්ථිරව සිටිමින් තම කොඩිය ඉහළටම ඔසවා ගත්හ. ක්‍රිස්තියානි කණ්ඩායමෙන් අනික් කණ්ඩායමට පුද්ගලයින් නොකඩවා ඇදී යනවා මම දුටිමි. ඔවුහු කළු කොඩියේ අය සමග එකතු වූහ. ඔවුහු සුදු කොඩිය යටතේ සිටි අයට පීඩා කිරීමටද සම්බන්ධ වූහ. බොහෝ අයව ඝාතනය කළහ. නමුත් සුදු කොඩිය එසවී තිබූ අතර එය වටා රොක්වන්ට තවත් අයව කැඳවන්ට යෙදින.

විනිශ්චය ශාලාවේදී පිලාත් යේසුස්වහන්සේව වරදට පත්කරන්ට නොකැමති වූ විට යුදාවරු කෑ ගසා, 'ඔහුගේ ලේ අප පිටත්, අපේ දරුවන් පිටත් වේවා' යයි කීහ. තම හිස් පිටට ඉල්ලා සිටි මෙම භයානක ශාපයේ ප්‍රතිඵල යුදා ජාතිය කෙරෙහි පතිත විය. 'අන්‍යජාතීන්' සහ 'ක්‍රිස්තියානින් 'යයි කියාගත් අය ඔවුන්ගේ සතුරන් වූහ. ක්‍රිස්තුස්වහන්සේව කුරුසියේ ඇණ ගැසීම යුදාවරුන්ගේ ඉල්ලීම නිසා සිදුවූ බැවින් යුදාවරුන්ට වඩ වඩා දුක් පැමිණවීමෙන් දෙවියන්වහන්සේව සතුටු කළ හැකි යයි කියා යුදාවරුන්ගෙන් බොහෝ දෙනෙකු මරා දැමූහ. ඉතිරි අයව තැනින් තැනට පළවා හරිමින් හැකි සෑම අන්දමකින්ම ඔවුන්ට දඬුවම් කළහ.

යේසුස්වහන්සේගේත්, ගෝලයන්ගේත් ලේවල වන්දිය ඔවුන් පිටට භයානක අන්දමින් පැමිණියහ. ක්‍රිස්තියානින් මෙන්ම අන්‍යජාතීන්ද ඔවුන්ට ද්වේෂ කළහ. ඔවුන්ව අප්‍රිය කරනු ලැබ තුච්ඡ කරනු ලැබීය. නමුත් ස්වාමින්වහන්සේ ඊශ්‍රායෙල් ජාතියව නැතිවන්ට නොදී පුදුම ලෙසින් ජාතීන් අතර විසුරුවා හැර ආරක්ෂා කළසේක. එසේ කළේ දෙවියන්වහන්සේගේ ශාපය විශේෂයෙන් ඔවුන් පිටට පැමුණුනු බව පෙන්වන පිණිසය. ජාතියක් ලෙස දෙවියන්වහන්සේ යුදා සෙනඟ එකතු කළ බව මම දුටිමි. නමුත් තමුන්ගේ සිත්වල වූ වැස්ම ඉරා දමන්ට හැකිවූ අය ඔවුන් අතර ඇත. තමන් ගැනවූ අනාගතවාක්‍ය ඉටුවූ බව තේරුම් ගෙන යේසුස්වහන්සේ ලෝකයාගේ ගැළවුම්කාරයාණන් ලෙස පිළිගන්නාවූ ඔවුහු යේසුස්වහන්සේව එපා කර කුරුසියේ ඇණ ගැසීමෙන් තම ජාතිය කළ මහත් පාපය තේරුම් ගනිති. ජාතියක් ලෙස දෙවියන්වහන්සේ ඔවුන්ව එපා කළසේක. නමුත් ඔවුන් අතරෙන් සමහර අය හැරී ඇවිත් ගැළවෙනවා ඇත.

## *18 - පරිච්ඡේදය*

# පාපයේ අභිරහස

මුල සිටම සාතන්ගේ සැලැස්මව තිබුණේ මිනිසාගේ මනස යේසුස්වහන්සේ වෙතින් ඉවත් කොට මිනිසා වෙතටම හරවා පුද්ගලික වගකීම් විනාශ කර දැමීමටය. දේව පුත්‍රයාණන්ව පරීක්ෂා කිරීමේදී සාතන් පරාජයට පත්විය. පවට වැටුන මනුෂ්‍යයා වෙතට ආ විට එය හොඳින් සඵල විය. ක්‍රිස්තියානි ධර්මතාවන් දූෂණයට ලක් විය. පාප්වරු සහ පූජකවරු උසස් පදවියක් දරාගෙන තමුන්ගේ පාපවලට කමාව ලබාගන්නා පිණිස ක්‍රිස්තුස්වහන්සේ දෙස බලනවා වෙනුවට තමුන් දෙස බලන මෙන් ජනතාවට ඉගැන්වූහ. ඔවුන්ව වරදට පත්කරන සත්‍යතාවන් වසං කරන පිණිස බයිබලය ජනතාවට නොදී සිටියහ.

සම්පූර්ණයෙන්ම ජනතාව රැවටූහ. සාතන්ගේ නියෝජිතයන්ව සිටි පාප්වරු සහ පූජකයන් තමන් යේසුස්වහන්සේගේ නියෝජිතයන් යයි ජනතාවට ඉගැන්වූහ. ජනතාව පූජකයන්ට වන්දනා කරන විට ඔවුන් වන්දනා කළේ සාතන්ටය. ජනතාව බයිබලය ඉල්ලූහ. දේව වචනය කියවන්ට ඔවුන්ට ඉඩ දීම අනතුරුදායක බව එනම් සැබෑ ආලෝකය ලැබී තමන්ගේ පව් ජනතාව දැනගනීවී කියා භය වූහ. මෙම රැවටිලිකාරයෝ ජනතාවට ඉගැන්වූයේ දේව මුඛයෙන් වචනය ලබාගන්නවා යැයි සිතාගෙන තමන්ගෙන් සෑම වචනයක්ම ලබාගන්නා ලෙසය. ඔවුහු මිනිස් මනස කෙරෙහි බලය පැවැත්වූහ. දෙවියන්වහන්සේට පමණක් අයිති විය යුතු මෙම බලය ඔවුහු තමන් හට පවරා ගත්හ. තම හෘද සාක්ෂියට එකඟව ක්‍රියා කරන්නට යමෙක් දිරිමත් වුවහොත් සාතන් සහ යුදා සෙනඟ යේසුස්වහන්සේට විරුද්ධව ක්‍රියා කළාවූ ක්‍රෝධය ඔහුට විරුද්ධව ඇවිලී ක්‍රියාත්මක වේ. තම ආගමික සත්‍යතාවන් පවිත්‍රව තබාගත් ක්‍රිස්තියානින් සමූහ වශයෙන් භයානක අන්දමින් මරා දැමූ නිසා සාතන් විශේෂයෙන් ප්‍රීතියට පත්වූ කාලයක් මට පෙන්වනු ලැබීය.

බයිබලයට වෛර කරනු ලැබ දේව වචනය විනාශ කර දැමීමට ඔවුහු උත්සාහ කළෝය. බයිබලය කියවීම මරණ දඬුවම ලැබීමට සුදුසු වරදක් වූ අතර සොයාගත හැකිවූ ශුද්ධවූ පිටපත් සියල්ල පුළුස්සා දැමීය. නමුත් දේව වචනය කෙරෙහි දෙවියන්වහන්සේ විශේෂ සැලකිල්ලක් දැක්වූ බව මම දුටිමි. සමහර යුගවල බයිබල් පිටපත් තිබුණේ ඉතා ස්වල්පයක්ය. දෙවියන්වහන්සේ බයිබලය

ආරක්ෂා කළසේක. එය නැතිවී යන්ට නොදුන් සේක. අන්තිම කාලයේදී බයිබල් පිටපත් වැඩි වී සෑම පවුලකටම එය ලබාගැනීමට අවස්ථාව සලසා ඇත. බයිබල් හිඟව තිබූ කාලයේ පීඩාවන්ට ගොදුරු වූ අයට දේව වචනය ඉතා අනර්ඝ වූ සැනසිලිදායක දෙයක්ව තිබූ බව මම දුටිමි. බයිබලය කියවූයේ ඉතාම රහසිගතවය. මෙම උතුම් ඉඩ ප්‍රස්ථාව ලැබූ අයට හැඟී ගියේ තමන් දෙවියන්වහන්සේ සමගද, ක්‍රිස්තුස්වහන්සේ සහ අපෝස්තුළුවරුන් සමගද සම්මුඛ සාකච්ඡා පැවැත්වූ පුද්ගලයන් ලෙසය. මෙම ආශිර්වාද ලත් ඉඩ ප්‍රස්ථාව ලද අය අතරින් බොහෝ දෙනෙකුට තම ජීවිත අහිමි වූහ. බයිබලය කියවන බව දනගත හොත් එතැනින් ඔවුන්ව ගෙන යනු ලැබුවේ ගෙල සිඳ දමනු ලබන තැනටය. නැතහොත් ගිනි ටැඹ වෙතටය. එසේත් නැතහොත් කුසගින්නේ නසින්ට වන අඳුරු බිංගෙය තුළටය.

ගැළවීමේ සැලැස්ම බිඳ දමන්ට සාතන්ට නොහැකි විය. යේසුස්වහන්සේ කුරුසියේ මළ නමුත් තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිටි සේක. සාතන් තම දූතයන්ට කියා සිටියේ කුරුසපත්විම සහ මළවුන්ගෙන් නැගිටීමද තමාගේ ප්‍රයෝජනයට යොදා ගන්නා බවය. ක්‍රිස්තුස්වහන්සේගේ මරණය සංකේතවත් කළ පුද පූජා ඇතුළු ව්‍යවස්ථා උන්වහන්සේගේ කුරුසපත්වීමත් සමග අහෝසි වූ බව කිතුණුවන් විශ්වාස කිරීම ගැන ඔහු කැමති විය. තවදුරටත් කිතුණුවන්ව ඉදිරියට ගෙන යමින් ක්‍රිස්තුස්වහන්සේගේ මරණයත් සමග දස ආඥා පනතද කුරුසියේ ඇණගසනු ලැබ මරණයට පත් කළ බව විශ්වාස කරවන්ට සාතන්ට උවමනා විය.

සාතන්ගේ මෙම මුළාව බොහෝ දෙනෙක් කැමැත්තෙන්ම පිළිගත් බව මම දුටිමි. දෙවියන්වහන්සේගේ ශුද්ධ ව්‍යවස්ථාව මෙසේ පාගා දමනවා දුටු ස්වර්ගීයයන් මහත් කම්පාවට පත්වූහ. යේසුස්වහන්සේ ඇතුළු ස්වර්ගීය සේනාවන් මෙම ව්‍යවස්ථාවේ ස්වභාවය ගැන තේරුම් ඇතුව සිටියහ. දෙවියන්වහන්සේ එය වෙනස් කරන්නේවත්, අවලංගු කරන්නේවත් නැති බව ඒ අය දන සිටියහ. බලාපොරොත්තුවක් නොමැති තත්ත්වයකට මනුෂ්‍යයන් වැටීම ගැන ඔවුහු මහත් දුකකට පත්වූහ. යේසුස්වහන්සේ තම ජීවිතය පූජා කරන්නට කැමති වූයේ ව්‍යවස්ථාව කඩ කරන අයව සදාකාල මරණයෙන් මුදාගන්නා අදහසින්ය. ව්‍යවස්ථාව අවලංගු කළ හැකිව තිබුණා නම්, යේසුස්වහන්සේගේ ජීවිත පූජාව නැතිව මනුෂ්‍යයන්ව ගළවනු ලබනවා ඇත. යේසුස්වහන්සේ තමන්ගේ මරණය මගින් ව්‍යවස්ථාව විනාශ කළා නොව, තම පියාණන් වහන්සේගේ ව්‍යවස්ථාව ගෞරවයටත්, මහිමයටත් පත් කළසේක, සෑම ආඥාවක්ම පවත්වන්ට අණ කළසේක. සභාව පවිත්‍රව, ස්ථිරව සිටියා නම් දේව ව්‍යවස්ථාව පාගා දමන ලෙස සාමාජිකයන්ව මුළා කරන්ට සාතන්ට නොහැකි වනවා ඇත. ව්‍යවස්ථාව අවලංගු කළාය යන ඉගැන්වීම මගින් සාතන් කෙලින්ම පහර දෙන්නේ ස්වර්ගයෙහිද, පොළොවෙහිද වන දෙවියන්වහන්සේගේ පාලන අධිකාරියේ අත්තිවාරමටය. කැරලි ගැසීම ඔවුන්ව ස්වර්ගයෙන් නෙරපා දැමීමට හේතු විය. කැරලි ගැසීමෙන් පසුව තමාවම බේරාගැනීම පිණිස දෙවියන්වහන්සේ ව්‍යවස්ථාව වෙනස් කරනවාට සාතන් කැමති විය. දේවදූත සේනාවන් ඉදිරියේ දෙවියන්වහන්සේ සාතන්ට පෙන්වා දුන්නේ තම ව්‍යවස්ථාව වෙනස් කළ නොහැකි බවය. සාතන් දන්නවා යම් කෙනෙක් ව්‍යවස්ථාවේ එක ආඥාවක් හෝ කඩ කළහොත් ඔහුව තමාට අයිති වන බව. ආඥා කඩ කරන හැමකෙනාම නසින්ට ඕනෑය. සාතන් තවත් ටිකක් ඔබ්බට යමින් තම දූතයන්ට මෙසේ පැවසීය. මේ දලට අසු කරගන්නට නොහැකි තවත් කණ්ඩායමක් සිටිනවා. දස පනත ගැන ජ්වලිතයක් ඔවුන් තුළ තිබෙනවා. එය අවලංගු නොකරන බව විශ්වාස කරනවා. ඒ නිසා හතරවන ආඥාව දූෂණයට ලක් කළ යුතුය. අහසත් පොළොවත් මැවූ සැබෑවූ එකම දෙවියන්වහන්සේව ප්‍රකාශයට පත්කරන සබත් දවස වෙනස් කිරීමට උත්සාහයක් කරන ලෙසට සාතන් තම නියෝජිතයන්ට මග පෙන්වීය. යේසුස්වහන්සේ තමන් මහිමවත් මළවුන්ගෙන් නැගිටීම මගින් සබත් දවස වන සෙනසුරාදා වෙනුවට මළවුන්ගෙන් නැගිටි දිනය වන ඉරිදා පිහිටවූ බව ඔවුන්ට පෙන්වා දුන්නේය. මෙසේ සතියේ සත්වන දවස වන සෙනසුරාදාට තිබූ සබත් නිවාඩුව සතියේ පළමුවන දිනය වන ඉරිදාට මාරු කළහ.

මෙසේ මළවුන්ගෙන් නැගිටීම පවා සාතන් තම අභිප්‍රාය ඉටුකර ගැනීමේ මගක් කරගත්තේය. තමන් සූදානම් කළ වැරදි ඉගැන්වීම් ක්‍රිස්තුස්වහන්සේගේ මිතුරන් යයි කියාගත් අය ඉතා සතුටින් පිළිගැනීම ගැන සාතන් සහ ඔහුගේ දූතයෝ මහත් ප්‍රීතියට පත්වූහ. කෙනෙක් ආගමික තැති ගැන්මකින් දකින දේ තව කෙනෙක් සතුටින් පිළිගනී. වැරදි දේවල් පිළිගෙන ඒවා ජ්වලිත ලෙස ආරක්ෂා කරයි. දේව කැමැත්ත ලෙස දේව වචනයෙහි පැහැදිලි ලෙස එළිදරව් කර ඇති දේ වසා තබා, වැරදි ඉගැන්වීම් හා පරම්පරාගත නියෝග දෙවියන්වහන්සේගේ ආඥාවන් ලෙස පිළිගෙන උගන්වති. මෙවන් මුළාවන් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊම දක්වා කරගෙන යාමට ඉඩදී තිබෙන නමුත් මෙම මුළු කාලය තුළ සැබෑ ආකාරයෙන් විශ්වාසවන්ත ලෙස දෙවියන්වහන්සේට නමස්කාර කරන දෙවියන්වහන්සේගේ සියලුම ආඥා පවත්වන අය ජීවත් වෙමින් සාක්ෂි දරූහ.

දේවදූතයෝ මහිමයේ රජතුමාගේ දුක්විඳීම සහ මරණයට පත්වීම දෙස විශ්මයෙන් බලා සිටින හැටි මම දුටිමි. ජීවනයේ අධිපතියාණන් වූ මුළු ස්වර්ගයම ප්‍රීතියෙන්ද අලංකාරයෙන්ද පිරවූ

තැනැන්වහන්සේ මරණයේ බැමි බිඳ දමා හිරගෙය නමැති සොහොන තුළින් ජයග්‍රාහී ලෙස පිටතට පැමිණීම දේව දූතයන් පුදුමයට පත්කිරීමේ හේතුවක් නොවූ බවද මම දුටිමි. මෙම සිදුවීම් දෙකෙන් එකක් හෝ සැමරීමට දවසක් වෙන් කරවා ගන්නට වුවා නම් ඒ දවස කුරුස පත්වීමේ දවස විය යුතුය. මේ සිදුවීම් දෙකෙන් එකක්වත් දේව ව්‍යවස්ථාව වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට සැලසුම් කර නොතිබූ බව මම දුටිමි. නමුත් එම සිදුවීම් දෙකම ව්‍යවස්ථාවේ වෙනස් නොවන සුළු භාවය තහවුරු කළහ.

මෙම සිදුවීම් දෙකටම (කුරුසියේ පූජාව සහ මළවුන්ගෙන් නැගිටීම) ඒවාටම අනුරූප වූ සැමරීම් පිළිවෙත් ඇත. ස්වාමීන්වහන්සේගේ මරණය සිහි කරන සත්කර්මය වන රාත්‍රී භෝජන මෙහෙය පවත්වන අතර කඩන ලද රොටියද මිදි යුෂද ගැනීමෙන් ක්‍රිස්තුස්වහන්සේ දෙවෙනි වර එන තුරු අප සමරන්නේ උන්වහන්සේගේ මරණයය. මෙම ශුද්ධ සත්කර්මයේදී ක්‍රිස්තුස්වහන්සේගේ දුක්විඳීමේ දර්ශන හා වේදනාත්මක මරණය අපට නැවත සිහි ගන්වනවාය. මළවුන්ගෙන් නැගිටීම සමරන්නේ බව්තීස්ම මෙහෙයන් පැවැත්වීමේදීය. ක්‍රිස්තුස්වහන්සේව භූමදාන කළාක් මෙන් බව්තීස්ම වන අය ක්‍රිස්තුස්වහන්සේ සමග වතුර නැමැති සොහොනේ තැන්පත් කිරීමත් ජීවිතයේ අලුත්කමෙන් හැසිරෙන පිණිස උන්වහන්සේ සමග නැවත නැගිට සිටීමත් බව්තීස්මය මගින් සංකේතවත් වේ.

දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව සදාකාලයටම අලුත් පොළොවේදී ද තිබෙන්ට යන බව මට පෙන්වීය. මැවීමේදී පොළොවේ අත්තිවාරම දමූ විට දෙවියන්වහන්සේගේ ක්‍රියාවන් අගය කරමින් දේව පුත්‍රයෝ බලා සිටි අතර ස්වර්ගීය සේනාවෝද ප්‍රීති නාද පැවැත්වූහ. සබත් දවසේ අත්තිවාරම දැමුවේද එම අවස්ථාවේදීය. මැවීමේ දින හය අවසන් වී තමන්වහන්සේ කළ සියලු වැඩවලින් උන්වහන්සේ නිවාඩු ගත් සබත් දවසට ආශිර්වාද කර එය විශුද්ධ කළසේක. තමන් කළ සියලු වැඩවලින් උන්වහන්සේ නිවාඩු ගත් බැවින් එසේ කළසේක. සබත් දවස ස්ථාපිත කළේ පාපය ඇතිවන්ට පෙර ආදම් සහ ඒවද සියලූම ස්වර්ගීය සේනාවන්ද ඇතිවය. සබත සදාකාලයටම පවතින බවද, මිදීම ලත් ශුද්ධවන්තයන් හා දේව දූතයන් මැවුම්කාරයාණන්ගේ ගෞරවය සඳහා සදාකාලයටම පවත්වනු ලබන බවද මම දුටිමි.

*බලන්න: දානියෙල් 7 පරිච්ජේදය සහ 2 තෙසලෝනික 2*

## *19 - පරිච්ජේදය*

# මරණය සදාකාලික දුකෙහි ජීවත්වීම නොවේය

සාතන් මුළා කිරීම ඇරඹුයේ ඒදන් උයනෙහිදීය. 'නුඹලා ඇත්තටම නසින්නේ නැත' යි ඒවට ඔහු කීවේය. ආත්මය නොමැරෙන බව ඉගැන්වූ පළමුවෙනි පාඩම එය විය. එතැන් සිට මෙම මුළා කිරීම අද දක්වාම ඉදිරියට ගෙනැවිත් ඇති අතර ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊම දක්වාම ගෙන යනු ඇත. මගේ නෙත් ඒදනෙහි වූ ආදම් සහ ඒව වෙතට යොමු කරවන ලදී. ආදම් සහ ඒව තහනම් ගසෙහි ගෙඩි අනුභව කළහ. පසුව ඔවුන් ජීවන ගසේ ගෙඩි අනුභව කර පව්කාරයන් ලෙස සදාකාලයටම ජීවත් නොවන පිණිස ඒදන් උයනෙන් පිටතට යවා ජීවන ගහ වටේට කරකැවෙන ගිනි කඩුවක් තැබීය. ජීවන ගහ දෙනු ලැබුවේ ජීවිතය නොනැවතී පවත්වාගෙන යන පිණිසය. ආදම් සහ ඒවගෙන් පැවත එන යම් කෙනෙක් මෙම ගිනි කඩුව පසුකරගෙන ගොස් ජීවන ගසෙන් කෑවේදැයි දේව දූතයෙක් ප්‍රශ්න කළේය. තවත් දේව දූතයෙක්, 'නැත' කියා උත්තර දෙනවා මම ඇසීමි. එබැවින් සදාකාල ජීවනය තිබෙන පව්කාරයන් කිසිවෙක් නොමැත. පව්කරන ආත්මය සදාකාල මරණයට පත්වේ. එම මරණය නැවත නැගිටීමේ බලාපොරොත්තුවක් නැති මරණයකි. දේව උදහස ඉන් නිමාවට පත්වේ.

දෙවියන්වහන්සේ වදාළ 'පව්කරන ආත්මය නසින්නේය' යන වාක්‍යය, 'පව්කරන ආත්මය නසින්නේ නැත' කියා 'සදාකාලයටම නිරයෙහි දුක් විඳින්නේය' කියාද විශ්වාස කරන්ට ඉගැන්වීමේදී සාතන් ලබා ඇති සඵලත්වය මට මහත් පුදුමයට හේතුවක් විය. වේදනාවේ ජීවිතය වේවා ප්‍රීතියේ ජීවිතය වේවා දෙකේම අර්ථය ජීවත්වීමකි. 'මරණයේදී වේදනාව නැත. ප්‍රීතිය නැත. වෛරයද නැත.' යනුවෙන් දේව දූතයා පැවසීය.

'නුඹලා ඇත්තටම නසින්නේ නැත' කියා ඒවට මුළා කළ බොරුව නැවත නැවත කියා දෙමින් එය ලොව පුරා පතුරුවන්නට විශේෂ උත්සාහයක් දරන ලෙස සාතන් තම දූතයන්ට උනන්දු කළේය. මෙම මුළාවේ බොරුව මිනිසුන් පිළිගත් පසු සාතන් තවත් ඉදිරියට යමින් පව්කරන ආත්ම

සදාකාලයටම දුක් වේදනා විඳින්ට යන බවද මිනිසුන්ට විශ්වාස කරන්ට සැලැස්වීය. දැන් සාතන්ට දෙවියන්වහන්සේ ගැන බලවත්ම බොරුව තම නියෝජිතයන් මගින් පතුරුවන්ට මාර්ගය සූදානම්ය. එනම්, 'දෙවියන්වහන්සේ කෲර අධිපතියෙක්ය. තමන්වහන්සේව සතුටු නොකරන අයව සදාකාල නිරාගින්නට හෙළා කිව නොහැකි දුක් වේදනා විඳින්ට සලස්වමින් තෘප්තියට පත්වන මනුෂ්‍යයෝ ගිනි දැල්වල දවෙමින් ඇඹරෙන මිනිසුන් දෙස බලා සතුටට පත්වන කෙනෙක්ය" යන බොරුවය. මනුෂ්‍යයෝ මෙය විශ්වාස කළහොත් බොහෝ දෙනෙක් දෙවියන්වහන්සේට භය වෙන්ටත් වෛර කරන්ටත් වන බව සාතන් විශ්වාස කෙරිණ. සාතන් තවත් අන්තයකට සෙනඟව මෙහෙයවා ඇත. එනම් දෙවියන්වහන්සේ ඉතා අනුකම්පාවෙන් බර වූ කෙනෙක්ය. කිසිවෙකුව විනාශ කරන්නේ නැත. ශුද්ධවන්තයන් සහ පව්කරුවන් යන දෙකොටසම ගළවා ගෙන අන්තිමේදී රාජ්‍යයට ඇතුල් කරගන්නා සේක.

තවත් කණ්ඩායමක් සාතන් මුළා කරන්නේ දෙවි කෙනෙක් නැත කියා විශ්වාස කිරීමටය. බයිබලයේ පෙන්වන දෙවියන්ගේ ඒකීය භාවයක් නැත, සෙනඟගෙන් එක් කොටසකට භයානක වධහිංසා පමුණුවනවා නම් එම විශ්වාසය අපට පිළිගැනීමට නොහැක. අප විශ්වාස කරන්නේ මරණය සදාකාල නින්දක්ය කියාය.

සාතන් තවත් මෝඩ බියගුළු කණ්ඩායමකට පව්කරන්ට සලස්වා, ඔවුන් ඉදිරියේ තමන්ගේ පාපයේ කුලිය මරණය නොව, භයානක වේදනාවක් ඇතුව සදාකාල ජීවනය එනම්, ඉවරයක් නැති සදාතනයේ දුක් වේදනා දරා ගැනීමක්ය. මෙසේ ඔහු තමාගේ ඉඩ ප්‍රස්ථා දියුණු කරගනිමින් දුර්වල මිනිසුන්ගේ මනසවල් තමාගේ පාලනය යටතට ගනී. ඔවුන්ට සිතා බැලීමේ ශක්තියද අහිමි වේ. මෙලෙස සාතන් සහ ඔහුගේ දූතයෝ ප්‍රීතියෙන් උද්දාම වන අතර අදේව දෘෂ්ඨිකයෝද මිථ්‍යාදෘෂ්ඨිකයෝද ඔහුට එකතු වී ක්‍රිස්තු භක්තිය අපහාසයට ලක් කරති.

සාතන්ගේ මෙම එඩිතර ක්‍රියාවන් ගැන ස්වර්ගීය සේනාවන් මහත් උදහසින් සිටිනවා මම දුටිමි. 'සාතන්ගේ දූතයන්ට වඩා දෙවියන්වහන්සේගේ දූතයන් බලවත් බැවින් ඔවුනට අවසර දුනහොත් මෙවන් සිදුවීම් නවතන්ට හැකිව තිබියදී එසේ නොකරන්නේ මක්නිසාද?"යි මම ඇසුවෙමි. සාතන් මනුෂ්‍යයන් විනාශ කර දැමීමට තමාගේ සෑම උපායක්ම යොදා ගන්නා බව දෙවියන්වහන්සේ දනගෙන සිටිසේක. සතුරාගේ බලය පහසුවෙන් බිඳ දැමීමට දෙවියන්වහන්සේට පුළුවන. නමුත් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනය ලියා තබන්ට සැලැස්වූ සේක. උන්වහන්සේ බුද්ධියෙන් දුර්වලයාට පවා වටහාගත හැකි සේ ඒවා පැහැදිලිව ලියවා තැබූසේක. දේව වචනය නැතිව යන්ට නොදී ආරක්ෂා කළසේක. අනිකුත් කුමන පොතක් නැතිව ගියත් මෙම ශුද්ධවූ පොත අමරණීයව පැවතිය යුතු විය. ලෝකයේ අවසාන කාලය ලංවන විට සාතන්ගේ මුළාකිරීම් වැඩි වන නිසා හැම කෙනෙකුටම ඒවාට මුහුණ දෙන්ට හැකිවන සේ දැනුවත් වීමට බයිබල් පිටපත්ද අතිශයින් වැඩි විය යුතුය.

දෙවියන්වහන්සේ විශේෂ ආකාරයකින් බයිබලය ආරක්ෂා කළසේක. නමුත් පිටපත් ස්වල්පයක්ව තිබූ කාලයේ උගත් අය සමහර වගන්ති වඩාත් පැහැදිලි කර දක්වන පිණිස වචන වෙනස් කර ඇත. නමුත් බයිබලය ඒකීය ආකාර සම්පූර්ණ පොතකි. එය දම්වැලක් සේ එක ලියවිල්ලක් තවත් ලියවිල්ලක් තේරුම් කරදෙන ආකාරයෙන් ලියවී ඇත. සත්‍යවාදී ලෙස සත්‍යය සොයන්නන්ට වරදින්නේ නැත. ජීවනයේ මාර්ගය ගැන සරලව පැහැදිලිව උගන්වනවා පමණක් නොව දේව වචනයෙහි දක්වා තිබෙන ජීවන මාර්ගය සොයන අයට එය තේරුම් ගැනීම පිණිස මගපෙන්වීමට ශුද්ධාත්මයාණන් වහන්සේවද දෙන්ට පොරොන්දු වී ඇත.

දේව දූතයන් විසින් මනුෂ්‍යයන්ගේ මනසවල් පාලනය නොකළ යුතු බව මම දුටිමි. මනුෂ්‍යයන් ඉදිරියේ උන්වහන්සේ ජීවිතයත් මරණයත් තබා ඇත. කැමති දේ ඔහුට තෝරාගත හැක. බොහෝ දෙනෙක් ජීවනය ලබන්ට කැමතිය. නමුත් ගමන් කරන්නේ පළල් මාර්ගයෙහිය. මක්නිසාද ඔවුහු ජීවනය තෝරා ගෙන නැත.

පව්කාර මනුෂ්‍යයන් උදෙසා තම පුත්‍රයාණන් දීමේ දෙවියන්වහන්සේගේ දයාව සහ අනුකම්පාව මම දුටිමි. මෙතරම් උසස් මිලයක් ගෙවා සැලසුම් කරදුන් ගැළවීම පිළිනොගත් අයට දඬුවම් කළ යුතුය. දෙවියන්වහන්සේ විසින් මවනු ලැබූ අයවලුන් උන්වහන්සේගේ පාලනයට විරුද්ධව කැරලි ගැසීමට තෝරා ගෙන ඇත. නමුත් උන්වහන්සේ ඔවුන්ව සදාකාලයටම දුක් වේදනා විඳින පිණිස නිරයට හෙළා එය වසා දැමුවේ නැත. උන්වහන්සේ ඒ අයව ස්වර්ගයට ගෙන යන්නේද නැත. මක්නිසාද පවිත්‍ර වූ ශුද්ධවූ කණ්ඩායමක් අතරට ඔවුන්ව ගෙන ගියොත් ඔවුනට එය ඉවසිය නොහැකි දුක්ඛිත අත්දැකීමක් වනවා ඇත. මෙසේ ඔවුන් ස්වර්ගයට හෝ නිරයට හෝ නොයවා ඔවුන් කවදාකවත් නොසිටියාක් මෙන් වන පිණිස සම්පූර්ණ ලෙස විනාශ කර දමන සේක. මෙසේ දෙවියන්වහන්සේගේ සාධාරණත්වය ඉටු වේ. දෙවියන්වහන්සේ මනුෂ්‍යයාව පොළොවේ දූවිල්ලෙන්

නිර්මාණය කළසේක. අකීකරු, අශුද්ධ අයව ගින්නෙන් දවා දැමීම මගින් නැවත දූවිල්ල සමග එක් වේ. දෙවියන්වහන්සේගේ ත්‍යාගවන්ත භාවය හා දයානුකම්පාවද උන්වහන්සේගේ යහපත් චචනයද අගය කොට උන්වහන්සේට හිස් නමා වන්දනාමාන කළ යුතු බව මම දුටිමි. සියලූ ස්වර්ගීය සේනාවන් 'ආමෙන්" යයි කියනවා ඇසීමි.

ක්‍රිස්තුස්වහන්සේගේ නාමය පටබැඳ ගත් නමුත් තමන්ගේ සූක්ෂ්ම මුළාවන්ට සම්බන්ධ වී අසුවී සිටි සියල්ලන් දෙස අධික තෘප්තියෙන් යුතුව සාතන් බැලීය. ඔහුගේ වැඩය වී තිබුණේ හැකි තරම් මුළාවන් නිෂ්පාදනය කිරීමය. ඔහුගේ බලය වැඩි වී, ඔහුගේ ක්‍රම අලූත් වී, ඔහු තමාගේ නියෝජිතයන් වන පාප්වරුන් සහ පූජකයන්ව මෙහෙය වූයේ තමන්වම උත්තමයන් සේ උසස් කරගෙන සෙනඟ පොළඹවා දෙවියන්වහන්සේට ප්‍රේම කළ අයට තද ලෙස පීඩා කරවීමටය. ඒවාට නොනැමෙන අයව නොහොත් ක්‍රිස්තුස්වහන්සේට කැපව සිටින අයව මරා දැමීමටය. අහෝ! දෙවියන්වහන්සේට ප්‍රියව සිටි අයට මොන තරම් දුක් වේදනා දරන්ට ඔවුහු සැලැස්වීද. දේව දූතයෝ ඒවා ගැන විශ්වාස ලෙස සටහන් තබා ඇත. නමුත් සාතන් සහ ඔහුගේ දූතයෝ මහත් උද්දාමයකින් කථා කරමින් දුක් වේදනාවල සිටි අයට උපස්ථාන කරමින් සහ ශක්තිමත් කරමින් සිටි දේව දූතයන්ට කීවේ ඔවුන් ඒ අයව මරා දමන බවය, මෙසේ සැබෑ වූ ක්‍රිස්තියානිකාරයින් ලොවේ නොසිටින්ට සලස්වන බවය. ඒ කාලයේදී දෙවියන්වහන්සේගේ සභාව පවිත්‍රව තිබෙන බව මම දුටිමි. දූෂිත සිත්වලින් යුත් අය සභාවට ඇතුල් වීමේ අනතුරද එකල නොතිබිණ. මක්නිසාද තමාගේ ඇදහිල්ල නොබියව ප්‍රකාශ කරන්ට කැමති වූ තැනැත්තා ඉදිරියේ වූයේ භයානක ලෙස වධහිංසා කරමින් මරණයට පත්කිරීමේ අනතුරය.

***කියවන්න: උත්පත්ති 3 වන පරිච්ඡේදය; දේශනාකාරයා 9: 5; 12: 7; ශු. ලූක් 2: 33; ශු. යොහන් 3: 16; 2 තිමෝති 3: 16; එළිදරව් 20: 14-15; එළිදරව් 21: 1; 22: 12-19.***

## 20 - පරිච්ඡේදය

# ප්‍රතිසංස්කරණය

කොතෙක් පීඩා ඇති කළත් ඇදහිලිවන්තයන්ව මරා දැමුවත් දෙවියන්වහන්සේ සෑම පැත්තෙන්ම ජීවමාන සාක්ෂි දරන්නන්ව නැගිටෙවූ සේක. දේව දූතයෝ තමන්ට භාරව තිබූ සේවය ඉටු කළහ. අඳුරු තැන්වල නොපෙනී සිටින අවංක සිත් ඇති අයව දේව දූතයෝ සොයන්ට වූහ. සිතින් අවංක අය බොරු ගොඩවල් යට වැළලී සිටියහ. දෙවියන්වහන්සේ සාවුල් සොයාගත් ලෙස ඔවුන්වත් සොයාගත් සේක. ක්‍රිස්තියානි යයි කියාගත් අයගේ පාප සහ මුළාවීම් හඬ නගා ප්‍රකාශ වෙන්ට සැලැස්වූ සේක. මාටින් ලූතර්, මෙලැන්ක්තන් සහ තවත් එවැනි අයගේ සිත් තුළ දේව වචනය ගැන පිපාසයක් ඇති කරවන පිණිස දේව දූතයෝ ක්‍රියා කළහ. සතුරා ජල ගැල්මක් ලෙස ඇවිත් තිබිණ. ඔහුට විරුද්ධව ආගමික ශුද්ධ භාවය ඔසවා තැබිය යුතුය. මාටින් ලූතර්ව ඒ සඳහා තෝරාගෙන ඇදහිල්ලෙන් වැටී ගියාවූ සභාවට එරෙහිව නැගී සිටින්ටත් ඇදහිල්ලෙහි විශ්වාසවන්තව සිටි ස්වල්ප දෙනා ශක්තිමත් කරන්ටත් යොදා ගත් සේක. මාටින් ලූතර් දේව සිත රිදවන්ට භයවූ කෙනෙකි. ක්‍රියා මගින් දෙවිඳුන්ගේ හොඳ හිත දිනාගන්ට සිතූ කෙනෙකි. නමුත් ඔහුගේ ක්‍රියාවලින් ඔහුට සහනයක් නොලැබුණ අතර ස්වර්ගීය ආලෝක රැල්ලක් මගින් ඔහුගේ සිතෙහි වූ අඳුර පහකරන්ට යෙදින. එයින් ඔහුට මගපෙන්වනු ලැබුවේ තමාගේ ධර්මිෂ්ඨ ක්‍රියා කෙරෙහි විශ්වාසය නොතබා ක්‍රිස්තුස්වහන්සේගේ සිඳ හෙලූ ලෙය කෙරෙහි විශ්වාසයෙන් යුතුව, පාප්වරුන් හෝ පූජකයන් මගින් නොව තමාම ක්‍රිස්තුස්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ වෙතට පැමිණීමටය. මෙම අවබෝධය ලූතර්ට කෙතරම් වටිනා වස්තුවක් වූයේද! දේව වචනය ඔහුට අලූත් දෙයක්ය. සියල්ල වෙනස් විය. බයිබලයේ තිබෙන අලංකාරය ඔහු දැක තිබුණේ නැත. නමුත් ඔහු තුළ එයට භයක් ඇතිව තිබිණ. බයිබලය ඔහුට ජීවිතය බවට පත්විය. එය ඔහුට සතුට හා සැනසිල්ල විය. එය ඔහුට ආශිර්වාදලත් ගුරුවරයා විය. එය අධ්‍යයනය කිරීමෙන් ඔහුව වළක්වන්ට කිසිවකට නුපුළුවන් විය. ඔහු සිටියේ මරණයට භයින්ය. නමුත් ඔහු දේව වචනය ඉගෙන ගත් අතර එම භය නොපෙනී යන්ට විය. ඔහු දේව වචනය අගය කර උන්වහන්සේට ප්‍රේම කරන්ට පටන් ගැනිණ. ඔහුම ශුද්ධ ලියවිලි සෙවීමෙහි යෙදින. එහි තිබෙන වටිනා වස්තුවලින් තම ජීවිතය පෝෂණය කර ගැනිණ. පසුව ඔහු සභාව උදෙසාද දේව වචනය හැදෑරීය. ගැළවීම සඳහා තම මිනිසුන් විශ්වාසය රඳවා සිටි ප්‍රධානින්ගේ පාප දැක ඔවුන් ගැන අප්‍රිය භාවයකට පත්විය. තමාව ආවරණය වී තිබූ අඳුරෙන් තවත් බොහෝ දෙනෙකු ආවරණය වී සිටිනවා ඔහුට පෙනෙන්ට විය. ලෝකයේ පාපය දුරලන බැටළු පැටවාණන් වෙතට ඔවුන්ව යොමු කරන්ට අවස්ථා පැමිණෙන තුරු නොඉවසිල්ලෙන් බලා සිටින්ට විය. පාප් සභාවේ වැරදි සහ

පාපවලට විරුද්ධව ඔහු තම හඬ ඇසෙන්ට සලස්වමින් තමා මෙන්ම ක්‍රියාවලින් ගැළවීම ලබන්ට බලාපොරොත්තුව සිටි දසදහස් ගණන් ජනතාව වෙළාගෙන තිබෙන අඳුර තුරන් වෙනවා දකින්ට නොඉවසිල්ලෙන් සිටින්ට විය. දේව අනුග්‍රහයේ අනගි වස්තුද යේසුස්වහන්සේ තුළ තිබෙන ගැළවීමේ උතුම්කමද ගැන ඔවුන්ගේ සිත් විවෘත කරන්ට තමාට හැකියාව ලැබෙන්නේ කෙසේද කියා ඔහු උනන්දු ප්‍රාර්ථනාවෙන් බලා සිටින්ට විය. මාටින් ලූතර් මහත් කැපවීමකින් යුතුව තමාගේ හඬ නගා, සභා ප්‍රධානීන්ගේ පාපිෂ්ඨ ක්‍රියාවන් ගැන ශුද්ධාත්මයාණන්ගේ බලයෙන් කථා කරන්ට විය. පූජකයන්ගේ විරුද්ධවාදිකම් ඉදිරියේදී ඔහුගේ දිරිය අඩු නොවී දෙවියන්වහන්සේගේ බලවත් හස්තයෙහි රඳා සිටිමින් ජයග්‍රහණය සඳහා විශ්වාසයෙන් ක්‍රියා කළේය. සටන ඔහු ඉදිරියට ගෙන යන අතර ඔහුට විරුද්ධව පූජකයන්ගේ කෝපය උත්සන්න විය. ඔවුන් වැරදි හදාගන්ට කැමති වූයේ නැත. ඔවුන්ට උවමනා කළේ පාපී සහ සැප පහසු ජීවිත ගත කිරීමටය. සභාව අඳුරේ තබාගැනීම ඔවුන්ගේ ප්‍රාර්ථනාව වූහ.

ලූතර් කැපවීමක් ඇති, උනන්දු, භය නැතිව පාපය පෙන්වා දෙන සත්‍යය නිර්භීත ලෙස ඉදිරිපත් කරන කෙනෙක් බව මම දුටිමි. ඔහු දුෂ්ට මිනිසුන්ව හෝ යක්ෂයන්ව ගණන් ගත්තේ නැත. ඔවුන්ට වඩා බලවත් කෙනෙක් තමා සමග සිටින බව ඔහුගේ විශ්වාසය විය. පමණට වඩා වේගයෙන් ඉදිරියට යන ගතියක් ඔහු සතුව තිබිණ. ඔහුගේ පිළිවෙලට වඩා වෙනස් ගුණාංග තිබෙන මෙලැන්ක්තන්ව දෙවියන්වහන්සේ කැඳවූ සේක. මෙලැන්ක්තන් සටනට නොයන, භය ඇති, සීරුවෙන් ක්‍රියාකරන මහත් ඉවසීමක් සතුව සිටි කෙනෙකි. ඔහු දෙවියන්වහන්සේගෙන් බොහෝ ප්‍රේමලත් කෙනෙකි; ශුද්ධ ලියවිලි ගැන හොඳ දැනුමක් ඔහුට තිබුණු අතර යම් දේවල් විමසා බැලීමට හැකි උසස් බුද්ධියක් ඔහු සතුව තිබිණ. දෙවියන්වහන්සේගේ සේවය ගැන ලූතර්ට තිබුණ ආශාව හා සමානවම ආශාවන් ඔහු තුළ තිබිණ. මේ දෙදෙනාගේ සිත් දෙවියන්වහන්සේ එකට ගැට ගසා තිබූ අතර, කිසිදා වෙන් කළ නොහැකි මිත්‍රත්වයකින් ඔවුහු බැඳී සිටියහ. මෙලැන්ක්තන් භයව දුර්වලව සිටි විට ලූතර් ඔහුට ශක්තියක් විය. ලූතර් තමාගේ වේගවත්කම හා නිර්භීත භාවය අනුව ක්‍රියා කළා නම් සමහර අවස්ථාවල සේවයට බලවත් පාඩු ඇතිවන්ට තිබිණ. නමුත් මෙලැන්ක්තන්ගේ දුර දිග බලා ක්‍රියා කිරීමේ හැකියාව නිසා ඔහු ලූතර්ට මහත් උපකාරයක් විය. ශුභාරංචි සේවය ඉදිරියට ගෙනයාම සඳහා මේ දෙදෙනාව එකතු කිරීම ගැනවූ දිව්‍ය ප්‍රඥාව මට පෙන්වීය. මගේ අවධානය ආපස්සට අපෝස්තුළුවරුන්ගේ කාලය වෙතට ගෙන ගොස් ලූතර් සහ මෙලැන්ක්තන් වැනි ප්‍රතිවිරුද්ධ ගුණාංග ඇතිව සිටි අපෝස්තුළු පේත්‍රුස් සහ යොහන් යන දෙදෙනාව මට පෙන්වූ සේක. පේත්‍රුස් කථාවෙහි වතුර සේවයෙහි ක්‍රියාවෙහි වේගවත් කෙනෙක්ව සිටියේය. සමහර අවස්ථාවල සතුරන් නිහඬ කිරීමට එයද අවශ්‍ය විය. යොහන් තුමා සිත් දිනාගන්නා කෙනෙක් විය. ඔහු තම ඉවසීම දරාගැනීමේ හැකියාව සහ ගැඹුරුවූ කැපවීම කරණකොටගෙන බොහෝ දෙනෙකුව දෙවියන්වහන්සේගේ සේවය සඳහා දිනාගන්ට යෙදින.

ප්‍රතිසංස්කරණය ඉදිරියට ගෙන යාමටත් පාප් සභාවේ පාප අපරාධවලට විරුද්ධව හඬ නගන්ටත් දෙවියන්වහන්සේ තව තවත් මිනිසුන්ව නැගිටවූ සේක. සාතන් මෙවන් අයව නසන්ට ප්‍රයත්න දැරූ නමුත් දෙවියන්වහන්සේ ඒ අය වටා ආරක්ෂක වැටවල් බැඳ තැබූසේක. තමන් දැරූ සාක්ෂියේ ජීවමාන බව දක්වන පිණිස සමහර අය තම ලේවලින්ම ඊට මුද්‍රා තැබූහ. නමුත් ලූතර් සහ මෙලැන්ක්තන් පාප්වරුන්ගේද පූජකයන්ගේද රජවරුන්ගේද පාප අපරාධවලට විරුද්ධව තම හඬ ඇසෙන්ට සලස්වා දෙවියන්වහන්සේව ගෞරවයට පත් කළහ. ඔවුහු ලූතර්ගේ හඬ ඉදිරියේ වෙව්ලන්ට වූහ. තෝරාගනු ලැබූ මිනිසුන් මගින් ආත්මික අඳුර තුළට ආලෝක රශ්මි විහිදී යන්නටවූ අතර බොහෝ අය ප්‍රීතියෙන් ආලෝකය පිළිගෙන එහි ගමන් කරන්ට වූහ. එක සාක්ෂිකරුවෙකු මරා දැමූ විට ඒ වෙනුවට දෙදෙනෙකු හෝ ඊට වඩා කීප දෙනෙකු නැගිටුවා දෙන්ට යෙදින.

සාතන් සෑහීමකට පත්වූයේ නැත. ඔහුට බලය තිබුණේ ශරීරය කෙරෙහි පමණය. විශ්වාසිකයන්ගේ ඇදහිල්ල සහ බලාපොරොත්තු තම වසඟයට ගන්ට ඔහුට හැකි නොවීය. මරණයේදී පවා ඔවුහු මළවුන්ගෙන් නැගිටීමේ බලාපොරොත්තු තුළ ජයග්‍රහණය ලැබූහ. ඔවුන් සතුව සාමාන්‍ය ශක්තියට වඩා වැඩි දෙයක් තිබිණ. ඔවුහු අවදිව සිටියහ. යුද්ධායුධ කට්ටලය පැළඳ ගෙන සිටියහ. සටනට සූදානම්ව සිටියහ. ආත්මික සතුරන්ට විරුද්ධව පමණක් නොව මනුෂ්‍ය වේශයෙන් පෙනී සිටි සාතන්ටද විරුද්ධවය. සතුරාගේ විරුදාවලිය වූයේ 'ඇදහිල්ල අත්හැරපල්ලා. නැතහොත් මැරියල්ලා' යනුවෙන්ය. එකල සිටි ක්‍රිස්තියානින් ස්වල්ප දෙනා දෙවියන්වහන්සේ තුළ බලයෙන් ශක්තිමත්ව සිටියහ. ලෝකයෙන් අඩක් පමණ වූ ක්‍රිස්තුස්වහන්සේගේ නම පටබැඳගෙන සිටි මහත් සෙනඟට වඩා එම ස්වල්ප දෙනා දෙවියන්වහන්සේ ඉදිරියෙහි ඉතා අනර්ඝව සිටියහ. සභාව පීඩාවන්ට පත්ව සිටි අවධියේ ඇදහිලිවන්තයෝ ප්‍රේමයෙන් එකමුතුව සිටියහ. දෙවියන්වහන්සේ තුළ බලවත්ව සිටියහ. පව්කරුවන්ට සභාවට ඇතුල් වෙන්ට ඉඩ නොදුන් අතර මුළාවූවන් හෝ මුළා කරවන්නන්ද ඇතුල් නොවූහ. ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සියල්ල ත්‍යාග කරන්ට කැමති වූවන්ට පමණක්ය උන්වහන්සේගේ ගෝලයන් විය හැක්කේ. ඒ අය දිළිඳු වන්නටද යටහත් පහත් වන්නටද ක්‍රිස්තුස්වහන්සේ මෙන් වූ අය වන්නටද කැමැත්තෝය.

*කියවා බලන්න: ලූක් 22: 61-62; යොහන් 18: 10; ක්‍රියා පොතේ 3 සහ 4 පරිච්ඡේද; එන්සයික්ලෝපීඩියා පොතේ ප්‍රතිසංස්කරණය.*

## *21 - පරිච්ඡේදය*

# සභාව සහ ලෝකය එකට එක්වේ

සාතන් සහ ඔහුගේ දූතයෝ එකතු වී සාකච්ඡාවක් පැවැත්වූහ. ඔවුහු තමන්ගේ වැඩවල ප්‍රගතිය සොයා බැලූහ. බයාදු ගති ඇති ටික දෙනෙකු ඇදහිල්ල පිළිගැනීමෙන් වළක්වා ගත් බව ඇත්තකි. ඒ මරණ භය නිසාය. නමුත් බයාදු ගති ඇති බොහෝ දෙනෙක්ද සත්‍යය වැළඳ ගත්හ. ඒ සමගම ඔවුන් තුළ වූ බයාදු ගති නැතිවූහ. සහෝදරයන් මරණයට මුහුණ දුන් විට ඔවුන්ගේ ස්ථිර භාවය සහ ඉවසිල්ල දක දෙවියන්වහන්සේ සහ දේව දූතයන් එවැනි දුක් වේදනා දරාගන්ට ඔවුන්ට උදව් දුන් බව දැනගත්හ. ඔවුහුද එයින් දිරිමත් වූහ. පසුකලෙක ඔවුන්ටද දිවි පුදන්නට කැඳවනු ලැබූ විට ඔවුන් ඊට මුහුණ දුන් ආකාරය දුටු අය වෙව්ලන්නට වූහ. කිතුණුවන් නසා දැමීමට තව වඩාත් සඵලවත් ක්‍රමයක් ගැන සාතන් සහ ඔහුගේ දූතයන් සිතන්ට වූහ. ක්‍රිස්තියානි අය කොතෙක් දුක් වේදනාවලට භාජන කළත් ඔවුන් තුළ වූ ස්ථිරත්වය හා පැහැදිලි බලාපොරොත්තුව නිසා වධහිංසා සහ ගිනි මැලය ඉදිරියේ පවා ඔවුහු භය නැතිව සිටින්ට යෙදින. යේසුස්වහන්සේ මිනීමරුවන්ට මුහුණ දී ගෞරවණීය ලෙස සියල්ල දරාගත් ආකාරය ඔවුහුද අනුගමනය කළහ. දෙවියන්වහන්සේගේ මහිමයේ ආලෝකයක් ඔවුන් මත රැඳී තිබූ බව බලාගෙන සිටි අය දුටුවහුය. වඩා මෘදු ක්‍රමයකින් ක්‍රියා කිරීමට සාතන් අදහස් කෙරිණ. කෝටි ගණන් ජනතාව විනාශ වන අන්දමට විකෘති කරන ලද බයිබල් ධර්මතාවන්ද, පරම්පරාගත නියෝගද මිනිසුන්ගේ සිත් තුළ ගැඹුරට මුල්බැස ගෙන තිබිණ. සාතන් තම වෛරය මැඩපවත්වා ගෙන පීඩා කිරීම් නවතා දමා සභාව වෙනතකට ගෙන යන්ට විය. ශුද්ධවන්තයන්ට මුලදී දෙන ලද ශුද්ධ ඇදහිල්ල උදෙසා පොර බදනවා වෙනුවට ලෝකයාගේ උදව් උපකාර හා ගෞරව සම්මාන ලබාගැනීමෙන් මහත් ලාභ ප්‍රයෝජන ලබාගත හැකි මාවතකට සභාව යොමු කෙරිණ. මෙසේ සභාවට දෙවියන්වහන්සේ ඉදිරියේ තිබූ ගෞරවය අහිමි කෙරිණ. ක්‍රම ක්‍රමයෙන් සභාව බලයෙන් පිරිහී ගියාය. මෙසේ සභාව සත්‍යතාවන්ගෙන් බැහැරවූ අතර සැප සෙල්ලම්වලට ආශා කරන ලෝකය සමග ආදරයෙන් බැඳුණාය.

සභාව ලෝකයෙන් වෙන්ව විශේෂ අමුතු සෙනඟක්ව පෙනී සිටියේ බොහෝ සෙයින් පීඩා ඇතිවූ කාලයන්හිදීය. රත්රන්වල දිලිසීම අඩු වූයේ කෙසේද? ඉතා හොඳ රත්රන් වෙනස් වූයේ කෙසේද? සභාව ඈ සතුව තිබූ ශුද්ධ වූ විශේෂ තත්ත්වය දිගටම පවත්වා ගෙන ආවා නම් අපෝස්තුළුවරුන්ට දෙනු ලැබුවා වූ ශුද්ධාත්මයාණන් වහන්සේ සභාව සමග ඉදිරියේදීත් සිටින බව මම දුටිමි. රෝග සුවවීම්, අශුද්ධාත්මයන්ට තරවටු කර පළවා හැරීම් ඇතිව සභාව බලයෙන් යුක්ත වන අතර සතුරන්ට භීතිය ගෙනෙනවා ඇත.

අති විශාල සෙනඟක් ක්‍රිස්තුස්වහන්සේගේ නම පටබැඳගෙන සිටි නමුත් දෙවියන්වහන්සේ ඔවුන්ව තමන්වහන්සේගේ අය ලෙස පිළිනොගත් බව මම දුටිමි. ඔවුන්ට උන්වහන්සේ ප්‍රසන්න නැත. සාතන් ආගමික චරිතයක් මවාගත් අතර සෙනඟ ද තමන් ක්‍රිස්තියානින් යයි කියාගන්නවාට ඔහු කැමති විය. ජනතාව ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි විශ්වාස කරනවාට කුරුසපත්වීම සහ මළවුන්ගෙන් නැගිටීම පිළිගන්නවාට සාතන් බොහෝ සෙයින් කැමතිය. සාතන් සහ ඔහුගේ දූතයන් මේ දේවල් පිළිගන්න නමුත් ඔවුහු භයෙන් වෙවුලති. මෙම විශ්වාසයන් යහපත් ක්‍රියාවන්ට පොළඹවන්නේ නැත්නම්, තමකම ත්‍යාග කළ ක්‍රිස්තුස්වහන්සේ මෙන් වන්නට උත්සාහයක් දක්වන්නේ නැත්නම් සාතන් කලබල වන්නේ නැත. මක්නිසාද නම පමණක් ලබාගෙන සිතේ වෙනසක් සිදු නොවී මාංසිකව සිටින අයව තමාගේ සේවයෙහි හොඳින් යොදා ගන්ට පුළුවන් බව සාතන් දන්නා නිසාය. ක්‍රිස්තියානි නම තුළ ඔවුහු තම අවගුණ සඟවා ගනිති. තම දුෂ්ට ආශාවන් යටපත් කරගෙන පවිත්‍ර කරනු නොලැබූ ස්වභාවය ඇතිව ඔවුහු එහා මෙහා යති. මෙවන් අය නිසා ක්‍රිස්තුස්වහන්සේටත්, පවිත්‍ර ඇදහිල්ල පවත්වා ගෙන යමින් සිටින අයටත් නොඇදහිලිකාරයන් ඉදිරියේ ලැජ්ජාවටත්, සිත් වේදනාවටත් පත්වන්ටද සිදුවන අතර ශුද්ධ ඇදහිල්ලද අපහාසයට ලක් වේ.

දේවගැතිවරු මෙවැනි මාංසික අයට ඔවුන් ආශාවෙන සුමුදු දේශනා පවත්වති. සාතන් කැමති වන්නේ එවන් දේශනා කරනවාටය. යේසුස්වහන්සේව දේශනා කරන්ටත් වැරදි දක්වන දේශනා කරන්ටත් බයිබල් සත්‍යතාවන් ඉදිරිපත් කරන්ටත් ඔවුහු භයපත් වෙති. සාමාජිකයන් අතර බොහෝ ධනවත් අය ද සිටිති. සාතන්ට සහ ඔහුගේ දූතයන්ට සභාව තුළ සිටින්ට සුදුසුකමක් නැතුවාක් මෙන්

මොවුන්ටද සුදුසුකමක් නැති නමුත් මේ අයව සභාවේ රඳවා ගෙන ඇත. ලෝකයා ඉදිරියේ සභාව ජනප්‍රිය වන්ට සහ ගෞරවය ලබන්ට ගෙනැවිත් ඇත. මෙම ඉගැන්වීම් කිතු දහමේ ඉගැන්වීම් වලට බොහෝ සෙයින් දුරස්ථව ඇත. ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කළ අය ලෝකය ත්‍යාග කරන්ට වූහ. මෙම සුමුදු ඉගැන්වීම් ආරම්භ වූයේ සාතන්ගෙන් සහ ඔහුගේ දූතයන්ගෙන්ය. ඔවුහු සැලැස්ම සැදූහ. නාමික කිතුණුවන් ඒවා අනුව ගියහ. මෙසේ වංචාකාරයෝද පව්කාරයෝද සභාවට ඇතුල් වෙති. සිත් සතුටු කරවන බොරු උගන්වති. ඔවුහු ඒවා කැමැත්තෙන් පිළිගනිති. නමුත් සත්‍යය එහි පවිත්‍රතාවෙන් යුතුව දේශනා කරනවා නම් වැඩිකල් යන්න පෙර වංචාකාරයන්වද පව්කාරයන්වද සභාවෙන් පිටත තබනවා ඇත. ක්‍රිස්තියානි අයත් ලෝකයත් අතර වැඩි වෙනසක් නැත. පිටත වැස්ම ගළවා බලන්ට පුළුවන් නම් ඔවුන්ගේ ජීවිතවල දුෂ්ටකම්, දූෂිත අපවිත්‍රකම් දකින ළමයෙක් වුවත් කියනවා ඇති මේ අය යක්ෂයාගේ දරුවන්ය යන වග. මක්නිසාද ඔවුන් කරන්නේ ඔවුන්ගේ පියාගේ ක්‍රියාය. යේසුස්වහන්සේද ස්වර්ගීයයන්ද ඔවුන් දෙස බලන්නේ ඉතා පිළිකුල් ආකාරයටය. සභාවට දීමට දෙවියන්වහන්සේ සමග පණිවිඩයක් ඇත. එය ශුද්ධය. ඉතා වැදගත්ය. එය පිළිගතහොත් සභාවේ සම්පූර්ණ ප්‍රතිසංස්කරණයක් ඇතිකර ජීවමාන සාක්ෂියක් දරන්ට සලස්වා වංචාකාරයන්ද පව්කාරයන්ද පහකර දමා සභාව නැවත වරක් දෙවියන්වහන්සේගෙන් ආශිර්වාද ලැබෙන තැනට ගෙන එනවා ඇත.

*යෙසායා 30: 8-21; යාකොබ් 2: 19; එළිදරව් 3 වෙනි පරිච්ඡේදය කියවන්න.*

## *22 - පරිච්ඡේදය*

# විලියම් මිලර්

දෙවියන්වහන්සේ, බයිබලය කෙරෙහි විශ්වාසය නොතැබූ ගොවියෙකුගේ සිතෙහි ක්‍රියා කර අනාවැකි සොයා බලන්ට පොළඹවන පිණිස, තමන්වහන්සේගේ දූතයා යවනු ලැබූ බව මම දුටිමි. දේව දූතයෝ නිතර ඔහු වෙත යමින් දේව සෙනඟට මෙතෙක් අඳුරෙන් වැසී තිබූ අනාවැකි වටහා ගන්නට උදව් කළහ. දම්වැලක් ලෙස ඇතට විහිදී යන සත්‍යයේ ආරම්භය ඔහුට පෙන්වන ලදී. පුරුකෙන් පුරුක සම්බන්ධ කරන්ට මගපෙන්වූ අතර දේව වචනය කියවා විශ්මපත් දේ දෙස ඔහු පුදුමයෙන් බලන්ට විය. පූර්ණත්වයෙන් වූ සත්‍යය දම්වැලක් ලෙස ඔහුට පෙනිණ. දේව පෙළඹීමකින් වුවත් ලෙස පිළිනොගත් වචනය දැන් ඔහු ඉදිරියෙහි අලංකාරයෙනුත් මහිමයෙනුත් දිස්වන්නට විය. ශුද්ධ ලියවිල්ලෙහි එක පාඨයක් තවත් පාඨයක් විස්තර කරන ආකාරය ඔහුගේ පුදුමයට හේතු විය. දේව වචනය ඔහු ප්‍රීතියෙන් පිළිගෙන ඊට ගෞරව කරන්ට ආශා විය.

අනාවැකි හදාරමින් දේව වචනය සොයන්ට වූ ඔහු පැහැදිලිව දුටුවේ ලෝකයේ අවසානය ලංවී තිබෙන බවය. නමුත් ජනතාව ඒ බව දැන සිටියේ නැත. ඔහු සභාවන්වල තිබෙන දූෂණයන් දෙස බැලීය. යේසුස්වහන්සේ වෙත තබා තිබූ ප්‍රේමය ඉවත්කර ලෝකය වෙත තබා තිබූ ආකාරයද යේසුස්වහන්සේ වෙතින් ඉහළින් එන ගෞරවය වෙනුවට ලෝකයෙන් ලැබෙන ගෞරවයද ස්වර්ගීය වස්තුව වෙනුවට ලෝකයේ වස්තුවද සොයන ආකාරය ඔහු දුටුවේය. අඳුර, වංචාව සහ මරණය හැමතැනම පෙනෙන්ට තිබිණ. මෙයින් ඔහුගේ සිත කැළඹීමට පත්විය. එලිෂාට ඔහුගේ කුඹුර සහ හරකුන් අතහැර එලියා පසුපස එන්ට කීවාක් මෙන් විලියම් මිලර්ටද තමාගේ ගොවිපල අතහැර එන ලෙෂ දෙවියන්වහන්සේ කැඳවූ සේක. කැඳවීම පිළිගත් ඔහු වෙව්ලන හදවතින් යුතුව දෙවියන්වහන්සේගේ අභිරහස්මය දේවල් ජනතාවට දිග හැර දක්වන්නට විය. අනාගත වාක්‍ය මාවතේ ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊම දක්වා ඔවුන්ව ගෙන ආ අතර විලියම් මිලර්ගේ ආත්ම ශක්තියද දියුණු විය. යොහන් බව්තීස්ත තම සේවය කරණකොටගෙන යේසුස්වහන්සේගේ පළමුවන පැමිණීමට සෙනඟක් සූදානම් කළාක් මෙන් විලියම් මිලර්ද තමා සමග එක්වූ අය සමග යේසුස්වහන්සේගේ දෙවන ඊමේ පණිවිඩය ප්‍රකාශ කළහ.

ගෝලයන්ගේ කාලය වෙතට මා ගෙන ගොස් දෙවියන්වහන්සේගේ විශේෂ සේවයක් භාරව සිටි යොහන් තුමාව මට පෙන්වූ සේක. ඔහුගේ සේවයට බාධා කිරීමට සාතන් තීරණය කර තිබිණ. තම සගයන් ලවා යොහන්ව මරාදමන්ට උත්සාහ කෙරිණ. නමුත් දෙවියන්වහන්සේ තම දූතයා එවා ඔහුව පුදුම අන්දමින් ආරක්ෂා කළසේක. යොහන්ව ගළවා ගැනීමේදී පෙනෙන්ට සැලැස්වූ දෙවියන්වහන්සේගේ මහත් බලය දැක විශ්මයට පත්වූ අය යොහන් සමග දෙවියන්වහන්සේ සිටි බවද ඔහු යේසුස්වහන්සේ ගැන දරූ සාක්ෂිය සැබෑ බවද දැන ගත්හ. ඔහුව නසන්ට උත්සාහ දරූ අය භයට පත්වූහ. යේසුස්වහන්සේ උදෙසා දුක් උසුලමින්ද සාක්ෂි දරන්ට යොහන් තුමාට හැකි විය. ඔහුගේ සතුරෝ ඔහුට විරුද්ධව බොරු චෝදනා එල්ල කිරීම නිසා ජනශූන්‍ය දූපතකට ඔහුව

පිටුවහල් කරන ලදී. එහිදී ස්වාමින්වහන්සේ තමන් දූතයා එවා ඉදිරියේදී පොළොව මත සිදුවන්ට යන දේවල් ද දෙවෙනි ඊම දක්වා වන කාලය තුළ සභාවේ ඇතිවන තත්ත්වයන් ගැන හා පසුබැසීමද සභාව දරිය යුතු වගකීම ගැන හා අවසාන ජයග්‍රහණය ගැනද ඔහුට එළිදරව් කළසේක. දේව දූතයා අවසාන සිදුවීම් ගැන විස්තර කරමින් සභාවේ ජයග්‍රහණය කරා යොහන් තුමාව ගෙන යද්දී දේව දූතයාගේ මුහුණ අතිමහත් ප්‍රීතියෙන් බැබළෙන්නට විය. දේව දූතයා මෙසේ යොහන් තුමාව සභාවේ ජයග්‍රහණය විස්තර කරද්දී දරාගන්ට නොහැකි ප්‍රීතියෙන් උද්දාම වී ඔහු දේව දූතයන්ට නමස්කාර කරන්ට ඔහුගේ පාමුල වැටිණ. දේව දූතයා කථා කොට, 'එසේ නොකරන්ට බලා ගනින්න. මම නුඹේද යේසුස්වහන්සේගේ සාක්ෂිය දරන නුඹේ සහෝදරයන්ගේද හවුල් මෙහෙකරුවෙක්ය. දෙවියන්වහන්සේට නමස්කාර කරපන්න. මක්නිසාද යේසුස්වහන්සේගේ සාක්ෂිය අනාගතවාක්‍යයේ ආත්මය' යැයි කීවේය. දේව දූතයා ඉන්පසු ස්වර්ගීය නගරයද එහිවූ සියලුම බබළන මහිමාලංකාරයද යොහන්ට පෙන්වීය. දේව දූතයා පළමුව කී දේ අමතක වී දෙවෙනි වරද දේව දූතයාට නමස්කාර කරන්ට ඔහුගේ පාමුල දණ ගැසීය. නැවතද දේව දූතයා ඔහුව නැගිටුවා 'එසේ නොකරන්ට බලා ගනින්නැ'යි කීහ.

දේශනාකරුවන් හා ජනතාව එළිදරව් පොත දෙස බලන්නේ අභිරහස්මය පොතක් මෙන්ම, එතරම් වැදත්කමක් නැති පොතක් ලෙසය. නමුත් මේ පොතේ සඳහන් ලියවිලි අන්තිම දවස්වල ජීවත්වන අයට විශේෂ උපකාරයක් ලබාදෙන පිණිස දී තිබෙන එළිදරව් කිරීමක් බව මම දුටිමි. එමගින් තමන්ගේ තත්ත්වය හා වගකීම තහවුරු කරගැනීමට මගපෙන්වා ඇත. විලියම් මිලර්ගේ මනසට මගපෙන්වා අනාගතවාක්‍ය මගින් එළිදරව් පොත වෙත මහත් ආලෝකයක් දෙවියන්වහන්සේ උදාකර දී ඇත.

දානියෙල්ගේ පොතේ දී ඇති අනාගතවාක්‍ය වටහාගත් අයට එළිදරව් පොතෙහි ප්‍රකාශිත කරුණු වටහා ගැනීමට පහසුය. දෙවියන්වහන්සේ නියම වේලාවට විලියම් මිලර්ගේ සිතෙහි ක්‍රියාකර ශුද්ධාත්ම බලයෙන් පැහැදිලි ලෙස අනාගතවාක්‍ය පහදා දී දානියෙල්ගේද යොහන්ගේ සහ අනිකුත් ශුද්ධ ලියවිලිවලද තිබෙන එකඟතාවය පෙන්වා දුන්සේක. එසේම දේව වචනයෙහි තිබෙන ශුද්ධ වූ මෙන්ම භයානක අනතුරු ඇඟවීම් මනුෂ්‍යයන්ගේ සිත්වල කාවදින්ට සලස්වා දේව පුත්‍රයාණන්ගේ දෙවෙනි ඊමට ඔවුන්ව සූදානම් කරන්නට මගපෙන්වූ සේක. ඔහුගේ දේශනා ඇසූ අයගේ සිත්වල ගැඹුරු හැඟීම් ඇති කරනු ලැබ දේවගැතිවරුද, ගිහියන්ද, අදේව දෘෂ්ටිකයන් හා පව්කාරයන්ද ස්වාමින්වහන්සේ වෙතට හැරී විනිශ්චයට මුහුණ දෙන්ට සූදානම් වූහ.

විලියම් මිලර්ගේ මිෂනාරි මෙහෙයන්හිදී දේව දූතයෝද ඔහු සමග වූහ. ඔහු ස්ථිරව නිර්භයව සිටිමින් තමාට භාරවූ සේවය ඉටු කළේය. දුෂ්ටකමෙහි වැතිර සිටි ලෝකයටද සීතලව, අලසව, ලෞකිකව තිබූ සභාවටද තම ශක්තිය යොදා සේවය කිරීමට ඔහුව කැඳවනු ලැබීය. ක්‍රිස්තියානින් යයි කියාගත් අයගේ විරෝධතා සහ සාතන් හා ඔහුගේ දූතයන්ගේ බාධා කිරීම් සියල්ල ඉදිරියේ දුක් ඉවසා ගෙන වෙහෙස දරාගෙන තමාව කැඳවනු ලැබූ හැමතැනකම රැස්ව සිටි අයට සදාකාල ශුභාරංචිය දේශනා කරමින් 'දෙවියන්වහන්සේට භයව උන්වහන්සේට ගෞරව දීපල්ලා. මක්නිසාද උන්වහන්සේගේ විනිශ්චය පැමිණියේය' යන පණිවිඩය ඔහු ප්‍රකාශ කළේය.

***කියවන්න:*** *1 රාජාවලිය 19: 16-21; දානියෙල් 7-12 පරිච්ඡේද; එළිදරව් 1 පරිච්ඡේදය; 14: 7; 19: 8:10; 22: 6-10.*

## *23 - පරිච්ඡේදය*

# පළමුවන දේව දූතයාගේ පණිවිඩය

1843 වසරෙ දී ප්‍රකාශ කරන ලද පණිවිඩය සමග දෙවියන්වහන්සේ වැඩ සිටි බව මම දුටිමි. එම පණිවිඩය මගින් ජනතාව අවදි කර තීරණයක් ගැනීමට ඔවුන්ව පරික්ෂණයකට භාජන කිරීම දේව සැලැස්ම විය. අනාගතවාක්‍ය කාලයන් ගැන ගෙන තිබූ කාලවල් නිවැරදි බව තේරුම් ගත් දේවගැතිවරු ඔවුන්ගේ තත්ත්වයන් පසෙක තබා වේතනය ගැන නොසලකා තමන් අයිතිව සිටි සභාවන් හැර දමා තැනින් තැනට ගොස් පණිවිඩය ප්‍රකාශ කරන්ට වූහ. නමුත් ස්වර්ගයෙන් පැමිණි පණිවිඩය පිළිගැනීමට එකල ක්‍රිස්තියානි සභාවල දේවගැතිවරුන් ලෙස ක්‍රියා කල අයගෙන් කැමති වූයේ ස්වල්ප දෙනෙක් වූයෙන් දේශනාකාරයන් නොවූ බොහෝ දෙනෙකුට තම සේවය භාර දෙන්ට යෙදින. සමහර අය තම ගොවිපලවල් හැර දමා පැමිණි අතර තවත් අය තමන්ගේ වෙළඳ ව්‍යාපාර පසෙක තබා මෙම ජනප්‍රිය නොවූ පණිවිඩය ගෙන යන්ට එකතු වූහ. මෙලෙස පළමුවෙනි දූතයාගේ පණිවිඩය හඬ නැගීමට බොහෝ අයට ස්වර්ගීය බලපෑමක් ඇති කරනු ලැබීය. පණිවිඩය පැමිණි හැමතැනම මනුෂ්‍යයන්ගේ සිත්වල ක්‍රියාකාරී බලයක් ඇති කෙරිණ. පව්කාරයෝ පසුතැවිලිව කමාව ඉල්ලා යාච්ඤා කරන්නට වූහ. වංක ලෙස ක්‍රියා කර තිබූ අය තමන් කළ වරද හරිගස්සන්නට සෙවූහ.

දෙමාපියන් තම දරුවන්ගේ ගැළවීම සඳහා ගාම්භීර ලෙස යාච්ඤා කළහ. පණිවිඩය ලැබූ අය නොහැරුණාවූ තම නෑදෑයින් හා මිත්‍රයින් උදෙසා බැගෑපත්ව සේවය කරමින් ක්‍රිස්තුස්වහන්සේගේ ඊම සඳහා සූදානම් වීමට අවවාද අනුශාසනා කළහ. බොහෝ අය කොතරම් සාක්ෂි දුටුවත් හැඟීම්බර දේශනා ඇසුවත් නොහැරෙන තරම් සිත් තදව සිටියහ. සිත් පවිත්‍ර කරන්නාවූ මෙම මෙහෙය ලෝක ආශාවන් වෙතින් සිත් ඉවත්කර මෙතෙක් අත් නොදුටු කැපවීමක් වෙතට ජනතාව පැමිණ විය. විලියම් මිලර් දේශනා කළ සත්‍යතාවන් සෙනඟ දහස් ගණනින් පිළිගත් අතර එලියාගේ ආත්මයෙන්ද බලයෙන්ද පණිවිඩය ගෙනයන පිණිස තව තවත් අයව දෙවියන්වහන්සේ නැගිටවූ සේක. මෙම උතුම් පණිවිඩය දේශනා කළාවූ අය එදා යොහන් බව්තීස්ත යේසුස්වහන්සේට මාර්ගය සූදානම් කළාක් මෙන්, එනම් 'පොරව ගස මුල තබා තිබේ පසුතැවිල්ලට සුදුසු එල උපදවාපල්ලා" යයි ස්වර්ගීය පෙළඹීමකින් යුතුව හඬ නැගූහ. එකල වූ සභාවල තත්ත්වයන් පෙන්වාදී මෙම සාක්ෂි දැරීම් මගින් පිබිදීමක් ඇති කිරීම පණිවිඩයෙහි අභිප්‍රාය විය. පැමිණෙන උදහසින් මිදෙන්ට සූදානම් වන ලෙස අනතුරු ඇඟවීම් කළ අතර බොහෝ අය තමන් බැඳී සිටි සභාවල් අත්හැර පිටතට පැමිණියහ. සුවකිරීමේ වචන ඇසූ ඔවුහු තමන්ගේ පසුබට වීම්, පාප කිළුටු දැක ගත්හ. තද ආත්ම වේදනාවෙන් යුතුව දෙවියන්වහන්සේ ඉදිරියේ යටහත් පහත් වූහ. ශුද්ධාත්මයාණන් ඔවුන් වෙත රඳා සිටි නිසා ඔවුහුද 'දෙවියන්වහන්සේට භයව උන්වහන්සේට ගෞරව දීපල්ලා. මක්නිසාද උන්වහන්සේගේ විනිශ්චයේ පැය පැමුණුනේය" යන පණිවිඩය ප්‍රකාශ කරන්නට දායක වූහ.

ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊම ගැන දේශනා කිරීමේදී පැමිණෙන දිනය සඳහන් කර තිබූ හෙයින් සෑම පංතියකම අයගෙන් විරෝධතා ගලා එන්ට විය. දේවගැතිවරුන්ද සාමාන්‍ය ජනතාවද කෑගසා පවසන්ට වූයේ දවසවත් පැයවත් කිසිවෙක් දන්නේ නැත කියාය. සභාවල් භාරව සිටි දේවගැතිවරුන් කියා සිටියේ ක්‍රිස්තුස්වහන්සේගේ දෙවෙනි ඊම ගැන දේශනා කිරීම පිළිබඳව තමන්ගේ විරෝධතාවක් නැති නමුත් දවස නොහොත් කාල වේලාවන් සඳහන් කිරීම ගැන එකඟ නොවන බවය. සියල්ල දකින්නාවූ දෙවියන්වහන්සේ ඔවුන්ගේ සිත් කියවා බැලූ සේක. යේසුස්වහන්සේට ප්‍රේමයක් ඔවුන්ගේ සිත් තුළ නොවූහ. ක්‍රිස්තුස්වහන්සේ ලකුණු කර තිබූ යටහත් පහත් අඩිපාරේ ඔවුන් ගමන් කරමින් සිටියේ නැත. මෙම ව්‍යාජ එඬේරුන් දෙවියන්වහන්සේගේ සේවයට බාධාවන් ලෙස සිටගත්හ. ප්‍රකාශ කරන ලද සත්‍යතාවයන් මනුෂ්‍යයන්ගේ සිත් පෙළඹවූ අතර එහිදී හිරගෙයි මුළාදෑනියා වෙව්ලමින් ඇවිත් ගැළවෙන පිණිස මම කුමක් කළ යුතුදැයි ඇසුවාක් මෙන් ජනතාව ඇසූහ. නමුත් ව්‍යාජ එඬේරු ජනතාව සහ සත්‍යය අතරට පැනගෙන සාතන් සහ ඔහුගේ දූතයන්ට එකතු වී 'සමාදානය සමාදානය" කියා සමාදානය නැතුව සිටියදී කෑගැසූහ. දෙවියන්වහන්සේගේ දූතයෝ මේ සියල්ල ලකුණු කරගත් බව මම දුටිමි. පහසු ජීවිත ක්‍රමයට ඇලුම් කළ, දෙවියන්වහන්සේ ඈතින් තබාගෙන ජීවත් වීමෙන් තෘප්තියක් ලැබූ අයව ඔවුන්ගේ නින්දෙන් අවදි කළ නොහැකිය.

දේවගැතිවරු බොහොමයක් මෙම ගැළවීමේ පණිවිඩය පිළිනොගත් අතර පිළිගත් අයට ද ඔවුන් බාධා කළහ. ඒ ලේ ඔවුන්ගේ හිස් මතය. ස්වර්ගයෙන් වූ පණිවිඩයට දේශකයන්ද ජනයන්ද විරුද්ධ වූහ. විලියම් මිලර්ට ඔවුහු පීඩා කළහ. ඔහුට සහාය දුන් අයටද පීඩා කළහ. බොරු ප්‍රචාර ගෙන යමින් සේවයට බාධා කළහ. රැස්වීම් හමාර වී යන අතරමඟදී ඔහුගේ ජීවිතය නැති කරන්ටද තැත් කළහ. නමුත් දෙවියන්වහන්සේ දූතයන් එවා ඔහුව ආරක්ෂා කළසේක.

දේව ලැදියාවක් ඇතිව සිටි අය පණිවිඩය පිළිගත්හ. පණිවිඩය දෙවියන්වහන්සේගෙන් බවද එය කාලෝචිත බවද ඔවුහු අවබෝධ කරගත්හ. ස්වර්ගීය පණිවිඩයේ ප්‍රතිඵල දකින්ට දේව දූතයෝ තද ආශාවෙන් සිටියහ. සභාවල් පණිවිඩයට පිටු පෑ බව දුටු ඔවුහු කණගාටුවෙන් යුතුව යේසුස්වහන්සේ සමග ඒ ගැන කථා කළහ. උන්වහන්සේ සභාවල් වෙතින් මුහුණ ඉවත හරවා ගත්සේක. තවත් ආලෝකයක් පිළිගත් අය වෙත පැමිණෙන්ට තිබෙන බව පැවසූ යේසුස්වහන්සේ

පණිවිඩය පිළිගත් විශ්වාසවන්ත අයව ආරක්ෂා කරන ලෙස දේව දූතයන්ගෙන් ඉල්ලූ සේක. තමන් ක්‍රිස්තියානින් බව පැවසූ අය තම මිදුම්කරුවාණන්ගේ පැමිණීමට ආශා වූවා නම්, ඔවුන්ගේ ලෙන්ගතුකම් උන්වහන්සේ වෙත තබා තිබුණා නම්, මුළු පොළොවේම එතුමන් හා සමාන කෙනෙක් නැතැයි ඔවුන්ට හැඟී ගියා නම්, උන්වහන්සේගේ පැමිණීමේ ආරංචිය ඔවුහු මහත් සතුටින් පිළිගන්නවා ඇත. නමුත් ඔවුහු දක්වූ අකමැත්ත ඔවුන් උන්වහන්සේට ආදරයක් දක්වූයේ නැති බවට සාක්ෂියක් විය. සාතන් සහ ඔහුගේ දූතයන් ජයග්‍රාහිකව යේසුස්වහන්සේටත් දේව දූතයන්ටත් මූණටම කියා සිටියේ ක්‍රිස්තියානි සෙනහ උන්වහන්සේට එතරම් ආදරයක් නොදක්වන නිසා උන්වහන්සේ දෙවෙනි වර එනවාට නොකැමති බවය.

දෙවිඳුන්ගේ සෙනහ ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම සතුටින් බලා සිටින බව මම දුටිමි. නමුත් දෙවියන්වහන්සේ ඔවුන්ව පරීක්ෂණයකට භාජනය කරන්ට අදහස් කළසේක. අනාගතවාක්‍ය කාලයන් ගණන් ගැනීමේදී වූ වරදක් උන්වහන්සේ තම හස්තයෙන් ආවරණය කළසේක. පැමිණීම බලා සිටි අයට එම වරද සොයාගත නොහැකි විය. පිළිනොගෙන විරුද්ධව සිටි අයට ද එය සොයාගත නොහැකි විය. තමන් සෙනහව බලාපොරොත්තු කඩවීමකට පමුණුවන්ට දෙවියන්වහන්සේ සැලසුම් කර තිබිණ. නියම දවස පසු විය. ස්වාමින්වහන්සේගේ පැමිණීම බලා සිටි අය දුකට සහ අසහනයට පත්වූහ. නමුත් ආදරය නිසා නොව භය නිසා බලාපොරොත්තුව සිටි අය නොපැමිණීම ගැන සතුටට පත්වූහ. ඔවුන්ගේ සිත් පවිත්‍රව තිබුණේ නැත. ප්‍රමාදය සිදුකළේ මෙවන් අය ප්‍රකාශයට පත්කරන පිණිසය. බලාපොරොත්තු කඩ වී දුකට පත්ව සිටි අයට පළමුවෙන් සමච්චල් කළේ මෙම අයය. අමාරුකම් ඇතිවන අවස්ථාවලදී හැකිලෙන ලෙස පසුබසින අයව හඳුනා ගැනීම පිණිස සෙනහව සෝදිසියකට භාජනය කිරීම දෙවියන්වහන්සේගේ ප්‍රඥාවක් බව මම දුටිමි.

තමන්ට ප්‍රේම කළාවූ ද, තමන්ගේ පැමිණීම මිහිරි ආශාවකින් බලා සිටියාවූ ද බලාපොරොත්තු කඩවීම ගැන දුකට පත්ව සිටියාවූ ද අය ගැන යේසුස්වහන්සේද ස්වර්ගීය සේනාවන්ද දයානුකම්පාවෙන් බලා සිටියහ. ඒ අයට පිහිට වෙන්ට දේව දූතයෝ නිතර ඔවුන් අවට බලා සිටියහ. ස්වර්ගීය පණිවිඩය පිළිගැනීම අතපසු කළාවූ අයව අඳුරේ සිටින්ට අත්හැර දමූ අතර ස්වර්ගයෙන් වූ පණිවිඩය එපා කිරීම ගැන ඔවුන්ට විරුද්ධව දේව උදහස ඇවිලෙන්නට විය. තම ස්වාමින්වහන්සේගේ නොපැමිණීමෙන් දුකට පත්ව සිටි විශ්වාසවන්ත අයව අන්ධකාරයේ අත්හැර දමනු නොලැබීය. නැවත වරක් අනාගත කාලවල් ගැනවූ අනාවැකි හදාරන්ට ඔවුන්ව බයිබලය වෙතට යොමු කරනු ලැබීය. එහි වූ අංක වෙතින් ස්වාමින්වහන්සේ තම හස්තය ඉවත් කරගත් සේක. එවිට වැරදී තිබූ දෙය ඔවුන්ට අවබෝධ විය. නැවත ගණන් බැලූ විට අනාගතවාක්‍ය කාලය 1844 දක්වා විහිදී තිබෙන බව සම්භ විය. 1843 දී අවසන් වෙනවා යයි ගණන් බලා තිබුණේ වැරදීමකින් බව මෙහිදී ඔප්පු විය. තවත් ශුද්ධ ලියවිලි සෙවූ විට දර්ශනය ප්‍රමාද වූවත් දර්ශනය ගැන බලා සිටින්ටය කියන නැවතීමේ කාලයක් ඔවුන්ට සම්භ විය. මෙයද විශ්වාසවන්ත අයව සෝදිසි කිරීම සඳහා සැලසුම් කර තිබිණ.. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට 1843 දී ඇතිවූ මහා බලාපොරොත්තු කඩවීමේ අත්දැකීමෙන් ඉහළට එන්ට නොහැකි වූ බව මම දුටිමි.

මෙම අය ගැන සාතන් සහ ඔහුගේ දූතයෝ මහත් උද්දාමයට පත් වූහ. මුළාවක් යයි ඔවුන් නම් කළ, ස්වර්ගීය පණිවිඩය පිළිනොගැනීම ගැන ජනතාව තමුන්ටම සතුට ප්‍රකාශ කර ගත්හ. දෙවියන්වහන්සේගේ අනුශාසනාවන් ප්‍රතික්ෂේප කළ බව ඔවුහු තේරුම් ගත්තේ නැත. දෙවියන්වහන්සේගේ සෙනහව කැළඹීමකට පත්කරන පිණිස සාතන් සමග එක්වී තමන් ක්‍රියා කරන බව ඔවුන්ට වැටහුණේ නැත.

පණිවිඩය පිළිගෙන සිටි ඇදහිලිවන්තයන්ව සභාවන් තුළම හිරිහැරවලට ලක් කෙරිණ. පණිවිඩය ප්‍රකාශ කිරීමට ස්වර්ගීය බලපෑමක් ඔවුන් තුළ විය. විරුද්ධවාදීන් මුලින් භයක් ඇතිව සිටි නමුත් 1844 ගැනවූ අනාවැකි කාලයද පසුවූ අතර සාක්ෂි දරන්නන්ව නිහඬ කරන්ට ඔවුහු බලාපොරොත්තු වූහ. බලාපොරොත්තු කඩ වූ අය පැහැදිලි ලෙස තමන්ට වූ වරද තේරුම් ගත් අතර 1844 වසරේදී ස්වාමින්වහන්සේගේ පැමිණීම බලාපොරොත්තු වීමට හේතු වූ කාරණා පෙන්වා දුන්හ. පෙන්වා දුන් බලවත් හේතු සාධක වලට විරුද්ධව කිසිවක් කියන්ට විරුද්ධවාදීන්ට නොහැකි විය. මේ නිසා සභාවල උදහස මේ අයට එරෙහිව ඇවිලෙන්නට වූහ. කිසිම සාක්ෂියකට සවන් නොදෙන්ට ඔවුන් තීරණය කළහ. සභාවල කථා කරන්ට ඔවුන්ට ඉඩ දුන හොත් අනිත් අයටද සත්‍යය වැටහී යා හැකි නිසා සභාවලින් ඔවුන් ඉවත් කර දමනු ලැබීය. නමුත් ස්වාමින්වහන්සේ ඔවුන් සමග වූසේක. උන්වහන්සේගේ මුහුණෙහි ආලෝකයෙන් ඔවුහු සතුටට පත්වූහ. මේ අය දෙවන දූතයාගේ පණිවිඩය ලැබීමට සූදානම්ව සිටියහ.

***කියවන්න: දානියෙල් 8: 14; හබක්කුක් 2: 1-14; මලාකි 3, 4 පරිච්ඡේදයන්; මතෙව් 24: 36; එළිදරව් 14: 6, 7.***

## *24 - පරිච්ඡේදය*

# දෙවන දූතයාගේ පණිවිඩය

පළමුවැනි දේව දූතයාගේ පණිවිඩය පිළිගැනීමට සභාවල් පසුබට වූහ. ස්වර්ගයෙන් එවන ලද ආලෝකය පිළිනොගැනීම නිසා එම සභාවල් දිව්‍ය අභිමුඛය අහිමි කර ගත්හ. ඔවුහු තමුන්ගේ ශක්තියෙහි පිහිටා සිට පළමුවන දේව දූතයාගේ පණිවිඩයට විරුද්ධව සිටි නිසා දෙවන දූතයාගේ පණිවිඩය පිළිගැනීමට නොහැකි තත්ත්වයකට තමන්ව පත්කර ගත්හ. ප්‍රේමලත් විශ්වාසවන්ත කණ්ඩායම පීඩාවන්ට භාජනය වී සිටි නමුත් 'බබිලෝනිය වැටුණේය" යන දෙවන පණිවිඩයට ප්‍රතිචාරය දක්වමින් ඇදහිල්ලෙන් වැටී ගිය සභාවලින් පිටව ගියහ.

දෙවන දේව දූතයාගේ පණිවිඩය අවසාන වන්ට ලංව තිබූ අතර දෙවියන්වහන්සේගේ සෙනඟ මත මහත් ආලෝකයක් පතිතව තිබෙනවා මම දුටිමි. මෙම ආලෝකයේ රශ්මි සූර්යයා මෙන් බබළන්ට විය. 'බලව මනමාලයා පැමිණෙනවාය එතුමා හමුවන්ට පලයල්ලා" යයි ශබ්ද කරන දේව දූතයන්ගේ හඬක් මට ඇසුණේය.

මධ්‍යම රාත්‍රියේ හඬ පැතුරුනේ දෙවන දේව දූතයාගේ පණිවිඩයට බලය දෙන පිණිසය. දුබල බවට පත්ව සිටි අයට දිරිය දෙන්ටද ඉදිරියේ තිබෙන මහත් සේවයට ඔවුන්ව සූදානම් කරන්ටද දෙවියන්වහන්සේ දේව දූතයන් එවූ සේක. පළමුව මෙම පණිවිඩය ලැබුවේ තලෙන්ත වැඩියෙන් තිබූ පුද්ගලයන් නොවේ. කැපවී සිටි යටහත් පහත් අය වෙතට දේව දූතයන් යවා 'මනමාලයා එන සේක. උන්වහන්සේ හමුවන්ට පලයල්ලා යන හඬ නගන්ට බලපෑම් ඇති කළසේක. පණිවිඩය ලබා සිටි අය ඉක්මන් කර ගොස් ශුද්ධාත්ම බලයෙන් ශබ්ද නගා පණිවිඩය පතුරුවාලූහ. අධෛර්යයට පත්ව සිටි සහෝදරයන් පිබිදෙවූහ. හඬ නැගී සිටියේ මනුෂ්‍ය ප්‍රඥවෙන් හෝ උගත්කමෙන් නොව දෙවියන්වහන්සේගේ බලයෙන්ය. පණිවිඩය ඇසූ දේව සෙනඟට ඊට විරුද්ධව සිටින්ට නොහැකි වූහ. පණිවිඩයට මුලින්ම එකතු වූයේ වඩාත්ම ආත්මීකව සිටි අයය. පළමුව මෙම සේවයට අත දී සිටි අය පසුව එකතු වී හඬ නැගීම බලවත් කරන්ට උදව් වූහ.

දේශයේ සෑම පළාතකම දෙවන දේව දූතයාගේ පණිවිඩයේ ආලෝකය බෙදා දුන් අතර දහස් ගණන් අය එය පිළිගන්ට වූහ. එය නගරයෙන් නගරයටත් ගමින් ගමටත් ගමන් කෙරිණ. දේව සෙනඟ සම්පූර්ණයෙන් පිබිදෙන තුරු එම හඬ නොනැවතිණ. සමහර අය මෙම පණිවිඩය සභාවලට ඇතුල් වීම වළක්වන ලෙස ක්‍රියා කළහ. නමුත් තමන් තුළ ජීවන සාක්ෂිය ඇතිව සිටි අය වැටී ගිය සභාවල් අත්හැර පිටතට පැමිණියහ. මධ්‍යම රාත්‍රියේ හඬ මහත් සේවයක් ඉටු කළාය. පණිවිඩය සිත් සෝදිසි කරන පණිවිඩයක් විය. එය ඇදහිලිවන්තයන්ට ජීවමාන අත්දැකීමක් ලබන්ට මගපෙන්වීය.

ශුද්ධවන්ත සෙනඟ නිරාහාරයෙන් හා යාච්ඤාවෙන් යුතුව ස්වාමීන් වහන්සේගේ පැමිණීම බලා සිටියහ. පව්කරුවෝද භයෙන් යුතුව පැමිණීම බලා සිටියහ. වැඩිදෙනා පණිවිඩයට එරෙහිව සිටිමින් සාතන්ගේ ආත්මය ප්‍රදර්ශනය කළහ. ඔවුහු අපහාස කරමින් සමච්චල් කරමින් 'කිසි මනුෂ්‍යයෙක් දවසවත් පැයවත් දන්නේ නැතැ"යි පවසමින් කෑගැසූහ. සාතන් සහ ඔහුගේ දූතයෝ ඔවුන් ළඟ සිට උද්දාම වූහ. තවත් සිත් තද කරගන්ටද, ලැබෙන හැම ආලෝකයක්ම එපා කරන්ටද, එමගින් මුළාවෙහි තද වෙන්ටම සැලැස්වූහ. තවත් බොහෝ දෙනෙක් මෙම මධ්‍යම රාත්‍රියේ හඬ පැතිරවීමේ කිසිම කොටසක් නොදරා පැමිණීම පමණක් බලා සිටියහ. ඔවුන් දුටුවාවූ දිව්‍ය මහිමය, සූදානම්ව සිටි අයගේ කැපවීම සහ යටහත් පහත්කම සහ නොයෙකුත් සාක්ෂි, සාධක, සත්‍යය පිළිගැනීමට හේතු වූහ. නමුත් ඔවුන් හැරී සිටියේ නැත. ජීවිත වෙනස් කරගෙන තිබුණේ නැත. ඔවුහු සූදානම්ව සිටියේ නැත. ශුද්ධවන්ත සෑමදෙනා අතර උනන්දු ගාම්භීර යාච්ඤාවේ ආත්මයක් ක්‍රියාකාරීව තිබිණ. දේවදූතයෝ මහත් උනන්දු සැලකිල්ලකින් ප්‍රතිඵල දකින්ට බලා සිටියහ. ගැළවීමේ ස්වර්ගීය උල්පත් වෙතට ඔවුන්ව යොමු කරමින් භූමික දේවල්වලින් මිදෙන්ට ඔවුන්ට උදව් කළහ. දෙවියන්වහන්සේ ඔවුන්ව පිළිගත් සේක. යේසුස්වහන්සේ ඉතා සතුටින් ඔවුන් දෙස බැලූසේක. තම ස්වරූපය ඔවුන් තුළ දුටු සේක. ඔවුහු සම්පූර්ණ කැපවීමක් කර තිබිණ. මිදීම සඳහා ඔවුන් බලා සිටි කාලවේලාව පසු විය. ඔවුන් තවමත් සිටියේ පොළොවෙහිය. බලා සිටියේ ස්වර්ගයට යාමටය. අමරණීය මිදීමේ රසය ඔවුන්ට හැඟී දැනී තිබිණ. නමුත් ඔවුන්ගේ බලාපොරොත්තු ඉටු වූයේ නැත. නැවත වරක් බලාපොරොත්තු කඩවීමේ දුකකට ඔවුන්ව පත්කිරීමට සැලසුම් කර තිබිණ.

බොහෝ දෙනෙකුගේ සිත් තුළට වැදගෙන තිබූ භය එකවිටම පහව ගියේ නැත. නැවතත් බලාපොරොත්තු කඩවූවන් කෙරෙහි ජයග්‍රාහී බවක් දක්වූයේ නැත. නමුත් පෙනෙන ලෙස ඔවුන් දේව උදහසකට පාත්‍ර නොවූයෙන් ඇතුව සිටි භය දැන් ඔවුන්ගෙන් පහව යන්ට විය. නැවතත් ඔවුහු උසුළු

විසුළු කිරීම් අපහාස කිරීම පටන් ගත්හ. දෙවියන්වහන්සේගේ සෙනඟව සෝදිසියකට, අමාරුවකට භාජන විය. යේසුස්වහන්සේ පැමිණ මළවුන් නැගිටුවා ජීවතුන් අන් වෙසකට හරවා රාජ්‍යය ලබාගෙන සදාකාලයටම රජකම් කරනවාය යන හැඟීම එදා ගෝලයන්ගේ සිත් වල ඇතිවූ සේම මොවුන් තුළද ඇතිව සිටියහ. ස්වාමීන්වහන්සේගේ සිරුර ඔවුන් ගෙන ගොස් කොහේ තැබුවාදෝ නොදනිමියි යන කියමන මොවුන් ගැනද කිව හැක.

***කියවන්න: ශු. මතෙව් 24: 36; 25: 6; ශු. යොහන් 20: 13; එළිදරව් 14: 8.***

## *25 - පරිච්ඡේදය*

# දෙවන ර්ම ගැන වූ මෙහෙය නිදර්ශනයෙන්

බැම්වලින් බැඳ තිබූ කණ්ඩායම් කීපයක් මම දුටිමි. මෙම කණ්ඩායම්වල වූ බොහෝ දෙනා සිටියේ පූර්ණ අඳුරකය. ඔවුන්ගේ නෙත් යොමු කරවා තිබුණේ භූමිය දෙසටය. ඔවුන් සිටියේ යේසුස්වහන්සේ සමඟ කිසිම සම්බන්ධකමක් නැතිවය. ස්වර්ගය දෙසට ඇස් ඔසවා සිටින., මුහුණුවල ආලෝකයක්ද තිබෙන පුද්ගලයින් මෙම කණ්ඩායම්වල විසිර සිටිනවා මම දුටිමි. හිරුගෙන් දිව එන රැස් දහරා වැනි ආලෝක ධාරා යේසුස්වහන්සේගෙන් ඔවුන් කරා පැමිණෙන්ට විය. ඒ දෙස සැලකිල්ලෙන් බලන ලෙස දේව දූතයෙක් මට පැවසීය. මා බැලූ විට අන්ධකාරයේ සිටි අයව දුෂ්ට දූතයෝ වටලාගෙන සිටිනවාද ආලෝකයේ සිටි හැම කෙනෙක් ළඟම දේව දූතයෙක් සිටිනවාද මම දුටිමි. 'දෙවියන්වහන්සේට භයව උන්වහන්සේට ගෞරව දීපල්ලා. මක්නිසාද උන්වහන්සේගේ විනිශ්චයේ පැය පැමුණුනේය' කියා කෑගසන දේව දූතයෙකුගේ හඬද මම ඇසීමි.

ආලෝකය පිළිගන්න අයට පැහැදීම දෙන පිණිස විස්මපත් ආලෝකයක් මෙම කණ්ඩායම් මත පැතිර තිබිණ. අඳුරේ සිටි සමහර අය එම ආලෝකය පිළිගෙන ප්‍රීති වූ අතර ඉතිරි අය ස්වර්ගයෙන් වූ එම ආලෝකය පිළිනොගෙන එය තමන්ව නොමඟ යවන පිණිස වූ මුළාවක් යැයි ඔවුහු පැවසූහ. ආලෝකය ඔවුන්ව පසුකර ගිය අතර ඔවුහු අඳුරෙහිම නැවතිණ. ආලෝකය පිළිගෙන අගය කළ අයට තව තවත් ආලෝකය වැඩි විය. ඔවුන්ගේ මුහුණ ආලෝකමත් වී ශුද්ධ වූ ප්‍රීතියකින් පිනාගිය අතර මහත් උනන්දුවකින් යේසුස්වහන්සේ වෙත ඔවුන්ගේ නෙත් ඉහළට යොමු කළහ. ඔවුන්ගේ හඬද දේව දූතයාගේ හඬ සමඟ මුසුවී 'දෙවියන්වහන්සේට භයව උන්වහන්සේට ගෞරව දීපල්ලා. මක්නිසාද උන්වහන්සේගේ විනිශ්චයේ පැය පැමුණුනේය' කියා මහත් හඬින් පැවසූහ. මෙසේ ඔවුහු හඬ නැගූ අතර අඳුරේ සිටි අය ඔවුන්ව පැත්තකින් හා උරහිසින් අහකට තල්ලු කර දමනවා මම දුටිමි. එවිට ශුද්ධ වූ ආලෝකය අගය කළ අය තමන්ව බැඳ තිබූ බැම් කඩා දමා එම කණ්ඩායම්වලින් වෙන්ව ඈත්ව සිටගත්හ. මෙසේ තව තවත් අය බැම් කඩා දමමින් පිටට යන්ටවූ අතර එහි වූ ප්‍රධානීන් වාටු වචන පවසන්ටත් භය ගැන්වීම් සහ බලපෑම් ඇති කරන්ටත් බැම් වඩාත් ශක්තිමත් කරන්ටත් වූහ. ඔවුන් කියා සිටියේ 'දෙවියන්වහන්සේ අප සමගය. අප සිටින්නේ ආලෝකයේය, සත්‍යය අප සමගය' කියාය. මේ අය කව්ද කියා මම ඇසීමි. ඒ අය දේවගැතිවරු සහ සභා ප්‍රධානීන්ය. 'ඔවුහු සත්‍යය එපා කළ අතර අනික් අයට ද සත්‍යය එපා කරන්ට සලස්වති' යි දේව දූතයා මට පැවසීය. ආලෝකය අගය කළ අය ඉතා උනන්දුවෙන් සහ ආශාවෙන් යේසුස්වහන්සේ පැමිණ තමන්ව උන්වහන්සේ ළඟට ගන්න තුරු බලා සිටියහ. තවත් වලාකුළක් ඔවුන්ව පසුකර ගියහ. සතුටු මුහුණු දුක්බර වූහ. වලාකුළ ගැන මම විමසීමි. එය තවත් බලාපොරොත්තු කඩවීමක් සංකේතවත් කළ බව ඔහු මට පැවසීය. යේසුස්වහන්සේව බලාපොරොත්තු වූ අවස්ථාව පසු විය. නමුත් උන්වහන්සේ පැමිණියේ නැත. සිත් අධෛර්යයට පත් විය. පිළිනොගෙන සිටි අය සතුටට පත්වූහ. සාතන් සහ ඔහුගේ දූතයෝද මහත් උද්දාමයට පත් වූහ.

එවිට 'බබිලෝනිය වැටුණේය වැටුණේය' යි කියන තවත් දේව දූතයෙකුගේ හඬ මට ඇසිණ. ආලෝකයක් බලාපොරොත්තු කඩව සිටි අය කෙරේ පහළ විය. උන්වහන්සේගේ පැමිණීමේ ආශාවෙන් නැවතත් ඔවුහු යේසුස්වහන්සේ දෙස බැලූහ. බබිලෝනිය වැටුණේය කියා පැවසූ දේව දූතයා සමග තවත් දේව දූතයන් කථාවක යෙදී සිටිනවා මම දුටිමි. දෙවන දේව දූතයා සමඟ අනිකුත් දේව දූතයයෝද එක්ව හඬ නගමින් 'මනමාලයා එන්නේය ඔහුගේ පෙරමඟට පලයල්ලා' යයි පැවසූහ. ගීතමය හඬක් වූ එම ශබ්දය හැම තැන පැතිර යන්ට විය. සත්‍යය පිළිගෙන අගය කළ අය කෙරෙහි අති මහත් ආලෝකයක් දල්වෙන්ට විය. ඔවුහු ද දේව දූතයන්ට එක්ව මනමාලයාගේ පැමිණීම ගැන පැවසූහ. මෙම අවස්ථාවේදී ද කලින් ඔවුන්ව නෙරපා දමූ අය නින්දා අපහාස කර වෛරකාරී ලෙස ඔවුන්ව එළවා දමූහ. මෙසේ පීඩා කරනු ලැබූ අය වටා අඳුර පතුරුවන්ට සාතන් සහ ඔහුගේ දූතයන් උත්සාහ දරූ අතර දේව දූතයෝ ඔවුන් මත පියාපත් සලන්ට වූහ.

එපා කළාවූ එළවා දමූ අය වෙත තවත් හඬක් එනවා මට ඇසිණ. එනම්, 'ඔවුන් අතරෙන් පිටතට ඇවිත් අපවිත්‍ර දෙයකට අත නොගසා සිටපල්ලා" යනුයි. මෙවිට මහත් සමූහයක් බැඳුම් කඩාගෙන එම හඬට කීකරුව අඳුරෙන් ඉවත්ව මීට ඉහත බැමි බිඳ දමා ආ අයට එකතු වී පණිවිඩය ප්‍රකාශ කළහ. අඳුරේ හෙළනු ලැබූ කණ්ඩායම්වල සිටි ටික දෙනෙකුගේ බලවත් උනන්දු යාච්ඤාවල හඬ මට ඇසිණ. මේ කණ්ඩායම්වල දේවගැතිවරුන් සහ අධිපතීන් බැමි වඩ වඩා තද කරමින් සිටියහ. එම අය මීට ඉහත නිදහස්ව සතුටින් එකමුතුව සිටි අය දෙසට අත් දිගුකර උදව් ඉල්ලනවා මම දුටිමි. පිළිතුර වූයේ 'උනන්දු පැතුමෙන් ස්වර්ගය දෙස බලා පිටතට වරෙල්ලා" යන්නය. පුද්ගලයින් නිදහස්වන්ට අරගලයක යෙදී සිටිනවා මම දුටිමි. අවසානයේදී ඔවුහු බැමි කඩා දමා පිටතට පැමිණියහ. භූමියෙන් ටිකක් ඔසවනු ලැබූ විවෘත පිට්ටනියක් ලෙස පෙනෙන්වූ ස්ථානයක සිටි කණ්ඩායමට ඔවුහු එකතු වූහ. ඔවුහු ඉහළ බලා සිටියහ. ආලෝකයකින් වෙළී සිටින ආකාරයක් මෙන් පෙනිණ. ආලෝකයේ බලපෑම නිසා මේ කණ්ඩායම වෙතට පැමිණි සමහර අයද සිටියහ. නමුත් ඔවුහු සම්පූර්ණ ලෙස කණ්ඩායමට සම්බන්ධව සිටියේ නැත. ලැබූ ආලෝකය අගය කළ අය මහත් ආශාවකින් ඉහළ බලා සිටියහ. යේසුස්වහන්සේ ඔවුන්ගේ ආශාව දෙස බලා සිටිසේක. පොළොව දෙස ඔවුන් නෙත් යොමු කළේම නැත. ඔවුන් මත නැවත වරක් වලාකුළක් පැතිර තිබෙනවාද ඔවුන්ගේ බැල්ම පොළොව දෙසට යොමුව තිබෙනවාද මම දුටිමි. 'මෙම වෙනසට හේතුව කුමක්ද"යි මම දේව දූතයාගෙන් ඇසීමි. දේව දූතයා පැවසුවේ නැවත වරක් ඔවුන් බලාපොරොත්තු කඩවීමකට පත්වූ බවය. 'යේසුස්වහන්සේට තවම පැමිණිය නොහැක. ඔවුහු තවදුරටත් දුක් විඳ අමාරුකම් දරාගත යුතුය. මනුෂ්‍යයන්ගෙන් ලබාගෙන තිබෙන වැරදි දේවල් අත්හැරිය යුතුය, සම්පූර්ණ ලෙස දෙවියන්වහන්සේද සත්‍යයද වෙතට හැරෙන්නට ඕනෑය. සෝදිසි කරනු ලැබ පවිත්‍ර විය යුතුය. මේ සියල්ල විඳ දරාගන්නා අය සදාකාල ජයග්‍රහණය ලබා ගන්නෝ" යයි පැවසීය.

ලෝකය ගින්නෙන් පවිත්‍ර කිරීම ශුද්ධස්ථානය පවිත්‍ර කිරීම යයි සිතූ අයගේ විශ්වාසය අනුව යේසුස්වහන්සේ පැමිණියේ නැත. අනාගතවාක්‍ය කාලයන් ගණන් කිරීමේදී ඔවුන් නිවැරදිව සිටි බව මම දුටිමි. අනාවැකි කාලය 1844 දී නිමාවට පත්විය. ඔවුන්ගේ වරදව තිබුණේ ශුද්ධස්ථානය කුමක්ද කියාත් පවිත්‍ර කිරීමේ ස්වභාවය ගැනත් හරි අවබෝධයක් නැතිව සිටීමත්ය. අනාවැකියේ කාලය සම්පූර්ණ වූ විට ශුද්ධස්ථානය පවිත්‍ර කරන පිණිස යේසුස්වහන්සේ ස්වර්ගීය මණ්ඩපයේ අති ශුද්ධස්ථානයට ඇතුල් වූසේක. ඔවුහු කාලවල් නැවත සොයා බැලූහ. ඒවා නිවැරදිව තිබිණ, යේසුස්වහන්සේට සිදුවූයේ කුමක්ද? උන්වහන්සේ නොපැමිණියේ මන්ද?

ගෝලයන්ගේ කාලය වෙතට මා ගෙනයනු ලැබීය. ඔවුන්ගේ බලාපොරොත්තු කඩවීම මම දුටිමි. ඔවුන් සොහොන් ගෙය වෙතට ආ විට උන්වහන්සේගේ ශරීරය එහි නොවීය. මරියා පැවසුවේ, 'මාගේ ස්වාමින්වහන්සේව ඔවුන් ගෙන ගොස් ඇත. කොහේ තැබුවාදැයි නොදනිමි" යි කියාය. දුක් වෙමින් සිටි අයට දේව දූතයන් කියා සිටියේ උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටි බවත් ඔවුන්ට කලින් ගලීලයට යන බවත්ය.

බලාපොරොත්තු කඩ වී දුකෙන් සිටි අය දෙස යේසුස්වහන්සේ බලවත් අනුකම්පාවක් දැක්වූ බව මම දුටිමි. පොළොව ශුද්ධස්ථානය නොවන බවද උන්වහන්සේ ස්වර්ගීය මණ්ඩපයේ අති ශුද්ධස්ථානයට ඇතුල්ව ශුද්ධස්ථානය පවිත්‍ර කළ යුතු බවද සෙනඟ උදෙසා සමගිකමේ මෙහෙයක් කළ යුතු බවද පියාණන් වහන්සේගෙන් රාජ්‍යය ලබාගෙන තමන් සමග සදාකාලයටම ජීවත්වන පිණිස නැවත එන බවද යන කරුණු අවබෝධ කරදෙන පිණිස මගපෙන්වීමට උන්වහන්සේ දේව දූතයන් එවූ සේක. එදා ගෝලයන් අත් දුටු දේ 1844 දී එම ඇදහිලිවන්ත කණ්ඩායමටද අත්දකින්ට සිදුවිය. එදා ජයග්‍රාහීව ගෝලයෝ යෙරුසලමට යේසුස්වහන්සේ සමග ගමන් ගත්හ. උන්වහන්සේ රාජ්‍යය ලබාගෙන ලෝක රාජ්‍යයක් පිහිටුවන්ට යනවා යයි මහත් බලාපොරොත්තු ඇතිව සිටියහ. ගස්වල අතු කපා පාර සැරසූහ. තමන්ගේ කබායන් ගළවා පාරේ ඇතුරූහ. තවත් සමහරු ඉදිරියේ ගමන් කරමින් 'දාවිත්ගේ පුත්‍රයාට හෝසන්නා, ස්වාමින්වහන්සේගේ නාමයෙන් එන තැනැත්තා ආශිර්වාද ලද්දේය" කියා කෑගසන්ට වූහ. මේ ශබ්ද ඝෝෂාව ඇසූ දුටු ඵරිසිවරු කලබලයට පත් වූහ. සෙනඟව නිශ්ශබ්ද කරන ලෙස ඔවුහු යේසුස්වහන්සේගෙන් ඉල්ලූහ. එවිට උන්වහන්සේ පැවසුවේ ඔවුන් නිහඬ වූවොත් ගල් කෑගසනවා ඇත කියාය. සෙකරියාගේ අනාවැකිය ඉටු විය යුතුය. (සෙකරියා 9: 9.) නමුත් ගෝලයන් මහත් තිත්ත අත්දැකීමක් ලබන්ට යන බව මම දුටිමි. දින කිහිපයකට පසුව ඔවුහු යේසුස්වහන්සේ පිටුපස කල්වාරි කන්ද වෙතට ගමන් කළහ. උන්වහන්සේ කුරිරු කුරුසයක් මත ලේ වැගිරී එල්ලෙමින් සිටිනවා දකින්ට වූහ. උන්වහන්සේගේ වේදනාත්මක මරණය ඔවුන් නැරඹූහ. මළ සිරුර සොහොන් ගෙයක තැන්පත් කරනවා ඔවුන් බලා සිටියහ. ඔවුන්ගේ සියලු බලාපොරොත්තු මෙසේ යේසුස්වහන්සේගේ මරණයත් සමග අභාවයට පත්විය. නමුත් උන්වහන්සේ මළවුන්ගෙන් නැගිටි සේක. ගෝලයන්ට නැවත පෙනුණ සේක. ඔවුන්ගේ බලාපොරොත්තු නැවත අළුත් විය. ගැළවුම්කාරයාණන් නැති වී දැන් නැවත ලැබී ඇත. සම්භ වී ඇත.

1844 දී බලාපොරොත්තු කඩ වූ අයගේ තත්ත්වය එදා ගෝලයන්ගේ බලාපොරොත්තු කඩවීමට සමාන නොවන බව මම දුටිමි. පළමුවන සහ දෙවන දූතයාගේ පණිවිඩ මගින් අනාවැකි සම්පූර්ණ විය. ඒවා නියම කාල වේලාවට දෙනු ලැබීය. දෙවියන්වහන්සේ අභිප්‍රාය කළ අන්දමට සැලැස්ම සම්පූර්ණ විය.

*කියවන්න: දානියෙල් 8: 14; ශු. මතෙව් 21: 4-1; 6 25: 6; ශු. මාර්ක් 16: 6-7; ශු. ලූක් 19: 35-40; ශු. යොහන් 14: 1-3; 20: 13; 2 කොරින්ති 6: 7; එළිදරව් 10: 8-11; 14: 7, 8.*

## *26 - පරිච්ජේදය*

# තවත් නිදර්ශනයක්

පොළොවේ ක්‍රියාත්මකව තිබෙන සේවය ගැන මුළු ස්වර්ගයම උනන්දුවෙන් සිටි බව මම දුටිමි. යේසුස්වහන්සේ තමන්ගේ දෙවන ඊම ගැන ලෝක වාසීන්ට අනතුරු ඇඟවීමක් කර ඒ සඳහා ඔවුන්ව සූදානම් කරන පිණිස බලවත් දේව දූතයෙකුව ස්වර්ගයෙන් පිටත් කර එවනවා මම දුටිමි. දේව දූතයාට පෙරටුවෙන් අති මහත් ආලෝකයක් ගමන් කෙරිණ. ලෝකය දිව්‍ය මහිමයෙන් ආලෝකමත් කර පැමිණෙන්ට යන දේව උදහස ගැන දැනුම් දීම දේව දූතයාගේ මෙහෙය බව මට දැන්වීය. සමූහයෝ ආලෝකය පිළිගත්හ. සමහර අය කෙරෙහි යම් බලපෑමක් ඇති විය. නමුත් පණිවිඩය හෘදයාංගමයෙන් පිළිගත්තේ නැත. ආලෝකය ලැබූ සැමදෙනා ස්වර්ගය දෙසට හැරී දෙවියන්වහන්සේට මහිමය දුන්හ. බොහෝ දෙනෙක් මහත් කෝපයටද පත්වූහ. දේවගැතිවරුද ජනයාද දුර්ජනයන් සමග එකතුව දේව දූතයා ගෙන ආ ආලෝකයට විරුද්ධකම් පෑහ. නමුත් පිළිගත් සැමදෙනා ලෝකයෙන් වෙන්ව එකට එකතු වූහ.

ආලෝකයෙන් ඉවතට මනසවල් ඇදගන්නා පිණිස සාතන් සහ ඔහුගේ දූතයෝ මහත් සේ ක්‍රියාකාරී වූහ. ආලෝකය එපා කළ කණ්ඩායම අඳුරේම ඉන්ට ඉඩ හරිනු ලැබීය. ස්වර්ගයෙන් වූ පණිවිඩය ලැබූ අයගේ ජීවිතවල චරිතය වර්ධනය වන ආකාරය දෙස උනන්දුවෙන් බලමින් දේව දූතයා සටහන් කරගන්නවා මම දුටිමි. ක්‍රිස්තියානින් ලෙස යේසුස්වහන්සේට ආදරේ යයි කියා සිටි බොහෝ දෙනා තරහෙනුත් අපහාසාත්මක ලෙසත් පණිවිඩය එපා කර ක්‍රියා කළ එම ලැජ්ජා සහගත ආකාරය තවත් දේව දූතයෙක් සටහන් කරගන්ට යෙදින. ක්‍රිස්තියානින් යයි කියාගත් අය ක්‍රිස්තුස්වහන්සේව සුළු කළ ආකාරය දැන මුළු ස්වර්ගයම මහත් කෝපයට පත්විය.

ඇදහිලිවතුන්ගේ බලාපොරොත්තු කඩවීම මම දුටිමි. බලාපොරොත්තු වූ දින ඔවුහු තම ස්වාමින්වහන්සේව දුටුවේ නැත. අනාගතය සඟවා තබා තමන් සෙනඟව සෝදිසියකට භාජනය කිරීම දේව අභිප්‍රායව තිබිණ. මෙම කාල වකවානුව නොමැති දිව්‍ය සැලැස්ම නිසි ලෙස ක්‍රියාත්මක නොවන්නට තිබිණ. සාතන් බොහෝ දෙනෙකුගේ මනසවල් ඈත අනාගතයක් දෙසට යොමු කරන්ට විය. වර්තමාන සූදානමක් සඳහා උනන්දු සොයා බැලීමකට සෙනඟව යොමු කිරීමේ සේවයක් අවශ්‍ය විය. කාලය පසුවූ අතර ආලෝකය සම්පූර්ණ ලෙස පිළිගෙන නොසිටි අය ස්වර්ගීය පණිවිඩයට එරෙහිව සිටි අය සමග එක්ව බලාපොරොත්තු සුන්ව සිටි අයට උසුළු විසුළු කළහ. ස්වර්ගයෙහි දූතයන් යේසුස්වහන්සේ සමග කථා කරමින් සිටිනවා මම දුටිමි. 'යේසුස්වහන්සේගේ අනුගාමිකයන්" යයි කියාපාමින් සිටි අයගේ තත්ත්වය දේව දූතයෝ සටහන් කරගන්නවා මම දුටිමි. බලා සිටි වේලාව පසුවී යාමෙන් ඔවුන්ව සෝදිසි කරනු ලැබූහ. බොහෝ දෙනෙකු කිරනු ලැබ අඩු බව සම්භ වූහ. ඔවුහු තමන් 'කිතු බැතිමතුන්" යයි හඬ නගා කිවූ අයය. නමුත් හැම අංශයකින්ම උන්වහන්සේව අනුගමනය කරන්ට ඔවුහු අසමත් වූහ. මේ අය ගැන සාතන් සතුටට පත් විය. මක්නිසාද ඔවුහු ඔහුගේ මළපතට අසුව සිටි බැවින්ය. බොහෝ දෙනෙකුට හරි වූ මාර්ගය අතහැර යන්ට ඔහු මගපෙන්වීය. වෙනත් මාර්ගවලින් ස්වර්ගයට නගින්ට ඔවුහු උත්සාහ කළහ. ශුද්ධ, පවිත්‍ර, අය සියොනේ පව්කාරයන්ද ලෝකයට ආශා කරන වංචාකාරයෝද සමග මිශ්‍රව සිටිනවා දේව දූතයන් දිටීය. ඔවුහු ශුද්ධ අයව රැකබලාගෙන සිටි අතර දූෂණය වූ අයගේ ක්‍රියාවන්ද ඔවුන්ට බලපාන්නට විය.

යේසුස්වහන්සේව දකගන්ට තද ආශාවෙන් සිටි අයට උන්වහන්සේගේ ඊම ගැන කථාකිරීම සභා ප්‍රධානීන් විසින් තහනම් කරන ලදී. දේව දූතයෝ මේ සියල්ල දැක ඉතිරි සෙනඟ ගැන කණගාටු වූහ. තවත් බලවත් දේව දූතයෙකුව පොළොවට පිටත් කර එවන්ට යෙදින. යේසුස්වහන්සේ ඔහුගේ අතේ යම් ලියවිල්ලක් තැබූ සේක. ඔහු පොළොවට ළඟා වූ අතර 'බබිලෝනිය වැටුණේය, වැටුණේය"

කියා මහත් හඬින් කෑගැසීය. එවිට බලාපොරොත්තු කඩව සිටි අය නැවත ප්‍රීතියට පත්ව හිස් ඔසවා ස්වාමින්වහන්සේගේ පැමිණීම බලා සිටින්ට වූහ. සමහර අය අඥාන ලෙස නිදිමතකින් වාගේ සිටිනවා මම දුටිමි. මුහුණුවල දුක ප්‍රකාශ වෙන ඉරියව් මම දුටිමි. තමන් දැන් සිටින්නේ නැවතී බලා සිටීමේ කාලයේ බව බයිබලය හැදෑරීමෙන් ඔවුන් දැනගත්හ. ඉවසිල්ලෙන් පොරොන්දු ඉටුවීම බලා සිටිය යුතු බව ඔවුනට වැටහිණ. 1843 දී වූ සිදුවීම 1844 දී සිදුවිය. මෙවරද සරදම් කරන්නෝ 'නුඹලා තවම ගියේ නැ නේද"යි කෑගැසූ අතර 'ඔවුහු දෙවියන්වහන්සේට සරදම් කරති"යි දේව දූතයා පැවසීය.

එලියා අනාගතවක්තෘවරයා ස්වර්ගයට ගෙන ගිය කාලය මට පෙන්වීය. ඔහුගේ සළුව එලිෂා මත වැටිණ. දුෂ්ට තරුණයෝ ඔහු පසු පස එමින් 'තට්ටයා ස්වර්ගයට නැගී යමන්, නැගී යමන්" කියා ඔහුට සමච්චල් කළහ. ඔවුහු සමච්චල් කළේ දෙවියන්වහන්සේටය. සුදුසු දඬුවම එවෙලේම ඔවුන්ට ලැබිණ. ඔවුන් මේ හැසිරීම ඉගෙන ගෙන තිබුණේ තම දෙමාපියන්ගෙන්ය. ශුද්ධවන්තයන් ස්වර්ගයට යාම ගැන අපහාස කරන අයට දඬුවම් ලැබෙන්නේ වසංගත කාලයේදීය.

තමන්වහන්සේගේ සෙනඟගේ නිදා වැටෙන ඇදහිල්ල අවදි කරවන්නටද දෙවන දේව දූතයාගේ පණිවිඩය තේරුම් ගැනීමට ඔවුන්ව සූදානම් කිරීමටද ස්වර්ගයෙහි සිදුවන්ට තිබෙන ඉතා වැදගත් දෙය අවබෝධ කරදීමටද යේසුස්වහන්සේ තමන් දේව දූතයන් ස්වර්ගයෙන් පිටත්කර එවූසේක. එම දූතයෝ යේසුස්වහන්සේගෙන් මහත් බලයද ආලෝකයද ලබාගෙන දෙවන දූතයාගේ මෙහෙයට උදව් දීමට ඉක්මණින් ස්වර්ගයෙන් බැස එනවා මම දුටිමි. 'මනමාලයා පැමිණෙනවාය උන්වහන්සේගේ පෙරමඟට පලයල්ලා" යයි දේව දූතයන් හඬ පැවැත්වූ විට දෙවියන්වහන්සේගේ සෙනඟ කෙරෙහි මහත් ආලෝකයක් පතිත විය. දේවදූතයන් කෙරෙන් වූ ආලෝකය අඳුර විනිවිද ගෙන යන්ට විය. සාතන් සහ ඔහුගේ දූතයන් මෙම සේවය අවහිර කරන්ට තැත් කළහ. ඔවුහු දේව දූතයන් සමග තර්ක කරමින් 'දෙවියන්වහන්සේ සෙනඟ මුළාකර ගනු ලැබ ඇත. නුඹලාගේ බලය සහ ආලෝකය මගින් යේසුස්වහන්සේ නැවත එන බව ජනතාවට පිළිගන්වන්ට හැකි නොවීය" යි කීහ. සාතන් වැට බඳින්ට උත්සාහ කළ නමුත් දේව දූතයා තම මෙහෙය නොනවතා ඉදිරියට ගෙන ගියහ. පණිවිඩය ලත් අය ප්‍රීතියට පත් වූහ. ඔවුහු ඉහළ බලා දෙවෙනි ඊමේ ආශාවෙහි බැඳී සිටියහ. සමහර අය මහත් සිත් වේදනාවෙන් හඬමින් සහ යාච්ඤාවෙන් පසු වූහ. ඔවුහු තමන් දෙසම බලමින් ඉහළ බලන්ට හයව සිටියහ.

පළමුවන දූතයාගේ පණිවිඩයට එරෙහිව සිට එය එපා කළ අයට දෙවන දූතයාගේ පණිවිඩයේ ආලෝකය අහිමි විය. 'බලව මනමාලයා පැමිණේය" යි දැන්වූ ආලෝකය හා මහිමය ඔවුන්ට ප්‍රයෝජනවත් නොවීය. යේසුස්වහන්සේ ඔවුන් වෙතින් ඉවතට හැරුණු සේක. ඔවුහු උන්වහන්සේව සුළු කොට එපා කළහ. පණිවිඩය පිළිගත් අය මහත් සතුටට පත් වූහ. ඔවුහු දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගැනීමට ආශාවෙන් යාච්ඤාවෙහිද බලා සිටීමෙහිද නිරත වූහ. උන්වහන්සේව අමනාප කරන්ට ඔවුහු භය වූහ. සාතන් මෙම ආලෝකය මනුෂ්‍යයන්ගෙන් වළක්වා ලීමට උත්සාහ කළේය. නමුත් දේව සෙනඟ ආලෝකය අගය කරමින් ඉහළට යේසුස්වහන්සේ වෙතට නෙත් යොමා සිටි තාක් කල් ආලෝකය ඔවුන්ගෙන් වළක්වාලීමට සාතන්ට නොහැකිය. විරුද්ධවාදීන්ගේ සෑම ඉරියව්වක්ම සහ ක්‍රියාවක්ම දේව දූතයෙක් විසින් සටහන් කරගන්ට යෙදින. බොහෝ දෙනෙක් හඬ නගමින් 'මනමාලයා එන්නේයැ" යි කෑගැසූ අතර යේසුස්වහන්සේගේ පැමිණීමට ආශා නොවූ සභාවල සහෝදරයන් අත්හැර ඔවුහු පිටව ගියහ. උන්වහන්සේගේ පැමිණීමට ආශා නොකළ අය වෙතින් යේසුස්වහන්සේ තම මුහුණ ඉවත් කරගන්නවා මම දුටිමි. ඔවුන්ගේ අපවිත්‍රකම් මගින් තමන්ගේ අයද අපවිත්‍ර විය හැකි නිසා ඔවුන්ව අපවිත්‍ර අය වෙතින් ඉවත් කරගන්නා ලෙස උන්වහන්සේ දේව දූතයන්ට කීසේක. පණිවිඩයට කීකරුවූ අය පිට වී නිදහස්ව එකමුතුව සිටගත්හ. ශුද්ධවූ උතුම් වූ ආලෝකයක් ඔවුන් කෙරෙහි පතිත විය. ඔවුහු ලෝකය ත්‍යාග කළහ. ලෙන්ගතුකම් ඉරා දැමූහ. ලෝකයේ සම්පත් පූජා කළහ. ඔවුන්ගේ හිතවත්කම් ස්වර්ගය දෙසට යොමු කළහ. තමන්ගේ පෙම්වත් මිදුම්කාරයාණන්ගේ පැමිණීම බලා සිටියහ. ඔවුන්ගේ මුහුණුවල දිස්වූ ශුද්ධ වූ ප්‍රීතිය කියාපෑවේ ඔවුන්ගේ සිත්වල තැන්පත්ව තිබූ සාමය හා සතුටය. ඔවුන්ව සෝදිසි කරන පැය ළංවෙමින් තිබියදී ඔවුන් වෙත ගොස් ඔවුන්ව ශක්තිමත් කරන ලෙස යේසුස්වහ්නසේ තම දූතයන්ට පැවසූ සේක. පැමිණීම බලා සිටි අය සෝදිසි කළ යුතු ප්‍රමාණයට තවම සෝදිසි කර නොතිබූ බව මම දුටිමි. ඔවුහු වැරදිවලින් නිදොස්ව සිටියේ නැත. පොළොවේ ජනතාවට අනතුරු ඇඟවීම් එවමින් දෙවියන්වහන්සේ දක්වූ දයානුකම්පාව සහ යහපත්කම මෙලෙස කාලය සම්බන්ධ ප්‍රශ්නයක් මගින් නැවත නැවත ක්‍රියාත්මක කළේ සෙනඟව තම තමන්ගේ වැරදි වඩා උනන්දුවෙන් සොයා බැලීමටද එමගින් මිථ්‍යාදෘෂ්ඨිකයන්ගේ හා පාප්වරුන්ගේ ඉගැන්වීම්වලින් ලබාගෙන පරම්පරාවෙන් පරම්පරාවට පැවත ආවා වූ වරදවල් ඉවත දමන්ට උදව් කරන පිණිසය. මෙම පණිවිඩ මගින් දෙවියන්වහන්සේ තමන්ගේ සෙනඟ උදෙසා බලවත් ලෙස ක්‍රියා කරන්ට සහ තමන්වහන්සේගේ සියලු ආඥා පවත්වන්ට හැකිවන තැනට ගෙන එන්ට අභිප්‍රාය කළසේක.

*කියවන්න: 2 රාජාවලිය 2: 11-23; දානියෙල් 8: 14; හබක්කුක් 2: 1-4; ශු. මතෙව් 25: 6; එළිදරව් 14: 8 සහ 18: 1-5.*

## *27 - පරිච්ඡේදය*

# ශුද්ධස්ථානය

දෙවියන්වහන්සේගේ සෙනඟගේ මහත් බලාපොරොත්තු කඩවීම මට උන්වහන්සේ පෙන්වූ සේක. බලා සිටි දිනදී යේසුස්වහන්සේ පැමිණියේ නැත. අනාගතවාක්‍යයෙන් පෙන්වා දී තිබෙන දේ සිදු නොවීමට හේතු ඔවුන්ට සොයාගත නොහැකි විය. දේව වචනය නිෂ්ප්‍රභා වීද? 'දෙවියන්වහන්සේ තමන් පොරොන්දු ඉටුකිරීමට අසමත් වූ සේක්ද' යයි දේව දූතයෙක් ප්‍රශ්න කළේය. 'නැත. උන්වහන්සේගේ පොරොන්දු සියල්ල ඉටු කළසේක'යි දේව දූතයාම පැවසුවේය. ඔහු තවදුරටත් මෙසේ පැවසුවේය. යේසුස්වහන්සේ මෙතෙක් සේවය කළේ ස්වර්ගීය දේව මාළිගාවේ ශුද්ධස්ථානය නමැති කොටසේය. දන් උන්වහන්සේ එහි දොර වසා දමා අති ශුද්ධස්ථානයේ දොර විවෘත කර එහි ඇතුල්ව සේවය ආරම්භ කළසේක. ශුද්ධස්ථානය පවිත්‍ර කිරීම දන් කෙරීගෙන යනවාය. ඉවසීමෙන් බලා සිටින අය මෙම අභිරහස තේරුම් ගන්නවා ඇත. මනුෂ්‍යයා වරද්දාගෙන ඇත. දෙවියන්වහන්සේගේ පැත්තේ කිසි වරදක් වී නැත. අනාගතවාක්‍ය කාල පරිච්ඡේදවල කෙළවරදී නොහොත් 1844 වසරේදී පවිත්‍ර කරනු ලබන්ට යන්නේ අපගේ මේ පොළොව යයි වරදවා වටහා ගෙන තිබිණ. මනුෂ්‍ය බලාපොරොත්තු අසාර්ථක විය. නමුත් දිව්‍ය පොරොන්දු ඇණහිටියේ නැත. උන්වහන්සේ දන් අති ශුද්ධස්ථානයට ඇතුල් වී සිටින්නේ ඊශ්‍රායෙල් සෙනඟ උදෙසා සමගිකමක් කිරීමටය. (අප හැම ආත්මික ඊශ්‍රායෙල්වරුය. ගලාති 3: 29) උන්වහන්සේ අති ශුද්ධස්ථානයේ සේවය කරන අතර අළුත් යෙරුසලම උන්වහන්සේට භාර දෙනවා මම දුටිමි. අති ශුද්ධස්ථානයේ මෙම සේවය හමාර වූ විට තමන්වහන්සේගේ පැමිණීම බලා සිටින වටිනා අයවලුන්ව උන්වහන්සේ සිටින තැනට ගෙන යන පිණිස උන්වහන්සේ ස්වර්ගයෙන් බැස එන සේක.

1844 දී අනාගතවාක්‍ය කාල සීමාව හමාර වූ විට ස්වර්ගයේ කුමක් සිදුවී දැයි මට පෙන්වනු ලැබීය. යේසුස්වහන්සේ ශුද්ධස්ථාන මණ්ඩපයේ සේවය හමාර කර එහි දොර වැසූ විට, යේසුස්වහන්සේගේ දෙවෙනි ඊමේ පණිවිඩය අසා එය පිළි නොගත් අය කෙරෙහි මහත් අන්ධකාරයක් පතිත වූ බව මම දුටිමි. ඔවුන්ට යේසුස්වහන්සේව නොපෙනී ගියේය. උන්වහන්සේ ඉන්පසු වෙනත් වටිනා ඇඳුමක් ඇඳගත් සේක. එම සළුවේ කෙළවරෙහි දෙළුම් ගෙඩියක්, සීනුවක්, දෙළුම් ගෙඩියක් සීනුවක් වශයෙන් විය. පපුව මත අලංකාර වැස්මක්ද විය. උන්වහන්සේ සෙලවෙන අතර මැණික් මෙන් දිළිසෙන්නට වූ අලංකාර දේ පෙනුණේ ලියා ඇති නම්වල අකුරු මෙන්ය. උන්වහන්සේගේ හිස මත ඔටුන්නක් වැනි දෙයක්ද තබා ඇඳුම සම්පූර්ණ වූ පසු දේව දූතයෝ උන්වහන්සේව වටකරගෙන ගිනිමය වූ රථයකින් දෙවෙනි තිරයෙන් ඇතුළට ගෙනගිය සේක. ස්වර්ගීය මණ්ඩපයේ කොටස් දෙස සැලකිල්ලෙන් බලන ලෙස එවිට මට පවසනු ලැබීය. තිරය නොහොත් දොර විවෘත කර මට ඇතුල් වන්ට අවසර ලැබිණ. පළමු කොටසේ පහන් හතක් සහිත පහන් කණුවද, රොටී තබන ලද මේසය ද, දුම් පූජාසනය ද, සුවඳ දුම් භාජනය ද විය. එහිවූ සියලුම භාණ්ඩ ඉතා පවිත්‍ර රනින් කරන ලද ඒවා විය. එහි ඇතුල් වන අයගේ ඡායා එහි දැකිය හැක. මෙම කාමර දෙක වෙන් කළ තිරය අති අලංකාර එකක්ව තිබිණ. එය නොයෙක් වර්ණවලින්ද වර්ගවලින්ද නිමව තිබූ අතර එම තිරයේ වාටිය රනින් කරන ලද දේවදූත රූප වැනි පෙනුම එහි විය. තිරය එසවූ විට මම දෙවන කාමරය දෙස බැලීමි. ආඥා දසය ලිවූ ගල්ලැලි තබා තිබූ ගිවිසුම් පෙට්ටිය මම එහි දුටිමි. එහි පෙනීම අති පවිත්‍ර රන් මෙන් විය. රනින් කරන ලද ඔටුනුවලින් යුත් වාටියක් මෙන්වූ පටියක් පෙට්ටියේ ඉහළ කොටසේ වටේටම විය. ගිවිසුම් පෙට්ටිය දෙපැත්තේ අලංකාර කෙරුබ්වරු දෙදෙනෙක් පියාපත් විදහාගෙන සිටි අතර එම පියාපත් එකිනෙකට ස්පර්ශ වී යේසුස්වහන්සේගේ හිසට ඉහළින් තිබිණ. කෙරුබ්වරුන්ගේ මුහුණු පහතට ගිවිසුම් පෙට්ටිය දෙසට හැරවී තිබිණ. මෙම ඉරියව්ව සියලූ දේව දූතයන් දේව ආඥාවලට කීකරුකම දක්වන සංකේතයක් විය. කෙරුබ්වරු දෙදෙනා මධ්‍යයේ සුවඳ දුම් භාජනය තිබිණ. ඇදහිලිවන්තයන්ගේ යාච්ඤා යේසුස්වහන්සේ වෙත පැමිණි විට උන්වහන්සේ එම යාච්ඤා මිහිරි සුවඳක් ලෙස පියාණන්වහන්සේ වෙතට එසවූ සේක. එම සුවඳ දුම් භාජනයෙන් ඉහළට විහිදී ගිය අතර අලංකාර ලෙස වර්ණවත් විය. ගිවිසුම් පෙට්ටිය ඉදිරියේ සිටි යේසුස්වහන්සේට ඉහළින් බලාසිටින්ට නොහැකි තරම් වූ අතිශයින් මහිමාලංකාර වූ ආලෝකයක් දුටිමි. එය දෙවියන්වහන්සේ වැඩ වාසය කරන සිංහාසනයක ආකාර විය. සුවඳ දුම් පියාණන් වහන්සේ වෙතට පැමිණි පසු සිංහාසනය වෙතින් යේසුස්වහන්සේ වෙතට මහිමාලංකාරයක් පැමිණියේය. එය උන්වහන්සේ වෙතින් නැවත යාච්ඤා කළ අය වෙත ළඟා විය. ආලෝකයද මහිමයද බහුල ලෙස

යේසුස්වහන්සේ වෙතට ගලා ඇවිත් කරුණාසනය වැසී යන්ට විය. මහිමයෙන් දේව මාළිගාව පූර්ණ විය. වැඩි වේලාවක් මට දේව මහිමය දෙස බලාසිටින්ට නොහැකි විය. කිසි භාෂාවකින් එම මහිමය විස්තර කළ නොහැකිය. මම විස්මයටද පුදුමයටද පත්වෙමින් දර්ශනය වෙතින් ඉවතට හැරුණෙමි.

පසුව කොටස් දෙකකින් යුක්ත වූ භූමික ශුද්ධස්ථානය වෙතට මාගේ බැල්ම යොමු කරවිණ. එය ස්වර්ගීය ශුද්ධ ස්ථානයට හැම දෙයින්ම සමාන විය. එය ස්වර්ගීක ශුද්ධස්ථානයේම ආදර්ශයක් බව මට පැවසීය. ශුද්ධස්ථානයේද අති ශුද්ධස්ථානයේද වූ සියලූ බඩු බාහිරාදිය එක සමානවම තිබිණ. භූමික ශුද්ධස්ථානයේ දිනපතාම පූජකයෝ සේවයෙහි යෙදී සිටියහ. ශුද්ධස්ථානය නම් කොටසේ අවුරුද්ද පුරාම සේවය කළ අතර අති ශුද්ධස්ථානයට සේවය සඳහා ඇතුල් වූයේ අවුරුද්දට එක දවසක් පමණය. එසේ ඇතුල් වූයේ දවස්පතා ශුද්ධස්ථානයට ගෙනෙන ලද පාප පූජාවල සටහන් පවිත්‍ර කරන පිණිසය. යේසුස්වහන්සේ ස්වර්ගීය ශුද්ධස්ථානයේ කොටස් දෙකේම සේවය කළ බව මම දුටිමි. උන්වහන්සේ ස්වර්ගීය මණ්ඩපයට ඇතුල් වූයේ පොළොවේදී තමන්ගේම ලේ පූජා කිරීමෙන් පසුවය. භූමික පූජකයන්ට මරණය නිසා සැමදා පවතින්ට නොහැකි වූහ. නමුත් යේසුස්වහන්සේ සදාකාලයටම පූජකයෙක්ව සිටින බව මම දුටිමි. භූමික පූජාවල් සැලසුම් කර තිබුණේ යේසුස්වහන්සේ ලොවට ඇවිත් පූජා වන තුරු උන්වහන්සේගේ පූජාවේ ඵල ඇදහිල්ලෙන් අල්ලාගෙන සිටින පිණිසය. භූමික ශුද්ධස්ථාන මෙහෙයේ කරනා දිව්‍ය ප්‍රඥාවට අනුව අපට දෙනු ලැබුවේ යේසුස්වහන්සේගේ ස්වර්ගීය මෙහෙය සම්බන්ධ පාඩම් ඉගෙනීමට අපට පහසුවන පිණිසය.

යේසුස්වහන්සේ කල්වාරි කුරුසිය මත මරණයට පත්වන විට 'ඉතින් නිමයි' කියා උන්වහන්සේ කෑගැසූ සේක. එවිට දේව මාළිගාවේ තිරය උඩ සිට පහළට දෙකඩව ඉරී ගියේය. එයින් සංකේතවත් කළේ පව්කාරයින්ගේ පාප පූජා පිළිගන්නා පිණිස මින් පසු භූමික ශුද්ධස්ථානයේදී දෙවියන්වහන්සේ මිනිසුන්ව මුණ නොගැසෙන බවය. යේසුස්වහන්සේ තමන් රුධිරය වගුරුවනු ලැබීය. එම ලේ උන්වහන්සේම ස්වර්ගීය මණ්ඩපයේදී ඔප්පු කරන පිණිසය. භූමික මණ්ඩපයේ අති ශුද්ධස්ථානයට උත්තම පූජකයා පමණක් අවුරුද්දකට එක් වරක් ඇතුල් වී සේවය කර ශුද්ධස්ථානය පවිත්‍ර කළා සේම යේසුස්වහන්සේද අවුරුදු 2300 යේ අනාගතවාක්‍යය කාලයේ කෙලවරේදී එනම් 1844 දී ස්වර්ගීය ශුද්ධස්ථාන මණ්ඩපයේ අති ශුද්ධස්ථානයට ඇතුල් වූසේක. එසේ ඇතුල් වූයේ උන්වහන්සේගේ මැදහත්කාර මෙහෙයේ ප්‍රයෝජන ලබන අය උදෙසා සමගි කිරීමේ අවසාන මෙහෙය ඉටු කර ශුද්ධස්ථානය පවිත්‍ර කරන පිණිසය.

***බලන්න: නික්මයාම පරිච්ඡේද 25 සිට 28 දක්වා; ලෙවී කථාව පරිච්ඡේදය 16; 2 රාජාවලිය 2: 11; දානියෙල් 8: 14; ශු. මතෙව් 27: 50, 51; හෙබ්‍රෙව් 9 වෙනි පරිච්ඡේදය; එළිදරව් 21 පරිච්ඡේදය.***

## *28 - පරිච්ඡේදය*

# තුන්වන දේව දූතයාගේ පණිවිඩය

ශුද්ධස්ථානයේ මෙහෙය නිම කර අති ශුද්ධස්ථානයට යේසුස්වහන්සේ ඇතුල්ව දේව ව්‍යවස්ථාව ඇතුළත්ව තිබෙන ගිවිසුම් පෙට්ටිය ඉදිරියේ සිටගත් විට තවත් දේව දූතයෙක්ව තුන්වන පණිවිඩයක් ඇතිව ලෝකයට එවූ සේක. උන්වහන්සේ ඔහුගේ අතේ යම් ලියවිල්ලක් තැබූ සේක. ඔහු තේජසින්ද බලයෙන්ද යුතුව ලෝකයට පැමිණි අතර මේ දක්වා මනුෂ්‍යයන්ව භය නොගැන්වූ තරම් භයානක අනතුරු හැඟවීමක් ප්‍රකාශයට පත් කළේය. මෙම පණිවිඩය සැලසුම් කර තිබුණේ දෙවියන්වහන්සේගේ දරුවන් උදෙසා ඔවුන්ගේ ආරක්ෂාව සලසන පිණිස වන අතර ඔවුන් ඉදිරියේ තිබෙන පරික්ෂාවේ කාලය සහ ගාවිනාවල්ද දන්වා දෙන අදහසින්ය. දේව දූතයා මෙසේද පැවසීය. මෘගයාද උගේ රූපයද සමග ඉතාම සමීප ගැටුමකට ඔවුන්ව ගෙනෙනු ලබනවාය සදාකාල ජීවනය ගැන ඔවුන්ගේ එකම බලාපොරොත්තුව වන්ට යන්නේ ස්ථිරව සිටීමය. මරණ තර්ජනවලට මුහුණ දෙන්ට වුවත් සත්‍යය අල්ලාගෙනම සිටිය යුතුය. තුන්වන දේව දූතයා තම පණිවිඩය හමාර කරන්නේ මේ ලෙසින්ය. 'මෙන්න දෙවියන්වහන්සේගේ ආඥා ද යේසුස්වහන්සේගේ ඇදහිල්ලද පවත්වන අය, ශුද්ධවන්තයන්ගේ ඉවසීම මෙහිය.' ඔහු මේ වචන පැවසූ අතර තම අවධානය ස්වර්ගීය ශුද්ධස්ථානය දෙසට යොමු කළේය. මෙම පණිවිඩය පිළිගන්නා හැම දෙනාගේම සිත් අති ශුද්ධස්ථානයේ ගිවිසුම් පෙට්ටිය ඉදිරියේ සේවය කරමින් සිටින යේසුස්වහන්සේ වෙතට යොමු කරනු ලැබේ. නොදනුවත්කමින් දෙවියන්වහන්සේගේ ආඥා කඩ කළාවූ අය උදෙසා තවමත් ඉවර නොවී තිබෙන දේව කරුණාව

ඉදිරියේ උන්වහන්සේ අවසාන මැදහත්කාර මෙහෙය ඉටු කරමින් සිටින සේක. මෙම සමගිකමේ මෙහෙය මළාවූ ධර්මිෂ්ඨ අය සහ ජීවත්ව සිටින ධර්මිෂ්ඨ අය උදෙසාය. දෙවියන්වහන්සේගේ ආඥා ගැන ආලෝකය නොලබා නොදන්නා කමින් පව් කල අය උදෙසාද උන්වහන්සේ සමගිකමක් කරන සේක.

යේසුස්වහන්සේ අතිශුද්ධස්ථානයේ දොර විවෘත කළ විට සබත් දවස ගැන ආලෝකය පෙනෙන්ට විය. දෙවියන්වහන්සේ පුරාණයේ සිටි ඊශ්‍රායෙල්වරුන්ව ආඥා පවත්වනවා දැයි බැලීමට සෝදිසියකට භාජන කළ සේම අද ද උන්වහන්සේ තමන්ගේම සෙනඟව විශ්වාසවන්තද කියා පෙන්වන පිණිස සෝදිසි කරන සේක. බලාපොරොත්තු කඩව සිටි අයව දේව දූතයා අති ශුද්ධස්ථානය වෙතට මගපෙන්වනවා මම දුටිමි. ඇදහිල්ලෙන් ඔවුහු යේසුස්වහන්සේ සමග අතිශුද්ධස්ථානය තුළට ගමන් කළහ. ඔවුන්ට නැවත යේසුස්වහන්සේ සම්බ වූහ. ඔවුන්ගේ ප්‍රීතිය සහ බලාපොරොත්තුව අලුත් වූහ. ඔවුහු පසුගියාව දෙස බැලූහ. 1844 වසරේ සිට බලාපොරොත්තු කඩවීමේ අත්දැකීම් එකිනෙක ගැන සිතා බැලූහ. තුන්වන දූතයා ඔවුන්ට අතීතය වර්තමානය සහ අනාගතය ආලෝකමත් කර දුන්හ. දෙවියන්වහන්සේ අභිරහස්මය අන්දමට මගපෙන්වූ බව ඔවුන්ට දැන් විශ්වාසය.

ඉතිරි සහාව යේසුස්වහන්සේ අනුව අති ශුද්ධස්ථානයට ඇතුල් වූ ආකාරයක් මට පෙන්වීය. ගිවිසුම් පෙට්ටියද, කරුණාසනයද මත වූ මහිමශ්‍රීයෙන් ඔවුන් වශී වූහ. යේසුස්වහන්සේ ගිවිසුම් පෙට්ටියේ ආවරණය ඉවත් කළ සේක. දසපනත ලියා තිබූ ගල්ලැලි ඔවුහු දැකගත්හ. පනත් දසය දෙස බලමින් සිටි ඔවුහු හතරවන ආඥාව ජීවමාන ලෙස තිබෙන ආකාරයද ඒ වටා බබළන ආලෝක වළල්ලක් තිබෙනවාද දුටු ඔවුහු වෙව්ලමින් පසුපසට පා තැබූහ. සබත අවලංගු කළ බව හෝ සබත සෙනසුරාදායින් ඉරිදාට මාරු කළ බව හෝ එහි ඔවුන්ට සම්බ නොවීය. විදුලි කෙටීම හා ගිගිරුම් හඬ වැනි බිය උපදවන ගාම්භීර සිදුවීම් ඇතිව සීනයි කඳු මුදුනෙන් දෙවියන්වහන්සේ කථා කර කියාදී තම ශුද්ධවූ ඇඟිල්ලෙන් ලියා දුන් ආකාරයටම එම ආඥා ද එහි විය. 'සදවසක් වැඩ කරමින් තාගේ සියලු කර්මාන්ත කරගනුව. එහෙත් සත්වන දවස තාගේ දෙවිවූ ස්වාමින්වහන්සේට පවත්වන ශුද්ධ සබතක්ය.' දස ආඥා පනත ගැන දෙවියන්වහන්සේ දක්වා තිබූ සැලකිල්ල ගැන ඔවුහු පුදුමයට පත් වූහ. යෙහෝවඃ වහන්සේගේ සමීපයෙහිම ඒවා තබාගෙන උන්වහන්සේගේ ශුද්ධ භාවය තුළ ආරක්ෂාව සපයා තිබිණ. යෙහෝවඃ වහන්සේ විසින් ශුද්ධ දවසක් බවට පත්කර තිබූ හතරවන ආඥාව තමන් විසින් පාගා දමා මිථ්‍යා දෘෂ්ටීන්ගෙන්ද පාප්වරුන්ගෙන්ද ලබාගෙන තිබූ වෙනත් දවසක් පැවැත්වූ බව ඔවුහු දැන ගත්හ. ඔවුහු දෙවියන්වහන්සේ ඉදිරියේ යටත්ව හඬා වැලපෙමින් තමන්ගේ වරදකාරකම ගැන දුක් වූහ.

ඔවුන්ගේ පව් කියාදීම් හා යාච්ඤා යේසුස්වහන්සේගේ අතෙහි වූ සුවඳ දුම් භාජනයේ දුමත් සමග පියාණන්වහන්සේ වෙතට පැමිණෙනවා මම දුටිමි. එවිට ආලෝකයක් පියාණන් වහන්සේ වෙතින් යේසුස්වහන්සේ වෙතටද කරුණාසනය වෙතටද ඉන්පසු යාච්ඤා කරමින් සිටි අය වෙතටද පැමිණ ඔවුන්ට ආශිර්වාදයක් විය. ඔවුන්ගේ සිත් ප්‍රීතියෙන්ද බලාපොරොත්තුවෙන්ද පිරී ඉතිරී යන්ට විය. තුන්වන දූතයාගේ පණිවිඩය සමග ඔවුහුද එක්ව එම ගාම්භීර අනතුරු ඇඟවීම් ප්‍රකාශයට පත්කරන්නට වූහ. ඔවුන්ගේ පණිවිඩය පිළිගත් බොහෝ දෙනෙක් මුලින් ප්‍රකාශ කළ අය සමග එකතු වී දෙවියන්වහන්සේව උසස් කරමින් උන්වහන්සේ ශුද්ධ භාවයට පත් කළ නිවාඩු දවස පැවැත්වූහ.

තුන්වන පණිවිඩය පිළිගත් බොහෝ දෙනෙක් ඊට ඉහත දී තිබූ පණිවිඩවල අත්දැකීම් ලබා නොතිබිණ. මෙය දන්නාවූ සාතන් ඔවුන්ව හෙළා දමන්ට බලා සිටියේය. නමුත් තුන්වන දූතයා ඔවුන්ව යොමු කළේ අති ශුද්ධස්ථානය වෙතටය. පසුගිය පණිවිඩවල අත්දැකීම් ලබා සිටි අය ඔවුනට ස්වර්ගීය ශුද්ධස්ථානය වෙතට මගපෙන්වූහ. දේව දූතයන් තුන්දෙනාගේ පණිවිඩවල ඒකීය සම්බන්ධතාවය හා සත්‍යතාවය බොහෝ දෙනෙක් අවබෝධ කරගෙන පණිවිඩය පිළිගත්හ. ඒවායේ පිළිවෙල අනුව පණිවිඩ පිළිගෙන ඇදහිල්ලෙන් යේසුස්වහන්සේ සමග ස්වර්ගීය ශුද්ධස්ථානයට ප්‍රවිෂ්ඨ වූහ. මෙම පණිවිඩ සභාව රඳවා තබාගැනීමේ නැංගුරමක් ලෙස මට පෙන්වා දෙන්ට යෙදින. පුද්ගලයෝ මෙම පණිවිඩ අවබෝධයෙන් යුතුව පිළිගන්නේ නම් සාතන්ගෙන් පැමිණෙන බොහෝ මුළාකිරීම් වලින් ඔවුහු ආරක්ෂා වෙනවා ඇත.

එක්දාස් අටසිය හතළිස් හතරේ වූ (1844) මහා බලාපොරොත්තු කඩවීමෙන් පසුව වූ කණ්ඩායමේ අයගේ ඇදහිල්ල බිඳ දැමීමට සාතන් සහ ඔහුගේ දූතයන් මළපත් ඇටවූහ. මෙම පණිවිඩවල යම් අත්දැකීම් ලැබූ සමහර අයගේ සිත්වල සාතන් ක්‍රියා කරන්ට විය. ඔවුහු පිටතට පෙනෙන්ට යටහත් පහත් බව පෙන්වූ අයවල් වූහ. ඔවුහු පළමුවෙනි සහ දෙවෙනි පණිවිඩ වෙනස් කර ඒවායේ සිදුවීම් ඈත අනාගතයේ සිදුවන්ට යන දේවල් ලෙස පෙන්වූහ. තවත් අය ඒවා ඈත අතීතයේ සිදුවූ දේවල් ලෙස දක්වූහ. මෙම පුද්ගලයෝ අත්දැකීම් නොලබා සිටි අයගේ මනසවල්

ව්‍යාකූල කරමින් වෙනතකට සිත් ඇදගන්ට උත්සාහ කළහ. තවත් සමහර අය ශුද්ධ ලියවිලි සොයන්ට වූයේ සභාවෙන් පිටත සිටගෙන තම අදහස්වලට අනුව ධර්මතාවන් ගොඩ නගන්ටය. මේ කාරණයේදී සාතන් මහත් සතුටට පත් විය. මක්නිසාද මෙලෙස නැංගුරමෙන් ඈත්වී යන අය තමාගේ සේවයට එක්කාසු කරගන්ට හැකිවන නිසාය. පළමුවන සහ දෙවන පණිවිඩවලදී මූලිකව ක්‍රියා කළ බොහෝ දෙනා ඇදහිල්ල එපා කළහ. කණ්ඩායම තුළ බිඳීම් විසිරීම් සිදු විය. මම විලියම් මිලර්ව දුටිමි. ඔහු කැළඹීමකට පත්ව තමා අනුව ආ අය ගැන දුකට හා කරදරයට පත්ව සිටින්ට විය. ඔහුට පෙනෙන්ට වූයේ 1844 දී එකමුතුව ආදරයෙන් සිටි අය පසුව ඒ ආදරය නැතිව ගොස් එකිනෙකාට එරෙහිව ක්‍රියා කරන බවය. ඔවුහු ශීතල හා ඇල්මැරුණු තත්ත්වයකට වැටෙනවා ඔහුට පෙනිණ. කණගාටුව නිසා ඔහුගේ ශක්තියද හින විය. ප්‍රධානීන් ලෙස සිටි අය විලියම් මිලර්ගේ තත්ත්වය දෙස බලා සිටිනවා මම දුටිමි. ඔහු තුන්වන දූතයාගේ පණිවිඩයද ආඥා පැවැත්වීමද පිළිගනීවි යයි ඔවුහු භය වූහ. ස්වර්ගීය ආලෝකය දෙසට ඔහු හැරෙන්න හදන හෙයින් ඔහුගේ මනස ඉවතට හරවන්ට ක්‍රියා කළහ. ඔහුගේ මනස අඳුරේ තබාගැනීමට ක්‍රියා කළ මනුෂ්‍ය උත්සාහය මම දුටිමි. පසුව විලියම් මිලර් තමාගේ හඬ ස්වර්ගීය ආලෝකයට විරුද්ධව නැගීය. මෙසේ ඔහුට තමාගේ බලාපොරොත්තු කඩවීම තේරුම් ගන්ටත්, පසුගියාව දෙසට විහිදී තිබූ ආලෝකය දකගන්ටත් තමාගේ නැතිවී ගිය භක්තිය අළුත් කරගන්ටත්, බලාපොරොත්තු දීප්තිමත් කරගන්ටත් දෙවියන්වහන්සේව ගෞරවයට පත්කරන්ටත් පුළුවන්වූ ආලෝකය ලබාගන්ට අසමත් විය. ඔහු දිව්‍ය ප්‍රඥවට නොව මනුෂ්‍ය ප්‍රඥවට හේත්තු විය. තම ස්වාමින්වහන්සේගේ මෙහෙයෙහි යෙදී විඩාවට පත්ව සිටීමද වයෝවෘධ භාවයද නිසා ඔහුව සත්‍යය පිළිගැනීමෙන් වැලැක්වූ අයට තරම් ගණන් දීමක් දෙවියන්වහන්සේ ඔහුගෙන් බලාපොරොත්තු වන්නේ නැත. ඔවුහු වගකිව යුතුය. පාපය ඔවුන් මත පතිතව ඇත. විලියම් මිලර් තුන්වන පණිවිඩය පිළිගත්තා නම් අභිරහස් ලෙස අඳුරුව පෙනුණා වූ බොහෝ දේ ඔහුට තේරුම් ගන්ට යෙදෙනවා ඇත. ඔහු සිතුවේ ඔහුගේ සහෝදරයන් ඔහුට දැක්වූ ආදරය සහ සැලකිල්ල නිසා ඔවුන්ගෙන් තමාට වෙන්විය නොහැකි යයි කියාය. සත්‍යය දෙසට ඔහුගේ සිත ඇදී ගියේය. සහෝදරයෝ ඊට එරෙහි වූහ. තමා සමග එකතු වී උරෙන් උර ගැටී යේසුස්වහන්සේගේ දෙවෙනි ඊම ප්‍රකාශ කළ අයගෙන් වෙන්විය හැකිද? ඔවුන් තමාව නොමඟ යවන්නේ නැත යනු ඔහුගේ විශ්වාසය විය. දෙවියන්වහන්සේ ඔහුව මරණයට පත්වන්ට ඉඩ හැර නිතරම ඔහුව තමන්වහන්සේ වෙතින් ඉවතට ගෙන යන්ට උත්සාහ කළ අයගෙන් වෙන්කර සොහොනෙහි වසා තැබූ සේක. පොරොන්දු දේශයට ඇතුල් වෙන්ට ලංව සිටි විට මෝසෙස් වරදක් කළා. එවැනිම වරදක් විලියම් මිලර්ද ස්වර්ගීය කානාන් දේශයට ඇතුල් වන්ට ලංව සිටියදී තමාගේ බලපෑම සත්‍යයට විරුද්ධව යන්ට ඉඩදීම මගින් කළේය. වෙනත් අය ඔහුට එසේ කරන්ට බලපෑම් කළහ. ඒ ගැන ඔවුහු වග කිව යුතුව ඇත. දේව දූතයෝ ඔහුව භූමදාන කළ තැන බලාගත්හ. අන්තිම හොරණෑ හඬ ඔහුව අවදි කරනවා ඇත.

***කියවන්න: නික්මයාම 20: 1-17; 31: 18; 1 තෙසලෝනික 4: 16; එළිදරව් 14: 9-12.***

## *29 - පරිච්ඡේදය*

# ස්ථිර වේදිකාවක්

කණ්ඩායමේ ස්ථාපිත ස්ථිර ඇදහිල්ල කළඹන්ට ඉඩ නොදී, තදින් සුරක්ෂිතව නැගී සිටි කණ්ඩායමක් මම දුටිමි. දෙවියන්වහන්සේ පිළිගැනීමෙන් යුතුව බලා සිටින සේක. එක, දෙක, තුන වශයෙන් පඩි තුනක් මට පෙන්වීය. ඒ පළමුවෙනි, දෙවෙනි සහ තුන්වෙනි දූතයන්ගේ පණිවිඩයන්ය. දේවදූතයා මෙසේ පැවසීය. මෙම පණිවිඩවලින් අල්පෙනිත්තක් පමණ දෙයක් හෝ එහා මෙහා කරන්නාට දුක් වේ. මෙම පණිවිඩ හරියාකාරව වටහා ගැනීම ඉතා වැදගත්ය. ඒවා පිළිගන්නාවූ ආකාරය මත ජීවිතවල ඉරණම රඳා ඇත. මෙම පණිවිඩ ලබාගැනීමේදී සිදුවූ දේවල් හා අත්දැකීම් මාව ආපස්සට ගෙන ගොස් පෙන්වීය. නැවත මාව ඉදිරියට ගෙනැවිත් දේව සෙනඟ මේවා ලබාගැනීමට කළ කැපවීම් පෙන්වා දුන්හ. දෙවියන්වහන්සේ පියවරෙන් පියවර ගෙනැවිත් සොලවන්ට නොහැකි ශක්තිමත් වේදිකාවක් මත ඔවුන්ව පිහිටවූ සේක. පසුව පුද්ගලයන් පැමිණ වේදිකාවට නගින්නට පෙර එය සෝදිසි කර බලනවා මම දුටිමි. සමහර අය ඉක්මණින්ම වේදිකාවට නැග ගත්හ. තවත් සමහර අය වේදිකාව ඉදිකර තිබූ අත්තිවාරමේ අඩුපාඩු සොයන්ට වූහ. අඩුපාඩු සාදා සම්පූර්ණ කළහොත් ජනතාව වඩාත්ම සතුටු වේවි යයි කීහ. ඉන්පසු තවත් අය වේදිකාවෙන් බැස වේදිකාවේ වැරදි ඇත්දැයි බලා එය වැරදියට සාදා ඇති බව කීහ. වේදිකාව මත සිටි වැඩි දෙනා ස්ථිර ලෙස නැගී සිට වේදිකාවෙන් බැස සිටි අයට කථා කොට පැමිණිලි කිරීම් නතර කරන ලෙසද, උතුම් ඉදිකිරීම්කාරයාණෝ දෙවියන්වහන්සේ බවද, උන්වහන්සේට විරුද්ධව සටන් නොකරන ලෙසද ඉල්ලා සිටියහ. දෙවියන්වහන්සේ ඔවුන් පුදුමාකාර ලෙස මෙම වේදිකාවට ගෙන ආ ආකාරය ගැන

කථා කරගෙන හැමදෙනාම ස්වර්ගය දෙසට හැරී මහ හඬින් දෙවියන්වහන්සේට ගෞරවය දුන්හ. විවේචනය කර වේදිකාවෙන් බැස සිටි සමහර අය මෙවිට ඇතිවූ හැඟීම් නිසා යටහත් පහත් පෙනුමෙන් යුතුව නැවත වේදිකාවට නැග ගත්හ.

යේසුස්වහන්සේගේ පළමු පැමිණීමේ කාලය වෙතට මාගේ අවධානය යොමු කරවන්ට විය. යේසුස්වහන්සේගේ පැමිණීමට මාර්ගය සූදානම් කරන පිණිස එලියාගේ ආත්මයෙන්ද බලයෙන්ද යොහන් බව්තීස්තව එවන ලදී. යොහන්ගේ සාක්ෂිය පිළිනොගත් අයට යේසුස්වහන්සේගේ ඉගැන්වීම්වලින් ප්‍රයෝජන ලැබුණේ නැත. යේසුස්වහන්සේගේ පළමු පැමිණීම ගැනවූ ප්‍රකාශයන්ට විරුද්ධ වීම නිසා උන්වහන්සේ මෙසියස්වහන්සේ බව පිළිගැන්වීමට කොතරම් බලවත් සාක්ෂි දෙනු ලැබූවත් ඒවා ඔවුනට ප්‍රයෝජනවත් නොවීය. යොහන්ගේ පණිවිඩ ප්‍රතික්ෂේප කළ අයව සාතන් තවත් ඉදිරියට ගෙන ගොස් යේසුස්වහන්සේව එපා කරන්ටද කුරුසියක ඇණ ගසන්ටද මෙහෙය වූහ. මේ දේවල් කිරීමෙන් ඔවුන් තමන්වම පත්කරගත්තේ පෙන්තකොස්ත දවසෙහිදී ආශිර්වාද ලබාගත නොහැකි සහ ස්වර්ගීය ශුද්ධස්ථානයට යා හැකි මාර්ගය දකගත නොහැකි තත්ත්වයකටය. දේව මාළිගාවේ තිරය ඉරා දැමීමෙන් පෙන්නුම් කළේ යුදාවරුන්ගේ පුද පූජා සහ සත්කර්මයන් මෙයින් පසු පිළිනොගන්නා බවය. අති මහත් පූජාව ඔප්පු කරනු ලැබීය. එය පිළිගනු ලැබූ ලෝකය වෙත වැඩම කළ ශුද්ධාත්මයාණන් වහන්සේ ගෝලයන්ගේ මනසවල් භූමික ශුද්ධස්ථානයෙන් ස්වර්ගීය ශුද්ධස්ථානයට එනම් යේසුස්වහන්සේ තමන්ගේම ලේ කරණකොටගෙන ඇතුළු වූ ස්ථානයට නොහොත් උන්වහන්සේගේ සමගිකමේ පිහිට උපකාර එව්වාවූ ස්ථානයට ගෙන ගියසේක. යුදා සෙනඟව මුළාවකද සම්පූර්ණ අඳුරකද අත්හරිනු ලැබීය. ගැළවීමේ සැලැස්ම සම්බන්ධව ඔවුන්ට ලැබෙන්ට තිබුණාවූ ආලෝකය අහිමි කරගෙන ඔවුහු තවදුරටත් නිෂ්ප්‍රයෝජන පුද පූජා පැවැත්වූහ. ඔවුන්ට යේසුස්වහන්සේගේ මැදහත්කාර මෙහෙයේ ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි විය. භූමික ශුද්ධස්ථානයේ තැන දැන් ස්වර්ගීය ශුද්ධස්ථානයට ලැබී තිබිණ. නමුත් ඔවුන්ට එහි යන මාර්ගය ගැන දැනුම තිබුණේ නැත.

යුදා සෙනඟ යේසුස්වහන්සේව පිළිනොගැනීම සහ කුරුසියේ ඇණ ගැසීම භයානක අපරාධයක් ලෙස බොහෝ අය දකිති. මෙම ලැජ්ජා සහගත ඉතිහාසය ඔවුන් කියවන විට යේසුස්වහන්සේට තමන් ආදරේ යයි සිතති. පේත්‍රුස් මෙන් උන්වහන්සේව හෙළා දක කථා කරන්නේ නැත. යුදයින් මෙන් කුරුසියේ ඇණ ගසන ලෙස ඉල්ලා කෑ ගසන්නේද නැත යයි කියති. නමුත් තම පුත්‍රයාණන් කෙරෙහි ඔවුන් තුළ වූ ප්‍රේමය දෙවියන්වහන්සේ පරීක්ෂණයට භාජන කළසේක.

පණිවිඩයට දෙන ප්‍රතිචාරය දෙස මුළු ස්වර්ගයම ගාම්භීර උනන්දුවකින් බලා සිටියහ. නමුත් යේසුස්වහන්සේට ප්‍රේම කරනවා යයි කියාගත් උන්වහන්සේගේ මරණය ගැන ඉතිහාසය කියවන විට කඳුළු සලන අය උන්වහන්සේගේ දෙවෙනි ඊමේ පණිවිඩය ඇසූ විට ඊට සතුට දක්වනවා වෙනුවට කෝපයට පත්ව එය මුළාවක් යයි කියමින් ඊට විරුද්ධකම් පෑහ. ඊට කැමති වූ අය සමග සහභාගිකම් පැවැත්වීම ප්‍රතික්ෂේප කොට ඔවුන්ව සභාවලින් පවා නෙරපා දැමූහ. පළමු පණිවිඩය එපා කළ අයට දෙවන පණිවිඩයෙන් ප්‍රයෝජන ලැබිය නොහැකි විය. මධ්‍යම රාත්‍රියේ හඬ අසා ඊට සම්බන්ධව ක්‍රිස්තුස්වහන්සේ සමග ඇදහිල්ලෙන් ස්වර්ගීය අතිශුද්ධස්ථානයට ඇතුල් වීමට නොහැකි විය. යුදාවරු ක්‍රිස්තුස්වහන්සේව ඇණ ගැසූ ලෙසම මෙකල වූ සභාවන් මෙම පණිවිඩ ඇණ ගසා දැමූහ. එබැවින් ස්වර්ගයේ වූ සිදුවීම් ගැන ඔවුන්ට දැනුමක් තිබුණේ නැත. අති ශුද්ධස්ථානයට යන මාර්ගයද දැනගත නොහැකි විය. මැදහත්කාර මෙහෙයේ ප්‍රයෝජනද ඔවුන්ට ලබාගත නොහැකිය. යුදාවරු ඒ කාලයේ තවදුරටත් දේව මාළිගාව තුළ නිෂ්ඵල පුද පූජා ඔප්පු කළ ලෙස මේ කාලයේදී පළමුවන දෙවන පණිවිඩ එපා කළ අය යේසුස්වහන්සේ අති ශුද්ධස්ථානයට ඇතුල් වූ බවද ශුද්ධස්ථාන කොටසේ දොර වසා තිබූ බවද නොදක තමුන්ගේ යාච්ඤාවල් සහ නමස්කාරයන් එම හිස් වූ ස්ථානයට යොමු කරන්ට වූහ. මේ ගැන බොහෝ සතුටට පත්වූ සාතන් මුළාවනට අසුවී සිටින අයව තමාගේ මළපත්වල තද ලෙස හසුකර ගෙන ආගමික මුහුණුවරකින් සිටගෙන ක්‍රිස්තු අනුගාමිකයන් යයි කියාගන්නා අයව තමා වෙතට යොමු කරවා ගන්නා පිණිස පුදුම හාස්කම් ආදිය ඔහුගේ බලයෙන් ක්‍රියාත්මක කරන්නට විය. ඔහු කෙනෙකුව එක විධියකටත් තව කෙනෙකු වෙනත් විධියකටත් මුළා කරන්නේය. එක් එක් මනසවල්වලට ගැළපෙන ආකාරයේ මුළාවන් ඔහු සූදානම් කරගෙන ඇත. සමහර අය සාතන්ගේ එක මුළාවක් දෙස තැති ගැන්මෙන් බලති. නමුත් තවත් මුළාවක් සතුටින් පිළිගනිති. සාතන් සමහර අයව ආත්ම බන්ධන නොහොත් මළාවූ අයගේ ආත්ම සමග කථා කළ හැකිය යන මුළාවට හසුකර ගනී. තවත් අවස්ථාවක ඔහු ආලෝකයේ දූතයෙකු ලෙස පැමිණ තම බලය දේශය මත පතුරවයි. ව්‍යාජ ප්‍රතිසංස්කරණවාදීන් හැමතැනම සිටිනවා මම දුටිමි. ඔවුහු සභාවන් තුළ අමුතු ආගමික ප්‍රබෝධතාවන් හා පෙළඹවීම් ඇති කරවයි. මේවා සාතන්ගේ ක්‍රියාකිරීම් බව නොදන දෙවියන්වහන්සේ තමන් සමග සිටිනවාය පුදුම ලෙසින් ක්‍රියා කරනවාය යයි සිතති. මේවායේ උණුසුම් තත්ත්වය නිවී නැති වී ගියාට පසු සභාවද ලෝකයද පෙර තිබූ තත්ත්වයට වඩා නරක තත්ත්වයකට ඇද වැටේ.

නාමික ඇඩ්වෙන්ටිස්ට්වරුන් අතරද ඇදහිල්ලෙන් වැටි ගිය සභාවන් තුළද දෙවියන්වහන්සේගේ අවංක දරුවන් සිටින බව මම දුටිමි. වසංගත පැමිණෙන්ට පෙරාතුව එම අයවද එම සභාවලින් පිටවී එන ලෙස කැඳවනු ලබනවාය. ඔවුන් පිටතට පැමිණ සත්‍යය සතුටින් පිළිගනිති. සාතන් මේ බව දන්න නිසා තුන්වන දූතයාගේ මහත් හඬ පැමිණෙන්ට පෙර මෙම සභාවන් තුළ අමුතු ආගමික ප්‍රබෝධයක් ඇති කර දෙවියන්වහන්සේ තමන් සමග සිටිනවාය කියා සිතන්ට සලස්වා අවංක අයව මුළා කිරීම ඔහුගේ උත්සාහයව ඇත. නමුත් ආලෝකය බබළන්නට යන අතර සැම අවංක අයෙක්ම ඇදහිල්ලෙන් වැටි ගිය සභාවලින් පිටට ඇවිත් දෙවියන්වහන්සේගේ ඉතිරි සෙනඟ සමග එක්වනවාය.

***කියවන්න : ශු. මතෙව් 3 පරිච්ඡේදය; ක්‍රියා 2;  2 කොරින්ති 11: 14; 2 තෙසලෝනික 2: 9-12; එළිදරව් 14: 4-12.***

## *30 - පරිච්ඡේදය*

# ආත්මවාදය නොහොත් මළවුන්ගෙන් පණිවිඩ

ආත්ම බන්ධන මුළාව මම දුටිමි. යේසුස්වහන්සේ තුළ සැතපී සිටින නොහොත් මරණයට පත්වූ අපගේ නෑදැයින් හා මිත්‍රයන්ගේ රූප ස්වභාවය අප ඉදිරියටම ගෙනැවිත් පෙන්වන්ට සාතන්ට බලය තිබේ. ජීවමාන ලෙස ඔවුන්ව සාතන් අප ඉදිරියේ පෙනෙන්ට සලස්වයි. අපට හුරු පුරුදු ඔවුන්ගේ කට හඬද ඔවුන් කථා කළ වචනද අපගේ කන්වලට ඇසෙන්ට සලස්වයි. මේ සියල්ලම ලෝකයා රවටන්ටද මුළාවකට පත්කර බොරුව විශ්වාස කරන්ටද සැලැස්වීම සඳහාය.

ශුද්ධ ලියවිල්ලෙහි ලියා තිබෙන සත්‍යතාවය නිතරම පවත්වා ගෙන යන පිණිස ශුද්ධවන්ත සෙනඟ වර්තමාන සත්‍යය ගැන පූර්ණ අවබෝධයකින් සිටිය යුතු බව මම දුටිමි. ඔවුහු මළාවූ අයගේ තත්ත්වය දනගත යුතුය. මක්නිසාද තමන්ගේ නැසී ගිය නෑදෑ මිත්‍රයින් යයි කියා ගනිමින් ඔවුන්ගේ රූපාකාරයෙන් යක්ෂ ආත්ම පෙනී සිට ශුද්ධ ලියවිලි ධර්මතාවන් ලෙස යම් ප්‍රකාශනයන් කරනවා ඇත. ප්‍රකාශ කළ දේවල් සැබෑ බව ස්ථිර කිරීමට බලවත් හාස්කම්ද කර පෙන්වනවා ඇත. දෙවියන්වහන්සේගේ සෙනඟ මෙම මුළාකරන ආත්මයන්ට විරුද්ධව සිටින පිණිස මළාවූ අය කිසිවක් නොදන්නා බව උගන්වන බයිබල් සත්‍යතාවන් දනගෙන සිටිය යුතුය.

අපගේ බලාපොරොත්තුවේ අත්තිවාරම අප හොඳින් පරික්ෂා කර බැලිය යුතු බව මම දුටිමි. මක්නිසාද අප ඊට හේතු ශුද්ධ ලියවිල්ලෙන් පෙන්වා දෙන්ට යුතු වෙනවාය. මේ මුළාව පැතිරී යන්නේය. ඊට විරුද්ධව මුහුණට මුහුණ ලා ක්‍රියාකරන්ට අපට සිදුවන්නේය. අප සූදානම්ව නොසිටියොත් එම මුළාව අපව ද බිලිගන්නවා ඇත. අප ඉදිරියේ තිබෙන මේ ගැටුමට මුහුණ දෙන්ට හැකිවන ලෙස අපි අපේ කොටස හරි හැටි ඉටු කළහොත් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ කොටස ඉටුකර උන්වහන්සේගේ බලවත් හස්තයෙන් අපව ආරක්ෂා කරන සේක. උන්වහන්සේ ඉක්මණින් ස්වර්ගයේ සිටින සැම දේව දූතයෙකුවම එවා විශ්වාසවන්ත අය වටා ආරක්ෂක වැටක් මෙන් තබා සාතන්ගේ මුළාකිරීමේ පුදුම ක්‍රියා මගින් අහකට ගෙනයන්ට නොදී තබාගන්නවා ඇත.

මෙම මුළාව පැතිරී යන වේගය මම දුටිමි. පෙට්ටි කීපයක් ඇදගෙන විදුලිය මෙන් ගමන් කරන දුම්රියක් මම දුටිමි. සැලකිල්ලෙන් එදෙස බලන්ට දේව දූතයා මට කීවේය. ඒ දුම්රිය දෙස මම මාගේ නෙත් රඳවා ගෙන සිටියෙමි. මට පෙනුණේ මුළු ලෝකයේම සෙනඟ එම දුම්රියේ සිටිනවා වගේය. එවිට දේව දූතයා මට එය මෙහෙය වන්නාව පෙන්වීය. දුම්රියේ ගමන් කරන හැමදෙනාගේම ගෞරවයට පාත්‍ර වූ පැහැපත් පෙනුමක් ඇති කෙනෙකු ලෙස මම ඔහුව දුටිමි. මට පටලැවිල්ලක් ඇති විය. ඔහු කවුද කියා මම මගපෙන්වූ දේව දූතයාගෙන් ඇසීමි. ඒ සාතන් යයි ඔහු මට පැවසීය. ආලෝකයේ දූතයෙකු මෙන් පෙනී සියල්ල මෙහෙය වන පුද්ගලයා ඔහුය. ඔහු මුළු ලොවම තම ග්‍රහණයට ගෙන ඇත. විනාශයට පත්කරන පිණිස බොරුව විශ්වාස කිරීමේ මුළාවකට ඔවුහු සාතන්ට භාරවී ඇත. ඔහු ළඟින්ම සිටින ඔහුගේ නියෝජිතයා කාර්මික නිලධාරියාය. තවත් නොයෙක් අය ඔහු තමාගේ අවශ්‍යතාවයන්ට අනුව බලධාරීන් ලෙස පත්කරගෙන ඇත. මේ සැමදෙනාම සාතන් සමග විදුලි වේගයෙන් විනාශය වෙතට යමින් ඇත. 'කිසිවෙක් මෙම මුළාවෙන් මිදී නැත්ද' යි මම දේව දූතයාගෙන් ඇසීමි. අනිත් පැත්ත බලන ලෙස දේව දූතයා මට කීයෙන් මම එදෙස බැලීමි. පටු මහක් ඔස්සේ ගමන් කරන කුඩා කණ්ඩායමක් මම දුටිමි. ඔවුහු සත්‍යතාවෙන් බැඳී ස්ථිරව එකමුතුව සිටියහ. මෙම කුඩා කණ්ඩායම බොහෝ ගැටුම් සහ අමාරුකම් අතරින් ගොස් විඩාවන්ට පත්වූවන් සේ පෙනිණ. ඔවුන්ට පිටුපසින් වළාකුල් අතරින් විහිදී ආ හිරු රැස් ඔවුන්ගේ මුහුණු ආලෝකමත් කර ජයග්‍රාහී බවකට පත් කළාක් මෙන්ද දිස් විය.

මෙම මුළාව හඳුනා ගැනීමට ලෝකයාට දෙවියන්වහන්සේ ඉඩ ප්‍රස්ථාවන් දී තිබූ බව මම දුටුවෙමි. වෙන සාක්ෂි නොතිබුණත් මෙම එක සාක්ෂිය ක්‍රිස්තියානි අයට ප්‍රමාණවත්ය. ලෝකයේ උසස් පහත් හැමදෙනාම මෙම මුළාව පිළිගෙන සාතන්ගේ දුම්රියේ ගමන් කරති. කුඩා කණ්ඩායම පමණක් ඉන් මිදී ඇත.

මෙම මුළාව නම් 'මනුෂ්‍යයාට නොමැරෙන ආත්මයක් ඇත. එය මරණ මොහොතේදී ශරීරයෙන් පිටව ගොස් යම් තැනක සදාකාලයටම ජීවත් වේ. එම ආත්මයට සියලූ මනුෂ්‍ය හැඟීම්, ආශාවන් සහ කල්පනාවන් ඇත' යනුයි.

තෝමස් පේන් නමැත්තා මරණයට පත්ව ඔහුගේ ශරීරය දූවිල්ලට හැරී බොහෝ කල්ය. දහස් වසර අවසානයේදී අධර්මිෂ්ඨයන් මළවුන්ගෙන් නැගිටින විට මළවුන්ගෙන් නැගිට පාපයේ දඬුවම ලබන්ට සිටින ඔහු දන් ස්වර්ගයේ සිටින බවත් ඔහුව උසස් තත්ත්වයකට පත්කර සිටින බවත් සාතන් පවසා ඇත. තෝමස් පේන් ජීවත්වූ කාලයේදී සාතන් ඔහුව තමාගේ මුළාවේ ක්‍රියාවන් සඳහා යොදාගෙන තිබිණ. සාතන් තමාගේ මුළාවේ ක්‍රියාවන් මගින් සමහර අයට බයිබලයේ ඉගැන්වීම් ගැන සැක පහළ කිරීමටද සලස්වා ඇත.

බොරුවේ පියා වන සාතන් තම දූතයන් යවමින් ලෝකයා රවටා සිත් අන්ධ කර ශුද්ධාත්මයාණන් වහන්සේගේ පෙළඹවීමෙන් ලියා ඇති සත්‍යයට වෙනස් වූ දේ උගන්වා නමින් පමණක් ක්‍රිස්තියානින් ලෙස සිටින අයව මුළාවට අල්ලා ගෙන බයිබලයේ ලියා ඇති සත්‍යය වූ දේ සුළු කරන තැනට ගෙන ඒමටද සමත් වී ඇත.

සාතන් ඔහුගේ දූතයන් හැමදෙනාටම එකිනෙකාගේ සේවා කොටස් භාර දෙනවාය. කූට උපක්‍රමික ලෙස ක්‍රියා කළ යුතු බව ඔවුන්ට පවසා ඇත. සමහර දූතයන්ට අපෝස්තුළුවරුන් මෙන් පෙනී සිට කථා කරන්ටද තවත් අයට අදේව දෘෂ්ඨිකයන් ලෙස සහ දෙවියන්වහන්සේට ශාප කර මළාවූ දුෂ්ටයන්ව දන් ආගමික අය ලෙස පෙන්වන්ටද දනුම්තිකම් දී ඇත. තමාගේ අභිප්‍රාය ඉටු වෙනවා නම් කා ලවා මොනවා කථා කළත් සාතන්ට කම් නැත. තෝමස් පේන් ජීවත්ව සිටියදී සාතන් ඔහුගේ ළඟම මිත්‍රයා ලෙස ක්‍රියා කළේය. ඔහු කථා කළ වචනම දන් සාතන්ට කථා කළ හැක. ඔහු ලියූ ලිපි බොහොමයක් සාතන් කියන විට ලියූ ඒවාය. ඒ නිසා ඔහුගේ දූතයන් ලවා දන් ඒවා කථාකරවන්ට ඔහුට පිළිවන. සාතන්ගේ බලවත්ම මුළාව මෙයය.

සාතන්ගේ අඳුරු අභිරහස්මය ක්‍රියා වටහා ගන්න පිණිස වැස්ම ඉවත් කිරීමට මෙය පමණක් වුවත් ප්‍රමාණවත්ය. දෙවියන්වහන්සේට සම්පූර්ණ ලෙස වෛර කළ තෝමස් පේන් නමැත්තාට සාතන් බොහෝ ප්‍රේම කොට දන් ඔහු අපෝස්තුළුවරුන්ද දේව දූතයන්ද සමග මහිමයට පත්ව ස්වර්ගයෙහි සිටින ආකාරයක් පෙන්වා දෙන්නේ නම් සාතන් ලෝකයාට හඟවන්නේ ඔබ අදේව දෘෂ්ඨිකයෙක් වුවාට කමක් නැත. බයිබලය විශ්වාස නොකළාට කමක් නැත, ඔබ කොයිතරම් දුෂ්ට මනුෂ්‍යයෙක් වුවාටත් කමක් නැත. දෙවියන්වහන්සේව විශ්වාස නොකළාට කමක් නැත. ස්වර්ගය නුඹලාගේ නිවාසයය. තෝමස් පේන් ස්වර්ගයෙහි සිටිනවා. ඔහු උසස් කරනු ලැබූ තත්ත්වයක සිටිනවා. ඔහු ස්වර්ගයෙහි සිටිනවා නම් තව කෙනෙක් කොතරම් පව් කළත් ඔහු ස්වර්ගයට යනවාමයි. මෙය භයානක කියමනකි. සාතන් දන් කරමින් සිටින්නේ ඔහුගේ වැටීමත් සමග ඔහු කරන්ට උත්සාහ කළ කලක් තෝමස් පේන් ලවා කළාවූ දේමය. ඔහු ඔහුගේ බලයද මුළා කිරීමේ හාස්කම්ද කරණකොටගෙන ක්‍රිස්තියානිකාරයෙකුගේ බලාපොරොත්තුවේ අත්තිවාරම බිඳ දමා ස්වර්ගයට යන පටු පාරෙන් ඔවුන්ව පසෙකට තල්ලූ කර දමීමටය. ඔහු ලෝකයට පෙන්වා දෙන්ට හදන්නේ බයිබලය ශුද්ධාත්ම පෙළඹවීමෙන් ලියූ පොතක් නොව සාමාන්‍ය කථාන්තර පොතකට වඩා වෙනසක් එහි නැති බවය. බයිබලයට වඩා හොඳ පොතක් ලෙස සාතන් ඉදිරිපත් කරන්නේ 'ස්පිරිචුවල් මැනිෆෙස්මේෂන්' නොහොත් 'මළාවූ අයගේ ආත්මවල ක්‍රියාකාරකම්' යන පොතක්ය.

මෙය සාතන් තමාගේ බලය යටතේ තබාගෙන තමා කැමති ලෙස ලෝකයාගේ විශ්වාසය මෙහෙය වන මාර්ගයක්ය. ලෝකයාගේ ගැලවුම්කාරයාණන්ගේ සොහොන රැකවල් කළ රෝම භේවායන් බොරුවක් පැවසූ ලෙස මේ පොතද මිදුම්කාරයාණන්ගේ උපත, මරණය සහ මළවුන්ගෙන් නැගිටීමද පසෙකට, අඳුරකට දමා ආත්මයන් දක්වන පුදුම හාස්කම් ක්‍රිස්තුස්වහන්සේ සම්බන්ධ දේවල්වලට වඩා බලවත් බව පෙන්වන්ට උත්සාහ කර ඇත. මෙලෙස ලෝකයාව උගුලට හසුකරගෙන නළවමින් තබාගෙන සිටින්ට උත්සාහ කරන්නේ වසංගත හත ලොවට වගුරුවන තෙක්ය. ලෝකයා උගුලට හසුවී සිටින අතර සාතන් තමාගේ සැලැස්ම සඵල වෙනවා දකිමින් සිනාසී සතුටට පත්වේ.

*බලන්න: හිතෝපදේශ 9: 5; ශු. යොහන් 11: 1-45; 2 තෙසලෝනික 2: 9-12; එළිදරව් 13: 3-14.*

## *31 - පරිච්ඡේදය*

# වස්තු තණ්හාව

සාතන් සහ ඔහුගේ දූතයන් රැස්ව කථා කරනවා මම දුටිමි. යේසුස්වහන්සේගේ දෙවෙනි ඊම බලා සිටින දෙවියන්වහන්සේගේ ආඥා පවත්වන සෙනඟ වෙතට විශේෂයෙන් ගොස් මළපත් අටවන ලෙස සාතන් තම දූතයන්ට පැවසීය. තවදුරටත් ඔහු කීවේ සභාවල් නිදිගතව ඇත, තමාගේ මුළාකිරීමේ හාස්කම් වැඩි කර ඔවුන්ට එසේම අල්ලා තබාගත හැකි බවය. නමුත් සබත් පවත්වන කණ්ඩායමට අපි වෛර කරනවා. ඔවුන් නොකඩවා අපට විරුද්ධව ක්‍රියා කරලා අපේ යටත්වැසියන්ව අප ද්වේෂ කරන ආඥා පවත්වන පිරිස වෙතට අරන් යනවා.

යමල්ලා, වතුපිටි මිල මුදල් ඇතුව සිටින අයව ලෝක දේ කෙරෙහි ආශාවලින් මත්කරපල්ලා. එවිට ඔවුන් අපේ අත්වල. ඔවුන් කුමක් ඇදහුවත් කමක් නැහැ. දේව රාජ්‍යයේ දියුණුවටද අප වෛර කරන සත්‍යතාවටද වඩා මුදලට වස්තුවට ප්‍රේම කරන්ට සලස්වාපල්ලා. ලෝකය ඉතා සිත් ආකර්ෂණය වන ලෙස ඔවුන්ට පෙන්වා ඔවුන්ව රූප වන්දනාකරුවන් කරපල්ලා. අප, හැකි තරම් වස්තුව අප සමග තබාගත යුතුය. ඔවුන් ළඟ වස්තුව බොහෝ තිබෙන විට අපේ යටත්වැසියන් ගෙනයමින් අපේ රාජ්‍යයට පාඩු සිදුකරනවා. නොයෙක් තැන්වල ඔවුන් රැස්වීම් පවත්වන විට අප අනතුරේ බැවින් අවදිව සිටින්න. හැකි තරම් බාධා කරන්න. එකිනෙකා අතර ප්‍රේමය නැති කරන්න. දේවගැතිවරුන් අධෛර්යයට පත්කරන්න. මුදල් තිබෙන අය සේවයට ඒවා නොදෙන ලෙස වළක්වන්න. මෙසේ ඔවුන්ගේ දිරියද උනන්දුවද නැති කළ හැකිය. උග්‍ර ලෙස සටන් කරන්න. ලෝක දේවලට ආශාව සහ මසුරුකම ජීවිත පාලනය කරන චරිත ගුණාංග බවට පත්කරන්න. එවිට ගැළවීමද අනුග්‍රහයද පිටුපසට වී සිටිනවා ඇත. ඔවුන්ව පිටතට ඇදගත හැකි දේවලින් ඔවුන්ව වට කරන්න. එවිට ඔවුන් අපට අයිති වනවා පමණක් නොව තවත් අයව ස්වර්ගයට ගෙන යාමේ ඔවුන්ගේ උත්සාහයද අඩපණ වනවාය. සේවයට මුදල් දෙන්ට කැමති වන අයව ද කොඳුරමින් ස්වල්පයක් දෙන්ට සලස්වන්න.

සාතන් තම සැලැස්මවල් හොඳින් ක්‍රියාත්මක කළ බව මම දුටිමි. දෙවියන්වහන්සේගේ සේවකයන් ආත්මික රැස්වීම් සැලසුම් කළ අතර සාතන් සහ ඔහුගේ දූතයන්ද තමන් කරන්ට යන දේවල් සූදානම් කරගෙන රැස්වීම්වලට බාධා පමුණුවන පිණිස රැස්වෙති. ඔහු නිතරම දෙවියන් වහන්සේගේ සේවකයන්ගේ මනසවල් වලට යෝජනාවල් ඇතුල් කරති. සමහර අයව එක මඟකටත් තවත් අයව වෙනත් පැත්තකටත් හරවති. මෙසේ එකිනෙකාගේ දුර්වලකම් ප්‍රයෝජනයට ගෙන එකිනෙකා අතර භේද උපදවන්ට ක්‍රියා කරති.

සාතන් යූදස්ගේ මසුරු ආත්මාර්ථකාමී තත්ත්වය ප්‍රයෝජනයට ගෙන මරියා යේසුස්වහන්සේට කැප කළ සුවඳ තෙලට විරුද්ධව කොඳුරන්ට ඔහුට සැලැස්විය. යූදස් එම තෙල විකුණා දුප්පතුන්ට දෙන්ට තිබෙනවා යයි කීවේ දුප්පතුන්ට ආදරේ වූ නිසා නොව මුදලට ආශා කළ නිසාය. යූදස් තම ස්වාමින්වහන්සේව මිල කළේ රිදී කාසි කිහිපයකට පමණය. තම ස්වාමින්වහන්සේගේ පැමිණීම බලා සිටින අය අතර ද යූදස් වැනි අය සිටින බව මම දුටිමි. ඔවුන්ව පාලනය කරන්නේ සාතන්ය. නමුත් ඔවුහු එය දන්නේ නැත. වස්තු තණ්හාව හෝ ආත්මාර්ථකාමීත්වය ස්වල්පයක් හෝ තිබේ නම් දෙවියන්වහන්සේ එය අනුමත කරන්නේ නැත. ඊට වෛර කරන සේක. එම තැනැත්තාගේ යාච්ඤා පවා එපා කරන සේක. සාතන් තමාගේ කාලය කෙටි වෙමින් තිබෙන බව දකින අතර සෙනඟව වඩ වඩා ආත්මාර්ථකාමී වෙන්ට සලස්වනවාය. මෙසේ ඔවුහු වස්තු තණ්හාවෙනුත් ආත්මාර්ථ කාමීත්වයෙනුත් පෙලෙන අතර සාතන් බොහෝ සෙයින් සතුටට පත්ව තමාගේ යෝජනාවලට අසුවන මෝඩකම ගැන සිනාසී උදම් වනවාය. මෙම අයගේ ආත්මාර්ථකාමී ගුණාංග සාතන් සහ ඔහුගේ දූතයෝ යේසුස්වහන්සේද උන්වහන්සේගේ දූතයන් වෙතට ගෙන ගොස් පෙන්වා 'මේ අය දෙවෙනි ඊමට සූදානම් වන අය නේද, මේ අය අන් වෙසකට හැරෙන බලාපොරොත්තුව ඇතිව සිටින අය නේද" කියා කියමින් මෙම ගුණාංග වරදට පත්කර තිබෙන බයිබල් පද ද පෙන්වා අපහාස කර 'ක්‍රිස්තුස්වහන්සේගේ පූජාවේ ඵල මේවාද" කියා අසන විට දේව දූතයෝ සිත් වේදනාවෙන් මුහුණු ඉවත හරවා ගනිති. යේසුස්වහන්සේ වැගිරූ අනගි ලේ මගින් ගැළවීම ලබාගන්ට යන අය ඉතා සුළු වශයෙන් හෝ ආත්මාර්ථකාමී බවක් දක්වන අතර දෙවියන්වහන්සේ ඊට අප්‍රසන්න වනසේක. වස්තු තණ්හාව ඇති ආත්මාර්ථකාමී සෑම පුද්ගලයෙක්ම අතරමඟදී වැටී යනවා ඇත. යූදස් සුළු මුදලකට තම ස්වාමින්වහන්සේව විකුණුවාක් (පාවා දුන්නාක්) මෙන් මෙම අයද යහපත් ප්‍රතිපත්ති සහ ගෞරවණීය ගුණාංගද පරිත්‍යාගශීලී බවද ලෝකයෙන් ලැබෙන සුළු ලාභයකට විකුණා දමති. එවන්

සැම කෙනෙකුම පිටතට පොලා දමනු ලබනවා ඇත. ස්වර්ගය බලාපොරොත්තු වන සැම කෙනෙක්ම තමන්ට තියෙන හැම ශක්තියක්ම යොදා ස්වර්ගීය ප්‍රතිපත්ති සංවර්ධනය කළ යුතුය. ආත්මාර්ථකමින් වියලි යනවා වෙනුවට පරිත්‍යාගශීලී ආත්මයෙන් තර වී ලැබෙන ඉඩ ප්‍රස්ථා දියුණු කරගනිමින් එකිනෙකාට යහපත කරමින් ස්වර්ගීය ප්‍රතිපත්තිවල වැඩි දියුණු විය යුතුය. සම්පූර්ණ ආදර්ශය ලෙස මා ඉදිරියේ යේසුස්වහන්සේව ඔසවා තබන්ට යෙදින. උන්වහන්සේගේ ජීවිතය තමකමෙන් තොරවූ පරිත්‍යාගශීලී බවෙන් පිරී තිබූ ජීවිතයකි.

*බලන්න: ශු. මාර්ක් 14: 3-11; ශු. ලූක් 12: 15-40; කොලොස්සි 3: 5-16; 1 යොහන් 2: 15-17.*

## *32 - පරිච්ජේදය*

# සොලවනු ලැබීම

බලවත් ඇදහිල්ලකිනුත් වේදනාවල හඬිනුත් සමහර අය දෙවියන්වහන්සේට කන්නලව් කරනවා මම දුටිමි. ඔවුන්ගේ සිත තුළ වූ අරගලයේ තරම සුදුමැලිව තිබූ මුහුණුවලින් පෙනෙන්ට තිබිණ. ස්ථිරමය හා තද උනන්දු භාවය ඔවුන්ගේ මුහුණුවල මතුවී වැටුන මහත් ඩහදිය බිඳුවලින් පෙනිණ. දෙවිඳුන්ගේ පිළිගැනීම නිසා ඉඳහිට මුහුණුවල දිස්වූ ආලෝකයද ඊට පසු නැවත ඉහත පෙනුණ වේදනාවල ලකුණුද පෙනෙන්ට වූහ.

දෙවියන්වහන්සේව සැක කර, කොඳුරන්ට සලස්වන පිණිස ඔවුන්ගේ දර්ශන පථයෙන් යේසුස්වහන්සේව ආවරණය කර දුෂ්ට දූතයෝ ඔවුන්ව වට කරගෙන අන්ධකාරය ඔවුන් දෙසට තෙරපා යවමින් සිටියහ. ඔවුන්ට එකම ආරක්ෂාව වූයේ ඔවුන්ගේ ඇස් ඉහළට ඔසවා ගෙන සිටීම විය. දේව දරුවන්ව ආරක්ෂා කිරීමට දේව දූතයන්ව යොදවා තිබිණ. සාතන්ගේ විෂ සහිත වාතාවරණය තුළ හිරවී සිටින අයට පහසුව ලබාදෙන පිණිස ඔවුනට ඉහළින් දේව දූතයෝ තටු සලමින් අඳුර තුනීකර දැමූහ.

වේදනාත්මකව කරන යැදුම්වලට සමහර අය සහභාගී නොවන බව මම දුටිමි. උවමනාවක් නොමැති නොසැලකිලි තත්ත්වයක ඔවුන් පසුවූහ. ඔවුහු තමන් අවට වූ අඳුරට විරුද්ධ නොවූ නිසා අඳුර තදව වලාකුළක් ලෙස ඔවුන්ව වසා ගන්ට යෙදින. දේව දූතයෝ ඔවුන්ව හැර දමා හඬන වැලපෙන අය වෙතට ගියහ. දුෂ්ට දූතයන්ට විරුද්ධව තමන්ගේ මුළු ශක්තිය යොදා අරගලයක යෙදී සිටින අයට උදව් කිරීමට ඉක්මණින් එතැනට යනවා මම දුටිමි. උත්සාහයක් නොදරූ අය වෙතින් දේව දූතයෝ පිටව ගියහ. මටද ඉන්පසු ඔවුන්ව පෙනුණේ නැත.

යාච්ඤා කරමින් සිටි අය නොකඩවා උනන්දු ඉල්ලීම් ඔප්පු කරද්දී යම් අවස්ථාවල යේසුස්වහන්සේ වෙතින් ආලෝක රශ්මියක් පැමිණ ඔවුන්ව දිරිමත් කළහ. ඔවුන්ගේ මුහුණේ පෙනුමද ආලෝකමත් විය.

මා දුටු 'සෙලවීමේ අර්ථය කිමෙක්ද'යි දේව දූතයාගෙන් මම ඇසීමි. එවිට මට පෙන්වන්ට යෙදුනේ සැබෑ වූ සාක්ෂිකාරයාණෝ ලවෝදිකයන්ට දී තිබෙන අනුශාසනාව මගින් ඉල්ලා සිටින සෘජු සාක්ෂිය කරණකොටගෙන සෙලවීම සිදුවන බවය. සාක්ෂිය ලබන්නාගේ සිතෙහි එය ක්‍රියාත්මක වී ඔහු සත්‍යය පවසන්ටද තත්ත්වය උසස් කරන්ටද පෙළඹේ. මෙම සාක්ෂිය දරන්ට සමහර අය කැමති නොවේ. එයට එරෙහිව ඔවුහු නැගී සිටිති. දේව සෙනඟ අතරේ සෙලවීම මේ හේතුවෙන් සිදුවේ.

සැබෑ සාක්ෂිකාරයාණන්ගේ සාක්ෂිය අඩක්වත් පිළිගෙන නැති බව මම දුටිමි. සභාවේ ඉරණම රඳා තිබෙන මෙම ගාම්භීර සාක්ෂිය ගණන් ගෙන තිබෙන්නේ ඉතා සැහැල්ලු ලෙසය., නැතහොත් මුළුමණින්ම එය නොසලකා හැරලාය. මෙම සාක්ෂිය ගැඹුරු පසුතැවිල්ලක් ඇති කරන්ට ඕනැය. එය පිළිගන්නා අය ඊට කීකරු වී පවිත්‍ර වනවා ඇත.

'සවන් දෙන්න', දේව දූතයා පැවසීය. සංගීත භාණ්ඩ බොහොමයකින් නිකුත් වූ එකාකාරව හඬ නැගූහ. මිහිරි ශබ්දයක් මට ඇසිණ. මා මෙතෙක් අසා තිබූ ගී හඬවලට වඩා එය උසස්ය. එය දයාව අනුකම්පාව උසස් කිරීම හා ශුද්ධ වූ ප්‍රීතිය ඇති කරන ආකාරයකින් විය. මගේ ශරීරය පුරා එයින් වින්දනයක් දනිණ. දේව දූතයා 'බලන්නැ'යි කීය. මීටපෙර මා දක තිබූ කණ්ඩායම වෙත මාගේ අවධානය යොමු කෙරිණ. ඔවුන්ව බලවත් ලෙස සොලවා තිබිණ. මීටපෙර හඬමින් වැලපෙමින් ආත්ම වේදනාවල සිටි අයව දුටිමි. ආරක්ෂක දූතයන් දෙගුණ කර තිබනවා මම දුටිමි. ඔවුන් හිස සිට දෙපා

දක්වා යුද්ධ ඇඳුමින් සැරසී සිටියහ. ඔවුහු සොල්දාදුවන් මෙන් නියම පිළිවෙලකට ගමන් කළහ. ඔවුන් මුහුණ පෑ මහත් අරගලයේදී දරාගත් දුක් වේදනාවලද ලකුණු ඔවුන්ගේ මුහුණුවල සටහන්ව තිබිණ. නමුත් දැන් ඔවුන්ගේ පෙනුම ස්වර්ගීය ප්‍රීතිය හා මහිමයෙන් ආලෝකමත් විය. ඔවුහු ජයග්‍රහණය ලබා තිබිණ. ස්තුති දීමේ ශුද්ධ වූ ප්‍රීතිය ඔවුන් තුළ විය.

මෙම කණ්ඩායමේ ගණන අඩු වී තිබිණ. සමහර අය සොලවනු ලැබ මාර්ගයේදී වැටී ගොස්ය. උනන්දු නොවූ, නොසැලකිලිමත්වූ, ගැළවෙන්ට ජය ලබන්ට ප්‍රමාණවත් ලෙස පොර නොබැදූ නොහැඩූ, නොවැලපූන අය එය ලබා නොගත්හ. මාර්ගයේදී ඔවුන් වැටී ගිය අතර ඔවුන්ගේ තැන ගන්ට වෙන අය සත්‍යය පිළිගෙන පැමිණියහ. දුෂ්ට දූතයෝ ඔවුන්ව ලූහුබැඳ ආ නමුත් එයින් ප්‍රයෝජනයක් නොවීය.

යුද්ධ ඇඳුමින් සැරසී සිටි අය මහත් බලයෙන් යුක්තව සත්‍යය කථා කරනවා මම දුටිමි. එය ඵලගැන්විණ. පුරුෂයන්ට හයේ සිටි භාර්යාවන්, දෙමාපියන්ට හයේ සිටි දරුවන් මම දුටිමි. සත්‍යය පිළිගැනීමෙන් වළක්වනු ලැබ සිටි අවංක අය දැන් සත්‍යය මහත් ආශාවෙන් පිළිගත්හ. හය දැන් ඔවුන්ගෙන් පහව ගොස්ය. සත්‍යය දැන් ඔවුන්ට ජීවිතයට වඩා වටිනවාය. ඔවුන් සත්‍යය සඳහා සාපිපාසාවෙන් සිටි අයය. මෙවන් මහත් වෙනසක් සිදුකළේ කුමක්දැයි මම දේව දූතයාගෙන් ඇසීමි. 'ඒ අන්තිම වර්ෂාවය, ස්වාමින්වහන්සේ ඉදිරියෙන් පැමිණෙන සහනයය, තුන්වන දූතයාගේ මහත් හඬ යයි දේවදූතයා පැවසීය.

තෝරාගනු ලැබූ අය මහත් බලය ඇතිව සිටියහ. දුෂ්ට නොඇදහිලිකාරයන් වෙතට මාගේ අවධානය යොමු කෙරිණ. ඔවුන් ඇවිස්සී සිටියහ. දෙවියන්වහන්සේගේ සෙනඟ කෙරෙහිවූ මුද්‍රාව සහ බලය ඔවුන්ව කෝපයට පත් කළහ. හැම පැත්තකම වූයේ ව්‍යාකූලත්වයය. දෙවියන්වහන්සේගේ බලය සහ ආලෝකය ඇතිව සිටි අයට විරුද්ධව යම් පියවරවල් ගන්නවා මම දුටිමි. ඔවුන් වටා අඳුර තවත් ඝන විය. නමුත් ඔවුන් සිටියේ දෙවියන්වහන්සේ පිළිගත් අනුමතය ඇතිවය. නමුත් ඔවුන් කර කියාගත හැකි කිසිවක් නැතිව සිටියහ. ඊළඟට මට ඇසුණේ ඔවුන් මහත් ආයාසයෙන් දෙවියන්වහන්සේට යාච්ඤා කරන හඬය. රෑ දාවල් දෙකේම ඔවුන්ගේ ඉල්ලීම් නැවතුණේ නැත. වචන මට ඇසුණා. 'ඔබගේ කැමැත්ත ස්වාමීනී, ඔබගේ කැමැත්ත වේවා, එය ඔබගේ ගෞරවය සඳහා වේ නම් එසේ වේවා, ඔබගේ සෙනඟට ගැළවීමේ මාර්ගයක් සාදා දුන මැනව" කියා ඔවුහු පැවසූහ. 'අප වටලාගෙන සිටින මිථ්‍යා දෘෂ්ඨිකයන්ගෙන් අපව මුදාගත මැනව. ඔවුහු අපව මරන්ට නියම කරගෙන ඇත. නමුත් ඔබගේ හස්තයෙන් ගැළවීම ගෙන දිය හැක." මට මතකයට ගෙන ආ හැක්කේ මේ වචන පමණය. ඔවුහු තමන්ගේ නොවටිනාකම ගැඹුරු ලෙස වටහාගෙන දේව කැමැත්තට සම්පූර්ණ ලෙස යටත්ව සිටිමින් හැමදෙනා යාකොබ් මෙන් මිදීම ඉල්ලා පොර බදන්නට වූහ.

ඔවුන් මෙසේ කන්නලව් කරමින් සිටියදී දේව දූතයෝ අනුකම්පාවෙන් යුතුව ඔවුන්ව මුදා ගන්නට යන්ට ඉඩ තිබිණ. නමුත් උසැති අණ දෙන දේව දූතයෙක් එසේ කරන්ට ඉඩ දුන්නේ නැත. ඔහු කථා කොට, දේව කැමැත්ත තවම ඉටුවී නැත. ඔවුහු කුසලාන පානය කළ යුතුය. ඔවුහු බව්තීස්මයෙන් බව්තීස්ම විය යුතු යයි පැවසීය.

එවිටම අහසත් පෙළොවත් කම්පා කළ දෙවියන්වහන්සේගේ හඬ ශබ්දය මට ඇසිණ. එවිට මහා බලවත් භූමිකම්පාවක් විය. ගොඩනැගිලි කඩා වැටී හැමතැනම විසිරිණ. එවිට මම ජයඝෝෂා හඬක් ඇසීමි. එය පැහැදිලි සංගීතමය වූ හඬක්ය. ටික වේලාවකට පෙර මහත් කරදරවලට පත්ව සිටි කණ්ඩායම දෙස මම බැලීමි. ඔවුහු වහල් බවෙන් මිදිලාය. තේජාන්විත ආලෝකයක් ඔවුන් මත පතිතව ඇත. ඔවුන් කොපමණ අලංකාරද, විඩා ගතියද අසරණකමේ ලකුණුද පහව ගොස් ඇත. සනීපයද අලංකාරයද පෙනෙන්ට විය. ඔවුන්ගේ සතුරෝ මළවුන් මෙන් ඇද වැටිණ. ශුද්ධවන්තයන් කෙරෙහි බැබලුණ ආලෝකය ඔවුන්ට දරන්ට බැරි විය. මෙම ආලෝකය යේසුස්වහන්සේ ස්වර්ගයෙන් පැමිණෙන තුරු ඔවුන් මත බැබළෙමින් තිබිණ. මොහොතකින් ඇසිපිය හෙලන ක්ෂණයකින් ඔවුන් මහිමයෙන් මහිමයට පත්වූහ. සොහොන් ගෙවල් විවර වූහ. අමරණ භාවයෙන් යුතුව මළාවූ අය පිටතට ආහ. ජීවත්ව සිටි ශුද්ධවන්තයන් සමග තම ස්වාමින්වහන්සේ සම්මුඛ වන පිණිස අහසට ඇදගනු ලැබූහ. සැම අමරණීය තොල්වලින්ම මහිමයේ සහ ජයග්‍රහණයේ ගීතමය ශබ්ද ඇසෙන්ට විය.

***බලන්න: ගීතිකා 86; හොෂෙයා 6: 3; හග්ගයි 2: 21-23; ශු. මතෙව් 10: 35-39; ශු. මතෙව් 20: 23; එපීස 6: 10-18; 1 තෙසලෝනික 4: 14-18; එළිදරව් 3: 14-22.***

## *33 - පරිච්ඡේදය*

# බබිලෝනියේ පාපයන්

සභාවල් වල වැටීයාම ගැන දෙවන දූතයා ප්‍රකාශ කළ පසු නොයෙක් සභාවල්වල තත්ත්වයන් මම දුටිමි. ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයන් යයි කියාගත් නමුත් ඔවුන් වඩ වඩා දූෂණය වෙමින් සිටියහ. ඔවුන්ව ලෝකයාගෙන් වෙන්කර හඳුනාගත නොහැක. ඔවුන්ගේ දේවගැතිවරු බයිබල් පාඨ ගෙන හැරපා දේශනා කරන්නේ සුමුදු දේවල්ය. ස්වභාවික සිත මේවාට විරුද්ධ නැත. මාංසික සිත වෛර කරන්නේ සත්‍යය ආත්මික බලය සහ ක්‍රිස්තුස්වහන්සේගේ ගැළවීම යන මේවාටය. සාතන්ගේ කෝපය අවුස්සන පව්කාරයන් තැති ගන්වන, ඉක්මණින්ම පැමිණෙන විනිශ්චය ගැන හදවතට කථා කරන සැබෑ වූ දේවල්, ජනප්‍රියව තිබෙන දේව සේවයේ පෙනෙන්නට නැත. දේව භක්තියෙන් තොරව පිටස්තර වතාවත්වලින් පිරුණු ක්‍රමවලට පව්කාරයන් සතුටු වෙති. එවන් ආගමික සේවාවන්ට ඔවුහු උපකාර කරති. සහාය දෙති. අන්ධකාරයේ බලවේග මැඩපවත්වා ජයගෙන ජයමග ගමන් කරන්නට ධර්මිෂ්ඨකමේ සම්පූර්ණ යුද්ධ ඇඳුම් කට්ටලයම නැතිව නුපුළුවන. සාතන් සියලුම සභාවල් තම අයිතිය යටතට ගෙන ඇත. පාපය කපා කොටා වෙන්කරන දේව වචනය වෙනුවට මිනිසුන් කියන දේ කරන දේ විශ්වාස කරති. ලෝකයේ ආත්මය සහ මිත්‍රකම දෙවියන්වහන්සේට එකඟ නැත. සත්‍යය එහි ශක්තිය සහ සරල බවෙන් යේසුස්වහන්සේ තුළ ඇති ආකාරයට ඉදිරිපත් කරන විට පීඩා කිරීමේ ආත්මය අවදි කරනු ලබනවාය. බොහෝ අය, ක්‍රිස්තියානින් යයි කියාගන්නාවූ බොහෝ දෙනා, දෙවියන්වහන්සේව හඳුනන්නේ නැත. සිතේ මාංසික ස්වභාවය වෙනස් කරගෙන නැති නිසා එම සිත දෙවියන්වහන්සේ සමග සතුරුකමක පවතී. ඔවුහු 'ක්‍රිස්තියානි" යන නම පවරාගෙන සිටින නමුත් සාතන්ගේ සේවකයන්ව ජීවත් වෙති.

යේසුස්වහන්සේ ස්වර්ගීය මණ්ඩපයේ ශුද්ධස්ථාන කොටස වසා දමා තිරයෙන් එහා කොටසට ඇතුල් වුණායින් පසු යුදාවරුන්ගේ කාලයේ දේව මාළිගය පාළුවට හැර දමුවා හා සමානව සභාවල් අපවිත්‍රතාවලින් පිරී යනවා මම දුටිමි. සභාවල්වල මහත් දුෂ්ටකම්ද අශීලාචාරකම්ද මම දුටිමි. ඔවුන්ගේ ආගමිකත්වය දෙවියන්වහන්සේ ඉදිරියේ පිළිකුලක්ව තිබිණ. 'ඔවුන්ගේ රැස්වීම්වල දෙවියන්වහන්සේට සුවඳ දැනෙන්නේ නැත" කියා දේව දූතයා පැවසීය. ආත්මාර්ථකාමී බව, ප්‍රෝඩාව රැවටිල්ල ආදිය හැඟීමෙන් තොරව ක්‍රියාත්මක වේ. මේ සියල්ල ආගම නමැති කබායෙන් වසාගෙන ඇත. නාමික ක්‍රිස්තියානි සභාවල අහංකාරය මට පෙන්වූ සේක. ඔවුහු තමන් ගැන සිතනවා මිස ඔවුන්ගේ සිතුවිලිවල දෙවියන්වහන්සේ නොසිටි සේක. ඔවුහු තමුන්ගේ සිරුරු සරසාගෙන ආශාවෙනුත් තෘප්තියෙනුත් එදෙස බලති. ඔවුන්ගේ පාප ද අහංකාරය ද ස්වර්ගය වෙතට පැමිණ ඇත. ඔවුන්ගේ කොටස සූදානම්ය. සාධාරණයද, දඬුවමද ඉක්මණින් පිබිද එනවා ඇත. 'පළිගැනීම මාගේය, මම ප්‍රතිඵල දෙන්නෙමි"යි ස්වාමින්වහන්සේ කියන සේක. තුන්වන දූතයාගේ ඉල්ලීම් භයානකය. ඔවුහු දෙවියන්වහන්සේගේ උදහස පානය කරනවා ඇත. ගණන් කළ නොහැකි දුෂ්ට ආත්ම සංඛ්‍යාවක් දේශය පුරා විසිර සිටිති. සභාවල් සහ ආගමික කණ්ඩායම් ඔවුන්ගෙන් පිරී ඇත. ඔවුන් මහත් උද්දාමයකින් ආගමික කණ්ඩායම් දෙස බලති. ඒ මහත්ම අපරාධ සහ පාප ක්‍රිස්තියානි නමැති කබායෙන් වසා ඇති නිසාය.

දෙවියන්වහන්සේගේ කර්මාන්තය වන මනුෂ්‍යයන්ව අශීලාචාරකම්වල පහතටම හෙළා මනුෂ්‍යයන් විසින්ම තමන්ව මෘගයන්ගේ මට්ටමට ගෙන ඒම ගැන මුළු ස්වර්ගයම වේදනාත්මක තරහවකින් බලා සිටිති. මනුෂ්‍යයන්ගේ දුක් වේදනා දක දයාවෙන් හා අනුකම්පාවෙන් ඔවුන්ට සේවය කර සුවය සනීපය උන්වහන්සේ උදා කර දුන්සේක. එතුමන්ගේ අනුගාමිකයන් යයි කියාගන්නාවූ අය මනුෂ්‍යයන්ට කරන වධහිංසා කොතෙක්ද දේව දූතයන් ඒවා සටහන් කර තබා ඇත. පොත්වල ලියා ඇත. පියවරුන්ගේ මව්වරුන්ගේ සහෝදර සහෝදරියන්ගේ සහ දූවරුන්ගේ කඳුළු බෝතල්වල රැස්කර ස්වර්ගයෙහි තබා ඇත. වහලුන් ලෙස මිනිසුන් ගැහැණුන් මිලට ගෙන හෝ විකුණා ඇත. ඔවුන්ගේ අදෝනා තැනින් තැනට ගෙන ගොස් ඇත. දෙවියන්වහන්සේ තම උදහස නවතා ගෙන සිටින්නේ තව ස්වල්ප කලකටය. මේ අයට විරුද්ධව උන්වහන්සේගේ කෝපය දැවෙමින් ඇත. විශේෂයෙන් මෙවන් දේවල යෙදී සිටින ආගමික කණ්ඩායම්වලට විරුද්ධව උන්වහන්සේගේ උදහස ඇවිලෙමින් ඇත. මෙවන් රිදවීම්, මෙවන් අසාධාරණ මෙවන් අපරාධ කරමින් කිසි භයක් නැතිව දෙවියන්වහන්සේටද නමස්කාර කරති. මේවා භයානක සමච්චල්ය. සාතන් උදම් වී යේසුස්වහන්සේටත් දේව දූතයන්ටත් මෙවන් දේ දක්වා නින්දා අපහාස කරති. මේ දේවල් කරන අය ක්‍රිස්තු අනුගාමිකයෝද!

මෙම ක්‍රිස්තියානි අය වේද සාක්ෂිකයන් වින්දා වූ දුක් වේදනා ගැන කියවන අතර ඔවුන්ගේ කම්මුල් දිගේ කඳුළු ගලා යති. මිනිසුන්ට මේ වගේ කුරිරු හදවත් තිබිය හැකිද කියා ඔවුහු සිතති. ඒ අතරම මනුෂ්‍යයන්ව ඔවුහු වහලුන් මෙන් තබාගෙන සිටිති. අමානුෂික ලෙස මනුෂ්‍යයන්ට වධ වේදනා පමුණුවති. ක්‍රිස්තුස්වහන්සේගේ සෙනඟට මිථ්‍යාදෘෂ්ඨිකයන් හා පාප්වරුන්ගේ අනුගාමිකයන් කළාක් මෙන් මොවුහුත් කරති. මොවුන්ට දේව දඬුවම් ඔවුන්ට වඩා බරපතල වෙනවා ඇත. පීඩා කරනු

ලබන අයගේ වේදනා සහ අදෝනා ස්වර්ගය වෙතට පැමිණ ඇත. දෙවියන්වහන්සේගේ සමානත්වයට මවන ලද මනුෂ්‍යයන් විසින් දයාවත් අනුකම්පාවත් නැතිව කුරිරුකමින් දේව සමානකමට මවන ලද තවත් අයට දෙන වධ හිංසා ගැන දේව දූතයෝ විශ්මයට පත්වෙති. දේවදූතයා මෙසේ පැවසීය. මෙවන් අයගේ නම් ලේ වලින් ලියා ඇත. ඒ මත ඉරි ඇඳ ඇත, අදෝනා කියන අයගේ කඳුළුවලින් තෙමී ඇත. ආලෝකයේ දේශය දේව උදහසේ කුසලානෙන් බී එය හිස් කරන තුරු උන්වහන්සේගේ කෝපය සංසිඳෙන්නේ නැත. බබිලෝනියට දෙගුණයක් දීපල්ලා, ඇගේ ක්‍රියා ලෙස ඇයට දෙගුණයක් දීපල්ලා.

වහලාගේ ස්වාමියා විසින් වහලාගේ ජීවිතය ගැනද ඔහුව අඳුරේ නොහොත් නොදන්නාකමේ තබාගැනීම ගැන සහ ඔහුගේ පව් ගැනද වග කිව යුතුය. මේ කාරණා ගැන දෙවියන්වහන්සේගේ විනිශ්චය ඔහු වෙතට පැමිණෙනවාය. දෙවියන්වහන්සේ ගැන දැනුමක් නැතිව සහ බයිබලය ඉගෙන ගෙන නැතිව, අන් කිසිවකට වඩා තම ස්වාමියාගේ කසයට හයෙන් ජීවත්වන ස්වාමියාගේ සතුන් සිවුපාවුන්ට වඩා වටිනාකමක් නැතිව චරිතයෙන් හීනව සිටින වහලාව ස්වර්ගයට ගන්ට දෙවියන්වහන්සේට නුපුළුවන. අනුකම්පාවෙන් පිරී සිටින උන්වහන්සේට කළ හැකි හොඳම දේ උන්වහන්සේ ඔහුට කරන සේක. ඔහු නොසිටියාක් මෙන් වන්නට හරින සේක. නමුත් ඔහුගේ ස්වාමියා වසංගත හතේ වේදනාවන් අත්දකින්ටද ඉන්පසු දෙවන මළවුන්ගෙන් නැගිටීමේදී ඉතාම භයානක මරණය වන දෙවන මරණය විඳින්ටද සිදු වෙනවාය. ඉන්පසු දෙවියන්වහන්සේගේ උදහස සංසිඳෙන්නේය.

*බලන්න: ආමොස් 5: 21; රෝම 12: 19; එළිදරව් 14: 9-10; 18: 6.*

## *34 - පරිච්ඡේදය*

# මහත් හඬ

දේව දූතයෝ ස්වර්ගයෙහි ඉක්මණින් එහා මෙහා යනවා මම දුටිමි. කිසියම් වැදගත් කාර්යයක් ඉටු කරන පිණිස ඔවුහු ස්වර්ගයෙන් පොළොවටත්, පොළොවෙන් ස්වර්ගයටත් යමින් එමින් සිටියහ. තවත් මහා බලවත් දේව දූතයෙකුට ලෝකයට යන්ට අණ දෙනවා මම ඇසීමි. එම දේව දූතයා තමාගේ හඬ තුන්වන දූතයාගේ හඬට එකතු කර එයට බලය දිය යුතු විය. මහත් බලයද තේජසද ඔහුට දෙනු ලැබීය. ඔහු ලෝකයට ලංවූ අතර ඔහුගේ තේජසින් ලෝකය ආලෝක විය. මෙම දේව දූතයාට ඉදිරියෙන්ද පිටුපසින්ද ගමන් කළ ආලෝකය හැමතැන විනිවිද පැතිර ගිය අතර ඔහු මහත් හඬකින් කථා කර මහ බබිලෝනිය වැටුණේය, වැටුණේය" කියාද 'එය යක්ෂයින්ගේද සැම අපවිත්‍ර ආත්මයන්ගේ හිරගෙයක්ද සියලු අපවිත්‍ර පක්ෂීන්ගේ හිරගෙයක්ද වූවා" යයි කීවේය. බබිලෝනියේ වැටීම ගැන දෙවන දූතයා දුන් පණිවිඩය නැවත හඬ නගන්ට විය. 1844 න් පසුව සභාවලට එකතු වූ දූෂණයන්ද පණිවිඩයට එකතු කර තිබිණ. මෙම පණිවිඩය පැමිණියේ නියම වේලාවටය. තුන්වන දූතයාට එකතුව අවසාන මහා මෙහෙය සඳහා වූ තුන්වන දූතයාගේ මහත් හඬට මෙය බලය එකතු කළේය. හැමතැනම සිටින දේව දරුවන්ව පරික්ෂාවේ පැය සඳහා එමගින් සූදානම් කරනු ලැබීය. මහත් ආලෝකයක් ඔවුන් අතර පැතිර තිබූ අතර පණිවිඩය තුළ ඔවුන් හැමදෙනාම එකමුතු වූහ. භය නැතිව තුන්වන දූතයාගේ පණිවිඩය ප්‍රකාශ කළහ.

ඒ බලවත් දේව දූතයාට සහාය වන පිණිස ස්වර්ගයෙන් තවත් දූතයන්ව එවන ලදී. පණිවිඩයේ හඬ හැම තැනින්ම පැමිණෙනවා මම ඇසීමි. තවද 'මාගේ සෙනඟනී, ඇගේ පාපවලට හවුල් නොවන පිණිසත්, ඇගේ පීඩාවලට අසු නොවන පිණිසත් ඇගෙන් ඉවත්ව වරෙල්ලා" යයි කියන වෙන හඬක් ස්වර්ගයෙන් මට ඇසුණේය. මක්නිසාද ඇගේ පව් ස්වර්ගය දක්වා නැංගේය. දෙවියන්වහන්සේද ඇගේ අපරාධ සිහි කළසේක. 1844 දී දෙවන දූතයාගේ හඬට මධ්‍යම රාත්‍රියේ හඬ එක්වූවාක් මෙන් මේ හඬ තුන්වන හඬට තවත් විශේෂ කරුණු එක්කරමින් එකතු විය. ඉවසිල්ල ඇතුව බලා සිටි ශුද්ධවන්තයන් කෙරෙහි දේව මහිමය පතිත විය. ඔවුහු භය නැතිව අවසාන අනතුරු ඇඟවීමේ පණිවිඩය ප්‍රකාශ කළහ. බබිලෝනිය වැටීමද ඈ වෙත පැමිණෙන්නට යන මහා විනාශයෙන් ගැළවෙන පිණිසද තවමත් බබිලෝනිය තුළ සිටින දෙවියන්වහන්සේගේ සෙනඟට ඈ වෙතින් ඉවත්ව එන ලෙස ඉල්ලා සිටියහ.

පැමිණි ආලෝකයෙන් බිඳක් හෝ ලබා සිටි අය වෙත මෙම මහත් ආලෝකය පැමිණි අතර මීටපෙර එවන ලද දේව දූතයන් තුන්දෙනාගේ පණිවිඩ එපා නොකළ අය මේ කැඳවීමට ප්‍රතිචාරය දක්වමින් ඇදහිල්ලෙන් වැටී තිබූ සභාවල් අතහැර පිටතට පැමිණියහ. දේව දූතයන් තුන්දෙනාගේ පණිවිඩ වසර කීපයක් තිස්සේම අසා තබූ අයගේ වගකීම අති මහත්ය. ඔවුන් ඒ ගැන ගණන් දෙන්ට

යෙදෙනවාය. දැන් ඔවුන්ට ජීවිතය හෝ මරණය තෝරාගන්ට ඉඩ ප්‍රස්ථාව ලැබී ඇත. සමහර අය ආඥා පවත්වමින් යේසුස්වහන්සේගේ පැමිණීම බලා සිටින්ට තෝරා ගත්හ. තුන්වෙනි දූතයාගේ පණිවිඩ මගින් ඇදහිලිවන්තයන් සෝදිසියකට භාජන කර, වටිනා අයව සහාවල්වලින් පිටතට ගන්ට නියම කර තිබිණ. අවංක අය තුළ පෙළඹවීමේ බලයක් ක්‍රියා කරන්ට වූ අතර මේ අයට විරුද්ධව බාධා කිරීම් ඇති නොකරන ලෙස නෑදෑයින් හා මිත්‍රයන් කෙරෙහි විශේෂ දේව බලපෑමක් ක්‍රියාත්මක වන බව පෙනෙන්ට තිබිණ. අවසාන කැඳවීම දුප්පත් වහලුන් වෙතටද පැමිණ ඔවුන් අතර දේව භය ඇතුව සිටි අය තමන්ගේ මිදීම පැමිණ තිබෙන බව දැන මහත් ප්‍රීතියෙන් කැඳවීම පිළිගත්හ. ස්වාමිවරු මහත් භීතියකද විශ්මයකටද පත්ව සිටියෙන් ඔවුන්ට බාධා කළේ නැත. රෝගීන් සුව කිරීම් ආදී මහත් පුදුම හාස්කම් ඇදහිලිවන්තයන් මගින් කරන්ට යෙදින. මේ මහත් මෙහෙය සමග දෙවියන්වහන්සේ සිටින බැවින් කුමක් වුවත් භය නැතුව තම හෘද සාක්ෂියට එකඟව ඔවුහු දෙවියන්වහන්සේගේ ආඥා සියල්ලම පවත්වා සෙනඟ සමග එකතු වූහ. ඔවුහු තුන්වන පණිවිඩය බලයෙන් යුක්තව ප්‍රකාශ කළහ. මධ්‍යම රාත්‍රියේ හඬට වඩා මහත් බලයකින් යුතුව තුන්වන පණිවිඩය ප්‍රකාශ කරන බව මම දුටිමි.

ස්වර්ගීය බලයෙන් සරසනු ලැබූ දේව සේවකයෝ ආලෝක කරනු ලැබූ මුහුණුවලින් යුතුව ශුද්ධ කැපවීමකින් බබළමින් ස්වර්ගීය පණිවිඩය ප්‍රකාශ කළහ. සභාවල්වල විසිර සිටි දේව දරුවෝ කැඳවීමට ප්‍රතිචාරය දැක්වූහ. විනාශයට කැපව සිටි සභාවලින් පිටතට ඔවුන්ව ඉක්මණින් ගෙනෙනු ලැබූහ. එය සොදොම් ගොමෝරා විනාශයෙන් ලොත්ව මුදාගත්තා හා සමානය. මහත් උතුම් තේජස මුදාගත් අය කෙරෙහි පැමිණ ඔවුන්ව ශක්තිමත්ව සූදානම් කෙරිණ. පරීක්ෂා පැයේ අමාරුකම් දරාගන්ට හැකිවන පිණිස ඔවුන් හැඩගැන්වූහ. 'දෙවියන්වහන්සේගේ ආඥා පවත්වා යේසුස්වහන්සේගේ ඇදහිල්ල රක්ෂා කරන ශුද්ධවන්තයන්ගේ ඉවසීම මෙහි" යයි කියන ශබ්ද හැම පැත්තෙන්ම පැමිණෙනවා මට ඇසිණ.

*බලන්න: උත්පත්ති 19; එළිදරව් 14: 12; 18: 2-5.*

## *35 - පරිච්ඡේදය*

# තුන්වන පණිවිඩය නිම කිරීම

තුන්වන දූතයාගේ පණිවිඩය හමාර වන අනාගතය වෙතට මාව යොමු කෙරිණ. දෙවියන්වහන්සේගේ බලය උන්වහන්සේගේ සෙනඟ මත පතිතව තිබිණ. ඔවුහු තමුන්ට හිමිව තිබූ සේවය ඉටු කර පරීක්ෂාවේ පැයට මුහුණ දෙන්ට සූදානම්ව සිටියහ. ඔවුහු අන්තිම වර්ෂාව නොහොත් ශුද්ධාත්ම බලය ලබා සිටියහ. ජීවමාන සාක්ෂිය පණ ගැන්වී තිබිණ. අවසාන මහා අනතුරු ඇඟවීම් ප්‍රකාශ කර තිබූ අතර එය පිළිනොගත් අයගේ කෝපය ඇවිස්සී තිබිණ.

ස්වර්ගයෙහි දේව දූතයන් කඩිනම් මෙහෙවරක යෙදී සිටිනවා දුටිමි. භාජනයක් පැත්තකින් බැඳ සිටි තවත් දේව දූතයෙක් යේසුස්වහන්සේ වෙතට පැමිණ පොළොවේ තමාගේ සේවය ඉටුකර ශුද්ධවන්තයන් ගණන් කර මුද්‍රා කළ බව උන්වහන්සේට පැවසීය. එවිට මෙතෙක් දසපනත තබා තිබෙන ගිවිසුම් පෙට්ටිය ඉදිරිපිට සේවය කරමින් සිටි යේසුස්වහන්සේ සුවඳ දුම් භාජනය පොළොවට වීසි කර තම දෑත් ඉහළට ඔසවා 'ඉතින් සමාප්තයි" කියා මහ හඬින් පැවසූ සේක. මෙම ගාම්භීර ප්‍රකාශය කරන විට සියලූම දේව දූතයෝ තම හිස්වලින් ඔටුනු ගළවා ගත්හ. යේසුස්වහන්සේ කථාකොට ගාම්භීර ප්‍රකාශයක් කළසේක. එනම් 'අධර්මිෂ්ඨ තැනැත්තා මතුත් අධර්මිෂ්ඨකම් කරාවා. අපවිත්‍ර තැනැත්තා මතුත් අපවිත්‍ර කරනු ලබාවා. ධර්මිෂ්ඨ තැනැත්තා මතුත් ධර්මිෂ්ඨකම් කරාවා. පවිත්‍ර තැනැත්තා මතුත් පවිත්‍ර කරනු ලබාවා."

ජීවනයට හෝ මරණයට හැම කෙනෙකුගේම ඉරණම විසඳා තිබූ බව මම දුටුවෙමි. යේසුස්වහන්සේ තම සෙනඟගේ පාප මකා දමා තිබිණ. උන්වහන්සේ රාජ්‍යය භාරගෙන රාජ්‍යයේ උරුමක්කාරයන් උදෙසා සමගිකමක් කළසේක. යේසුස්වහන්සේ අති ශුද්ධස්ථානයේ සේවය කරමින් සිටින අතර මළාවූ ධර්මිෂ්ඨ අය සම්බන්ධව විනිශ්චයන් ඉටු කරමින් තිබිණ. ඉන්පසු ජීවත්ව සිටින ධර්මිෂ්ඨ අයගේ විනිශ්චයය. මෙසේ රාජ්‍යයේ කොටස්කරුවන් තෝරාගෙන හමාරය. බැටළු පැටවාණන්ගේ සරණ මංගල්‍යය පැවැත්විණ. අහසින් යට සියලූ රාජ්‍යවල මහත්කමද බලයද යේසුස්වහන්සේට ද ගැළවීමේ උරුමක්කාරයන්ට ද දුන්සේක. යේසුස්වහන්සේ රජවරුන්ගේ රජද ස්වාමිවරුන්ගේ ස්වාමියාණන්ද ලෙස සදාකාලයටම රජකම් කරන සේක.

යේසුස්වහන්සේ අති ශුද්ධස්ථානයෙන් පිටවන විට උන්වහන්සේගේ ඇඳුමේ වූ සීනු හඬ මට ඇසිණ. උන්වහන්සේ පිටතට ආ විගසම අඳුරු වලාපටලයකින් පොළොවේ ජනතාව වැසී ගියේය. උදහස් කරනු ලැබූ දෙවියන්වහන්සේත් පව්කාර මනුෂ්‍යයනුත් අතර මැදහත්කාරයෙක් ඉන්පසු නොසිටියේය. යේසුස්වහන්සේ මැදහත්කාරයෙකු ලෙස දෙවියන්වහන්සේද පව්කාර මනුෂ්‍යයන්ද අතර සේවය කරද්දී මනුෂ්‍යයන්ට දේව ආරක්ෂාවක් සපයා තිබිණ. යේසුස්වහන්සේ ඉන් පිටවූ පසු එම ආරක්ෂාව නැවතිණ. මනුෂ්‍යයෝ සාතන්ගේ පාලනය යටතට පත්වූහ. යේසුස්වහන්සේ ශුද්ධස්ථානයේ සේවය කරන තාක් කල් වසංගත හත පොළොවට වැගිරවිය නොහැක, නමුත් උන්වහන්සේ සේවයෙන් ඉවත්වූ පසු දෙවියන්වහන්සේගේ ගැළවීම එපා කළාවූ සහ සුළු කළාවූ සහ උන්වහන්සේට වෛර කළාවූ අය කෙරෙහි පැමිණෙන විපත්ති නවත්වන්ට කිසිවෙක් නැත. මෙම කෙටි කාලය තුළ ශුද්ධවන්තයන් ජීවත් වන්ට යන්නේද ශුද්ධ වූ දෙවියන්වහන්සේ ඉදිරියේ මැදහත්කාරයාණන්ගේ සේවය නොමැතිවය. සෑම කෙනෙකුවම විනිශ්චය කර හමාරය. ශුද්ධ මණ්ඩපයට අයත් පිටත මළුවේ යේසුස්වහන්සේ ටික වේලාවක් නැවතී සිටිසේක. උන්වහන්සේ අති ශුද්ධස්ථානයේ සේවය කරද්දී කමාව දෙනු ලැබූ පාප සියල්ල පාපයේ ආරම්භකයා වූ සාතන් පිට තබන්ට යෙදින. මෙම පාප ගැන ඔහු වගකිව යුතුය.

ඉන්පසු යේසුස්වහන්සේ පූජක ඇඳුම් ගළවා තම රාජ වස්ත්‍ර ඇඳගෙන ඔටුන්නක් මත ඔටුනු ඇති රාජකීය ඔටුන්න පැළඳ ගෙන දේව දූතයන් පිරිවරාගෙන ස්වර්ගයෙන් පිටත් වූසේක. පොළොවේ ජනයන් වෙත වසංගත වැගිරෙන්ට පටන්ගෙන තිබිණ. සමහර අය දෙවියන්වහන්සේට ශාප කරමින් අපහාස කරන්ට වූහ. තවත් අය දෙවියන්වහන්සේගේ සෙනඟ වෙතට දුවැවිත් දෙවියන්වහන්සේගේ දඬුවම්වලින් මිදෙන්ට කුමක් කළ යුතු දැයි ඇසූහ. නමුත් දැන් ඔවුන්ට දෙන්ට දෙයක් නැත. පව්කාරයන් උදෙසා අවසාන කඳුළු සලා අවසාන යැදුම් ඔසවා අවසානය බර දරා හමාරය. කැඳවීම් කිරීමේ මිහිර හඬ දැන් නැවතිලාය. අනතුරු හැඟවීම් කරලා ඉවරය. දේව දරුවන් සහ ස්වර්ගීය සේනාව ඔවුන්ගේ මිදීම ගැන උනන්දුවක් දක්වූ නමුත් ඔවුන් ඒ ගැන සැලකිල්ලක් දක්වූයේ නැත. ජීවනයත් මරණයත් ඔවුන් ඉදිරියේ තබා තිබිණ. බොහෝ දෙනෙක් ජීවනයට කැමති වූහ, නමුත් එය ලබාගන්ට උනන්දු වූයේ නැත. දැන් සමගි කිරීමේ ලේ නොමැත, තව ටිකක් ඉවසන්න කියා හඬන්ට කෙනෙක් නැත. "ඉතින් නිමයි" යන භයානක ප්‍රකාශය කර හමාරය. ගැළවීමේ සැලැස්ම සම්පූර්ණත්වයට පත්කර ඇත. නමුත් එය පිළිගන්ට කැමති වූයේ ස්වල්ප දෙනෙක්ය. දයාවේ මිහිරි හඬ ඈත්ව යද්දී භයානකත්වයෙන් මිනිස් ජීවිත වෙළාගන්ට විය. ඔවුන්ට පැහැදිලි ලෙස ඇසුණේ "ප්‍රමාද වෙලා වැඩියි. ප්‍රමාද වෙලා වැඩියි" යන්නය.

දේව වචනය අගේ නොකළ අය හැමතැන දුවන්ට විය. මුහුදෙන් මුහුදටද උතුරේ සිට නැගෙනහිරටද ස්වාමින්වහන්සේගේ වචනය සොයා ගියහ. ඔවුන්ට එය සම්භ නොවන්නේ යයිද ආහාර සාගතයක් නොව දේශයෙහි දේව වචනය සොයාගන්ට නොහැකි, අසන්නට නැති සාගතයක් වන්නේයැ" යි දේව දූතයා පැවසීය. දෙවියන්වහන්සේගෙන් දයානුකම්පාවේ වචනයක් අසන පිණිස ඔවුන් දැන් දෙන්නට නොකැමති දෙයක් නැත. නමුත් ඔවුන්ගේ සාගින්න දැන් නිවාලන්ට නොහැක. දවසින් දවස ඔවුහු ගැළවීම සුළු කළහ. ලෝක ආශාවන්, මාංසික තෘෂ්ණාවන්, මිල මුදල් හා වස්තුව ස්වර්ගීය දේවලට ඉහළින් අගය කළහ. ඔවුහු යේසුස්වහන්සේව එපා කොට ශුද්ධවන්තයන්ට අපහාස කළහ. අපවිත්‍ර අය සදහටම අපවිත්‍රව සිටීවා.

වසංගතවල විෂමතාවන්ට අසු වූවන්ගෙන් බොහෝ දෙනා ඉන් අතිශයින් කෝපයට පත්වූහ. එය මහත් වේදනාවල දර්ශනයක් විය. දෙමාපියන් දරුවන්ට දොස් තැබූහ. දරුවෝ දෙමාපියන්ටද, සහෝදරයෝ සහෝදරියන්ටද, සහෝදරියෝ සහෝදරයන්ටද දොස් පැවරූහ. හැම පැත්තෙන්ම මහත් විලාප හඬ ඇසෙන්ට විය. මාව සත්‍යය පිළිගැනීමෙන් වැලැක්වූයේ නුඹය. එය පිළිගත්තා නම් මට මෙසේ වන්නේ නැත. ජනතාව පූජකවරුන්ට විරුද්ධව නැගිට "නුඹලා අපට අනතුරු හැඟවීම් කළේ නැත. නුඹලා අපට කීවේ මුළු ලොවම හැරී ගැළවෙනවාය කියාය. සමාදානයය සමාදානයය භයවෙන්ට කරුණක් නැත කියාය. නුඹලා අපට මේ භයානක පැය ගැන කියා දුන්නේ නැත. අපට අනතුරු ඇඟවීම් කළ අය ගැන නුඹලා කීවේ ඔවුන් උමතු වූවන්ය, දුෂ්ට මිනිසුන්ය, නුඹලාව නාස්ති කරන්ට සිතන අය කියාය." පූජකයන් දේව උදහසින් ගැළවුණේ නැති බවද අනිත් අයට වඩා ඔවුන්ගේ වේදනා දස ගුණයකින් වැඩි වූ බවද මම දුටිමි.

***බලන්න: එසකියෙල් 9: 2-11; දානියෙල් 7: 27; හොෂෙයා 6: 3; ආමොස් 8: 11-13; එළිදරව් 16 සහ 17: 14.***

## ***36 - පරිච්ඡේදය***

# යාකොබ්ගේ විපත්ති කාලය

ශුද්ධවන්ත සෙනඟ නගරවලින් හා ගම්වලින් පිටව ගොස් ඉතාම පාළු ස්ථානවල කණ්ඩායම් වශයෙන් ජීවත් වෙනවා මම දුටිමි. දේව දූතයෝ ඔවුන්ට ආහාර සහ ජලය සැපයූහ. දුෂ්ටයෝ සාගින්නෙන් සහ පිපාසයෙන් සිටියහ. ලෝක නායකයන් එක්ව මන්ත්‍රණයක යෙදී සිටිනවාද සාතන් ද ඔහුගේ දූතයන් ද ඒ අය වටකර සිටිනවාද මම දුටිමි. එක්තරා ලියවිල්ලක් ඒකේ පිටපත් රාශියක් දේශයේ හැමතැනම විසුරුවා තිබෙන බවද මම දුටිමි. ඒවායෙහි මෙසේ ලියා තිබිණ. සබත් පවත්වන සෙනඟ සතියේ පළමුවන දිනය වන ඉරිදා පවත්වන්ටත් සබත් දිනය නොහොත් සෙනසුරාදා පැවැත්වීමද ඔවුන්ගේ අමුතු ඇදහිල්ලද අත්හරින්ටත් කැමති නොවූවොත් එක්තරා දිනයකදී ඔවුන්ව මරා දැමිය යුතුය යන නියෝගය සඳහන් විය. මෙම භයානක විනාශයෙන් ගැළවීමට දෙවියන්වහන්සේ මාර්ගයක් සූදානම් කර දෙනවාය යන උන්වහන්සේගේ පොරොන්දු කෙරෙහි විශ්වාසයෙන් ශුද්ධවන්තයෝ නිහඬව බලා සිටියහ. සමහර ප්‍රදේශවල නියම දිනයටත් කලින් ශුද්ධවන්තයන්ව මරා දැමීමට සෙනඟ දුව ආහ. නමුත් මනුෂ්‍ය වේශයෙන් යුද සෙබළුන් මෙන් පෙනී සිටි දේව දූතයන් ඔවුන්ට විරුද්ධව සටන් කළහ. මහෝත්තමයාණන් වහන්සේගේ ශුද්ධවන්තයන් නසා දමන්ට සාතන් මෙම ඉඩ ප්‍රස්ථාව යොදා ගන්ට සිතා ගත්තේය. නමුත් යේසුස්වහන්සේ ඔවුන්ව ආරක්ෂා කරන ලෙස දේව දූතයන්ට අණ දුන්සේක. මිථ්‍යාදෘෂ්ටීන් ඉදිරියේ දේව ව්‍යවස්ථාව පවත්වමින් දෙවියන්වහන්සේට ගෞරව කළ ශුද්ධවන්තයන් සමග ගිවිසුමක් කිරීමෙන් දෙවියන්වහන්සේව ගෞරවයට පත්වීමද මෙතෙක් දෙවෙනි ඊම ඉවසිල්ලෙන් බලා සිටි අය අන්වෙසකට හරවා ස්වර්ගයට ඔසවා ගැනීම මගින් යේසුස්වහන්සේව ගෞරවයට පත්වන නිසාද ශුද්ධ සෙනඟව මෙසේ ආරක්ෂා කළසේක.

ශුද්ධවන්තයෝ මහත් මානසික පීඩාවකට පත්ව සිටින බව මම දුටිමි. දුෂ්ට සෙනඟ ඔවුන්ව වටලාගෙන සිටින ආකාරයක් පෙනිණ. දෙවියන්වහන්සේ දුෂ්ටයන් අතින් මැරෙන්ට තමන්ව අත්හැර දමූවාදෝ කියා සමහර අය භයට පත්ව සිටියහ. නමුත් ඔවුන්ගේ ආත්මික ඇස් ඇර බැලුවා නම් දේව දූත සේනාවන් ඔවුන්ව වටකර ආරක්ෂා කරන බව ඔවුන් දකින්ට යෙදෙනවා ඇත. ඊළඟට මහත් සමූහයක් දිවගෙන ආ අතර ශුද්ධවන්තයන්ව මරා දමන ලෙස සාතන්ගේ දූතයෝ ඔවුන්ව උසි ගැන්වූහ. නමුත් එසේ කරන්නට නම් ඔවුහු බලවන්ත දේව දූත සේනාවන් පසුකරගෙන ආ යුතුය. දේව දූතයෝ ඔවුන්ව පස්සට යන්ට සැලැස්වූහ. මේ අවස්ථාව ශුද්ධවන්තයන්ට ඉතාමත්ම වේදනාත්මක අත්දැකීමක් විය. තමන්ව මුදාගන්නා මෙන් දිවා රෑ දෙකේම ඔවුහු දෙවියන්වහන්සේට මොර ගැසූහ. පෙනෙන්ට තිබූ ආකාරයට නම් ඔවුන්ට ගැළවෙන්ට මඟක් නොවීය. දුෂ්ටයෝ ජයග්‍රාහී ශබ්ද පවත්වන්ට වූහ. 'නුඹලාගේ දෙවියන්වහන්සේ දැන් නුඹලාව ගළවන්නේ නැත්තේ මන්ද? කියා ඔවුහු කෑගැසූහ. නුඹලා අහසට නැගගෙන ගැලවියල්ලා" කියාද ඔවුහු සමච්චල් කළහ. ශුද්ධවන්තයෝ ඔවුන්ට සවන් දුන්නේ නැත. ඔවුහු යාකොබ් මෙන් දෙවියන්වහන්සේ සමග පොර බදිමින් සිටියහ. දේව දූතයෝ ඔවුන්ව මුදාගන්න ආශාවෙන් බලා සිටියහ. නමුත් තව ටිකක් ප්‍රමාද කළ යුතුය. ගින්නේ බව්තීස්ම ලැබිය යුතුය. මහත් බලයෙන් යුතුව තේජාන්විත ලෙස දෙවියන්වහන්සේ ඔවුන්ව මුදාගන්නා වේලාව ළඟාවෙමින් තිබිණ. තමන්වහන්සේගේ නාමය අපහාසයට ලක්වන්ට උන්වහන්සේ ඉඩ හරින්නේ නැත. පොතේ නම් ලියා තිබෙන හැම කෙනෙකුවම උන්වහන්සේ ගළවා ගන්නා සේක.

විශ්වාසවන්ත නෝවා වෙතට මාව යොමු කරන ලදී. වැසි වැස ජලය ගැලීය. නෝවා සහ ඔහුගේ පවුලේ අය නැවට ඇතුල් වූ පසු දෙවියන්වහන්සේ දොර වැසූ සේක. තමාට නින්දා අපහාස කළ අතර පවා නෝවා පොළෝ වාසීන්ට අනතුරු ඇඟවීම් කළේය. ජලගැල්ම බලවත් වෙද්දී එකිනෙකා දියේ ගිලී යද්දී තමන් විනෝදයකට ලක් කරගෙන තිබූ නැව නෝවාගේ පවුලේ අය ඇතුළුව දිය මත ආරක්ෂා සහිතව පාවෙමින් තිබිණ. ඒ ආකාරයෙන්ම ලෝකයාට අනතුරු අඟවමින් සිටින දෙවියන්වහන්සේගේ දරුවන්ව උන්වහන්සේ මුදාගන්නා බව මම දුටිමි. විශ්වාසවන්ත ලෙස ඔවුහු ලෝකයාට අනතුරු ඇඟවීම් කළහ. මෘගයාගේ අණට කීකරු නොවී මෘගයාගේ ලකුණ නොලබා අන් වෙසකට හරවනු ලැබීමේ බලාපොරොත්තුව ඇතිව සිටින තමන් ශුද්ධවන්තයන්ව මරා දමන්ට දෙවියන්වහන්සේ ඉඩ දෙන්නේ නැත. එසේ ඔවුන්ව මරා දමන්නට ඉඩ දුනහොත් සාතන් සහ ඔහුගේ දූතයන්ද දෙවියන්වහන්සේට වෛර කරන දුෂ්ට සෙනඟ ද තෘප්තියට පැමිණෙනවා ඇත. තමන් ප්‍රේම කළාවූ තැනැන්වහන්සේව දැකගන්ට මෙතෙක් බලා සිටියාවූ අය කෙරෙහි මෙම අවසානම අරගලයේදී සාතනික බලයට යටත් වන්නට සිදුවුව හොත් අහෝ! සාතන්ට කෙබඳු ජයග්‍රහණයක් අත් වේවිද. නමුත් දෙවියන්වහන්සේ තමන් සෙනඟට දැක්වූ සැලකිල්ලද ඔවුන්ව උන්වහන්සේ මුදාගත් මහිමාන්විත ආකාරයද ඔවුන් දකිනවා ඇත.

ශුද්ධවන්තයෝ නගර හා ගම්වලින් පිටව ගිය අතර දුෂ්ටයෝ ද ඔවුන්ව ලුහුබැඳ ගියහ. ඔවුන්ව මරන්ට ඔවුහු කඩු එසවූහ. නමුත් ඒවා බල රහිතව පිදුරු මෙන් කඩා වැටිණ. දේව දූතයෝ

ඔවුන්ව සහවා ගත්හ. මිදීම ඉල්ලා දිවා රෑ ඔවුහු දෙවියන්වහන්සේට මොරගැසූ අතර ඔවුන්ගේ මොර ගැසීම් දෙවියන්වහන්සේ ඉදිරියට පැමිණියේය.

*බලන්න: උත්පත්ති 6 සහ 7 පරිච්ඡේද; 32: 24-28; ගීතිකා 91; ශු. මතෙව් 20: 23; එළිදරව් 13: 11-17.*

## *37 - පරිච්ඡේදය*

# ශුද්ධවන්තයන්ගේ මිදීම

දෙවියන්වහන්සේ තමන්ගේ සෙනඟව මුදාගන්ට තෝරා ගත්තේ මධ්‍යම රාත්‍රියකය. දුෂ්ටයෝ ඔවුන්ට අපහාස කරමින් සිටියදී හදිසියෙන්ම ඉර බබළන්නට විය. සඳ නතර විය. දුෂ්ටයෝ මෙම දර්ශනය විශ්මයෙන් බලා සිටියහ. එකිනෙක පුදුම හාස්කම් ඉක්මණින් සිදුවන්ට විය. හැම දෙයක්ම අස්වාභාවික අයුරින් සිදුවන්ට විය. ශුද්ධවන්තයෝද තමන්ගේ මිදීම ලංවී තිබීමේ ලකුණු දෙස ප්‍රීතියෙන් බලා සිටියහ.

දිය ඇලි ගලා යාම නැවතිණ. අඳුරු ඝන වළාකුළු ඉහළට විත් එකිනෙකට ගැටුණි. නමුත් පැහැදිලි මහිමාලංකාරයෙන් යුත් වූ එක් තැනක් විය. එතැනින් මහත් ජල ඝෝෂාවක හඬ මෙන් දෙවියන්වහන්සේගේ හඬ ඇසෙන්නට විය. එයින් අහස ද පොළොව ද සැලෙන්ට වූහ. මහා බලවත් භූමිකම්පාවක්ද විය. සොහොන් ගෙවල් විවර විය. තුන්වන දේව දූතයාගේ පණිවිඩය අසා සබත් දවස පවත්වමින් සිට මළාවූ අය මහිමයට පත්කරන ලද ශරීරවලින් යුතුව සොහොන් වලින් පිටත්ව ආහ. ස්වාමින්වහන්සේගේ ව්‍යවස්ථාව පැවැත්වූ අය සමග දෙවියන්වහන්සේ කරන්ට යන ගිවිසුමට සවන් දෙන පිණිස ඔවුන් පැමිණියාහ.

අහස ඇරෙන්ටත් පියවෙන්ටත් පටන් ගැනිණ. සුළඟින් සෙලවෙන බට ගස් මෙන් කඳු සැලෙන්ට විය. පර්වත පුපුරා කැබලි ඒ මේ අත විසිවෙන්ට විය. මහා මුහුද දිය සැලියක් මෙන් උතුරන්ටත් එහි වූ ගල්පර කැබලි වී ගොඩ බිමට විසිවෙන්ටත් විය. දෙවියන්වහන්සේ යේසුස්වහන්සේ පැමිණෙන දවස ද පැය ද දන්වා තම සෙනඟට සදාකාල ගිවිසුම ප්‍රකාශයට පත් කළ විට උන්වහන්සේ එක වගන්තියක් කීසේක. එම වගන්තිය ලොව වටා පැතිර යන තුරු බලා සිටිසේක. එවිට දෙවියන්වහන්සේගේ සෙනඟ තමුන්ගේ ඇස් අහස දෙසට යොමු කොට යෙහෝවඃ වහන්සේගේ මුඛයෙන් නික්මෙන වචන ගැන බලා සිටියහ. එම වචන ගිගිරුම් හඬ සේ අහසේ ගමන් කරන්නට වූහ. ඒ හඬ භයක් ඇතිකරන තරම් ගාම්භීරය. මක්නිසාද යත් වගන්තියක් පාසාම දේව සෙනඟ 'හාලේලූයියා. මහිමය වේවා' යයි කෑගැසූහ. ඔවුන්ගේ මුහුණුද දේව මහිමයෙන් ආලෝකමත් වූහ. මෝසෙස් සීනයි කන්දෙන් බැස එන විට ඔහුගේ මුහුණ බැබලුවාක් මෙන් දෙවිඳුන්ගේ සෙනඟගේ මුහුණු බබළන්ට වූහ. දුෂ්ටයන්ට ඔවුන්ගේ මුහුණු දෙස බලන්ට නොහැකි විය. සබත් දවස ශුද්ධ ලෙස පවත්වමින් දෙවියන්වහන්සේට ගෞරව කළ අය කෙරෙහි ඉවරයක් නොවන ආශිර්වාදය දී වදාළ විට මෘගයාටද උගේ රූපයටද විරුද්ධව ලබාගත් මහා බලවත් ජයග්‍රහණයේ ශබ්දයක් පැතිර ගියේය.

ඒ සමගම දේශය නිවාඩු භුක්ති විඳීමේ ජුබිලි මංගල්‍යය ආරම්භ විය. භක්තිවන්ත වහලා ජයග්‍රහණ ප්‍රීතියෙන් නැඟී සිටිනවා මම දුටිමි. තම ස්වාමියා කිසිවක් කරගත නොහැකිව ව්‍යාකූලව සිටි අතර ඔහු බැඳුම් ගසා දමා නැඟිට සිටියේය. දෙවියන්වහන්සේගේ හඬ ශබ්දයේ වචනවල තේරුම දුෂ්ටයන්ට වැටහුණේ නැත. එවිටම අති මහත් සුදු වලාකුළ දර්ශනය විය. මනුෂ්‍ය පුත්‍රයාණන් වහන්සේ එහි අසුන්ගෙන සිටිසේක.

මෙම වලාකුළ මුලින් දිස්වූයේ ඉතා කුඩාවටය. ඈතට කුඩාවට දිස්වූ එය දේව දූතයා හැඳින්වූයේ මනුෂ්‍ය පුත්‍රයාගේ ලකුණ ලෙසය. වලාකුළ පොළොවට පාත්වෙමින් ලංවූ අතර ඉතා උසස් මහිමයකින් යුත් යේසුස්වහන්සේ ජයගත් තැනැන්වහන්සේ ලෙස අපට දකගත හැකි විය. දිළිසෙන

ඔටුනු පැළඳ ගත් දේව දූතයෝ උන්වහන්සේ පිරිවරාගෙන සිටියහ. එම දර්ශනය වචනවලින් විස්තර කළ නොහැක. උන්වහන්සේ හිසේ දරා සිටියේ කටු ඔටුන්නක් නොව, උන්වහන්සේගේ හිස මත මහිමාලංකාරයේ ඔටුන්නක් විය. උන්වහන්සේගේ වස්ත්‍රයේද කලවයේද 'රජවරුන්ගේ රජය ස්වාමිවරුන්ගේ ස්වාමියා'ය යන නාමය ලියා තිබුණේය. උන්වහන්සේගේ ඇස් ගිනි සිළුවක් සේය. උන්වහන්සේගේ පාද ඔප් නැංවූ පිත්තල මෙන්ය. උන්වහන්සේගේ හඬ ඇසුණේ සංගීත භාණ්ඩ බොහොමයක හඬ මෙන්ය. උන්වහන්සේගේ මුහුණ ඉර මුදුන් වෙලේ සූර්යාලෝකය මෙන්ය. උන්වහන්සේ ඉදිරියේ පොළොව කම්පා විය. යමක් අකුලන්නාක් මෙන් අහස පහව ගියේය. සෑම කන්දක්ද, දූපත්ද ඒවායේ ස්ථානවලින් පහකරන ලද්දේය. පොළොවේ රජවරුද, උත්තමයෝද, සේනාධිපතියෝද, ධනවන්තයෝද, බලවන්තයෝද, දාසයෝද නිර්දාසයෝද කඳුවලත් ගුහාවලත් සැඟවුණෝය. ඔවුහු කඳුවලටත් පර්වතවලටත් කථා කොට 'අප පිට වැටී, සිංහාසනයේ වැඩ සිටින තැනැන්වහන්සේගේ මුහුණ ඉදිරියෙනුත් බැටළු පැටවාණන්ගේ උදහසිනුත් අප සඟවා ගනිල්ලා. මක්නිසාද උන්වහන්සේගේ උදහසේ මහත් දවස පැමුණුන බැවින් සිටින්ට පුළුවන් කාටද'යි කීවෝය.

ටික කලකට පෙර දෙවියන්වහන්සේගේ දරුවන්ව විනාශ කරන්ට උත්සාහ කළ අය දැන් දකින්නේ දිව්‍ය මහිමය ඒ අය මත පතිතව තිබෙන ආකාරයය. ඔවුන්ව මහිමයට පත්කර ඇත. මේ අපගේ දෙවියන්වහන්සේය. අපි උන්වහන්සේ ගැන බලා සිටියෙමුව. උන්වහන්සේ අප ගළවන සේක යන ප්‍රීතිමත් හඬ අනිකුත් සියලු හඬ ශබ්ද මැඩගෙන ඔවුන්ට ඇසිණ. දේව පුත්‍රයාණන් වහන්සේ සැතපී සිටින තම ඇදහිලිවන්ත දරුවන්ට හඬ ගසන ශබ්දයෙන් පොළොව මහත් ලෙස කම්පා විය. කැඳවීමට ඔවුහු ප්‍රතිරාවය දක්වූහ. ඔවුහු නොදිරන නොමැරෙන ජීවනයෙන් පළඳවන ලදුව පිටතට ආහ. 'මරණය නුඹේ ජය කොයිද? ජයග්‍රහණය! ජයග්‍රහණය! කියා ඔවුහු කෑගැසූහ. රෝගීව හා දුර්වලව සිට සැතපුන අය භූමියෙන් නැගිට ආවේ සදාකාල සුවය හා ශක්තිය ඇතිවය. ජීවත්ව සිටි ශුද්ධවන්තයන්ව මොහොතකින් ඇසි පිය හෙලන ක්ෂණයකින් අන්වෙසකට හරවනු ලැබ මළවුන්ගෙන් නැගිටුවනු ලැබූ අය සමග අහසට ඇදගනු ලැබ ඔවුන්ගේ ස්වාමින්වහන්සේව සම්මුඛ වූහ. අහෝ! එය කෙබඳු හමුවීමක්ද. මරණය කරණකොටගෙන වෙන් කරනු ලැබූ මිතුරන් හා ආදරය කරනු ලැබූවන් තවත් වෙන් නොවන ලෙස හමුවීමකි.

වලාකුළක් මෙන් වූ රථයේ දෙපැත්තේ පියාපත් තිබිණ. යට පැත්තෙන් වූයේ ජීවමාන රෝද වැන්නක්ය. රථය ඉහළට ගමන් කරන්නට වූ විට එහිවූ ජීවමාන රෝද ද පියාපත්ද 'ශුද්ධ' යයි හඬ නැඟුය. දේව දූත සමූහයාද 'සියලු බලැති දෙවි ස්වාමින්වහන්සේ ශුද්ධය! ශුද්ධය! ශුද්ධය! කියා හඬ නැගූහ. ශුද්ධවන්ත සෙනඟද මහිමය වේවා. හාලේලූයියා කියා කෑගැසූහ. වළාකුළු රථය ශුද්ධ නගරය දෙසට පියාසර කළහ. නගරයට ඇතුල් වන්ට පෙර ශුද්ධවන්තයෝ චතුරස්‍රයක් ලෙස සිටගත්හ. යේසුස්වහන්සේ එහි මධ්‍යයට පැමිණ සිටගත් සේක. උන්වහන්සේ ශුද්ධවන්.තයන්ටද දේව දූතයන්ටද වඩා උරහිසේ සිට ඉහළින් සිටිසේක. චතුරස්‍රයේ සිටි හැමදෙනාටම උන්වහන්සේගේ තේජවන්ත භාවයද මුහුණේ අලංකාරයද දැකගත හැකි විය.

***බලන්න: 2 රාජාවලිය 2: 11; යෙසායා 25: 9; 1 කොරින්ති 15: 51-55; 1 තෙසලෝනික 4: 13-17; එළිදරව් 1: 13-16; 6: 14-17; 19: 16.***

## *38 - පරිච්ඡේදය*

# ශුද්ධවන්තයන්ගේ විපාකය

අති විශාල දේව දූත සමූහයක් නගරයේ සිට ඔටුනු රාශියක් ගෙනෙනවා මම දුටිමි. සෑම කෙනෙකුටම ඔටුන්නක් තිබූ අතර එකිනෙකාගේ නාමයද එහි ලියා තිබිණ. යේසුස්වහන්සේ ඔටුනු තමා වෙත ගෙනෙන ලෙස ඉල්ලූ අතර දේව දූතයෝ උන්වහන්සේ වෙත ඔටුනු ගෙන ආහ. උන්වහන්සේගේම දකුණතින් ඒවා මුදනු ලැබූවන්ගේ හිස් මත පැළඳ වූසේක. එලෙසම වීණාද දේව දූතයෝ ගෙනැවිත් දුන් අතර යේසුස්වහන්සේම ඒවා එකිනෙකා අත තැබූ සේක. සියලු දෙනාම දක්ෂ ලෙස වීණා වාදනය කරමින් මිහිරි හඬින් ප්‍රශංසාවේ ගී ගැයූහ. ඉන්පසු යේසුස්වහන්සේ නගර දොරටු වෙත ඔවුන්ව කැඳවා ගෙන ගොස් දොර විවෘත කර සත්‍යය පැවැත්වූ තමන්ගේ සෙනඟට ඇතුල් වෙන්ට සැලැස්වූ සේක. නගරය තුළ ඇස පිනවන සියලුම දේ තිබිණ. සතුට ගෙන දෙන හැම දෙයකින්ම නගරය පිරී තිබෙන බව දිස් විය. යේසුස්වහන්සේ මුදනු ලැබූවන් දෙස නෙත් හෙළා, ප්‍රීතියෙන් පිරී තිබූ ඔවුන්ගේ මුහුණු දෙස බලා 'මාගේ ආත්ම වේදනාවේ ඵල මම දැන් දකිනවා. මම එයින් තෘප්තියට පැමිණියෙමි'යි උන්වහන්සේ මිහිරි හඬින් පැවසූ සේක.' මේ සියලූ දේම

සදාකාලයටම නුඹලාට අයිතිය. නුඹලාගේ දුක් වේදනා සියල්ල හමාරය. මරණය තවත් නොවන්නේය. හැඩීමක්වත් වේදනාවක්වත් තවත් නොවන්නේය.' එවිට මුදනු ලැබූ අය තමන් හිස් මත වූ ඔටුනු ගළවා යේසුස්වහන්සේගේ පාමුල තබා උන්වහන්සේට ස්තුති ප්‍රශංසාවේ ගී ගයා ගී හඬින් ස්වර්ගය පිරවූහ.

උන්වහන්සේ ඉන්පසු ඔවුන්ව ජීවන වෘක්ෂය වෙත කැඳවා ගෙන යනවා මම දුටිමි. එතැනදී ද සියළු මිනිස් හඬකට වඩා මිහිරි වූ ගීතමය හඬකින් කථා කොට මේ ගසේ කොළ සියලූ ජාතීන්ගේ සුවවීම පිණිසය. එයින් ගෙන කාපල්ලා යයි කීසේක. ජීවන ගසෙහි වූයේ ඉතාම අලංකාර ගෙඩිය. ශුද්ධවන්තයන්ට ඒවා කැමති ලෙස කන්ට පුළුවන. ඉතාම තේජවන්ත ලෙස වූ සිංහාසනයක් නගරයෙහි විය. ඉතාම පිරිසිදු ජලය ගලා යන ජීවනදායක ගංගාව සිංහාසනය වෙතින් ගලාගෙන ගියේය. ගඟේ ඒ පැත්තේද මේ පැත්තේද එකමුතුවක් වැනි වූ ජීවන වෘක්ෂය තිබිණ. ගසේ ඉවුරු දිගේම කෑමට හොඳ රසැති පළතුරු ගස්ය. ස්වර්ගයේ අලංකාර ස්වභාවය ගැන විස්තර කිරීමට භාෂාවල වචන ප්‍රමාණවත් නැත. එම දර්ශන මා ඉදිරියේ මැවී පෙනෙන විට මම විශ්මයෙන් මුසපත් වීමි. එම විශ්මිත අලංකාරය මාව මෝහනය කළ අතර මම මාගේ පෑන බිම තියා පවසන්නේ කෙබඳු ප්‍රේමයක් ද; මොන විදියේ පුදුම ප්‍රේමයක්ද; ඉතාම උසස් භාෂා විලශයකින්වත් ස්වර්ගීය මහිමය වර්ණනා කළ නොහැක. කිසිවෙකුට සමාන කළ නොහැකි ගැළවුම්කාරයාණන්ගේ ගැඹුරු ප්‍රේමය විස්තර කළ නොහැක.

***බලන්න: යෙසායා 53: 11;  එළිදරව් 21: 4;  22: 1-2.***

## *39 - පරිච්ඡේදය*

# පොළොව පාළු විය

මම එවිට පොළොව දුටිමි. දුෂ්ටයන් මැරිලාය. ඔවුන්ගේ මළ සිරුරු පොළොව මත හැමතැනම විසිර තිබිණ. ඔවුහු දේව උදහසේ වසංගත හතේ පීඩාවන්ට ගොදුරු වූහ. ඔවුහු දෙවියන්වහන්සේට ශාප කර තමන් දිවි නසාගත්හ. ව්‍යාජ එඬේරු දෙවියන්වහන්සේගේ උදහසට සෘජුවම අසුවූහ. ඔවුන් දෙපයින් සිටගෙන සිටිද්දීම ඔවුන්ගේ ඇස් ඒවායේ සිදුරුවලම ක්ෂය විය. ඔවුන්ගේ දිව්ද ඔවුන්ගේ කටවල්වලම ක්ෂය වූහ. දෙවියන්වහන්සේ තමන්ගේ හඬ පවත්වා තමන්ගේ සෙනඟව මුදාගත් පසු දුෂ්ටයන්ගේ කෝපය එකිනෙකා කෙරෙහි ඇවිලී සටන් වැදුණි. පොළොව පෙනුනේ ජල ගැලීමක් ලෙස ලෙයින් පිරී තිබෙන ආකාරයය. මළ සිරුරු පොළොවේ එක් කෙළවරක සිට අනික් කෙළවර දක්වා විසිර තිබිණ.

පොළොව ඉතාම පාළු ස්වභාවයකින් පෙනිණ. මහා භූමි කම්පාවෙන් නගරවල සහ ගම්වල ගොඩනැගිලිවල සුන්බුන් තැන් තැන්වල ගොඩවල් වශයෙන් විය. කඳු උදුරා දමනු ලැබ ඒවා තිබූ තැන්වල කුහර පෙනෙන්නට තිබිණ. මුහුදේ පිපිරීම්වලින් ගොඩට විසිවූ පර්වත කැබලි ද ගොඩබිම පුපුරා විසිවූ පර්වත කැබලි ද හැමතැන විසිර තිබිණ. මුළු පොළොවම පාළු කාන්තාරයක් ලෙසට දිස් විය. විශාල ගස් උදුරා දමනු ලැබ හැමතැනම විසිර ඇත. වසර ගණනාවක් මුළුල්ලේම සාතන්ගේ නිවාසය වන්ට යන්නේ මෙම පොළොවය. මෙම වසර දහස තුළ සාතන් සහ ඔහුගේ දූතයන් දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට විරුද්ධව ගෙන ගිය සටනේ විපාක දෙස බලමින් තෘප්තියක් ලබති. දැන් ඔහුව මෙම පාළුකරයට සීමා කර ඇත. වෙනත් ලෝකවල ජීවත්වන පාපයට නොවැටුණාවූ අයගේ සිත් රිදවන්ට යාමට දැන් ඔහුට අවසර නැත. මෙම කාලය තුළ සාතන් තද ලෙස වේදනා විඳියි. දැන් ඔහුගේ බලය සීමා කරනු ලැබ තමා පව් කළදා සිට මේ දක්වා කළ සියලූ අධර්මිෂ්ඨකම් ගැන සිතා බලන්ට ඔහුට කාලය ලැබී තිබෙන අතර අනාගතයේ තමාගේ ඉරණම නොහොත් මනුෂ්‍යයන් ලවා කරවූ පාප අපරාධ සියල්ල ගැන අත්වෙන්ට තිබෙන දුක් වේදනාද මරණයද ඉදිරියේ භයින් තැති ගනී.

දේව දූතයන්ගේද මිදීම ලත් අයගේද ජයග්‍රහණයේ ප්‍රීති ඝෝෂා හඬ මම ඇසීමි. එය දස දහසක් සංගීත භාණ්ඩවල මිහිරි නාදයක් සේ විය. මක්නිසාද තවදුරටත් තමන්ගේ සිත් පාරන්ට හෝ පරීක්ෂා කරන්ට සාතන්ට නොහැකි වන නිසාය. අනිකුත් ලෝකවල වාසය කරන්නෝද සාතන්ගෙන් පැමිණෙන කරදර පරීක්ෂා ආදියෙන් දැන් නිදහස ලැබූහ.

තවද මම සිංහාසන දුටිමි. යේසුස්වහන්සේද මිදීම ලැබූ අයද ඒවායෙහි හිඳගත්හ. ඔවුහු දෙවියන්වහන්සේගේ රජවරුන්ද පූජකයන්ද ලෙස රජකම් කළෝය. පොත්වල ලියා තිබෙන දේ අනුවද දේව වචනය අනුවද මළාවූ දුෂ්ට අයව විනිශ්චය කරනු ලැබුවෝය. යේසුස්වහන්සේද සමග ඔවුහු විනිශ්චයේ යෙදී දුෂ්ටයන්ට දිය යුතු දඬුවම්වල ප්‍රමාණයන් තීරණය කළහ. පොත්වල ලියා තිබූ සටහන් අනුව එකිනෙකා ශරීරයේදී කළ ක්‍රියා අනුව තීන්දුව දුන්හ. සාතන්ව සහ ඔහුගේ දූතයන්වද විනිශ්චය කළේ යේසුස්වහන්සේද මිදීම ලත් ශුද්ධවන්තයෝද එකතු වෙලාය. සාතන්ගේ දඬුවම ඔහු විසින් මුළාකරනු ලැබූ අනික් අයගේ දඬුවමට වඩා අතිශයින් දරුණු විය. ඔහු අනික් අයට වඩා දිගු කලක් දඬුවම් විඳින්ට යුතුව තිබිණ.

මළාවූ අයගේ මෙම විනිශ්චය හමාර වූ පසු එනම් අවුරුදු දහස (1000) කෙළවර වූ විට යේසුස්වහන්සේ නගරයෙන් පිටත්ව ගියසේක. දේවදූත සේනාවන්ද මුදාගනු ලැබූ අය ද උන්වහන්සේ සමග ගියහ. යේසුස්වහන්සේ පහතට බැස ආවේ අති මහත් කඳු මුදුනක් මතටය. උන්වහන්සේගේ පාද එම කන්දට ස්පර්ශ වූ විගසම එය මැදින් දෙකඩව දෙපැත්තට ගොස් විශාල තැනිතලාවක් බවට පත්විය. එවිට අපි ඉහළ බැලීමුව. අති විශාල අලංකාර නගරය දුටීමුව. එහි දොරටු එක පැත්තක තුන බැගින් දොරටු දොළසක් වූහ. හැම දොරටුවක් ළඟම දේව දූතයෙක් විය. 'අන්න නගරය, අති විශාල නගරය දෙවියන්වහන්සේ වෙතින් ස්වර්ගයෙන් බැස එනවා' යයි කියා අපි කෑගැසීමු. දිළිසෙන මහත් අලංකාරයෙන් යුතුව එය පැමිණ යේසුස්වහන්සේ සූදානම් කර තිබූ තැනිතලාව මත පිහිටා නතර විය.

*බලන්න: සෙකරියා 14: 4-12; එළිදරව් 20: 2-6 20: 12; එළිදරව් 21: 10-27.*

## *40 - පරිච්ඡේදය*

# දෙවන මළවුන්ගෙන් නැගිටීම

යේසුස්වහන්සේද දේව දූත සේනාවන් සියල්ලෝ සහ මිදීම ලත් සියලුම ශුද්ධවන්තයෝද ශුද්ධ නුවරින් පිටත්ව ආවෝය. යේසුස්වහන්සේව පිරිවරාගත් දේව දූතයන් පස්සේ ශුද්ධවන්තයන්ද පැමිණියහ. මහත් භයානක තේජවන්ත හඬකින් යේසුස්වහන්සේ කථා කළසේක. එවිට මැරී සිටින දුෂ්ට මනුෂ්‍යයෝ මැරෙන විට ජීවත්ව සිටි ආකාරයෙන්ම නැගිට ආහ. එය මහත් පුදුම දර්ශනයකි. පළමුවන නැවත නැගිටීමේදී නැගිටි අය අමරණීය නොදිරන භාවයේ අලංකාරයෙන් නැගිට ආහ. නමුත් දෙවන නැගිටීමේදී නැගිට ආ අය ශාපයේ ලකුණු ඇතිව නැගිට ආහ. එඬේරු ස්වාමිවරු සහ පහත් දුර්වල අයද උගත් නූගත් ඒ හැම පොළොවේ සිටි ආකාරයෙන්ම වූහ. යේසුස්වහන්සේට නින්දා අපහාස කළාවූ අය ද උන්වහන්සේගේ හිසේ කටු ඔටුන්නක් තබා බට දණ්ඩකින් තැලූ අයද තේජාන්විත රාජකීයත්වයෙන් යුතු උන්වහන්සේ දෙස බැලූහ. උන්වහන්සේගේ මුහුණට කෙළ ගැසූ අය උන්වහන්සේගේ දිළිසෙන ඇස්ද තේජසින් බබළන මුහුණද බලන්ට නොහැකිව ඇස් ඉවත හරවා ගත්හ. උන්වහන්සේගේ අත්පා ඇණවලින් සිදුරු කළ අය ද හෙල්ලයකින් උන්වහන්සේගේ ළපැත්ත සිදුරු කළ අය ද උන්වහන්සේගේ එම තුවාලවල කැළැල් දැක උන්වහන්සේගේ ශරීරයට ඔවුන් කළ කුරිරුකම් දකගත්හ. තමන්ගේ කෲරකම්වලට භාජනව කුරුසිය මත මරණයට පත්වූයේ මේ තැනැන්වහන්සේම බව ඔවුහු හඳුනා ගත්හ. රජවරුන්ගේ රජද ස්වාමිවරුන්ගේ ස්වාමිද වන උන්වහන්සේ වෙතින් පලා යන අතර ඔවුන්ගේ මහා විලාප හඬ ඇසෙන්ට විය.

තමන් විසින් තුවාල කළ තැනැන්වහන්සේගේ අති මහත් තේජස ඉදිරියේ සැඟවී යන්නට ඔවුහු සියල්ලෝම කඳුවල හා ගුහාවල ආරක්ෂාව සෙවූහ. උන්වහන්සේගේ උතුම්කමද අති මහත් තේජසද දැක භීතියටත් වේදනාවටත් පත්ව සිටි නමුත් සියල්ලෝම එක හඬින් කෑගසා 'ස්වාමින්වහන්සේගේ නාමයෙන් එන තැනන්වහන්සේ ආශිර්වාද ලද්දේ' යයි කීවේය.

යේසුස්වහන්සේද දේව දූතයන්ද සමග ශුද්ධවන්ත සෙනඟ නැවත වරක් නගරයට ඇතුල් වූහ. විනාශයට ලක්ව සිටින දුෂ්ට සෙනඟගේ විලාප හඬ සුළඟට එක්ව තිබිණ. එවිට සාතන් නැවත තමාගේ සේවය ඇරඹූ බව මම දුටිමි. ඔහු තමාගේ ජනතාව අතරේ එහා මෙහා යමින් දුර්වල බෙලහීන අයව ශක්තිමත් කරමින් තමාද තමාගේ දූතයන්ද බලවත්ව සිටින බව පැවසීය. මළවුන්ගෙන් නැගිටුවනු ලැබ සිටින ගණන් කළ නොහැකි බලවන්ත සෙනඟව පෙන්වූහ. රජවරු රාජ්‍යවල් යටත් කරගත් සේනාධිපතීන් බලවත් යෝධයින් සහ සටනෙහි බලවත් වූ කිසිදා පරාජයට පත්නොවූ අය ඔහු සමග වූහ. රාජ්‍යයන් යටත් කරගන්නට ලංවෙන විට බලවතුන් වෙවුලීමකට පත් කළාවූ අහංකාර නැපෝලියන්ද ඒ අය අතර වූහ. මේ අය මළවුන්ගෙන් නැගිට්ටේ ඔවුන් මරණයට පත්වූ

අවස්ථාවේ තිබූ හැඟීම් සම්භාරයත් සමගය. රාජ්‍යයන් යටත් කරගැනීමේ පිපාසය ඔවුන් තුළ විය. සාතන් තම දූතයන් සමගද ඉන්පසු රජවරුන්ද සටන් කාමීන්ද බලවත් මිනිසුන්ද සමග කථාබහක යෙදින. ඉන්පසු ඔහු තමාගේ අති විශාල සේනාවන් දෙස බලා කියා සිටින්නේ නගරය තුළ සිටින්නේ දුර්ලයන් බවත් ස්වල්ප දෙනෙක් බවත්ය. තම සේනාවන්ට නගරය යටත් කරගත හැකි බවත් එහි වැසියන් පිටත දමා එහි ඇති සියලූ සම්පත් හා ඉසුර තමන්ට අත්පත් කරගත හැකි බවත්ය.

ඔවුන්ව මුළා කරගැනීමට සාතන් සමත් විය. සැමදෙනාම සටනට සූදානම් වීම ඇරඹූහ. ඔවුහු ආයුධ තනන්ට පටන් ගත්හ. එම විශාල හමුදාවේ යුද්ධායුධ තැනීමේ දක්ෂ අය වූහ. ඉන්පසු සාතන්ගේ මූලිකත්වය ඇතිව ඔවුහු ගමන් ඇරඹූහ. කණ්ඩායම් වශයෙන් ඔවුහු ඔහු පස්සේ ගමන් කළහ. සෑම කණ්ඩායමකටම මූලිකයෙක් විය. ක්‍රමානුකූලව ඔවුහු ශුද්ධ නගරය දෙසට ගමන් කළේ කැඩුම් බිඳුම් ඇතිව තිබූ භූමිය මතය. යේසුස්වහන්සේ ශුද්ධ නගරයේ දොරටු වසා දැමූ සේක. මේ මහත් සේනාවන් පැමිණ නගරය වටලා යුද්ධ පිළිවෙලින් සිටගත්හ. නොයෙක් මාදිලියේ යුද්ධායුධ ඔවුන් සාදාගෙන තිබිණ. බලවත් ගැටීමක් ඔවුහු බලාපොරොත්තුව සිටියහ. නගරය වටා සන්නද්ධව සිටියහ. යේසුස්වහන්සේ සහ සියලූම දේව දූතයෝ තම හිස් මත දිළිසෙන ඔටුනු ඇතිව සහ සියලූම ශුද්ධවන්තයන් තම හිස් මත බබළන ඔටුනු ඇතිව නගරයේ තාප්ප මතට පැමිණියහ. යේසුස්වහන්සේ බලයෙන් යුක්තව කථා කරමින් දුෂ්ට අයට 'ධර්මිෂ්ඨයන්ගේ විපාකය දෙස බලාපල්ලා" යයි කියාද, ධර්මිෂ්ඨ අයට 'දුෂ්ටයන්ගේ දඬුවම දෙස බලාපල්ලා" යයිද කීසේක. ඒ මහත් සමූහයා තාප්පය මත සිටින තේජස් සම්පන්න අය අලංකාරව දිළිසෙන ඔටුනු පැළඳ සිටිනවා දුටුවහුය. යේසුස්වහන්සේගේ චරිත ස්වභාවයද ඔවුන්ගේ මුහුණුවල පෙනෙන්ට වූහ. සියල්ලන්ට වඩා තේජස් සම්පන්න රජවරුන්ගේ රජ වූද ස්වාමිවරුන්ගේ ස්වාමියාණන් වූද යේසුස්වහන්සේගේ මහිමය දුටු දුෂ්ට සේනාවන්ගේ ධෛර්යය දියවී යන්නට විය. තමන්ට අහිමිවූ මහිමය හා සම්පත් ගැන හැඟීම් බලවත් ලෙස දැනෙන්ටද පාපයේ කුලිය මරණය බව සිහිවන්ටද වූහ. තමන් විසින් අපහාසයට ලක් කරනු ලැබූ අය දැන් මහිමයෙන් පළඳවනු ලැබ අමරණ භාවය ගෞරවය, සදාකාල ජීවනය ලබා සිටි අතර තමන් දැන් ශුද්ධ නගරයෙන් පිටත අපවිත්‍ර, එපා කරනු ලැබූ අයව සිටින බව ඔවුන්ට හැඟී යන්ට වූහ.

***බලන්න: ශු. මතෙව් 23: 29; එළිදරව් 6: 15-16; 20: 7-9; 22: 12-15.***

## 41 - පරිච්ඡේදය

# දෙවන මරණය

සාතන් හදිසියේම මැදට පැමිණ මහත් සමූහයාව ක්‍රියාවකට පොළඹවන්නට උත්සාහ කළේය. නමුත් එවිට ස්වර්ගයෙන් දෙවියන්වහන්සේ වෙතින් ගින්දර පැමිණ බලවතුන් ප්‍රබලයන් ඇතුළුව සියලූ දෙනාවම දවා දැමීය. සමහර අය ඉක්මණින් දැවී ගිය අතර තවත් අය දැවී යන්ට වැඩි කාලයක් ගතවිය. ඒ ඔවුන් ශරීරයේදී කළ ක්‍රියාවන්ට අනුව බව මම දුටිමි. දැවෙන්ට යමක් ඉතුරු නොවන තුරු සියල්ල දැවී යන්ට විය. වේදනාවල සියලූම හැඟීම් ඔවුන්ට දැනිණ.

සාතන්ට සහ ඔහුගේ දූතයන්ට වැඩි කාලයක් වේදනා විඳින්ට සිදුවිය. සාතන්ට දඬුවම් විඳින්ට සිදුවූයේ ඔහුගේ පාපවලට පමණක් නොව ගැළවුණාවූ අයගේ පව්ද ඔහු පිට තබන ලද අතර නොගැළවුණාවූ අයගේ ජීවිතවල ඔහු කළාවූ විනාශකාරී දේවල්වලටද ඔහු දඬුවම් විඳිය යුතුය. සාතන් සහ ඔහුගේ මුළු සංහතියම දැවී පිලිස්සී යනවා මම දුටිමි. දෙවියන්වහන්සේගේ සාධාරණත්වය ඉටුවී තෘප්තියට පැමිණි අතර දේව දූත සමූහයාද මිදීම ලත් සියලූ දෙනාද මහත් හඬින් 'ආමෙන්" යයි පැවසූහ.

සාතන් මුලය. ඔහුගේ දරුවෝ අතුය. දැන් මුලද අතුද පිලිස්සී ගොස්ය. ඔවුහු සදාකාල මරණයට පත්වූහ. ඔවුනට තවත් මළවුන්ගෙන් නැගිටීමක් නැත. දෙවියන්වහන්සේගේ විශ්වය දැන් පිරිසිදුය. මම නැවත බැලූ විට දුෂ්ටයන් දවා දැමූ ගින්න පොළොවේ කුණු කසල දවා දමමින් එය පිරිසිදු කරනවා දුටිමි. නැවත මම බැලූ විට පොළොව පවිත්‍රව තිබෙනවා දුටිමි. එහි පාපයේ ශාපයේ ලකුණක්වත් නොවීය. පිළිවෙලක් නැතිව කැඩී බිඳී තිබුණාවූ පොළොව මතුපිට ඈතට විහිදී යන සමතුලිතතාවයක් ලෙස දිස්විය. දෙවියන්වහන්සේගේ මුළු විශ්වයම පිරිසිදුය. මහා අරගලය සම්පූර්ණ ලෙස නිමාවට පත්ව ඇත. අප බැලූ හැමතැනම නෙත් ගැටුන හැම දෙයක්ම ශුද්ධව අලංකාරව තිබිණ. ගැළවීම ලත් බාල, මහළු ලොකු, කුඩා හැමදෙනාම තමන්ගේ දිලිසෙන ඔටුනු ගළවා බිමට නැමී තම මිදුම්කරුවාණන්ගේ පාමුල තබා උන්වහන්සේ ඉදිරියේ වැඳ වැටී නමස්කර කළෝය. අලංකාර අළුත් පොළොව එහි තිබෙන සියලූ මහිමවත් දේ සමග ශුද්ධවන්තයන්ගේ සදාකාල

උරුමයය. මුළු අහස යට තිබෙන රාජ්‍යවල රජකමද ආණ්ඩුවද මහත්කමද මහෝත්තමයාණන්ගේ ශුද්ධවන්තයන් වන සෙනඟට දෙන ලද්දේය. එය ශුද්ධවන්තයන් විසින් සදාකාලයෙන් සදාකාලයටම භුක්ති විඳින පිණිසය.

*බලන්න: යෙසායා 66: 24; දානියෙල් 7: 26, 27; එළිදරව් 20: 9-15; 21: 1; 22: 3.*

.